

# කඞ්ඛාවිතරණී

# පිටපොත.

පෞරාණිකාචාර්‍ය්‍යවරයෙකු විසින්

විරචිත

# කඞ්ඛාවිතරණී පිටපොත.

විද්‍යෝදය පිරිවෙණේ ආචාර්‍ය්‍ය

කළුකොඳයාවේ පඤ්ඤාසේඛර

ස්වාමිපාදයන් වහන්සේ

විසින්

සංශොධිත යි.

විද්‍යෝදය පරිවෙණාධිපති

බද්දෙගම ශ්‍රී ප්‍රියරතනාභිධාන

නායක මාහිමියන් වහන්සේ

විසින්

ප්‍රතිගෘහීත යි.

ජී. ඩී. ශරණතිලක ජයශෙඛර විසින්

මහාබොධි යන්ත්‍රාලයෙන්

මුද්‍රාපිත යි.

2480

1936

# ප්‍රස්තාවනා.

**සංඥා:—** මේ ග්‍රන්ථයෙහි නාමය **කඞ්ඛාවිතරණී පිටපොත** වනු යි. මේ වනාහි භික්ෂු භික්ෂුණී උභයවිභඞ්ගාත්මක ප්‍රාතිමෝක්ෂයට කරණලද **කඞ්ඛාවිතරණී** නම් අට්ඨකථාව පිළිබඳ ග්‍රන්ථිපද විවෘත කිරීම් වශයෙන් ලියන ලද්දකි.

**කර්තෘ:—** මේ ග්‍රන්ථයාගේ කර්තෘවරයා කවරෙක් දැ යි එක් පිටපතක වත් නො දක්වන ලද්දේ ය. සමකාලීන වූ හෝ පශ්චාත්කාලීන අන්‍ය ග්‍රන්ථයෙක්හි ද අනිර්දිෂ්ට ය. නානා භාෂාශාස්ත්‍රප්‍රවීණ, විනයපිටකය පිළිබඳ විශේෂඥ, පඬිවරයෙක යන්න පමණක් ප්‍රකාශ කළහැකි ය.

**නිර්මාණකාලය:—** ලංකා ඉතිහාසයෙහි සඳහන් වන පරිදි ව්‍යක්ත විචක්ෂණ විද්‍යාධරයන් විසින් අතිශය සම්භාව්‍ය වූ ග්‍රන්ථ රචනා කරණ ලද්දේ **පොළොන්නරු** කාලයේ හා **දඹදෙණි** කාලයේ ය යි කිය යුතු ය. මෙය ද එයට ආසන්න වූ ශාස්ත්‍රාලෝකයෙන් අතිශය දීප්තිමත් කාලයෙක්හි ම රචිත ය යි පිළිගත හැකි ය. භාෂාවිලාසයෙන් ද ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 18 වැනි 19 වැනි ශතවර්ෂයන්ට අයත් ය යි පිළිගත හැකි සේ පෙණේ. මෙහි දෙ තැනෙක්හි **ද්විතීය පණ්ඩිත පරාක්‍රමබාහු** මහ රජතුමා විසින් ලියනලද **නිස්සන්දේහ** නම් **විනයවිනිශ්චය** සන්නයෙන් උපුටා ගත් කාරණයෝ ඇත්තාහ. එහෙයින් මෙය ඉන් පසු ව ලියන ලද බව නිසැක ය. **ද්විතීය පරාක්‍රමබාහු** රජතුමාගේ රාජ්‍ය වර්ෂය **මහාවංශයේ** පෙණෙන පරිදි ශ්‍රී බුද්ධ වර්ෂ 1791 ය. **අත්තනගලුවංශයේ** පෙණෙන පරිදි ශ්‍රී බුද්ධ වර්ෂ 1779 ය. ඒ අනු ව කරුණු සලකන කල මෙය 19 වැනි ශත වර්ෂයේ මූලභාගයෙහි ලියන ලදැ යි සිතිය යුතු ය.

**ආශ්‍රිතග්‍රන්ථ:—** තෙවළා දහම් අතුරෙන් විනයපිටකය පිළිබඳ නිරාකුල අර්ථාවබෝධය සඳහා රචිත ග්‍රන්ථයෝ බොහෝ වූහ. ශාසනාරක්ෂාවට කාරණ වන බැවින් එය එසේ විය යුතු ම ය. **සමන්තපාසාදිකා** නම් වූ විනයට්ඨකථාව එයින් ප්‍රධාන ය. ඒ පිළිබඳ ප්‍රධාන ටීකාග්‍රන්ථයෝ තුන්දෙනෙකි. ඔවුනතුරෙන් වඩා පැරණි වූයේ **වජිරබුද්ධිටීකාව** යි.

“මාගධිකාය භාසාය-ආරභිත්වාපි කෙනචි,
භාසන්තරෙහි සම්මිස්සං-ලිඛිතං කිඤ්චිදෙව ච.”

න **සාරත්ථදීපනී** විනයටීකාප්‍රාරම්භයෙහි පැණෙන
චි “කෙනචි” යන්න පිළිබඳ ව “සබ්බත්ථ කෙනචීති
වජිරබුද්ධිටීකාකාරෙනාති ගහෙතබ්බං”යි එහි ම
ලද වාක්‍යයෙන් එය ප්‍රස්ඵුට වෙයි.

:වැනි වූයේ **සාරත්ථදීපනී** විනයටීකාව ය. මේ ටීකා
ායම මෙයට වඩා පැරණි බව නිසැක ව පිළිගත යුතු
3 කීප පලක ම **වජිරබුද්ධිටීකාවෙන්** නිදර්ශනයෝ උපුටා
ා ලදහ. **සාරත්ථදීපනී**ටීකාව එයට වඩා සර්වප්‍රකාරයෙන්
; ව ද සම්භාව්‍ය ව ද තිබියදීත් එයින් කරුණු උපුටා
ගණ **වජිරබුද්ධියෙන්** උපුටා දැක්වීමට ඇති හෙතුව
දැ යි නිශ්චය නො කළහැකි ය. එහෙත් **වජිරබුද්ධිටීකා**
ා ස්වාමීන්ගේ ශිෂ්‍යපරම්පරාවට අයත් විද්‍යාධරයෙකු
මෙය ලියන ලදැ යි එයින් සැක වශයෙන් සිතිය හැකි ය.
**කොදනිය** තුන්වැනි ටීකාව යි. එයින් ද කිසිවක් උපුටා
ක්වූ බවට සාක්ෂ්‍ය නො පෙණේ. එය මෙයට වඩා පැරණි
භාවය කිරීමට ද කිසි සාක්ෂ්‍යයක් නැත්තේ ය.

රාජිකපාලි, පාචිත්තියපාලි, පරිවාරපාලි, සමන්තපාසා
ාජිරබුද්ධිටීකා, අටුවාසන්න, පපඤ්චසූදනීඅට්ඨකථා, වන
න්න, විනයසන්න, කඞ්ඛාවිතරණීසන්න, හෙළ කඞ්ඛාවිත
ා තවත් විනයග්‍රන්ථ කීපයකින් ම උපුටා ගන්නාලද
ඉයෝ මෙහි ඇත්තාහ.

**ගැටපද, පොත්:—**

ඒ ග්‍රන්ථයන් පිළිබඳ ව ලියනලද අටුවා, ටීකා, අනුටීකා
නො ව පෞරාණිකයන් විසින් හෙළබසින් ලියන
ලද සන්න, ගැටපද හා පිටපොත් ද
තුබූබව පෙණේ. “බුද්ධදින්න ය, ධම්
පාල ය,-පෙ-බුද්ධප්පිය ය, අනවම
දර්ශී ය යනාදි මහාස්ථවිරවරයෝ
ක් ටීකාඅට්ඨකථා හා තත්ප්‍රවෙශොපාය වූ අනෙකප්‍රකාර වූ
හා සන්න ගැටපද පිටපත් ආදිය උපදවා බුදුන්ගේ
ශාසනය බැබලවූහ” යි නිකායසඞ්ග්‍රහකාරයෝ ද පැව
සන්න නම් පදානුපදික අර්ථව්‍යාඛ්‍යානය යි සිතිය යුතු
ණේ. විශුද්ධිමාර්ග සන්න, ගඩලාදෙණි සන්න, මහාරූප
ස්න ආදිය එයට සාධක වෙයි. **ගැටපද** නම් ග්‍රන්

ස්ථාන විවෘත කිරීම් වශයෙන් හෙළබසින් ලියන ලද විවරණ ග්‍රන්ථයෝ ය. ඇතැම් තැනෙක්හි ගැටපදයට ද සන්න යන නාමය ප්‍රචලිත වී ය. "දෙබිසෙවැජ අභාසලමෙවන් මහරජහු **දහම්පියා**අටුවාවට කළ සන්නය යි" යන **ධම්පියා ගැටපද**යේ අවසනැ පෙණෙන වාක්‍යය එයට සාධක යි. **පිටපොත** යන නාමය මාතෘභාෂාවකින් අනූදිත ග්‍රන්ථයකට ව්‍යවහාර කිරීම උචිත බව පෙණෙතුදු මෙහි නම් ග්‍රන්ථපද විවරණයකට වඩා කියයුතු විශෙෂයක් නො පෙණේ. මෙය හා **නාමරූපසමාසය** පිළිබඳ වූ **සිලිපිටපත** හැර අනෙක් පිටපොතක් අප විසින් නො දක්නාලදී. නාමමාත්‍රය පවා නො ද අසනලදී. **සිල්පිටපත** වනාහි **නාමරූපසමාසය** පිළිබඳ පදානුපදික ව්‍යාඛ්‍යාවකි. එහෙයින් සන්නයට ද පිටපත යන නාමය අවිශෙෂයෙන් ව්‍යවහාර කළබව පෙණේ. මෙයට පිටපොත යන නාමය ව්‍යවහාර කරණ ලද්දේ කවර හෙයකින් දෑ යි සිතිය යුතු ය. **කඞ්ඛාවිතරණී**යට ලියනලද පැරණි ගැටපද හා සන්න තවත් තුබූබව නිසැක ය. **කඞ්ඛාවිතරණීසන්න**යෙන් හා **හෙළ කඞ්ඛාවිතරණී**යෙන් (මේ දෙක ම එකක් දෑ යි නො දනුම්හ.) උපුටාගත් වාක්‍යයෝ මෙහි ම පැණෙති.

"පාතිකම්මං නාම සමකං වා අතිරෙකං වා තදග්ඝනකං. ඒ වටනා මිල හෝ වඩා දීම හෝ පාතිකම් නම්. මේ මැසි පුටු ඇ සඟහට දෙම් යි කල ගුරුබඞු වෙයි. නො බෙජිය යුතු. සඟිනි පිරිමැජිනි බැවිනි. මෙ සජ හිමියනට වසෙගිනි ගණිනට දෙම් යි කල ගුරුබඞ් හොතුජ් කෙපෙවත බෙජෙයි. වසෙගිනි ගණිනි වටී ද වා කීසෙයිනි කරත දෙස නැත. අයපවත බෙජෙයි. ගත නො ලැබෙයි. මේ මැසි පුටු වසෙගිනි ගණිනට සඟහට දෙම් යි කී දෙස නැති. පළම් සඟිනි පෙරෙම්ජ් කියා යි කල ගුරුබඞ් වෙයි."

"සාමිකෙ අපලොකෙත්වා යි බැවින් හිමියන කීයෙහි ලති දෙස් නැති. එකරුණෙනි බික්සඟිනි අයති වතුයෙහි ලති දෙස් නැති" යනු **පැරණි කඞ්ඛාවිතරණී ගැටපද**යෙහි වාක්‍යයෝ යි. (මේ වාක්‍යයන්හි බොහෝ දෙස් ඇති බව පෙණේ. අපි ඒ කිසිවක් ශුද්ධ නො කොට මුද්‍රිත ග්‍රන්ථයෙහි පැණෙන පරිදි ම යෙදුවෙමු.) එහෙයින් මෙයට සන්න ගැටපද යන දෙ නම ම නො යොදා **පිටපොත** කියා යෙදීම යුක්ති සහගත ය යි සැලකූ සේ පෙණේ.

**ප්‍රාතිමොක්ෂය** හා **කඞ්ඛාවිතරණිය** උද්ග්‍රහණය කරන්නවුන්ට මෙය අතිශයින් ප්‍රයොජනවත් බැවින් මුද්‍රණයෙන් ප්‍රකට කරවුව හොත් මැනවැ යි අප වයස්‍ය කීපදෙනෙකුන් විසින් ම කරණ ලද ආරාධනාය පිළිගත් අපි ඒ සඳහා ව්‍යාපෘත වූමු.

**ශෝධනය:—**

**විද්‍යොදය පිරිවෙණේ** පුස්තකාලයට අයත් පොත ද, අපවත් වී වදාළ **ආචාර්ය්‍ය බැණ්ඩිගමුල්ලේ ධම්මරතන** ස්ථවිරපාදයන් වහන්සේට අයත් **ගම්පහ විද්‍යාරවින්ද** පිරිවෙන් පුස්තකාලයට අයත් පොත ද, **පණ්ඩිත කඹුකුරුන්දේ දෙවානන්ද** ස්ථවිරයන් වහන්සේ විසින් සපයා එවන ලද පොත ද, **ආචාර්ය්‍ය පලුවැල්ගොලේ සරණපාල** ස්ථවිරයන් විසින් සපයා එවනලද පොත දූ යි ආදර්ශ පොත් සතරක් අපට ලැබුනේ ය. ඇතැම් සංශයස්ථාන නිරාකරණය සඳහා **කොළඹ කෞතුකාගාර**ප්‍රතිබද්ධ පුස්තකාලයෙහි පොත සමග ද සසඳ බැලූම්හ. එහෙත් මුලින් කී පොත් සතර ම එක ම පොතකින් කොපි කරණ ලදූ යි සිතිය හැකි පමණට අතිශයින් සමාන ය. එබැවින් මෙය ශුද්ධියට පැමිණවීමට මහත් පරිශ්‍රමයක් දරන්නට සිදු විය. පෙළ අටුවා ටීකා ග්‍රන්ථයන්ගෙන් ඒ සඳහා ලැබූ ප්‍රතිෂ්ඨාව ප්‍රමාණ රහිත ය.

**විද්‍යොදය පරිවෙණාධිපති බද්දේගම ශ්‍රී ප්‍රියරතනාභිධාන** නායක මාහිමියන් වහන්සේගෙන් ද එහි ම උපප්‍රධානාචාර්ය්‍ය **පණ්ඩිත වැලිවිටියේ සොරත** ස්ථවිරයන් වහන්සේගෙන් ද මේ සඳහා ලැබුනු උපකාර නිසා ම මෙය මෙතරම් වත් ශුද්ධියකට පැමිණවිය හැකි වූ බව කෘතඥතා පූර්වක ව සඳහන් කරම්හ.

**උපකාරානුස්මරණ:—**

මෙය සම්පූර්ණයෙන් ශුද්ධියට පමුණුවනලද්දැ යි අපි නො සිතම්හ. මෙහි අපගේ සැකයට භාජන වූ ස්ථාන ද නොයෙක් ග්‍රන්ථයන් හා සසඳ බලාත් නොයෙක් විචක්ෂණයන් හා සාකච්ඡා කොටත් නිශ්චය කර ගත නො හැකි වූ සාවද්‍යස්ථාන ද ඇත්තේ ය. එබඳු ස්ථාන පිළිබඳ යථාර්ථය අවබොධ කරගත් භවත්හු අප වෙත දන්වා එවන්නාහු නම්, ද්විතීය මුද්‍රණාවස්ථාවෙහි එය කෘතඥතාපූර්වක ව සඳහන් කරණු ලබන බව ද මතක් කරම්හ.

**කළුකොඳයාවේ පඤ්ඤාසේඛර ස්ථවිර.**

**2480 ජූනි මස 30 වැනි දින**
**1936 විද්‍යොදය පිරිවෙණේ දී ය.**

# කඞ්ඛාවිතරණී පිටපත.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

**වන්දනා**- කායවාඞ්මනස් යන ද්වාරත්‍රයයෙන් වැන්ද යුතු වූ ත්‍රිවිධ වන්දනයට ද; **මාන**-ගුණ විසින් කරණ ආදරයට ද; **පූජා**- ප්‍රත්‍යයප්‍රතිපත්ත්‍යාදින් කරණ පූජාවට ද; **සක්කාර**- වන්දනාදිය සත්කොට කිරීමට ද; **ධම්මඤ්ච**-සපර්‍ය්‍යාප්තික නවලොකොත්තර සද්ධර්මය ද; **සඞ්ඝං ච**- අෂ්ටාර්‍ය්‍ය පුද්ගල සඞ්ඝයා ද; **විප්පසන්නෙන චෙතසා**-විශේෂයෙන් පහන්සිතින් හෙවත් විවිධප්‍රසන්න වූ චිත්තයෙන්; **වන්දිත්වා**-භය ලොභ කුලාචාරාදි විනා මනාකොට වැඳ;

**ථෙරවංස** මහාකාශ්‍යපාදිස්ථවිරවංශයට[1]; **පදීපානං**-ආගමාධිගමසම්පත්තීන් ප්‍රදීපභූත වූ; **විනයක්කමෙ**-විනයතන්ත්‍රක්‍රමයෙහි; **ථිරානං**- අකම්ප්‍ය වූ; ආරම්භානුරූපවචනමෙතං. [තෙ පන] සුත්තාභිධම්මෙසුපි ථිරා යෙව. **පුබ්බාචරියසීහානං**- පූර්වාචාර්‍ය්‍ය සිංහයන්ට හෙවත් ශෘගාලාදිතිරශ්චීනයන්ගේ සහනය ද හස්ත්‍යශ්වාදි චණ්ඩ සත්ත්වයන්ගේ හනනය ද කරන්නාවූ සිංහයන් මෙන් ශීතොෂ්ණාදි විරුද්ධප්‍රත්‍යයසඞ්ඛ්‍යාත වූ ශෘගාලාදීන්ගේ සහනය ද රාගාදි ක්ලේශසඞ්ඛ්‍යාත සත්ත්වයන්ගේ හනනය ද කරණහෙයින්, සිංහයන් වනු වූ පූර්වාචාර්‍ය්‍යොත්තමයන්ට; **කතඤ්ජලි**-බද්දිලි ඇති වැ; **නමො කත්වා**-නමස්කාර කොට;

"**විප්පසන්නෙන චෙතසා**" යන්නෙන් මනොවන්දනය කියන ලද. "**කතඤ්ජලි**" යන්නෙන් කායවන්දනය කියනලද. "**නමො කත්වා**" යන්නෙන් වාග්වන්දනය කියනලදී. **අනවජ්ජානං**-නිරවද්‍ය වූ; **ධම්මානං**-අවිප්‍රතිසාරාදි වූ හෝ සමාධි ආදි වූ හෝ දශකුශලකර්මපථචේතනා සමාධිප්‍රඥාසංඛ්‍යාත ධර්මයන්ට; **පාමොක්ඛං**- ආදි වූ හෙවත් ප්‍රධාන වූ; **මොක්ඛප්පවෙසනං**- නිර්වාණප්‍රත්‍යක්ෂකරණයට[1] **මුඛං**- ද්වාර වූ; **යං පාතිමොක්ඛං**-යම් ප්‍රාතිමොක්ෂයෙක්; **මහෙසිනා**-මහර්ෂීන් විසින්; **පකාසිතං**-ප්‍රකාශ කරණ ලද ද;

**සූරතෙන**- පරිශුද්ධ වූ ද්වාරත්‍රය ඇති බැවින්, අව්‍යතික්‍රම සඞ්ඛ්‍යාත ශුභයෙහි ඇලුනාවූ; **නිවාතෙන**-මානොද්ධත වසයෙන්; අත්තුක්කංසනයක් නැතිහෙයින් ස්ථවිරනව (ක) මධ්‍යමයන්

1. ස්ථවිරයන්ට.

කෙරෙහි නිවප්‍රවෘත්ති ඇති; **සුචි**-පරිශුද්ධ වූ; **සල්ලෙඛවුත්තිනො**-කෙලෙශයන්ගේ ද පරිෂ්කාරයන්ගේ ද තුනීබව කිරීම ය යන උභයසල්ලේඛනයෙන් යුක්ත බැවින් සල්ලේඛපැවතුම් ඇති; **විනයාචාරයුත්තෙන**-චාරිත්‍රවාරිත්‍රශීලයෙන් යුක්ත වූ; මෙතැන්හි '**විනය**' නම් වාරිත්‍ර ය. '**ආචාර**' නම් චාරිත්‍ර යි. **සොණත්ථෙරෙන**-සොණ නම් තෙරුන් විසින්; **යාචිතො**- ආරාධිත වූයෙමි;

**තත්ථ**- ඒ යථොක්ත ප්‍රාතිමොක්ෂයෙහි; **සඤ්ජාතකඞ්ඛානං**- 'මේ ශික්ෂාපදයෙහි කවර අර්ථයෙක් දෝ හෝ'යි යනාදීන් උපන් ශඞ්කා ඇති; **භික්ඛූනං**-භික්ෂූන්ගේ; **කඞ්ඛාවිතරණත්ථාය**-සැක දුරු කරණ පිණිස; **පරිපුණ්ණවිනිච්ඡයං**-අනූන වූ විනිශ්චය ඇති; **මහාවිහාරවාසීනං**-මහාවිහාරවාසී වූ ස්ථවිරවරයන්ගේ, **වාචනාමග්ගනිස්සිතං**- අර්ථකථාමාර්ගය ආශ්‍රය කොට පවත්නාවූ; **නාමෙන**-ගුණ නමින්; **කඞ්ඛාවිතරණිං**-කඞ්ඛාවිතරණී නම් වූ; **සුභං**-ශබ්දලක්ෂණ හෙයින් ද විනිශ්චය හෙයින් ද විශේෂ හෙයින් ද ශුභ වූ; **තස්ස**-ඒ ප්‍රාතිමොක්ෂයාගේ; **වණ්ණනං**- අර්ථවර්ණනාව; **කථයිස්සාමි**-කියමි.

**තත්ථ**- ඒ 'පාතිමොක්ඛං' යන ගාථාපදයෙහි; **පාතිමොක්ඛන්ති**- 'පාතිමොක්ඛං' යන්නෙහි අර්ථ කිමෙක් ද? යත්:- "**ප අති මොක්ඛං**" යනු පදච්ඡෙද ය. "**අතිපමොක්ඛං**" යනු උපසර්ගවිපර්යාස ය. "**අතිසෙට්ඨං**" යනු ශබ්දාර්ථ ය "**අතිඋත්තමං**" යනු අභිප්‍රායාර්ථ යි

**ඉති**-මෙසේ; **ඉමිනා වචනත්ථෙන**- මේ අතිශ්‍රේෂ්ඨ ය යන වචනාර්ථයෙන්, ශබ්දාර්ථයෙන්; **සීලගන්ථභෙදතො**- ශීලප්‍රාතිමොක්ෂ ග්‍රන්ථප්‍රාතිමොක්ෂභෙදයෙන් විවිධ වේ. **තථාහි**- වදාළේ මැ නො? **පාතිමොක්ඛසංවරසංවුතො**- ප්‍රාතිමොක්ෂසංවරශීලයෙන් යුක්ත වූයේ; **විහරතීති** ච-වෙසෙ යි කීහ ද; **එතං**-මේ ප්‍රාතිමොක්ෂසංවරශීලය; **කුසලධම්මානං**-චාතුර්භූමික කුශල ධර්මයන්ට; **ආදි**-ආදි ය; **මුඛං**-වාර ය; **පමුඛං**-ප්‍රධාන ය යන; **ආදිසු ච**-මේ ආදි පාලියෙහි ද; **උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි**-භික්ෂුභික්ෂුණී ප්‍රාතිමොක්ෂ දෙදෙන සවරූපයෙන්;[1] **අස්ස**-මොහට; **ස්වාගතානි**-නුවණට හමු වැ එති, මනා කොට පුහුණග යනාදි තන්හි ළ **තත්ථ**-ඒ දෙක්හි; **යො**-යමෙක්; **තං සීලං**- ඒ ප්‍රාතිමොක්ෂශීලය රක්ෂා කෙරේ ද? **තං**-ඔහු; "සීලං පාතිමොක්ඛං" යනු සම්බන්ධ යි. අපායාදි දුකින් හෝ, අනනානුවාදාදී භයින් හෝ; **මොක්ඛෙති**-නගා නු යි; **සීලං**-සීලයතෙම; **පාතිමොක්ඛං**- ප්‍රාතිමොක්ෂ නම් වේ; **ගන්ථො**-ග්‍රන්ථයතෙම; **තස්ස පාතිමොක්ඛස්ස**-

1. සවරයෙන්.

ඒ ප්‍රාතිමොක්‍ෂයා සම්බන්‍ධ ව; ඒ ප්‍රාතිමොක්‍ෂය; **ජෙට්ඨකත්තා**-බවුළ වන හෙයින් හෙවත් ප්‍රකාශ කරණ හෙයින් ද; **ආදිම්හි පන වුත්තො වචනත්ථො**- ආදියෙහි කියනලද 'අතිශ්‍රෙෂ්ඨ ය' යන වචනාර්‍ථය; **උභින්නම්පි**-ග්‍රන්‍ථශීලප්‍රාතිමොක්‍ෂ දෙදෙනාහට ම සාධාරණ ය. **තත්ථ**-ඒ දෙක්හි; "**අයං වණ්ණනා**" යනු වක්‍ෂ්‍යමාණාපෙක්‍ෂා යි. මේ වර්‍ණනා තොමෝ ශිලප්‍රාතිමොක්‍ෂයට ද ග්‍රන්‍ථප්‍රාතිමොක්‍ෂයට ද යෙදෙයි. ග්‍රන්‍ථය වර්ණනා කළ කල්හි ඔහුගේ අර්‍ථය තෙම වර්‍ණිත ම වේ. **තං එතං පන**-ඒ මේ ග්‍රන්‍ථප්‍රාතිමොක්‍ෂය වනාහි භික්‍ෂුප්‍රාතිමොක්‍ෂය, භික්‍ෂුණීප්‍රාතිමොක්‍ෂය යි දෙවැදෑරුම් වේ. **තත්ථ**-ඒ භික්‍ෂු භික්‍ෂුණී ප්‍රාතිමොක්‍ෂ දෙක අතුරෙහි; **සුණාතු** -පෙ- **සංඝොති** යනු ආදි පස් උදෙස් පරිච්ඡෙදයෙකින්; **වවත්ථිතං**-නිශ්චිත වූයේ; "අසඞ්කරතො කපිතං"[1] යු තැනි. **නිදානුද්දෙසො පාරා-පෙ-විත්ථාරුද්දෙසො** යන මොහු යි. **තත්ථ**-ඒ උද්දෙස යන් පස්දෙනා අතුරෙහි; **නිදානුද්දෙස** නම්:- **සුණාතු**[2] -පෙ- ධාරයාමි යි කියා; **අවසෙසෙ**-අවශිෂ්ටය; **සුතෙන සාවිතෙ**-ශ්‍රැතියෙන් ඇස්වූ කල්හි; ඇසුවිරූ බැවිනැයි සේයි; **උද්දිට්ඨො හොති**-කියනලද්දේ වෙයි. **පාරා**-පෙ-,පාරාජිකුද්දෙසාදීන්ගේ පරිච්ඡෙදයෝ, නිදානයාගේ ආදිය පටන් කොට පාරාජිකාදීන්;**ඔසාපෙත්වා**-තිමචා; යෙදිය යුත්තාහ. **අවසෙසං සුතෙන සාවෙතබ්බන්ති වචනතො**-අවශිෂ්ටය ශ්‍රැතියෙන් ඇස්වියයුත්තේ ය යි වදාළ බැවින්;

**එත්ථ**-මේ දෙක්හි; **යස්මා භික්ඛුපාතිමොක්ඛං පඨමං තස්මා තස්ස තාව වණ්ණනත්ථං ඉදං වුච්චති**- මේ ගාථා පදය කියනුලැබේ. **සවණාණත්තිසුවචනං**-'අසව'යි ඇණවීමෙහි හෙවත් ඇසීමෙහි යොදා කියන්නාවූ යාච්ඤාවචනයෙකැ යු තැනි. **සගාරවසප්පතිස්සවචනං**-ගෞරව ආදරයෙන් යුක්ත තෙපුලෙකැ; **පාතිමොක්ඛුද්දෙසකෙන**-පාමොක් උදෙසන්නහු විසින්; **වත්තබ්බං**-කියයුතු; **සබ්බමෙව චෙතං වචනං**-"**සුණාතු මෙ භන්තෙ සංඝො**" යන මේ සියලු වචනය; "යස්මා ඉදං පාතිමොක්ඛුද්දෙසකෙන වත්තබ්බවචනං, තස්මා ථෙරෙන වානුරූපතො වත්තබ්බං" යු තැනි. **ඨානතො**-පාල්‍යර්ථී දනී ද; **පටිබලො**-සිපිලධනිතාදිය කියහේ ද; **අවිසෙසතො**- 'ආගතියහා 'අනාගතියහ'යන තොරතුරක් නැති ව; **පුග්ගලසමූහො කිඤ්චාපි වුත්තො**-පුද්ගල සමූහය කිසිසේ කියනලද්දේ වී නමුදු; **අථ ඛො**-එතෙකුදු වුව; **සඞ්ඝො**-ඒ සම්මුති සංඝතෙම; **ඉමස්මිං පනත්ථෙ**-මේ උපොසථකර්මයෙහි වනාහි;

---

1 අසංකොපෙත ඝිතං. 2. තස්මා.

කත්තිකස්ස ච කාලම්හා යාව ඵග්ගුණපුණ්ණමා,
හෙමන්තකාලොති විඤ්ඤෙය්‍යො අට්ඨ හොන්ති උපොසථා.

ඵග්ගුණස්ස ච කාලම්හා යාව ආසාළ්හපුණ්ණමා,
ගිම්හානකාලොති විඤ්ඤෙය්‍යො අට්ඨ හොන්ති උපොසථා.

ආසාළ්හස්ස ච කාලම්හා යාව කත්තිකපුණ්ණමා,
වස්සකාලොති විඤ්ඤෙය්‍යො අට්ඨ හොන්ති උපොසථා.

උතූනං පන තිණ්ණන්නං පක්ඛෙ තතියසත්තමෙ,
චාතුද්දසොති පාමොක්ඛං උද්දිසන්ති තයඤ්ඤුනො.

**පකතිචාරිත්තං**-පියවිසිරිති; **පුරිමවස්සං වුත්ථානං පන**-පෙරවස් වසා නිමැවූවන්ට වනාහි; **භණ්ඩනකාරකෙහි**-කලහ කරන්නවුන් විසින්; **පච්චුක්කඩ්ඪන්ති**-පසුබහත් නම්; **අථ**-එකල්හි; කත්තිකමාස නම්, වප්මස අවය හා ඉල්මස පුරය යි. **කාලපක්ඛචාතුද්දසො වා**-වප්මස ගුණපොහොය වෙවයි; **ඔසාරිතෙ**-බහාගත් කල්හි; **තස්ස වත්ථුස්ස**-ඒ අධිකරණය; අඤ්ඤොපි **යො කොචි දිවසො**, **තස්මිං**-අනුපොසථදිවසෙ; **තදෙතං**-තං එතං පත්තකල්ලං; **ඉධ**-මෙ උපොසථාධිකාරයෙහි; **යථාහු**- මෙසේ කීහු;

**තත්ථ**- ඒ චතුර්විධප්‍රාප්තකාලයෙහි; **තස්මිං**- ඒ සඟරුස; **නාසති**-න අසති; නැත හොත් නැති; **පකතත්තා**-(උක්ඛිත්තක නුවූ)පාරාජිකාපන්න නොවූ; බද්ධසීමා නම් කම්වදන් කියවා බඳ සීමා යි. **නිමිත්තෙන නිමිත්තං සම්බන්ධිත්වා**-නිමිත්තයෙන් නිමිත්තය ගළපා; **සම්මතා සීමා**-බඳනාලද සීමා යි ඛණ්ඩසීමෙ **සීමාසම්මතා** නම්, සීමතො බහි ඨත්වා බද්ධ සීමායි. **ජාතස්සර** නම්, ස්වයංජාතවිලි. **සම්භින්දන්තෙන**-මුසු කරන්නහු විසින්; **සංසත්ත**- ඇලී සිටි; **අජ්ඣොත්ථරන්තෙන**-මඩනහු විසින්; **ඉමෙහි එකාදසහි ආකාරෙහි**-මේ එකාදස ආකාරයෙන්; **සීමතො කම්මානි විපජ්ජන්තීති වචනතො**-සීමා හෙයින් කර්මයෝ කොප්‍ය වෙතී වදාළ හෙයින්; **එකවීසති** යනු කර්මාංගයා හා සමඟ කීහු. **නිසීදිතුං**-පරිමණ්ඩලාකාරයෙන් යෙහෙන් හින්ද නො හෙද්ද; **කෙසග්ගමත්තෙනාපි**-කෙශාග්‍රමාත්‍රයකිනුදු; **අතික්කමිත්වා**-ඉක්මවා -පෙ- **අනිමිත්තුපගං**-නිමිත්තයට නො එළඹෙන; **තචසාරරුක්ඛං**-තාලනාළිකෙරාදි; **වාලිකා**-වැලිරැස යන මොවුන් කෙරෙහි; **අඤ්ඤතරං**-එක්තරා එකක්; **අන්තරා**-කිත්තිත නිමිත්තයන් අතුරෙහි; **එකං නිමිත්තං කත්වා**- එක් නිමිත්තක් කොට; **සබ්බෙන සබ්බං**-හැමපරිද්දෙන් ම; **තස්සා පදෙසං**-ඒ සීමාවගේ භාගයක් හෝ;

සම්මන්නතීති-බදිද්ද; නිමිත්තුපගානි යථා ලද්ධානි-නිමිත්තට එළඹෙනලද යම් නිමිත්ත කෙනකුත්; සම්මා කිත්තෙත්වා-නිමිත්තවිපල්ලාස නො කිරීමෙන් ද, අනිමිත්තානිකිත්තනයෙන් ද මනා කොට කියා; තත්‍ර-ඒ පබ්බතනිමිත්තං යනාදි පාලියෙහි; හත්ථිප්පමාණතො පට්ඨාය-, සත්රියන් පමණ ඇතකු සා පර්වතයෙහි පටන්; අයගුළම්පි- යදුකැටකුදු; රුක්ඛො-වෘක්ෂනිමිත්තය; උබ්බෙධතො- උසින්; පරිණාහතො-අවටින්; සූචිදණ්ඩප්පමාණොපි-හෙළදිවැඟි පත්ගිද්දඬක් සා ද වූ; වෙ තිණ්ණ ගාමක්ඛෙත්තානි- දෙතුන් ගම් කෙතක්;

අසන්දමානං- තො නො ගොස්; ආවාට-වළ; ජාතස්සර-විල්; ලොණි-කලපු; ඛතෙ-කනනලද; සන්දමානකං-නො සිඳෙන්නේ; විඤ්ඣාටවි ආදිසු වා-විඤ්ඣාටවි ආදි වූ ආරණ්‍යයෙහි වෙවයි; මජ්ඣබන්ධානං- කෙවුළන්; අගමනපථෙ-එ ද ගොස් එදම නො ඉය හැකි ස්ථානයෙහි; දීපකෙසු වා-දීපයෙහි වේවයි; විනිබ්බෙධෙන-එක් කිරීමෙන්, දිගිනැ යි සේයි. උපචාරත්ථාය-උපචාර පිණිස; සීමාසඞ්කර නොවන පිණිස ය යි සේයි. නදිආදිනං-නදිසරසමුද්‍රයෙහි: සීමභාවං-බදසීම්බව; පටික්ඛිපිත්වා-ප්‍රතික්ෂෙප කොට; යං-යම් තැනෙක්; සමන්තා-හාත්පසින්; මජ්ඣිමස්ස පුරිසස්ස-ථාමමජ්ඣිමපුරිෂයාගේ; උදකුක්ඛෙපා-උදකුක්ඛෙපයෙන් පරිච්ඡින්න ද; අයං-මේ ස්ථානය; තත්ථ-ඒ නදී ආදියෙහි; සමානසංවාසා එකූපොසථාති-සමානසංවාසා ය එකූපොසථා ය යි; යා පනෙසා වුත්තා-යම් මේ සීමාවක් වදාරණලද ද; "අයං උදකුක්ඛෙපසීමා" ය යි සම්බන්ධයි. සමානසංවාස නම් සෙසු සඞ්ඝකර්ම ය එකූපොසථ නම් උපොසථකර්ම ය; තත්ථ-ඒ පාලියෙහි, සබ්බා භික්ඛවෙ නදී අසීමා යන පාලියෙහි; යස්සා-යම් නදියෙක්හි; අඩ්ඪමාසං-අඩමසින් අඩමස; පිළිවෙළින් අඩමසක් වස්සී, අඩමසක් නො වස්සී යි සේයි. අනුදකාභාවෙහි දු මෙසේ මැ යි. සොතං-ජලප්‍රවාහය; පච්ඡිජ්ජති-සිඳී යේ ද; නදීසඞ්ඛං-නදීභාවයට නො යේ; යත්ථ-යම් නදියෙක්හි; "සික්ඛාකරණීයෙ ආගතලක්ඛණෙන තිමණ්ඩලං පටිච්ඡාදෙත්වා අන්තරවාසකං අනුක්ඛිපිත්වා තිත්ථෙන වා අතිත්ථෙන වා උත්තරන්තියා භික්ඛුණියා එකඞ්ගුලමත්තම්පි අන්තරවාසකො තෙමියති"යි සම්බන්ධ කරණු. පභවතො පට්ඨාය-දිය පවත්නා තැන් පටන් සමුද්‍ර දක්වා; කෙනචි ඛණිත්වා-සූකරාදි කිසිවක්හු විසින් කැන; යත්ථ-යම් ආවාටයෙක්හි; "යත්ථ නදියං වුත්තප්පකාරෙ වස්සකාලෙ උදකං සන්තිට්ඨති" යන්නෙන් දිය සිටිනා තෙක් කල් කීහු. යො සොබ්භො එවං ලක්ඛණං පාපුණාති-

නදියෙහි උක්තප්‍රකාර ලක්‍ෂණයට පැමිණේ ද; **සමන්තතො උදකුක්ඛෙපෙන පරිච්ඡින්නං**-හාත්පසින් දමනලද උදකයෙන් පරිච්ඡින්න ද යන අර්‍ථ යි. **තත්ථ**-ඒ උදකුක්ඛෙපයෙහි; **අක්ඛධුත්තා**-දූවරුවෝ;[1] **දූරංගුලං**-පස ඇට; **ඛිපන්ති**-යම්සේ ලද් ද; **සබ්බථාමෙන**- බලපමණින්; **එවං ඛිත්තං**-මෙසේ පසඇට ලත ආකාරයෙන් දමනලද; **උදකං වා වාලිකං වා යත්ථ පතති** යනු සම්බන්ධ යි. **තෙසු නදී ආදිසු උදකුක්ඛෙපපරිච්ඡින්නා අයං සීමා, සමානසංවාසා**-සමාන සංවාස ඇති නමුදු වෙයි. **එකූපොසථා** ඇතිනමුදු වෙයි. **අයං පන**-මේ උදකුක්ඛෙපය වනාහි; **අන්තොයෙව** සාරමස දිය සිටිතැනින් පරිච්ඡින්න වූ ඇතුළත්හි ම ලැබෙයි; **න බහි**-පිටත්හි නො ලැබෙයි; **ඔසරති**-මඩී ද; **පසාති විචියො**-පියවිරළහු; **ඔසරිත්වා**-බැස; **සණ්ඨහන්ති**-සිටිද් ද; **තතො පට්ඨාය**-එ දිය සිටිතැන් පටන් ගෙණ; **දුබ්බුට්ඨිකාලෙ වා**-වැසි නැති කල්හි වෙවයි; **සා එව**-සාරමසැ දියසිටිනා භූමිය ම; **වප්පං වා කරොන්ති**-පුබ්බන්නාපරන්න වපුරද්ද; **තං ඨානං**- එතැන ම; **උදකුක්ඛෙපසීමා**- උදකුක්ඛෙපසීමා නොමො; **න ගච්ඡති**- නො යේ; **කස්මා**-පිටතට නො යන හෙයින්; **පරිච්ඡෙදතො බහි**- උදකුක්ඛෙපපරිච්ඡෙදයෙන් පිටත්හි; **අඤ්ඤං තත්තකංයෙව පරිච්ඡෙදං**-අතික් එතෙක් ම තැන්; **අනතික්කමිත්වා**-නො ඉක්ම; **ඨිතොපි**- සිටියේ ද; උදකුක්ඛෙප දෙක අතුරෙහි උපචාර පිණිස තබනලද උදකුක්ඛෙපයෙහි සිටියේ මැ කම්කොප්‍ය කෙරෙයි සේයි. මෙයින් උපචාර පිණිස තබනලද තැන් මුත් සෙසු දිශායෙහි සිටියෝ කම්කොප්‍ය නො කෙරෙති යි සේයි. මෙ අර්‍ථ විවිධසීමා පිණිස යි.

**සභාගවත්ථුනා**- සමානව්‍යතික්‍රමයෙන්; "**ආපත්තිසභාගං**" යන්නෙන් වස්තුසභාගත්වය ප්‍රතික්‍ෂිප්ත යි **සාමන්තා**- සමීපයෙහි; **ආවාසං**-විහාරයකට; **සජ්ජුකං**-එද ම එනු පිණිස; **පටිකරිත්වා**- දෙසා; **එවං චෙතං ලභෙථ, එවං**-මෙසේ; **එතං**- මේ; **ලභෙථ**- ලැබුනේ වී නම්; **ඉච්චෙතං**- මේ ලැබීම; **කුසලං**-මැනැව; **නො චෙ ලභෙථ** සඞ්ඝාබුතවිහාර දුරු හෙයින් හෝ මඟ උපද්‍රව ඇතිහෙයින් හෝ සම්භාව නො වී නම්; **ඤාපෙතබ්බා**-දැන්විය යුතුයි. ඤත්ති කියා දැන්විය යුතු යි සේයි. **සචෙ දෙසෙති** යනු සම්බන්ධ යි. **උභොපි අඤ්ඤං දුක්කටං** යනු සම්බන්ධ යි; "**ආරොචෙතබ්බා වා**" යනු විමති පිණිස කීහු; **නිබ්බෙමතික** නම් ආපත්ති නිශ්චය කිරීම යි; "**සචෙ උපොසථං කරොන්ති**" යනු අභිප්‍රාය යි; **එතාසු හි**-මේ සභාගාපත්තීන් වනාහි;

---

1. දරුවෝ. දරුවෝ.

**යස්ස උපසම්පදා පටික්ඛිත්තා**-යමක්හට උපසම්පදා ප්‍රතික්ෂිප්ත ද; භික්ෂූන්ගේ ක්‍රියාව දන්නා නාගගරුඩදෙවාදීහු යි. **කාරකවසෙන යෙ තෙ තයො උපොසථා වුත්තා තෙසු**, තීසු උපොසථෙසු **ඉතරෙ මෙ පටික්ඛිපිත්වා**- "සඞ්ඝො උපොසථං කරෙය්‍යා"ති ඉමිනා **සඞ්ඝ උපොසථමෙව දීපෙතීති** යොජනා. **කාරකවසෙන**-උපොසථකාරකයන්ගේ වසයෙන්; **කත්තබ්බාකාරවසෙන**-කටයුතු ආකාර වසයෙන්;

**තිතික්ඛාසඞ්ඛාතා ඛන්ති**- තිතික්ඛාසඞ්ඛ්‍යාත ක්ෂාන්ති නම් දූය; **පරමං තපො**-මේ ශාසනයෙහි උතුම් තපස යි; **නිබ්බාණං**- නිවන්; **බුද්ධා**-ත්‍රිවිධ බුද්ධයෝ; **පරමං වදන්ති**- උතුමැ යි කියත්. **පරූපඝාතී**- ප්‍රාණාතිපාතාදි වශයෙන් පරහිංසා කරන්නේ; **න හි පබ්බජිතො**-ප්‍රව්‍රජිත නම් නො වේ. **පරං විහෙඨයන්තො**- උක්තප්‍රකාරයෙන් පරහට වෙහෙස දෙන්නේ; **සමණො න හොති**-සන්හුන් පාප ඇත්තේ ද නො වේ.

**සබ්බපාපස්ස අකරණං**-සියලු පව් නො කිරීම ද; **කුසලස්ස උපසම්පදා**- අභිනිෂ්ක්‍රමණයෙහි පටන් අර්හත්මාර්ග ප්‍රතිලාභය දක්වා සියලු කුසල් උපදවා, ඉපිදවූ කුසලයන් වැඩීම ද; **සචිත්ත පරියොදපනං**-පඤ්චනීවරණයන් කෙරෙන් තමාගේ සිත්සතන් පිරිසුදු කිරීම ද යන; **එතං**-මෙ; **බුද්ධානසාසනං**-සියලු බුදුන්ගේ අනුශාසනා යි;

**අනූපවාදො**-පටික්කොසනවශයෙන් උපවාද නො කිරීම නො කැරවීම ද; **අනූපඝාතො**-පරහිංසාවක් නො කිරීම නො කැරවීම ද; **පාතිමොක්ඛෙ ච**-ප්‍රාතිමොක්ෂයෙහි පිහිටීම ද; **සංවරො**-ඉන්ද්‍රියසංවරණය ද; **මත්තඤ්ඤුතා ච භත්තස්මිං**- භොජනයෙහි මාත්‍රඥබව ද; **පන්තං ච සයනාසනං**- විවික්ත ශයනාසනය ද; **අධිචිත්තෙ**- අෂ්ටසමාපත්තියෙහි; **ආයොගො**- ප්‍රයොග කිරීම ද යන; **එතං**-මේ සියල්ල; **බුද්ධානසාසනං**- බුදුන්ගේ අනුශාසනා යි;

**තං ඔවාදපාතිමොක්ඛං ඉමස්මිං අත්ථෙ**- "පාතිමොක්ඛං උද්දිසෙය්‍ය" යන අර්ථයෙහි, **ඉදමෙව අධිප්පෙතං**; **ඉතරෙ මෙ යෙ උපොසථා**-යම් ඒ පාරිසුද්ධි අධිෂ්ඨාන සඞ්ඛ්‍යාත උපොසථ කෙනෙක් ඇද්ද; **පච්ඡිමිකාය**- පස්වසන්හි; **අනුපගච්ඡනෙන වා**- මහපවුරුණෙහි උපසපන් වූයේ වෙවයි, සිහි නැති වැ වස් නො එළඹියේ වෙවයි; **ඡින්නවස්සෙන වා කායසාමග්ගිං දත්වාති සම්බන්ධො**. **චාතුමාසිනියම්පන**-හිල්මස මැදිපොහොයෙහි වනාහි; **පවාරිතානං සන්තිකෙ**-පැවැරූවන් සමීපයෙහි; **අනුපගච්ඡනෙන වා**- පෙරවස් නො විසූවහු විසින් වේවයි, **කායසාමග්ගිං දත්වා**-

හත්ථපාසොපගමනයෙන් කායසාමග්ගි දී; **පරිසුද්ධොති**-පිරිසුදු ය යි; මං මා; **ධාරෙථ**- සලකව්. **සන්නිපතිතෙසු**- රැස්වූ ඔවුන් අතුරෙහි; **ඉධ**-මේ පාමොක්හි; **නිද්දිට්ඨොති**- දක්වන ලදැයි; **තස්මිං පවත්තමානෙ**- ලක්ෂණසම්පන්න උපොසථය පවත්නා දවස්; **අභික්ඛුකං**- පාමොක්උදෙසක පමණ භික්ෂූන් නැති හෙයින් හෝ, ඇති ව ද පාමොක් නො පවත්නා හෙයින් හෝ අභික්ඛුක වූ; **ආවාසං වා**-ලැගුම්ගේ ඇති වාසයකට වේවයි; **අනාවාසං වා**- ලැගුම්ගේ නැති වාසයකට වේවයි; **වාසත්ථාය**- ලග්නා පිණිස; "**නානාසංවාසකෙහි සභික්ඛුකං ආවාසං අනාවාසං වා**"යි යොදනු. **උපොසථකරණසම්බන්ධෙන**- පොහෝ කිරීම් පිළිබඳ බැවින්; **වුත්තස්ස**- කියන ලද; **සඞ්ඝස්ස**-සඞ්ඝයා විසින්; තං කතං කින්ති යනු හා සම්බන්ධ යි. **අනුජානාමි**-පෙ- **ආදිනා නයෙන**; **පාළියං**-පෙළ; **සම්මජ්ජනී**-පෙ-**පුබ්බකිච්චන්ති වුච්චතීති**-ඒහි නාමෙහි අට්ඨකථාසු ච ආගතං යං තං නවවිධං පුබ්බකිච්චං දස්සිතං තං කින්ති පුච්ඡති" යි යොදනු. **ආසනෙන උදකඤ්ච**- ධම්මාසන හා සමග නහන බොන පැන් පරහා තිබීම ද යන; **එතානි**- මොහු සතරදෙන; **පුබ්බකරණන්ති වුච්චති**-පුබ්බකරණාති ඉති වුච්චන්ති, සඞ්ඝයා රැස් නො වන තෙක් කටයුතු හෙයින් පූර්වකරණයහයි කියනුලැබේ.

**ඡන්දපාරිසුද්ධි**-සඳ පිරිසුදු ගෙණඇර කීම; **උතුක්ඛානං**- සෘතු යෙහි සිටිකල් ගියකල් හිම් කීම; **භික්ඛුගණනා ච**- රැස් වූ මහණුන් ගිණීම ද; **ඔවාදො**-භික්ෂුණීන් යාචිත අවවාද පොහො ඇ කීම යන; **එතානි**-මොහු පස්දෙන; **පුබ්බකිච්චන්ති වුච්චති**- පුබ්බකිච්චානීති වුච්චන්ති, සඞ්ඝයා රැස්වූ කලැ කළ යුතු හෙයින් පූර්වකෘත්‍යයහ යි කියනු ලැබෙත්. **ඒහි නාමෙහි**- පූර්වකරණ පූර්වකෘත්‍ය නාමවශයෙන්; **කතං කින්ති**-කරණලද ද; **පුච්ඡති**- ප්‍රාතිමොක්ෂෝද්දෙශකයා විචාරයි යන අර්ථ යි; **තං නවවිධං පුබ්බකිච්චං, පානීයං පරිභොජනීයං උපට්ඨපෙතබ්බං**-ආගන්තුකයන් පිණිස නහන බොන පැන් පරහා තිබිය යුතු යි; **බහි**-සිමින් පිටත; **යොපි**-ඇතුළු සිම්හි හුන් යමෙක් වනාහි; **කිච්චපසුතො වා**- ගිලානුපස්ථානාදි කෘත්‍යයෙහි යුක්ත ද; **තෙනාපි ඡන්දො දාතබ්බො** යි යොදනු. "**ඡන්දං දම්මි**"යන්නෙන්, තමන් සමග බව කී නියා ය. "**ඡන්දම්මෙ හර**" යන්නෙන් අතිකෙකුට දීම් ආදීන් නො ගැණ ගියහොත් නැවැත දියයුතු බව කී නියා ය;"**ඡන්දම්මෙ ආරොචෙහි**" යන්නෙන් නො කීමෙන් අවදනා ඇවැතින් ද මිදෙනු කී නියා යි. **අසම්මොසො**-මේ ත්‍රිවිධ වචනාර්ථය; **කායෙන වා**- අර්ථ සලකා කායචලන කිරීමෙන් කයින් වේවයි; **වාචාය වා**- එසේ ම යම්

තෙප්ලෙකින් වේවයි; **එවං**–එසේකල්හි; **සන්ති සඞ්ඝස්ස කරණීයං**- සඞ්ඝස්ස කරණීයානි සන්ති, සෙසු සඞ්ඝකම් ඇත් නම්; **අත්තනො පත්තස්ස**–අත්තනො පත, ඔහු තමාගේ වනාහි; **සුද්ධිකඡන්දං වා**–හුදුසඳ වෙවයි; **ආහරිතුං**–ගෙණ යත් වටී; **සචෙ ඡන්දපාරිසුද්ධිං දෙති, තස්සෙව**– ඡන්දහාරකයාගේ ම; සඳපිරිසුදු එන්නේ යි; **ඉතරා**–ඉතර ඡන්දපාරිසුද්ධි තොමෝ; **බිළාලසඞ්ඛලිකඡන්දපාරිසුද්ධි නාම හොති**–බළල් දමක් වැනි සඳපිරිසුදු වේ; දම පළමුවන වලල්ල දෙවන වලල්ලට මුත් තුන්වන වලල්ලට නො පැමිණෙන්නා මෙනැ යි සේයි.

**උපොසථග්ගෙ**–පොහෝගෙහි; උපොසථය ම උපොසථාග්‍ර නම් වේ. **ඉදම්පි හි උභයං** යනු කුමක් පිණිස කියනලද ද? යත්:– "සෙසු සම්මජ්ජනාදීහු තෙරුන් විසින් අණවන ලද්දහු විසින් කටයුත්තාහ" යි ද, "උතුආචික්ඛණ භික්ඛු ගණනාවෝ වනාහි– මහතෙරුන් විසින් වෙවයි, පාමොක් උදෙසන්නහු විසින් වෙවයි, ඤත්ති තබන්නහු විසින් වෙවයි, අතික් යම්තම් කෙනෙකුන් විසින් වෙවයි කටයුත්තාහ"යි ද, "සම්මජ්ජනාදීහු එවනු ප්‍රයොජනයන් සපයති. උතු ආචික්ඛණාදි දෙදෙන වනාහි උපොසථයෙහි කිසි ප්‍රයොජනයක් නො සපයති. එබැවින් කිරුමෙන් ප්‍රයොජන කිමෙක් දැ?යි නො කියා අවශ්‍ය යෙන් ම කටයුත්තාහ" යි ද දක්වනු පිණිස "**ඉදම්පි හි උභයං**"යි කීහු.

**භික්ඛුනොවාදෙති**-භික්ඛුණී ඔවාදෙ; මෙහෙණන් විසින් යාචි තොවාද යි. **ස්වෙ උපොසථොති**-සෙට පොහොය යි කීකල; **අයං උපොසථො**–අප සෙට කරණ මෙ පොහොය; **අය්‍ය**–ස්වාමි; **ඔවාදූපසඞ්කමනං ච යාචති**–ඔවාද පිණිස නමන්ගේ ඊම ද ආරාධනා කෙරෙති. **භික්ඛුනීසඞ්ඝො ඔවාදූපසඞ්කමනං ලභතු කිර** යි යොදනු. **ලභතු කිර**–ලැබේවා; **තං**–ඒ අවවාදයාචනය; **ඨපෙත්වා බාලගිලානගමියෙ**–සිත් ගෙණ වරද කිය[1] නො හෙන බාලයා ද,[2] පොහොඅගට ගොස් නො කිය හෙන ගිලනු ද, පැළම්ය දවස් ගමන් යන ගමනීහු ද තබා; **අඤ්ඤො**–සෙසු; **සචෙ ආරඤ්ඤකොපි හොති**–ඉදින් ආරණ්‍යක භික්ෂුවෙක් වි නමුදු; නො පිළිගත් නට නොවටනේ යි. **යස්මා අපටිග්ගහෙතුං න ලභති තස්මා, යෙන**–යමක්හු විසින්; **සො**– ඒ අවවාදය; **තෙන භික්ඛුනා**–පෙ–ඛමනන්ති **එවං වත්තබ්බො. සම්මතො චෙ හොති** යි යොදනු.

---

1. සුත්ගෙන පෙර ද කීය.
2. ආරොචනවිධානං අජානන්තො බාලො–ටීකා.

**සෙනාති**- පාතිමොක්ඛුද්දෙසකෙන; **සොති**-සො භික්ඛුනො වාදකො. **සම්මතො**-පෙ-**උපසඞ්කමතූති වත්තබ්බා** යි යොදනු. **තෙනාති** පාතිමොක්ඛුද්දෙසකෙන භික්ඛුණොවාදකො සම්මතො කොච් භික්ඛු සචෙ හොති යි යොදනු **කො ආයස්මා උස්සහති**- කවර ආයුෂ්මතෙක් සමර්ථ ද? යි; **අට්ඨහි අඞ්ගෙහි සමන්නාගතො** යන්නෙහි:- 'සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, බහුස්සුතො හොති සුතධරො සුත සන්නිචයො යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරි යොසානකල්‍යාණා සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරි සුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටි විද්ධා, උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො ව්‍යඤ්ජනසො, කල්‍යාණවාචො[1] හොති කල්‍යාණ වාක්කරණො, යෙභුය්‍යෙන භික්ඛුණීනං පියො හොති මනාපො, පටිබලො හොති භික්ඛුණියො ඔවදිතුං, න ඛො පන තං භගවන්තං උද්දිස්ස පබ්බජිතාය කාසායවත්ථවසනාය ගරුධම්මං අජ්ඣාපන්න පුබ්බො හොති, වීසතිවස්සො වා හොති අතිරෙකවීසතිවස්සො වා" යන මේ අෂ්ටාඞ්ගයෙන් සමන්විත ද;

**තත්ථෙව**-ඒ උපොසථාග්‍රයෙහි දී ම; **සම්මන්නිත්වා**-සම්මත කොට; **ඉත්ථන්නාමො**-පෙ-**උපසඞ්කමතූති** ඔවාදපටිග්ගාහකො **වත්තබ්බො. පාසාදිකෙන**-ප්‍රසාදකර වූ කායවාඞ්මනඃකර්මයෙන්; **සම්පාදෙතූ**-අධිශීල අධිචිත්ත අධිප්‍රඥ සඞ්ඛ්‍යාත ත්‍රිවිධශික්ෂාවන් ප්‍රතිපාදනය කෙරේවයි; **සික්ඛාත්තයසඞ්ගහිතං**-අධිශීලාදි ශික්ෂා ත්‍රයයෙහි සඞ්ගෘහීත වූ; **සකලසාසනං**-සියලු ප්‍රවචනය; **තෙන භික්ඛුනා**- ඔවාදපටිග්ගාහකෙන භික්ඛුනා; **භික්ඛුණිසඞ්ඝස්සපි, අය්‍යා ගච්ඡථ**-ආර්යාවෙනි! යව්. **අය්‍ය**-ස්වාමීනි! **භික්ඛුණිසඞ්ඝො ඔවාදූපසඞ්කමනං, ලභති කිං**-ලැබේද්ද යි; **පුච්ඡථ**-විචාරව යි; **තා භික්ඛුණියො පෙසෙතබ්බා** යි යොදනු. **සාධු අය්‍යාති**- සාධු අය්‍යා ඉති; **තං භික්ඛුනති** ඔවාදපටිග්ගාහකභික්ඛුං; **ඉදං ච**-'තාහි' යන මේ බහුවචනය ද;

**තෙන භික්ඛුනාති**-ඔවාදපටිග්ගාහකෙන භික්ඛුනා; **උපොසථාගාරෙ**-පොහෝ කරණහල්හි; **පාතිමොක්ඛුද්දෙසකෙන වා**- පාමොක් උදෙසන්නහු විසින් වෙවයි; **ඤත්තිඨපකෙන වා**-

1. කල්‍යාණසො වාචෙතා හොති.

ගණූපොසථයෙහි ඤත්ති තබන්නහු විසින් වෙවයි; **ඉතරෙන වා**- දෙදෙනා කරණ පොහොයේ එකකු විසින් වෙවයි; **පාටිපදෙ පච්චාහරිත්වා**-පැලවියදවස් ගෙණ ඇර; “**පාති**-පෙ-**මී**”ති, **ඉදන්ති**-ඉදං වචනං; **පාරිසුද්ධිආරොචනස්ස කාරණවචනං**-තම තමන්ගේ පිරිසුදුබව කීමට කාරණවචනයෙකි;“පාමොක් උදෙසමි. තොප, තොපගේ පිරිසුදුබව කියව. තො එසේ වැ පාමොක් ඇසුව සම්පජානමුසාවාදයෙන් දොස් වෙයි. එසේ හෙයින් පිරිසුදු බව කියව”යි පිරිසුදු කිරීමට කාරණවචනයෙකැ යි සේයි. **එත්ථ**- පාතිමොක්ඛං උද්දිසිස්සාමි යන පදයෙහි; **සියා**-චොදනාවෙක් වන්නේ යි. **ඉධාති**-පාතිමොක්ඛං උද්දිසිස්සාමි යනුයෙහි; **එවං සති**-එසේ වුව හොත්; **පුබ්බෙන** -පෙ- **සඞ්ඝා** -පෙ- **උද්දිසෙය්‍ය** යනු හා උද්දිසිස්සාමි යන පූර්වපදය හා; **අපරං පාතිමොක්ඛං උද්දිසිස්සාමීති** යන පදය හා; **සඞ්ඝති**- හැනේ. **වුච්චතෙ**- පරිහාර කියනු ලැබේ; **එතං**-මෙ; **වචනමත්තං**-වචනමාත්‍රයෙක; ශබ්ද නානාත්වයෙකැයි සේයි; **ලක්ඛණතො පන සමෙති**-ලක්ඛණ හෙයින් “සඞ්ඝා-පෙ-උද්දිසෙය්‍ය”යනු හා සම යි; **සඞ්ඝස්ස සාමග්ගියාති**- අරියසඞ්ඝස්ස සාමග්ගියා; **ගණස්සාති**- අනරියසඞ්ඝස්ස; සඞ්ඝස්ස සාමග්ගියා යනුයෙන් ආර්‍ය්‍යසඞ්ඝයා ම ගැණෙති යි සිතා **ගණස්ස සාමග්ගියා** යුහු. **පුග්ගලස්සාති**- පාතිමොක්ඛුද්දෙසකස්ස; **සඞ්ඝස්සාති**- සඞ්ඝසන; **පාතිමොක්ඛං උද්දිට්ඨං** හොති යි යොදනු. සඞ්ඝයා සමග වැ මැ එකකුගේ උදෙසීමෙන් සඞ්ඝයා උදෙසුවා නම් වනබැවින් උද්දිසිස්සාමි යනු උද්දිසෙය්‍ය යනු හා ලක්ෂණ හෙයින් සම ය යි සේයි. **එත්ථ**-මෙ පාමොක්හි; **ඉදං**-මේ සියල්ල; **ලක්ඛණං**-ලක්ෂණ යි.

**අභිකත්වාති** අර්පී කොට; ව්‍යාස කොට ය යි සේ යි. නොහොත් අර්පී ව; **මනසිකත්වා**-මෙනෙහි කොට; මෙසේ අසමු. **සොතද්වාරවසෙන සබ්බචෙතසා**- සොතද්වාරජවනවිඤ්ඤාණ වසයෙන් ප්‍රවෘත්ත සියලු චිත්තවාරයෙන්; **සමන්නාහරාම**- පරියොසානය දක්වා විසය කරම්හ යි සේයි. එසේ ගත් දෙය ද, **එකග්ගචිත්තා හුත්වා**-ඇසූ එ මැ අරමුණු අග්‍ර කොට ඇති සිත් ඇති වැ; **චිත්තෙ ඨපයාම**-සිත්හි තබමු; අභිකත්වා මනසි කරිත්වා යනු **සාධුකං** යන්නෙහි අර්ථපද යි; **එත්ථ චාති** සුණොම මනසිකරොමාති ඉමස්මිං පාඨවයෙ; **පාති**-පෙ-**යුත්තානං විය කිඤ්චාපි දිස්සති** යි යොදනු. පැණේ නමුදු; **පාරිසුද්ධිං**-පෙ-**ආරොචෙථාති තං වුත්තන්ති** සම්බන්ධො. **තත්ථ පාරිසුද්ධිආරොචනං කථං හොති ඉදානි තං දස්සෙතුං** යි යොදනු.

**තත්ථාති** තෙසු සුත්තපදෙසු; **ජනිතං**-පෙ-**ආපත්ති යස්ස භවෙය්‍ය, අලජ්ජිතාති** අලජ්ජිතාය; **කුක්කුච්චපකතත්තා**-කුකුසින් මඩනාලද බැවින්; **ආපත්තිං ති**-පෙ-**ඡහාකාරෙහි ආපජ්ජති** යි යොදනු. **පරිගුහති**-සඟවා ද; **අගතිගමනඤ්ච ගච්ඡති**-භණ්ඩ භාජනීයට්ඨානාදියෙහි ඡන්දාදි සතරඅගතියට යේ ද; අගන්තබ්බා ගති=අගති. **මන්දො**-නුවණ නැත්තේ; **මොමූහො**-මොහයෙන් මුළා වූයේ; **විරොධෙති**-වරදවා කෙරෙයි සේයි; **අසං පන**- කුකුසින් මඩනාලද මෙ මහණ වනාහි; **වදවනීති**-පාලියට්ඨකථා විනිශ්චය නො කොට වටනේ ය යි; **මද්දන්තො වීතික්කමති සෙව**-මැඩ කායවචීද්වාර වීතික්‍රමය කෙරේ මැ යි. **සහසෙය්‍යචීවරවිප්පවාසාදීනි**-සහසෙය්‍යචීවරවිප්පවාසාදි ශික්ෂාපදයන්;

**පතාසෙතු වා** යනු පාරාජිකා පිණිස යි. **වුසිතා වා** යනු සඞ්ඝාදිසෙස පිණිස යි. **ආරොචිතා වා** යනු විමතිආරොචනා පිණිස යි. **ආපන්නා යස්ස නත්ථාති** සම්බන්ධො. **සාපත්තීති** සා ආපත්ති; **එකෙන පුණෙණ එකො යථා ව්‍යාකරෙය්‍ය**-යම්සේ ප්‍රති වචන දේ ද; **එස මං පුච්ඡතීති, එසා නාම**-මෙහි වනාහි; **එකමෙව ආචරියා**-සමහර ධර්මධර ඇදුරුකෙනෙක්; **යස්ස සියා**-පෙ-**වෙදිසාමීති, යදෙතං තික්ඛත්තුං අනුසාවිතං**-යම් මෙ වචනත්‍රය යෙක් තුන්යලෙක් අස්වනලද ද; **තං**-ඒ වචනත්‍රයය; **එකමෙකෙන**-එකක්හු එකක්හු විසින් මැ; **තං**-ඒ වචනත්‍රයය අනුසාවනබව; **අත්ථව්‍යඤ්ජනභෙදතො**-අර්ථ හෙයින් ද, ව්‍යඤ්ජන හෙයින් ද, භෙද හෙයින් ද; වෙනස් හෙයින් දැ යි සේයි. **තෙන**-එහෙයින්; භින්නබැවිනැයි සේයි. **අස්ස**-**යස්ස සියාති** යනාදි වචනත්‍රයයාගේ; **යදි ච සියා** යි යොදනු; **අනාපත්තිකොතෙන**-ඇවැත් නො වැද්ද පුතුහත්හි; **අපරෙ**-අර්ථදර්ශිස්ථවිරප්‍රමුඛයෝ; **ආහු** යනු සම්බන්ධ යි; **අනුසාවියතීති පදස්ස අත්ථං**-අනුසාවිතං යන පදයාගේ අතීතාර්ථය; **විසජ්ජෙත්වා අනුසාවෙතබ්බං** යී අනාගතාර්ථ කොට සිතා ගෙණ; **උපරි උද්දෙසාවසානෙ**-මතුයෙහි පාරාජිකොද්දෙශයාගේ අවසන්හි; **තම්පි**-තෙ ද; **ඉදං හි පදනති**-අනුසාවිතනති ඉදං පදං; **කෙචීති** ඛන්ධකභාණකා; **සජ්ඣායන්තීති** උපොසථක්ඛන්ධකෙ සජ්ඣායනාහි; **තං**-ඒ සජ්ඣායනය; **අස්ස**-අනුසාවිතං යන මේ පදයාගේ; **අත්ථං**-මේ අනාගතකාලය; **යදි අත්ථො සියා**-අර්ථ වී නම්; **වදෙය්‍ය**-සජීඥ කියන්නේ යි; **එතං**-අනුසාවිතං යන පදය; **උද්දෙසාවසානෙ**- පාරාජිකුද්දෙසාවසානයෙහි; **වචනං**-යාවතතියානුසාවනවචන සම්බන්ධය පිණිස; **යදි ච වුත්තං සියා**-කියනලද්දේ වී නම්; **යාවතතියං අනුසාවිතං**

**හොතීති**-යාවතතියං අනුසාවිතං හොති යන; **ඉදං**- මෙ වචනය; **ලක්ඛණවචනමත්තං**- යාවතතියානුසාවනය හඳුන්වන වචන මාත්‍රයෙකි; විහනවචනයෙකැ යි සේයි.

**තෙන**-ඒ වචනමාත්‍රයෙන්; **ඉමමත්ථං දස්සෙති**- මෙ අර්ථය දක්වා; කිමෙක් ද? යත්:- **ඉදං පාති**-පෙ-**මුසාවාදො හොති** යන මේ යි. **තදෙතන්ති**- තං එතං යාවතතියානුසාවනං; **යථා අනුසාවිතං**-යම් සේ අස්වනු ලද්දේ; **උද්දෙසකාලෙ**-පාමොක් කියන කලැ; **ඉමමෙවත්ථං සන්ධාය**- මේ යාවතතියානුසාවනාර්ථ පිණිස; **එත්ථ**- යාවතතියානුසාවිතං යන පදයෙහි; **අයං විනිච්ඡයො**- මේ විනිශ්චය; **ආචරියපරම්පරාභතො**- ආචරියපරම්පරායෙහි ආයේ යි;

**තෙන**-ඒ මුසාවාදයෙන්; **අස්ස**-ඒ මහණහට; **දුක්කටාපත්ති හොති**-දුකුළා ඇවැත් වේ. **සා ච ඛො පන**- ඒ දුකුළා ඇවැත් ද; **අකිරියසමුට්ඨානාපත්ති හොතීති**- අක්‍රියායෙන් වූ ආපත්ති වේ ය යි; **යස්ස සියා ආපත්ති සො ආවිකරෙය්‍ය** යි වදළ නියොග නො කළ හෙයිනැ යි සේයි.

**කෙනචි මනුජෙන**-කිසි සතක්හු හා; **අනාලපන්තො**-නො බණන්නේ; **වාචාය**-වචසින්; **ගිරං**-තෙපුලක්; **පරෙ**-මෙරමාහට; **නො ච භණෙය්‍ය, වාචසිකං**- වචසින් වූ; **න කායිකං**-කායික නො වන්නා වූ ඇවතක්; **ආපජ්ජෙය්‍ය**-අවදනේ ය; **පඤ්හා මෙසා කුසලෙහි චින්තිතා**-**එසො පඤ්හා**-මේ ප්‍රශනය; **කුසලෙහි**- විනයධරයන් විසින්; **චින්තිතො**-සිතනලදී;

**විප්පටිසාරවත්ථුතාය**- කළකිරීමට කාරණ වනහෙයින්; **පාමොජ්ජාදිසම්භවං නිවාරෙති**-ක්ෂුද්‍රප්‍රීත්‍යාදි සම්භවය වළකා; ආදි ශබ්දයෙන් බලවත් ප්‍රීතිප්‍රශ්‍රබ්ධිය ගත්හු. **අධිගමාය**-ප්‍රතිවෙධයට;ප්‍රතිලාභයට ය යි සේයි;**වුට්ඨාතුකාමෙන**-සඞ්ඝාදිසෙසාපත්තීන් නැඟෙනු කැමැත්තවු විසින්; **විසුජ්ඣිතුකාමෙන**-ක්ෂුද්‍රාපත්තීන් ශුද්ධ වනු කැමැත්තවු විසින්; "සඞ්ඝමජ්ඣෙ ආරොචෙස්සාමී"ති අධිප්පායෙන ආරොචෙන්තො **සඞ්ඝමජ්ඣෙ ආරොචෙති** නාම; උභතො පස්සෙ නිසින්නානං ආරොචෙන්තො **ගණමජ්ඣෙ**. "එකස්ස ආරොචෙස්සාමී"ති අධිප්පායෙන ආරොචෙන්තො **එකපුග්ගලෙ ආරොචෙති** නාම. **අවිප්පටිසාරමූලකානං**- නො කළ කිරීම මුල් කොට ඇති; **පාමොජ්ජාදීනං**-ප්‍රමොද්‍යාදීන්ගේ වශයෙන්; **සුඛාපටිපදා**-සුවයෙන් පිළිපැදීම; **සම්පජ්ජතීති අත්ථො**- සම්භව වන්නේ ය යන අර්ථ යි.

**නිදානවණ්ණනා නිට්ඨිතා.**

**නිදානානන්තරං**–නිදානානන්තර කොට; **යදෙතං පාරාජිකකණ්ඩං**–යම් මේ පාරාජිකකාණ්ඩයෙක් දක්වනලද ද; තස්ස අත්ථවණ්ණනාක්කමො ඉදානි අනුප්පත්තොති යොජනා. **තත්ථ** ඒ පාරාජිකකාණ්ඩයෙහි; **තත්‍රාති**, **තස්මිං පාතිමොක්ඛෙති** සම්බන්ධො; **සරූපෙන**–තමන් තමන්ගේ නමින්; **රස්සදීඝාදිනාති**, හ්‍රස්ව දීර්ඝ ස්ථූල කෘශාදි වූ ද; **ලිඞ්ගාදිභෙදෙන**–ලිඞ්ග-වණ්ණ-කාල- අපදෙශාදි ප්‍රභෙදයෙන් යුක්ත වූ; **යො කොචි**–යම් යම් කිසිවෙක්; ලිඞ්ග නම්, සංස්ථාන යි. වර්ණ නම් කාලශ්‍යාමාදි යි. කාල නම්, සගකල් මාලුකල් ආදි යි. අපදෙශ නම් තිස්ස පුස්සාදි නාම යි.

**එහිභික්ඛූපසම්පදා** නම්, අන්තිම භවික වූ පූර්වහෙතුසම්පන්න පුද්ගලහට "එහි භික්ඛු චර බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්සන්තකිරියාය"යි දෙන උපසම්පත්ති යි; **සරණාගමනූපසම්පදා** නම්, "බුද්ධං සරණං ගච්ඡාමි" යනාදි නයින් තුන්විටක් වාග්භෙද කොට ප්‍රථම බොධියෙහි දුන් උපසම්පත්ති යි. බුදු වූ එක්විසිගවුරුද්දෙක් ප්‍රථම බොධි නම් වෙයි. **ඔවාදපටිග්ගහණූපසම්පදා** නම් "තස්මාතිහ තෙ කස්සප එවං සික්ඛිතබ්බං" යනාදීන් ස්ථවිර නවමධ්‍යමයන් කෙරෙහි හිරිඔතප් ද, ධර්මදෙශනා අර්ත්ථි වැ මෙනෙහි කොට ඇසීම ද, කායගතාසතිමනසිකාර ද යන වදාළ තුන් අවවාදයන් පිළිගැන්මෙන් වූ උපසම්පදා යි. **පඤ්හබ්‍යාකරණූපසම්පදා** නම් දශඅශුභවිෂයයෙහි බුදුන් පුළුවුත් ප්‍රශ්න විසර්ජන කළ **සොපාක** සාමණේරයන්ට අනුදත් උපසම්පදා යි. **ගරුධම්මපටිග්ගහණූපසම්පදා** නම් "වස්සසතූපසම්පන්නාය භික්ඛුණියා තදහුපසම්පන්නස්ස භික්ඛුනො අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං කාතබ්බං, අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයො. න භික්ඛුණියා අභික්ඛුකෙ ආවාසෙ වස්සං වසිතබ්බං, අයම්පි ධම්මො–පෙ–අනතික්කමනීයො. අන්වද්ධමාසං භික්ඛුණියා භික්ඛුසඞ්ඝතො ද්වෙ ධම්මා පච්චාසිංසිතබ්බා උපොසථපුච්ඡනං ච ඔවාදූපසඞ්කමනං ච, අයම්පි ධම්මො–පෙ–. වස්සං වුට්ඨාය භික්ඛුණියා උභතොසඞ්ඝෙ තීහි ඨානෙහි පවාරෙතබ්බං දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා, අයම්පි ධම්මො–පෙ–. ගරුධම්මං අජ්ඣාපන්නාය භික්ඛුණියා උභතොසඞ්ඝෙ පක්ඛමානත්තං චරිතබ්බං, අයම්පි ධම්මො–පෙ–. ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය සික්ඛමානාය උභතොසඞ්ඝෙ උපසම්පදා පරියෙසිතබ්බා, අයම්පි ධම්මො–පෙ–. න භික්ඛුණියා කෙනචි පරියායෙන භික්ඛු අක්කොසිතබ්බො පරිභාසිතබ්බො, අයම්පි ධම්මො–පෙ–. අජ්ජතග්ගෙ ඔවටො භික්ඛුණීනං භික්ඛූසු වචනපථො අනොවටො භික්ඛූනං භික්ඛුණීසු වචනපථො, අයම්පි ධම්මො

සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයො" යි වදළ මේ **අට්ඨධම්ම** පිළිගත්කල **මහාපජාපතීගොත**මින්දූට අනුදත් උපසම්පදා යි.

**දූතෙන උපසම්පදා** නම් අඩ්ඪකාසි නම් ගණිකාවට අතික් තැනෙක්හි දී ව්‍යක්ත ප්‍රතිබල මෙහෙණක දූත වැ අවුත් භික්ෂුසඞ්ඝයා කරා එළඹ උපසම්පත්තියට ආරාධනා කළකලැ පරම්මුඛයෙහි මැ ඤත්ති කම්වදන් කියවා උපසම්පත්ති කරණ පරිද්දෙන් අනුදත් උපසම්පදා යි. **අට්ඨවාචිකාඋපසම්පදා** නම් භික්ඛුණීසඞ්ඝයා කෙරෙන් ඤත්තිචතුත්ථකම්මයෙන්ද භික්ඛුසඞ්ඝයා කෙරෙන් ඤත්තිචතුත්ථකම්මයෙන් දු යි යන මේ කම්වයයෙන් මෙහෙණන්ට අනුදත් උපසම්පදා යි. **ඤත්තිචතුත්ථඋපසම්පදා** නම් භික්ෂූන්ට මෙසමයෙහි දෙන උපසම්පදා යි. **ඨානාරහෙන**–තථාගතොවාදයට තිසි වූ;

**ආසිත්තපණ්ඩක** නම්, මෙරමාගේ හඳන් මුයෙන් ගෙණ අසුචි අජ්ඣාහරණයෙන් ආස්වාද කළකල්හි සන්හිඳෙන කාමදාහ ඇත්තේ යි. **උසූයපණ්ඩක** නම්, මෙරමාගේ අධ්‍යාචාර දක ඊෂ්‍යා උපදවා ගත්කල්හි සන්හිඳෙන කාමපරිදාහ ඇත්තේ යි. **ඔපක්කමිකපණ්ඩක** නම් නිමිත්ත සංඛ්‍යාත බීජෝද්ධරණ කෙළේ යි. **නපුංසක** නම් පිළිසඳ මැ අඞ්ගවිකල යි. **පණ්ඩකභාවපක්ඛෙ**– පණ්ඩක වූ කාලපක්ෂයෙහි; **පක්ඛපණ්ඩකොව**-පක්ෂපණ්ඩක මැ මෙතෙන අභිමතයි. පක්ඛපණ්ඩක නම් කාලපක්ෂයෙහි ස්ත්‍රී වැ ජුණ්හපක්ෂයෙහි පිරිමි වන්නේ යි. **න භික්ඛුවස්සානි ගණෙති**– උපසම්පන්න වූයේ මෙතෙක් කල් යි වස් නො ගණී ද; **ආසනෙන**– භික්ෂූන් හුනස්නෙන් මෙ අස්න මට පැමිණෙයි; **න පටිබාහති**– නො නහා ද; **උපොසථාදිසු**– උපොසථාදිසඞ්ඝකම්යෙහි; **න ගණ්හිස්සති**– ගණපූරකවසයෙන් නොපැණේ ද; **අයං**– මෙතෙමෙ; **අසුද්ධචිත්තතාය**–අසුද්ධචිත්තයෙන්, වඤ්චාචිත්තයෙන්[1] ද; නොසුදුසු බව දූන ය යි සේයි. එසිවුරෙහි, **සඋස්සාහොව**- සොත්සාහ වැ මැ; සාලය වැ මැ ය යි සේයි. **ලිඞ්ගානුරූපස්ස**- සාමණේරලිඞ්ගයට සුදුසු වූ; **සංවාසස්ස සාදිතත්තා**- අභිවාදනාදි සාමණේරසංවාසය ඉවසූ හෙයින්;

**චීවරගහණත්ථං** වා-ගෙට ගොස් හළ සිවුරු නැවත ඇර දෙනු පිණිසද; **ඉධ**–මේ ශාසනයෙහි; **සො**–යමෙක්; **ලිඞ්ගං ආදියති**– මහණවෙස් ගණී ද; 'ලිඞ්ගං ආදියති' යන්නෙන් ලිඞ්ගත්ථෙනක නො වනබව කීහු. **සො**–හෙතෙම; **සුද්ධමානසො හුත්වා**–සුද්ධ

1. වාචාචිත්තයෙන්-හැම.

වූ සිත් ඇති වැ; රජභයාදි නැතිකලැ ය යි සේයි. **යාව**- යම්තාක්; **සංවාසං නාධිවාසෙති**-සංවාස නො ඉවසා ද; **තාව**- ඒ තාක්; **එසො**- මෙතෙමෙ; **ථෙය්‍යසංවාසකො නාම න වුච්චති** යි යොදනු.

**උපසම්පන්නොති** උපසම්පන්නො හුත්වා; **තෙසං**-ඔවුන්ගේ; **වතානි**-කෙසලුඤ්චනාදිව්‍රතය; **ආදියති**- ගණී ද; **සයම්පි මනුස්සභූතොයෙව යෙන**- තමා ද මනුෂ්‍ය වූ ම යමක්හු විසින් සංසිඬ වචන ප්‍රයොග කොට; **පකතත්තං**-සිල්වත්; **භික්ඛුණිං දූසෙති** යනු සම්බන්ධ යි. **සාසනං**-ප්‍රවචනය; **උද්ධම්මං උබ්බිනයං කත්වා**-පහ කොට; ධර්මවිනය පෙරළා ය යි සේයි. **චතුන්නං කම්මානං වසෙන**- අපලොකනකර්මය, ඤප්තිකර්මය, ඤප්තිද්විතියකර්මය, ඤප්තිචතුර්ථකර්මය යන චතුර්විධකර්මයන් කෙරෙන්; **අඤ්ඤතර වසෙන**- එක්තරු සඞ්ඝකර්මයකින්; **සඞ්ඝං භින්දති**- එකසිමැ පොහෝපවුරුණු ආදි කිරීමෙන් සඞ්ඝයා බිදි ද; **දුට්ඨචිත්තෙන** යි සේයි. **වධකචිත්තෙන ලොහිතං උප්පාදෙති**-සිටිතැනින් ලෙහෙ සොල්වා ද; **උභතො**- දෙපක්ෂයෙන්; **දුවිධම්පි ව්‍යඤ්ජනං**- විවිධවූ ව්‍යඤ්ජන; **යස්ස අත්ථි** යනු සම්බන්ධ යි.

**එසා ඤත්ති** යනු අනුසාවණාකෙළවර ඤත්ති කියා ඒ කිවා වූ ඤත්ති දැක්වූ පාඨය යි දතයුතු. **අනුසාවණවසෙන**-කර්මවාක්‍යවශයෙන්; **එතෙසං**-මේ වාක්‍යාදීන්ගේ; තික්ඛත්තුං, ඤත්ති කිත්තනමෙව සාවනාය හාපනං නාමාති යොජනා. **සාවණාය අනොකාසෙ**-සාවණාවගේ අනවකාශයෙහි; ඤත්තියගේ අවකාශයෙහි යයි[1] සේයි.

**පටික්ඛෙපසන්නාති**-වැළකීම ය යන; **කාරණාරහත්තා** ය යි සේයි; **සත්ථුසාසනාරහත්තා**-තථාගතොවාදයට සුදුසු හෙයින්; මෙතැන තථාගතොවාද නම් ඤත්තිචතුත්ථකර්ම යි; **ඉධ**-මේ ප්‍රථම පාරාජිකායෙහි; **අඤ්ඤෙපි**-එහිභික්ඛූපසම්පන්නාදීහු දු.

**භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නොති**- භික්ෂූන්ගේ අධිශිල සඞ්ඛ්‍යාත චෙතනා-විරති ය යි කියනලද; **යා සික්ඛා**-යම් සික්ඛාවක් ඇත් ද; **තං ච**-හෙ ද; **යත්ථ**-යම් සාජීවයෙක්හි; **එතෙ**-මේ භික්ෂුහු; **සභාගවුත්තිනො**-සම වැ පැවතුම් ඇත්තාහු වෙත් ද; අව්‍යතික්‍රමයෙහි හැමදෙන මැ සම වැ පැවතුම් ඇත්තාහු දු යි සේයි. **භගවතා පඤ්ඤත්තසික්ඛාපදසඞ්ඛාතං තං සාජීවං ච, තත්ථ**- ඒ දෙක්හි; **සික්ඛනභාවෙන**-හික්මීමෙන්; **සික්ඛං පරිපූරෙන්තො**-චෙතනා විරතිසඞ්ඛ්‍යාතශික්ෂාව පුරන්නේ; **සාජීවං ච අවීතික්කමන්තො හුත්වා**-සාජීවය ද නො ඉක්මවන්නේ;

---

1. අනවකාශපොහොය යි-හැම.

**සික්ඛා**ති කායවචීදුච්චරිතතො විරති ච චෙතනා ච; අඤ්ඤත්‍ර චෙතනා යෙව වෙදිතබ්බා. අඤ්ඤත්‍රාති වාරිත්තෙ, සීලපච්චවෙක්ඛනාපි[1] සීලමෙව. තස්මා සුපටිච්ඡන්නතාදිවාරිත්තෙසු විරතිවිප්පයුත්තචෙතනං පවත්තෙන්තොපි සික්ඛං පූරෙන්තො යෙව සංඛ්‍යං ගච්ඡති; සම්පජානමුසාවාදෙ පාචිත්තියන්ති ආදි උත්තමරියාදං අවීතික්කමන්තො තස්මිං සික්ඛාපදෙ සික්ඛතී ති වුච්චති. **දුබ්බල්‍යභාවං**– "දුක්කරං යාවජීවං එකභත්තං එකසෙය්‍යං" යනාදීන් පැණවූ සිඛ පදයෙහි දුර්වලත්වය; **තස්ස**– සික්ඛං අපච්චක්ඛාය යන පාඨයෙහි; **තදභාවෙන**- ඒ ව්‍රතාදින්ගේ අසම්භවයෙන්;

**කථං?** ප්‍රත්‍යාඛ්‍යානය කෙසේ ය? යත්; **දවා වා**– චිත්තකාමතාවක් නැති වැ සහසා වෙමයි; **රවා වා**– 'එකක් කියමි'යි අනිකක් කියන්නහුට වෙමයි; **කථාති** යථා චිත්තවසෙන පච්චක්ඛානං හොති, **යථා බුද්ධං පච්චක්ඛාමි–පෙ–යං කිංචි වදතො සික්ඛාපච්චක්ඛානං හොතීති** යොජනා. **සද්ධිවිහාරිකයෝ** නම් උපාධ්‍යායග්‍රහණය කොට වසන්නෝ යි. **අන්තෙවාසිකයෝ** නම් ආචාරින් නිසා වසන්නෝ යි. **සමානුපජ්ඣායකයෝ** නම් එක උපාධ්‍යායයන් කෙරෙහි වසන්නෝ යි. තථා **සමානාචරියකා**. **අසක්‍යපුත්තා**–අශාක්‍යපුත්‍රහ යි, අබුද්ධපුත්‍රහ යි සේයි. **සවෙවචනස්ස**–පරියායවචනසහිත වූ; **යස්ස කස්සචි වසෙන**–යම් කිසිවක්හුගේ වසයෙන්; **තෙසු**–ඒ ක්ෂෙත්‍රපදයන් අතුරෙහි; **යං කිංචි වත්තුකාමස්ස**–යම් කිසි පදයක් කියනු කැමැති වැ; **යං කිඤ්චි වදතො**–යම් කිසිවක් කියන්නාහට; **රුක්ඛාදීනං අඤ්ඤතරස්ස**–වෘක්ෂාදින් කෙරෙන් එක්තරා එකක්හුගේ; **නාමං ගහෙත්වා**–'රුක්ඛං පච්චක්ඛාමි, රුක්ඛොති මං ධාරෙහීති' යි නමක් ගෙණ; **පච්චාචික්ඛන්තස්ස**[2]–ප්‍රත්‍යාඛ්‍යාන කරන්නාහට; **න**-නො වේ; **තත්ථ**–පච්චක්ඛාමි, ධාරෙහි යන පදවයයෙහි; **ඡන්දනං වත්තමානකාලවචනං වුත්තං** යි යොදනු **අලං**–පමණි, ප්‍රයොජන නැතැයි සේයි. **බුද්ධෙන**–බුදුන් කෙරෙන්; **අහං**–මම; **සුමුත්තො**–සුවෙන් මිදිනිමි; **අලං මෙති ආදීනි යානි චත්තාරි පදානි** යි සබඳි. **සවෙවචනානං**–'තථාගතං' යනාදි පරියායවචනසහිත වූ; **තෙසං යෙව වසෙන**–ඒ තුදුස් පදයන්ගේ මැ වසයෙන්; **යාය කායචි භාසාය**–අන්ධද්‍රවිඩාදි යම් කිසි බසෙකින්; **වාචසිකපයොගෙනෙව**–වාක් ප්‍රයොග කරන්නාහට ම; **උම්මත්තකො** නම් යක්ඛුම්මත්තක පිත්තුම්මත්තක යි; **ඛිත්තචිත්තො** නම් යකුන් විසින් කරණ ලද වික්ෂෙප සිත් ඇත්තේ යි; **වෙදනාට්ටො** නම් බලවත් වෙදනායෙන් පීඩිත වූයේ යි; **සම්මුඛීභූතෙ යෙව**–ඔහු හමු වූ කල්හි ම; **උම්මත්තකාදීනං** යන

---

1. සීලපච්චවෙක්ඛනාපි-හැ.ව. 2. පච්චක්ඛන්තස්ස.

පදයෙහි ආදිශබ්දයෙන් බාලඑළමූගාදීහු ගැණෙත්; **ලොකෙ මනුස්සා වචනං සුත්වා ආවජ්ජනසමයෙ යථා පකතියා ජානන්තීති** යොජනා. **එවං**- මෙසෙයින් මැ; **තස්ස**- ඒ ප්‍රත්‍යාඛ්‍යාන කරන්නහුගේ; **වචනානන්තරමෙව**- වචනානන්තරයෙහි මැ; **අඤ්ඤං-පෙ-තස්ස සික්ඛාපච්චක්ඛානභාවං සචෙ න ජානන්තීති** යොජනා කාතබ්බා. **දවායපි**-සහසා ද; **චිත්තාදීනං වසෙන** යනු පස්විකත්තට වාක්ප්‍රයොග කොට චිත්තාදිඅඞ්ගවිකල කොට පස් නො විකුමන් ගෙණ කී නියා යි. **සබ්බෙසා වා** යනාදි පස්විකත්තට වාක්භෙද නො කළවුන් ගෙණ කීහු. **අත්ථභූතං**- අර්ථ වූ, ප්‍රයොජන වූ ය යි සේයි; **එකච්චං දුබ්බල්‍යං**- එක්තරා දුර්බලබවක්; **අනාවි කත්වා**-ප්‍රකාශ නො කොට.

**රාගපරියුට්ඨානෙන**-රාගොත්පත්තියෙන්; **සදිසානං**-සදෘශ වූ; **ධම්මං**-ස්වභාවයෙකි; **අජ්ඣාපජ්ජෙය්‍ය**-මාර්ගයෙන් මාර්ග ප්‍රවෙශයෙන් මැඩ[1] පවතී ද; **සබ්බන්තිමෙන පරිච්ඡෙදෙන**-සියල්ලූ යටත් පිරිසෙයින්; **පරනිර්මිතවශවර්ති**යෙහි පටන් දිව්‍යමනුෂ්‍යනාග සුපර්ණය යන මොවුන් හැමදෙනාට යටත් පිරිසෙයිනැ යි සේයි. **පාරාජිකො හොති**-පරදවනලද්දේ මැ වේ; දුර්ලභ ක්ෂණසම්පත්ති සමාගමානුභාවයෙන් ලබ්ධව්‍ය ලෞකිකලොකොත්තර සම්පත්ති සුඛයෙන් පිරිහේ; කෙලෙස්සතුරන් විසින් පරදවනු ලැබෙයි සේයි. **එත්ථ**-මේ එකකර්මාදියෙහි; **සහ වසන්ති**-එක් වැ පවතිත් නු යි; **එකකම්මාදිවිධො**-එකකර්මාදිවිධි ප්‍රභෙද වූ; **සංවාසො නාම**-සංවාස නම් වේ. මෙහි ආදිශබ්දයෙන් උද්දෙසසංවාස ය සික්ඛාසංවාස ය යන දෙක ගත්හු. මෙහි අපලොකනකම්මාදි සතර කර්ම සංවාස නම් වෙ යි. පඤ්චවිධ වූ උද්දෙසය උද්දෙසසංවාස නම් වෙ යි. සික්ඛාසංවාස නම් චාරිත්‍රවාරිත්‍ර ශික්ෂාදෙක යි; **සො**-ඒ සංවාසය; **තෙන සද්ධිං**-ඒ පාරාජිකාපන්නයා හා සමඟ නැත් නු යි; **අසංවාසො**-අසංවාස නම්.

වසපසාදීන් තික්මෙනහෙයින් මාර්ග නම්හු. **තෙසු**- ඒ මාර්ගයන් කෙරෙහි; **අක්ඛායිතස්ස වා**- සොනසිගාලාදීන් විසින් නො කෑ වෙව යි; **යෙභුය්‍යෙන අක්ඛායිතස්ස වා**- බොහෝ සේ නො කෑ; සතරවන කොටසෙහි කෑ ය යි සේයි. පරොපක්‍රම හෙයින් පවෙසනාදි සතර භික්ඛුපච්චත්ථිකයන් ප්‍රතිබද්ධ ය යි දත යුතු. භික්ෂුත්ව ප්‍රතිපක්ෂයෝ **භික්ඛුපච්චත්ථිකා** නම් වෙත්. **එත්ථ**- මේ ප්‍රථමපාරාජිකායෙහි;

**සක්ක**-කපිලවත්හු; **සබ්බසික්ඛාපදානං**- උභතොවිභඞ්ගපරියාපන්න ශික්ෂාපදයන්ගේ; **අනුප්පන්නෙ දොසෙ**- දොෂ නැති වැ;

---

1. මස.

**අඤ්ඤත්‍ර නත්‍ථි**-සෙසු ශික්‍ෂාපදයෙක්හි නැති. **විනයධරපමුඛෙන ගණෙන**-විනයධර ආචාරීන් විසින් පස්වනු කොට ඇති ගණයෙන්; ධුවනහාන නම්, එක්වන් සැතගිම යි; **චම්මත්ථරණ** නම්, හෝනා සම් ඇතිරිය යි. මෙසේ කීමෙන් සම්බාධ නො ගත යුතු. **පාතිමොක්ඛෙ ආගතං**- ප්‍රාතිමොක්‍ෂයෙහි ආ ය. සෙස්ස සැම බන්ධකයෙහි ආ යි.[1] **සබ්බානි**-සෙසු සියලු ශික්‍ෂාපදයෝ; **සබ්බත්ථපඤ්ඤත්තියෙව හොන්ති**-සියලු තන්හි ම ප්‍රඥප්ති නම් වෙත්. ප්‍රදෙශප්‍රඥප්ති නො වෙති යි සේයි. **සෙසානං චතුන්නං වසෙන**-පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති සාධාරණපඤ්ඤත්ති අසාධාරණපඤ්ඤත්ති යන සතර දෙනාගේ වසයෙන්; **සබ්බත්ථ**-සියලු ශික්‍ෂාපදයෙහි;

**පුබ්බපයොගාදිවසෙන**-පූර්වප්‍රයොගාදිවශයෙන්; පූර්වප්‍රයොග නම්, නිධාන සොරා ගන්නා පිණිස එහි මත්තේ වළ ආදි කරණු පිණිස වාසිඑරසුආදි පරියෙෂනයෙහි-අදත්තාදානපූර්වභාගයෙහි වන දුක්කට යි. **ආදිශබ්දයෙන්** සහප්‍රයොග ගත්හු. සෙස්සෙහි දු මෙසේ මැ ගන්න. **අජානනාදිවසෙන**-අජානන,අසඤ්චිච්ච,අසතියා යනාදි වසයෙන්; සීලවිපත්ති නම්, පාරාජිකා සඞ්ඝාදිසෙස යි. ආචාරවිපත්ති නම්, පඤ්චලහුකාපත්ති යි. දෘෂ්ටිආජීවවිපත්තීහු දු ඔහු මැ යි. එහි දෘෂ්ටි නම්, මිථ්‍යාදෘෂ්ටිය හා අන්තගග්‍රාහිකදෘෂ්ටි යි. ආජීවවිපත්ති නම්, ආජීව හෙතු කොට- ආජීව කාරණ කොට පණවනලද ශික්‍ෂාපදයෝ සදෙනා යි. **කායො වාචා-පෙ-චිත්තන්ති යානි සමුට්ඨානානි වොහාරසුඛත්ථං සික්ඛාපදසමුට්ඨානානිති පි වුච්චන්ති** තානි සබ්බාපත්තීනං එකඞ්ගික වඞ්ගික තිවඞ්ගිකානි ඡ සමුට්ඨානානි යි කියා අධ්‍යාහාර කොට යොදනු. මෙහි අඞ්ග නම්, ආපත්ති වීමට හෙතු වූ කාරණ ය යි අර්ථ යි. **කායො**-කායද්වාරය; **වාචා**-වාග්ද්වාරය; -පෙ-**කායවාචාචිත්තන්ති**-කායද්වාරවාග්ද්වාරචිත්තය යි කියා; **යානි**-යම් සමුට්ඨාන කෙනෙක් ඇද්ද; **වොහාරසුඛත්ථං**-ව්‍යවහාර සුව පිණිස; **සික්ඛාපදසමුට්ඨානානිතිපි**-ශික්‍ෂාපදසමුට්ඨානයහ යි කියනු ලැබෙත් ද; **තානි**-ඒ සමුට්ඨානයෝ; **සබ්බාපත්තීනං**-සියලු ඇවැත්පිළිබැඳි වූ; ඇවැත් ජනක වූ ය යි සේයි. කාය ය වාචා ය යන දෙක වෙන වෙන ම එකඞ්ගික නම් වේ. කායවාචා ය, කායචිත්ත ය, වාචාචිත්ත ය යි වඞ්ගික තුණ ය. කායවාචාචිත්ත යනු තිවඞ්ගික එක ය යි කියා; **එකඞ්ගිකචඞ්ගිකතිවඞ්ගිකානි**- එකඞ්ගික දුවඞ්ගික තිවඞ්ගික වූ; **ඉමානි ඡ සමුට්ඨානානි**-මේ සමුට්ඨානයෝ සදෙන; **සබ්බාපත්ති**

---

1. අයි.

**නං**-සියලු ආපත්තීන්ගේ; **සමුට්ඨානානි**-සමුට්ඨානයෝ යි. **පුරිමානි තීණි**-කායො වාචා කායවාචා ය යන තුන්දෙන, තුන් සමුට්ඨාන යෝ; **අචිත්තකානි**-අචිත්තකයහ. **පච්ඡිමානි**- අවශෙෂපශ්චිම ත්‍රය ය; එකං සමුට්ඨානං කාරණං යස්සා සා ආපත්ති=**එකසමුට්ඨානා** යි ගන්න. තුබූයෙහි දු මෙ මැ නය යි. **නාඤ්ඤතො**-ඒ අතික් එකෙකින් සමුට්ඨාන නො වේ. මෙ කියනලදුයෙන් මැ වෙයි සේයි.

'යා ආපත්ති සියා කිරියතො සමුට්ඨාති, සා අත්ථී'ති සාධ්‍යාහාර යොජනා. **සා අත්ථි**-එසේ වූ ඇවතක් ඇති. මෙහි අත්ථි **සියා** කිරියතො සියා අකිරියතො යනාදියෙහි **සියා** යනු **කදාචි** යන්නෙහි අර්ථ යි. එහෙයින් 'කිසිකලෙක්හි ක්‍රියායෙන්, කිසිකලෙක්හි අක්‍රියායෙන්' යි අර්ථ යි. **කායවාචාහි කත්තබ්බං**- කයින් වචසින් කට යුතු; අධිට්ඨානදසාහබ්භන්තරයෙහි අතිරෙකචීවර නො ඉටී මෙන් නිස්සග්ගිපචිති වන්නෙන් **පඨමකඨිනාපත්ති** ය යි දක්වූහු. **අඤ්ඤාතිකාය භික්ඛුණියා හත්ථතො චීවරපටිග්ගහණාපත්ති විය** යන්නෙහි නොනෑ මාගම්පැවිද්ද අතින් සිවුරු ගණුත් ක්‍රියා ය. පරිවට නො දෙනු අක්‍රියා ය. රූපියස්ස පටිග්ගහණෙන ආපජ්ජනතො සියා කිරියතො, පටික්ඛෙපස්ස අකරණෙනාපජ්ජනතො සියා අකිරියතොති ආහ: '**රූපියපටිග්ගහණාපත්ති විය**'ති. කුටිං වත්ථුං දෙසාපෙත්වා පමාණාතික්කන්තකරණෙනාපජ්ජනතො සියා කිරියතො, අදෙසාපෙත්වා පමාණාතික්කන්තකරණෙනාපජ්ජනතො සියාකිරියාකිරියතොති ආහ: '**කුටිකාරාපත්ති විය**'ති.

**වීතික්කමසඤ්ඤාය අභාවෙන**-ව්‍යතික්‍රමසංඥවගේ අභාවයෙන්; **යා මුච්චති**-යම් ඇවැත්කෙනෙක් මිදේ ද; සංඥවයෙහි හා සචිත්තකවයයෙහි හා නානාත්වය කිම් ද? යත්:-සංඥවයෙහි සංඥවිමොක්ෂපක්ෂයෙහි නිරාපත්ති ය. සචිත්තකවය යෙහි ඇවැති. සචිත්තකාවයය නම්, සචිත්තකාපත්ති හා අචිත්තකාපත්ති යි.

**යස්සා**-යම් ආපත්තියකගේ; **සචිත්තකපක්ඛෙ**-සචිත්තකපක්ෂයෙහි; යට කියනලද සචිත්තකසමුට්ඨානයෙහි ඇවැත් දනවන සිත්හු දෙතිසෙකි. අට කාමාවචරකුසල්සිත් යැ, දොළොස් අකුසල් යැ, එකොළොස්කාමාවචරක්‍රියාචිත්තයන් කෙරෙහි මනොධාතු හැර සෙසු දසසිත් යැ, කුශල-ක්‍රියාඅභිඥචිත්තවය යි කියා මෙසේ දෙතිස යි. කායවච්කම් ය යනු විඥප්තිපථ වූසිකුසල් අකුසලැ. අව්‍යාකෘත සිතින් අවදනෝ එකාවිධ ය යන මේ ප්‍රභෙදය මැ ලැබෙයි. වෙදනාත්තිකයෙහි දු මෙ මැ යුක්ති යි.

**දුබ්බිජානං හොති**- නො දත හැකි වේ. **නං**-ලක්ෂණය; **අනුබජ්ඣා**-නො තහා; **ඉධ**-මේ සිඛයෙහි; **අස්ස**-මේ සතළොස්

ප්‍රකාරයාගේ; **කායසංසග්ගානි** ආපත්තිභෙදදස්සනත්ථං වුත්තං. **සබ්බසො ඡින්නා**-වට කොට හෝ සම කොට හෝ සිසාරු කැපූ යයි සේයි. **චම්මඛිලං වා**–අර්බුදාදි චර්මකීලයක් වෙවයි, සම්කොඩලෙක් වෙවයි; ඉන්නන් ද කියත්. **නට්ඨකායප්පසාදං වා**–නටුවාවූ කායප්‍රසාද ඇති පිළිකා එව් සම්බිල එව්. **පවෙසනප්පමාණවිරහිතෙ**–අඞ්ගජාතප්‍රවේශයට යොග්‍ය නුවූ; **න කුපිතං හොති**-ක්ෂත වැ නො ගියේ ද; **විවටකතෙ මුඛෙ**–විවෘත වැ ගිය මුඛයෙහි; **අච්ඡුපන්තං**–යම් කිසි තැනෙකැ නො පහරවා; **ඔට්ඨො බහි නික්ඛන්තො**–පිටවී ඔෂ්ඨයෙන් නිෂ්ක්‍රාන්ත; **බහි පතිතමංසපෙසියං**–කපා හළ මංසපෙසියෙහි;

**නිද්දං ඔක්කන්තත්තා**–නිදන්නට වන්බව හෙයින්; **ආපත්තියා හොන්ති**–අධ්‍යාචාරයෙහි වෙති. **න සික්ඛාපදස්ස**–ශික්ෂාපද ප්‍රඥප්තිපිළිබඳ වැ නො වෙති.

**අට්ඨං**–ශබ්දජීවය; **සරණං අවොච**–පැමිණිය යුතු ය යි කියා; **නිවෙසෙය්‍ය**–පිහිටුවන්නේ යැ.

## පඨමපාරාජිකං.

---

**නිවිට්ඨො**–වසනලද; **නිම්බකොසො**-අක් සෙයග[1]; **ද්වාරෙ ඨිතො**-දෙරකඩ සිටියේ; **යං උදකං** යන සබඳි. **සුප්පස්ස වා**– කුල්ල වෙවයි; **රුක්ඛසුසිරං**–හිදිදෙර; **ද්වෙ ඉන්දඛීලා**–ඉන්ද්‍රකීලයෝ දෙදෙනෙක් හෙවත් එලිපත් දෙකක් ඇද්ද; **සඞ්ඛා** යනු සඞ්ඛාත යන පදයට උදුහරණ කටැටි වැ කීහු. **පපඤ්චසඞ්ඛා**–තෘෂ්ණා දෘෂ්ටි මාන සඞ්ඛ්‍යාත ප්‍රපඤ්චකොට්ඨාසයෝ; **සඤ්ඤානිදානා හි**– අයාථාවසංඥව මුල් කොට ඇත්තෝ යි. අයාථාවසංඥා නම් අතත්ත්වසංඥව යි. **අස්සාති**-ථෙය්‍යසඞ්ඛාතනාති අස්ස; **පඤ්ච පඤ්චකානි සමොධානෙත්වා අවහාරා සාධුකං සල්ලක්ඛෙතබ්බා.** **අවහාරා**-සොරකම්හු;

**එතස්සෙව පදස්සාති**– 'ආදියෙය්‍යා'ති පදස්ස; **ධුරං**–උත්සාහය; **ආපත්ති පාරාජිකස්ස**–ප්‍රාතිමොක්ෂසංවර ශීලසම්පත්තියෙහි නො හිමි වැ පරිජි අවදනේ ය යි සේයි. **නාහං ගණ්හාමි**–අහං නාගගහෙසිං. **අතික්කාමෙති**–තමා කැමැතිදිසාවකට ඉක්මවා **ද**; **ඛිලාදිනි**-අකුරු කෙටූ නො කෙටූ පාසාණඛිලාදීන්; **සඞ්කාමෙත්වා**–යතා හිදුවා; **සංවිදහිත්වා**-බැණැ ගෙණැ; **සම්මන්තයිත්වා**-සැමැතැ ගෙණ; **සඤ්ජානනකම්මං**-සලකුණු දන්නා ක්‍රියා යි. **සංකෙතතො**–හැඟවූකාලයෙන්; **සඤ්ඤුප්පාදනත්ථං**–සංඥ උපදවන පිණිස; **අක්ඛිනිඛනනාදි**–ඇස් තෙරුම් බැම නැගීම් ආදීන්;

---

1. අක්සෙනග-තැම.

**කූටමාන**-සොරම්නුමෑ; **කූටකහාපණාදීහි**-සොරමසු ආදීන් වඤ්චා කොට; **ගාමඝාතකාදයො විය**-ගම් වොලෝ ගන්නාදීන් මෙන්; **බලිනො**-කරවුවරින්; **රක්ඛති**, කිං? සීලං; පාරාජිකං නා පජ්ජතීති වුත්තං හොති. අථවා අවහාරා භික්ඛුං ආපත්තිතො රක්ඛති. අඤ්ඤං නොවි ගණ්හාති චෙ **පගෙවෙත. මයා ගහිතං**-පළුඹු කොට මා විසින් ගන්නාලද; **නට්ඨාති** විසු පරිකප්පෙසු; **ගබ්භමාර**- ගර්භාරය; **පමුඛ**-අග්දෙරිය; **හෙට්ඨාපාසාද**- යට මහල; **ද්වාරකොට්ඨක**-දොරටු ය; වෘක්ෂමූලාදිය යන මොවුන්ගේ වශයෙන්; **දළ්හකාමතාය ගහෙත්වා විචරන්තා විය**-බලත් වත් වැ ගෙණෑ ඇවිදිනක්හු මෙන්; **තස්ස අවහාරො හොති. පච්ඡාදෙත්වා**-තෘණපර්ණාදීන් ප්‍රච්ඡාදනය කොට; **විචිනන්තා**-සොයත් නාහු; **ආලයාව**-ආලයසහිත වැ මැ; **අථ**-එකල්හි; **අයං අවහාරො හොති. ගතා දූති නෙ**-ඔහු දූත් ගියාහ.

**කස්මා**-කුමක් හෙයින් ද? යත්:- **යස්මා**-යම් හෙයකින්; **තස්ස**-ඒ සොරහුගේ; **පයොගෙන**- ප්‍රයොගයෙන්; **තෙහි**- ඒ වස්තුස්වාමීන් විසින්; **න දිට්ඨං**-නො දක්නාලද ද; **තස්මා**- එහෙයිනි; **යථාඨානෙ ඨිතංයෙව**[1]-තුබූතැනැ තුබුවා ම; **සණ්ඨාපෙත්වා**-හැද;[2] **විලිවමය** නම්, හුණපොත්තෙන් කොළේ යි; **අග්ගෙන**-අගයෙන්; **මජ්ඣිමතරං වා**-මඳක් වටනා හෝ; **මහග්ඝතරං වා**-බොහෝ වටනා හෝ; **සමසමං වා**-සමසම වූ හෝ; **ඉති**-මෙසේ; **ආදිමෙසු** -පෙ- **ඨාති යං වුත්තං තස්සත්ථො පකාසිතො හොති.**

**රඤ්ඤොති**-රාජනො යන; **ඉදං**-මෙය; සබ්බරාජසාධාරණ බහුවචනයක් වුව ද මෙතැන, **බිම්බිසාරං යෙව සන්ධාය වුත්තං**-බිම්බිසාරයන් පිණිස මැ වදාරණලදි. සො හි ධම්මිකරාජතා යථා **පවෙණියා කරොති** යි සේයි. **තෙ**-ඒ රජදරුවෝ; **නප්පමාණා**-ප්‍රමාණයෝ නො වෙත්. **පාදස්ස වා** යන්නෙහි පාදයෙක් නම් මසුරන් පස්මදයෙක්; **පොරාණස්ස**-පුරාතන ශාස්ත්‍රානුරූප කොට; **කහාපණස්ස**-අටඅකින් කළ නීලකහාපණයාගේ ය යි සේයි. වීසතිමාසකො කහාපණො හොති. තස්මා පඤ්චමාසකො පාදො. එතෙන ලක්ඛණෙන සබ්බජනපදෙසු කහාපණස්ස චතුත්ථො භාගො පාදොති වෙදිතබ්බො. සො ච ඛො පොරාණස්ස නීලකහාපණස්ස වසෙන. න ඉතරෙසං රුද්‍රදමකාදීනං යනු අභි කාථා සි. **කො පන වාදො**-කියයුතු කිම?

---

1, ඨපිතං යෙව. 2, හෙද.

**රක්ඛෙ** දරුනි **ආදියනවත්ථුස්මිං පක්ඛන්තානං.** කිදිසනාහි මෙ? අදින්නං. **සබ්බත්ථ**-ඌනමාසකාදි හැමතන්හි; **පංසුකූලසඤ්ඤිස්ස**-අනුන් නො හිමි ය යන සංඥා ඇත්තාහට ද; **පෙතපරිග්ගහෙ**-ප්‍රෙතයන් විසින් රක්‍ෂිතයෙහි ද; **පරපරිග්ගහිතං**-අනුන් විසින් රක්‍ෂිතබව ය.

## දුතියපාරාජිකං.

---

**වධාමි නන්ති වධකචෙතනාය චෙතෙත්වා**-'තං වධාමි' ඉති වධක චෙතනාය; **චෙතෙත්වා**-ප්‍රයොග කොට; **පරිකප්පෙත්වා**-විමැස; **ජීවමානකං**-ජීවිතෙන්ද්‍රියය ඇති; **නයො**-කලලරූපයෙන් මතුයෙහි; **ඉමස්ස පනත්ථස්ස**-"සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපෙය්‍ය" යන මොහුගේ අර්ථ ප්‍රකාශ කරණු පිණිස; **පයොගං සමුට්ඨාපෙති**-කායවාක්ප්‍රයොග උපදවා ද; **උසු**-ශර; **සත්ති**- අඩයටි; **සත්තපාසාණාදීනං**- යන්ත්‍රපාෂාණාදීන්ගේ; **නිස්සජ්ජනං**-දැමීම යි. **තත්ථ**-ඒ උසුආදියෙහි; **කම්මබද්ධො**-කර්ම සිඩිය වෙයි සේයි. පාරාජිකා වෙයි සේයි.

**අථ**-නොහොත්; **සබ්බත්ථ**-ඔකාසාදියෙහි; **අසංචාරිමෙන**-නො ගැසිරෙණ; **ඔපාතඛනනං**-වළ කැනීම්; **අපස්සෙන සංවිධානං**-පිටහටු සැලසීමැ; **රූපූපහාරොති** ඉෂ්ටානිෂ්ට රූපයාගේ එළිවීම ය යනු; **එත්ථාපි**-මේ ස්ථාවරප්‍රයොගයෙහි දු; **කම්මවිපාකජාය ඉද්ධියා පයොජනං**-කර්මවිපාකජ ඍද්ධියගේ යෙදීම යි. **ඉතරථාපි**-අන්පරිද්දෙන් වී නම්; පයෙදිෂ්ණාර්ත්‍ථි වී නම්; **අස්ස පදභාජනෙ**-"සත්ථහාරකං වා පරියෙසෙය්‍ය" යන මොහුගේ පදවිභාගයෙහි; **මතෙනෙත ජීවිතා සෙය්‍යොති, එත්ථ වුත්ත**- මෙහි කියනලද; **එත්ථ ච**-"ඉති චිත්තමනො" යන මෙහි; **අස්ස පදභාජනෙ**- "ඉති චිත්තමනො" යන්නහුගේ පදවිභාගයෙහි; **සංවිදහනමත්තස්සෙව නාමං**- සංවිධානමාත්‍රයකට නමෙකි; **ඉමස්මිං අත්ථෙ**- මේ සංවිධානාර්ථයෙහි; **තං ච සංවිදහනං**-ඒ සංවිභාගය ද; **සඤ්ඤාචෙතනාධිප්පායෙහි**- සංඥාචෙතනාභිප්‍රාය යෙන් සංග්‍රහයට යේ. **එත්ථ ච අධිප්පායොති** විතක්කො වෙදිතබ්බො. **මතෙනෙත -පෙ- ධිප්පායොති එවං** ඉති චිත්තසංකප්පොති **එත්ථ අත්ථො දට්ඨබ්බොති** යොජනා.

**මරණචිත්තාදීහි විනා**-මරණචිත්ත මරණචෙතනා මරණාභිප්‍රාය නැති වැ; **දළ්හං විරියං ආරභතො**-දෘඪ වූ වීර්‍ය්‍යයට පටන් ගත්තහුගේ; **එකාහං ජීවිතං සෙය්‍යො**-එකදවසකුදු ජීවත් වීම

උතුමැ යි; **උච්චාවචෙන කාරණෙන**-කුදු මහත් කාරණයෙන්; ඛුද්දමහන් කාරණ නම්, ජීවිතෙ ආදීනවදස්සනවසෙන අච්චාකාරතා මරණෙ වණ්ණභණනවසෙන උච්චාකාරතා වෙදිතබ්බා යනාදි; **නිගමනවචනං**-විශෙෂ කොට නැවැත දක්වන තෙපුලෙකි. **යක්ඛ**-යක්ෂයහ; **පෙත**-ප්‍රෙතයහ; **තිරච්ඡානගත මනුස්ස විග්ගහානං**-තිර්‍යග්ගත මනුෂ්‍යයහ යන මොවුන්ගේ; **අචෙතනකා**- නො සිතා; **මුසලුස්සාපන**- මොහොලුදැහුම්; **විසගත පිණ්ඩපාතවත්ථුස්මිං විස**-විෂමිශ්‍රපිණ්ඩපාතවස්තුයෙහි මෙන්;

**තතියපාරාජිකං.**

---

**උත්තරිමනුස්සානං**-සෙසු මිනිසුන් කෙරෙන් උත්තරිතර වැ සිටියා වූ; **ඣායීනං චෙව**-ධ්‍යාන ලද්දවුන්ගේ ද; **අරියානං ච**-ආර්‍යයන්ගේ ද; **ධම්මං**-ධර්‍මය යි. **මයි අත්ථි සමුදාචරන්තො**-ප්‍රකාශෙන්තො; තං උත්තරිමනුස්සධම්මං අත්තනි උපනෙතීති=**අත්තුපනායිකො**; **වා**-නොහොත්; **අහං කත්ථ** උත්තරිමනුස්සධම්මෙ **සන්දිස්සාමීති සමුදාචරන්තො**- **අත්තා**නං තත්ථ උත්තරිමනුස්සධම්මෙ උපනෙති. තං කරෙතීති උත්තරිමනුස්සධම්මො අත්තුපනායිකො නාම. **එවං කත්වාති**-අත්තනි උපනීතං කත්වා; **ජානන්තෙන**-සවිෂය දන්නාහෙයින්; **පරියන්තං**-සමර්ථ වූ; **අලං වා අරියඤාණදස්සනස්සාති** උත්තරිමනුස්සධම්මස්සාති අත්ථො. **අලමරියඤාණදස්සනො**-අලමරියඤාණදස්සන නම් වේ, උත්තරිමනුෂ්‍යධර්‍මය. **වුත්තප්පකාරමෙතං**- කෙලශවිධ්වංසන සමර්ථ වූ විශුද්ධ වූ ඥානදර්‍ශන ඇති උත්තරිමනුෂ්‍යධර්‍මය; **අත්තුපනායිකං කත්වා**- තමා කෙරෙහි ඇති වත් කොට, තමා කරා එළවා; **විනා අඤ්ඤාපදෙසෙන**- "යො තෙ විහාරෙ වසතී"ත්‍යාදි ක්‍රමයෙන් වක්ෂ්‍යමාණව්‍යාජකථාවක් නැති වැ; **එවං**-මෙසේ; "ඉති ජානාමි ඉති පස්සාමි" යනාදීන්; **ඉධෙවාති ජානාති පස්සාමීති එත්ථෙව; ඉදං වචනමත්තමෙව න වදති.**

**එතං**- "තතො අපරෙන සමයෙන" යන මේ වචනය; **ආපත්තිපටිජානනකාලදස්සනං**-ඇවැත් ගිවිස්නාකාලය දක්වීමකි. **අයං පන**-මේ මහණ වනාහි; **පටිජානාති**-ප්‍රතිඥා කෙරේ ද, ගිවිසී ද; **අභබ්බො ඣානාදීනි අධිගන්තුං**-ධ්‍යානාදීන් පිළිලැබීමට අභව්‍ය යි. **සග්ගමග්ගො** නම්, කුශලමාර්ගග යි; **ආරාධෙතුං**- සිද්ධ කරන්නට; **තිලක්ඛණං ආරොපෙත්වා**-තුන්ලකුණු සිතට නගා; **ආරද්ධ**-වඩනලද; **විපස්සනාස්ස**-උදයව්‍යයඥාන ඇත්තාහට; **පාපිච්ඡතාය**-බුහුමන් කැමැති වැ; **අනුල්ලපනාධිප්පාය** නම්, පාපෙච්ඡාවක් නැති වැ වාග්භෙදමාත්‍ර කිරුම යි.

**චතුත්ථපාරාජිකං.**

---

**පියවචනෙන**-කල්‍යාණවචනයෙන්; **සඞ්ඝපතිතානං**-උපොසථාග්‍රයෙහි රැස් වූවන්; **සංවිජ්ජති**-විද්‍යමාන වූ; **චෙතනා**- ව්‍යතික්‍රමචෙතනාතොමෝ; **අස්සාති**-අස්සා සුක්කවිස්සට්ඨියාති; **විස්සට්ඨි** නම් විසර්ගය යි, හැරිම යි. මොචනය යි සේයි. **රාගූපත්ථම්භාදිසු**-රාගූපත්ථම්භෙ මොචෙති, වච්චූපත්ථම්භෙ මොචෙති, පස්සාවූපත්ථම්භෙ මොචෙති, වාතූපත්ථම්භෙ මොචෙති, උච්චාලිඞ්ගපාණකදට්ඨූපත්ථම්භෙ මොචෙති"යි වදාළ පඤ්චවිධයෙහි; **කෙනචි**-යම්කිසිවෙකින්; **ආරොග්‍යාදිසු**-"ආරොග්‍යත්ථාය මොචෙති, සුඛත්ථාය මොචෙති, භෙසජ්ජත්ථාය මොචෙති, දානත්ථාය මොචෙති, පුඤ්ඤත්ථාය මොචෙති, යඤ්ඤත්ථාය මොචෙති, සග්ගත්ථාය මොචෙති, බීජත්ථාය මොචෙති, වීමංසත්ථාය මොචෙති, දවත්ථාය මොචෙති"යි වදාළ දශවිධ අභිප්‍රායාන්තරයෙහි; **යං කිඤ්චි**-යම් කිසිවක්; **අපදිසිත්වා**-එල්බැ; **අජ්ඣත්තරූපාදිසු**- "අජ්ඣත්තරූපෙ මොචෙති, බහිද්ධා රූපෙ මොචෙති, අජ්ඣත්තබහිද්ධාරූපෙ මොචෙති, ආකාසෙ කටිං කම්පෙන්තො මොචෙති"යි වදාළ චතුර්විධයෙහි; **යත්ථ කත්ථචි**-යම් කිසි රූපයෙක්හි; **මොචනස්සාදචෙතනාය** යන්නෙහි, 'මොචන' නම් අනභිමධාතුමොචන ය. එසඳ ධාතුවිෂය වැ උත්පන්නරාගසම්ප්‍රයුක්තවෙදනා මොචනාස්වාද නම්.

**ආසයධාතුනානත්තතො**- වාත පිත්ත ශ්ලෙෂ්ම රුධිර යන මොවුන් රැස් වැ සිටිනා ස්ථානභෙදයෙන්, රසාදිධාතූන්ගේ හෝ පෘථිව්‍යාදිධාතූන්ගේ හෝ නානාත්වයෙන්; **නීලාදිවසෙන දසවිධෙ සුක්කෙ**-නීලං, පීතං, ලොහිතං, ඔදාතං, තක්කවණ්ණං, දකවණ්ණං, තෙලවණ්ණං, ඛීරවණ්ණං, දධිවණ්ණං, සප්පිවණ්ණං යි **පදභාජනීයෙහි** වදාළ දශවිධ ශුක්‍රයෙහි යම් කිසි ශුක්‍රයක්; **ඨානා චාවනා**- සිටිසිටිතැනින් සෙල්විම යන අර්ථ යි. මෙහි ස්ථාන නම් කෙශ, ලොම, නඛ, දන්ත යන මාංසවිනිර්මුක්තස්ථාන හා මූත්‍ර, පුරීෂ, ලාලා, ඛෙල, සිඞ්ඝාණිකා, ස්තබ්ධශුෂ්කචර්ම හා හැර අවශිෂ්ට සකලශරීරය යි දත යුතු. සුපිනො එව=**සුපිනන්තෙනා. තං ඨපෙත්වා**-කපිනිද්‍රාවස්ථායෙහි සම්භව වන ස්වප්නයෙහි දක්නා අරමුණු හෙයින් වනබැවින් අවිෂය වූ ශුක්‍රමොචනය තබා; **අයං සුක්කවිස්සට්ඨි. එත්ථාති** සඞ්ඝාදිසෙසොති පාඨෙ; **අස්සාති**-ආපත්තිකායස්ස; **සඞ්ඝාදිසෙසො**- සඞ්ඝාදිශේෂ නම්, සුක්විසට්සඟ වෙසෙස්. **තස්සාති**-වුට්ඨානස්ස; වුට්ඨාන නම් ආපත්තියෙහි. **ආදිතො සෙසෙ**-ආදියෙන් ශෙෂ වූ; **එත්ථ**-මේ ස්ථානයෙහි; **චෙතෙත්වා**-ප්‍රයොග කොට; **දකසොතං**-ජලමාර්ගයට; **අනොතිණ්ණෙ**-නොබට ද;

**සුක්කවිස්සට්ඨි පඨමං.**

**යක්ඛාදීහි ගහිතා විය** – යක්ෂාදීන් ආවිෂ්ට සත්ත්වයන් මෙන්; **ඔතිණ්ණා** – බස්නාලද්දේ; **කූපාදීහි විය පතිතා** – කූපාදියට බස්නා සත්ත්වයන් මෙන්; **අසමපෙක්ඛිත්වා** – අපරීක්ෂිත ව; **එතනති** 'ඔතිණ්ණො'ති එතං; අත්තනො කායෙන ඉත්ථියා කායස්ස සංසග්ග විම්සහිභාවෙ රාගො=**කායසංසග්ගරාගො. පරිණතෙන** – පෙරළිය වූ; **අස්සාති** – 'කායසංසග්ගං සමාපජ්ජෙය්‍යා'ති අස්ස පදස්ස; **තස්ස** – ඒ හස්තග්‍රහණාදියෙහි; **කප්පරතො පට්ඨාය** – වැලමිට පටන් ගෙණ; **යාව අග්ගනඛා** – නඛාග්‍රය දක්වා යි. **විනද්ධා වා** – ගොතා වේවයි; **සුද්ධකෙසෙහි වා** – නො ගෙතූ කෙශයෙන් වේවයි; **සුත්ත** – සූත්‍ර ය; **කුසුම** – දෑසමන් ආදී මල; **කහාපණමාලා** – කාෂීපණමාලා ය; **සුවණ්ණචීරක** – පාමඩගාදි රන්සිරු ය; **මුත්තාවලි ආදීසු** – මුත්හර ආදීන් අතුරෙහි; **අඤ්ඤතරමිස්සෙහි වා** – එක්තරා එකකින් මිශ්‍ර වූ කෙශයෙන්; **කත** – කෘත වූ; **එතස්සාති** – 'වෙණිගහණං වා'ති එතස්ස; **කෙසාපි** – නො ගැවසූ කෙශයෝ ද;

**එතස්ස පටිවිජානන්තස්ස** – පහස් විඳිනාහට; **කායෙන** – තමාගේ කයින්; **කායපටිබද්ධෙ** – ස්ත්‍රියගේ කායප්‍රතිබද්ධයෙහි; **අසඤ්චිච්ච** – පාත්‍රප්‍රතිග්‍රහණාද්‍යුපායයෙන් 'සිරුරුපහස් විඳිමි යි' නො සිතා බෙහෙත් සත්ආදිය පිළිගන්වන මාගමුන් අත පහරණ ආදී කල්හි නිරවැත යන අර්ථ යි. **අසතියා** – මාගම වෙරළ පහරණබව නො දැන, අන්‍යවිහිත ව, සිහි නැති ව, අත්පා දික් කරණ කල්හි පුසනුවහට ය යන අර්ථ යි. **අජානන්තස්ස** – දරුවකු වැනි ලදූරිය මාගම්බව් නො දැන කිසි කාවර කටයුතුයෙකින් පුසනුවහට නිරවැති.

**කායසංසග්ගං දුතියං.**

---

**දුට්ඨුල්ලවාචස්සාදරාගවසෙන** – වසමග පසමග පිළිබැඳි ගුණ දොස් මෙවුන්දම් නිසා පවත්නා බැවින් දුට්ඨුල්ලවචනාස්වාදසම්ප්‍රයුක්ත රාගවශයෙන්; මෙහි **දුට්ඨුල්ලං** යන්නෙහි "**දුට්ඨං කිලෙසසන්දූසිතං** – රාගාදි කිලෙසින් කිලිටි වී නු යි දුෂ්ට නම්දු වෙයි. **ථූලත්තා,** අසුඛුමං **අනිපුණන්ති** වුත්තං හොති – මහත් වරදක් හෙයින් ථූල නම්දු වෙයි. ප්‍රඥාවගේ සියුම්බවක් විශදබවක් එහි නැති හෙයින් අසුඛුම අනිපුණ නම්දු වෙයි" යනු අටුවාගැටපද යි. **දුට්ඨුල්ලාදුට්ඨුල්ලසල්ලක්ඛණසමත්ථං මනුස්සිත්ථිං** – සභ්‍යාසභ්‍ය තෙපුල් දන්නට සමර්ථ වූ මාගමට; **වණ්ණ** නම්, "තව වච්චමග්ගො පස්සාවමග්ගො ච ඊදිසො සුභො සුසණ්ඨානො" යනාදී ක්‍රමයෙන් මාර්ගසතුති කිරීම යි. **අවණ්ණ** නම්, "අනිමිත්තාසි, නිමිත්ත

මත්තාසි" යනාදීන් දෙමඟ උදෙසා බණන ප්‍රතොදෙපමගහී සි. **යාචනා** නම්, "දෙහි මෙ මෙථුනං ධම්මං අරහසි මෙ මෙථුනං ධම්මං දාතුං" යනාදි විසින් මෙවුන් දම් ඇරවීම්. **ආයාචනා** නම්, "කදා තෙ මාතා පසීදිස්සති, කදා තෙ පිතා පසීදිස්සති, කදා තෙ මෙථුනං ධම්මං ලභිස්සාමි" යනාදි විසින් පැතීම්. **පුච්ඡා** නම්, "කථං මෙථුනං ධම්මං සාමිකස්ස දෙසි"ත්‍යාදි විසින් පිළිවිසීම්. **පටිපුච්ඡා** නම්, "එවං කිර ත්වං සාමිකස්ස දෙසි, එවං ජාරස්ස දෙසි" යනාදීන් පිළිවිසීම්. **ආචික්ඛණා** නම්, "කථං දදමානා සාමිකස්ස පියා හොති"යි පුළුවුත් මාගමට "එවං දෙහි. එවං දෙන්තී සාමිකස්ස පියා භවිස්සසි" යනාදීන් කීම්. **අනුසාසනා** නම්, නුපුළුවුත් මාගමට එසේ මැ කීම්. **අක්කොසනවසෙන**– "සිඛරිණීසි, සම්භින්නාසි" යනාදීන් ආක්‍රොශ වශයෙන්; **අසද්ධම්මවචනං**-නොමනා තෙපුල් කීම්.

**එතෙනාති**– "යථා තං යුවා යුවතිං"න්ති එතෙන; **නිරාසඞ්කභාවං**–සැකනැතිබව; මෙථුනුපසංහිතාය වාචාය අධිකං දුට්ඨුල්ලං නාම නත්ථි, තස්මා **ඉදං දුට්ඨුල්ලවාචාය සික්ඛාපදනලක්ඛණ දස්සනන්ති** වුත්තං. **සිඛරිණීසීති** බහිනික්ඛන්තආණිමංසාසි. **සම්භින්නාසීති** මිස්සීභූතවච්චමග්ගපස්සාවමග්ගාසි. **උභතොබ්‍යඤ්ජනාසීති** "ඉත්ථිනිමිත්තෙන පුරිසනිමිත්තෙන චාති උභතොබ්‍යඤ්ජනෙහි සමන්නාගතාසි" යන මේ තුන්දෙනා අතුරෙහි ආක්‍රොශවශයෙන් හෝ; **මාතුගාමං**– උක්තප්‍රකාර ස්ත්‍රියට; **ඔභාසෙන්තස්ස**–අසද්ධර්ම තෙපුල් බණන්නාහට;

**සචෙ සා තමත්ථං තඞ්ඛණඤ්ඤෙව ජානාති**– උක්තසමනන්තරයෙහි ඉදින් ඕ ඒ අර්ථ විසින් දනී නම්; **අධක්ඛකං**– අකු ඇටින් යට; **උබ්භජාණුමණ්ඩලං**– දනමඬුලුයෙන් මතු; **ආදිස්ස**– උද්දිස්ස; **කායපටිබද්ධ** නම්, වස්ත්‍රාලංකාරාදි සි. **සබ්බත්ථ**– ඉත්ථි පණ්ඩක හැමදෙනා කෙරෙහි; අක්ඛකම්පන ජාණුමණ්ඩලං ච එත්ථෙව දුක්කටක්ඛෙත්තෙ සඞ්ගහං ගච්ඡති. **අත්ථධම්මපුරෙක්ඛාරානන්ති** යන්තෙහි 'අත්ථපුරෙක්ඛාරස්ස අනාපත්ති' සි යොදනු. මාගම්නට 'අනිමිත්තාසි'ත්‍යාදිපදයෙහි අර්ථ කියනු පෙරදැරි කොට, අනිමිත්තාසීත්‍යාදි පද බණන්නා හට ද, මාගමුන් එක්තැන් ව් අටුවා හදරන්නාහට හෝ අනාපත්ති ය යන අර්ථ සි. **ධම්මපුරෙක්ඛාරස්ස**–පෙළදම් කියනු හෝ උන්ට ඇසෙන සේ හදරණු හෝ පෙරදැරි කොට අනිමිත්තාසීත්‍යාදි පදයන් කෙරෙහි යමක් මාගම්නට කියනුවහට නිරවැත. **අනුසාසනිපුරෙක්ඛාරස්ස**– "ඉදානි අනිමිත්තාසි -පෙ- උභතොබ්‍යඤ්ජනාසි, අප්පමාදංදානි

කරෙය්‍යාසි, යථා ආයතිම්පි එවරූපං න හොසී"ති අනුසාසනිපුරෙක්ඛාරිකස්ස; **උම්මත්තකාදීනඤ්ච** - යක්ෂොන්මත්තපිත්තොන්මත්තයන්ට ද, ආදිශබ්දසංග්‍රහීත **උදායී** මහතෙරුන්ට ද නිරවැති. මෙහි ත්‍රිකත්‍රිකවෙදනාත්‍රයෝ නො ගැණෙත්.

## දුට්ඨුල්ලං නිට්ඨිතං.

---

**මෙථුනධම්මසඞ්ඛාතෙන කාමෙන**–මෛථුනධර්මකොටාස වූ කාමයෙන්; **පාරිචරියා**–පූජා, උපස්ථාන, මෙහෙ කිරීම ය යි සේයි. **සයං**–තමා විසින්; **අත්තකාමපාරිචරියාය**– අත්තකාමපාරිචරියා වගේ; **තත්‍ර**–'එතදග්ගන්ති' යනාදියෙහි; **අයං**–මේ අප කියන්නේ; **පදසම්බන්ධවසෙනෙව සඞ්ඛෙපත්ථො**– පදසම්බන්ධවශයෙන් සංක්ෂෙපාර්ථ යි. උල්ලිඞ්ඝන නො කොට පදසම්බන්ධවශයෙන් අර්ථ කියම්හ යි සේයි. **තාදිසෙනාපි**– එ දෙකින් මැ; **විරතත්තා**– විරක්ත හෙයින්; **අභිරමෙය්‍ය**–ඇලවා ද, සන්තොෂ කෙරේ දෑ යි සේයි **මාදිසං එවං පරිචරන්තියා තස්සා යා අයං පාරිචරියා නාම පාරිචරියානං එතං අග්ගං**, එසා අග්ගාති යොජනා. **පාරිචරියාය වණ්ණං** චීවරාදිහි **වත්ථුකාමෙහි භාසන්තස්ස අනාපත්තීති** යොජනා කාතබ්බා.

## අත්තකාමපාරිචරියං චතුත්ථං.

---

**නත්ථීති**–'ඉත්ථියා වා'ති ආදිසු; **ජායාභාවෙ වා**–තිබ්ඩභාර්‍යාභාවයෙහි වේවයි; **ජාරභාවෙ වා**–මිථ්‍යාචාරභාවයෙහි වේවයි; **අස්සාති**–'ජායත්තනෙ වා ජාරත්තනෙ වාති' අස්ස පදභාජනෙ; **ජාරී භවිස්සසි** යන්නෙන් සවාමින් ඇති මාගම කීහු. **යා අයං තං ඛණිකාති** වුච්චති යි යොදනු. **මුහුත්තිකා භවිස්සසි** යන්නෙන් සවාමින් නැති මාගම කීහු.

**පතිගණ්හාතී**–'සාධු උපාසකා' යනාදි ක්‍රමයෙන් වචනභෙද කොට හෝ සීසකම්පනාදි විසින් හෝ පිළිගණී ද; **වීමංසති**–මෙසේ පිළිගත් හසුන් ඒ මාගම තමහට හෝ ඈව එකාන්තයෙන් නො වරදවා කියන මවුපිය ඈ යමක්හට හෝ කියා ද; **අන්තෙවාසිකං පච්චාහරාපෙති**–මෙසේ හැරූ කී හසුන් අතැවැස්සා ලවා ඒ මාගම ගිවිස්ස ද, නො ගිවිස්ස ද, ලජ්ජායෙන් නො බිණුව ද එපවත් හැරූ කියවා ද; **අසඤ්චරිත්තා නාලංවචනීයාය**–සවාමිහු විසින් නො හරණ ලද්දිය තබා. "ධනක්කීතා නාම ධනෙන කිණිත්වා වාසෙතී"යි වදාළ හෙයින් භාර්‍යාව සඳහා මිළ වූ හෝ බොහෝ ධන දී ගන්නා

ලද්දී **ධනක්කීතා** නම්. **ඡන්දවාසිනීති ආදීසු** යන්නෙහි ආදි ශබ්දයෙන් භොගවාසිනී, පටවාසිනී, ඔදපත්තකිනී, ඔභතචුම්බටා, දාසී භරියා, කම්මකාරී ච භරියා, ධජාහටා, මුහුත්තිකා ය යන අෂ්ටවිධ භාර්යාවෝ ගෘහිතයෝ යි.

"ඡන්දවාසිනී නාම පියො පියං වාසෙති" යි වදාළ බැවින් තමා විසින් ඉස්තාලදකල පුරුෂයා විසින් පසුවැ ඉස්තාලද්දී[1] ඡන්දවාසිනී නම්. "භොගවාසිනී නාම භොගං දත්වා වාසෙති"යි වදාළ බැවින් උදුක්ඛලමුසලාදි ගෘහොපකරණ ලදින් භාර්යාභාවයට යන ජනපදිකාස්ත්‍රී භොගවාසිනී නම්. "පටවාසිනී නාම පටං දත්වා වාසෙති" යි වදාළ නිවාසනමාත්‍රයක් හෝ පාරුපණමාත්‍රයක් හෝ ලදින් භාර්යාභාවයට යන දරිද්‍රස්ත්‍රී පටවාසිනී නම්; "ඔදපත්තකිනී නාම උදපත්තං ආමසිත්වා වාසෙති"යි වදාළ 'ඉදං උදපත්තං විය සංසට්ඨා අභෙජ්ජා හොථ'යි කියා එක් දියපතක් පිරිමිහු හා එක් කොට හස්තාවතාර කරවා භරියා කැරවූ මාගම් ඔදපත්තකිනී නම්. "ඔභත චුම්බටා නාම චුම්බටං ඔරොපෙත්වා වාසෙති"යි වදාරණලද හිසින් සුම්බුළු බහා තබා භාර්යාභාවයට උපනීත කාෂ්ඨහාරිකාදිස්ත්‍රී ඔභත චුම්බටා නම්. "දාසි නාම දාසී චෙව හොති භරියා ච"යි වදාළ භාර්යා කොට වසන ඔ ම දාසී වෙව භාර්යාය යි කියනලද. 'කම්ම කාරී නාම කම්මකාරී චෙව හොති භරියා ච' යි වදාළ ප්‍රධානස්ත්‍රී නිරපෙක්ෂ වැ ගෘහකාර්යභාරපරිහරණයා කරවා භාර්යාභාවයට එළවූ බැළයට මෙහෙ කළ මාගම් කම්මකාරී ච භරියා යි කියන ලදූ. "ධජාහටා නාම කරමරානීතා වුච්චති"යි වදාළ කොඩි නඟා යන සෙනඟ හා ගොස් පරවිෂය විලොප කොට පැහැර ගෙණ ඇවිදින් භාර්යාභාවයට උපනීත ස්ත්‍රී ධවජාහෘත නම්. "මුහුත්තිකා නාම තංඛණිකා වුච්චති"යි වදාළ අචිරකාලයක් සංවාසයට තැකූ මාගම මුහුත්තිකා නම් වෙයි යන මොවුන් අතුරෙහි; **අඤ්ඤතරෙන ආකාරෙන**-අන්‍යතර ආකාරයකින්;

**මාතුරක්ඛිතා** නම් පුරුෂයන් හා සංවාස නො කට හැකි සේ මව විසින් රක්නාලද්දී; **අඤ්ඤං පිතුරක්ඛිතාදිසු** යන්නෙහි **ආදි** ශබ්දයෙන් මාතාපිතුරක්ඛිතා, භාතුරක්ඛිතා, භගිනිරක්ඛිතා, ඤාතිරක්ඛිතා, ගොත්තරක්ඛිතා, ධම්මරක්ඛිතා, සාරක්ඛා, සපරිදණ්ඩා යි කියනලද අෂ්ටවිධ ස්ත්‍රීහු ගෘහිතයෝ යි. පිතුරක්ඛිතාදීන් කෙරෙහි දු යටැ කී නියෙන් මැ දත යුතු. එහි **කෞණ්ඩින්‍යාදි** යම් ගොත්‍රයෙකැ උපන්නී එම ගොත්‍රයෙහි උපන්නන් විසින් රක්ෂා කරණලද්දී, ගොත්‍රරක්ෂිතා නම් වේ. වදාළේ මැ යැ:- "ගොත්ත රක්ඛිතා නාම සගොත්තා රක්ඛන්තී"ත්‍යාදි. එක් ශාස්තෘකෙනෙකුන් උදෙසා පැවිදි වූවන් විසින් හෝ එකගණපර්යාපන්නයන්

---

1. සපතිස්තාලද්දී.

විසින් හෝ රක්නාලද්දී **ධම්මරක්ඛිතා** නම් වේ. වදාළේ මැ යැ:– 'ධම්මරක්ඛිතා නාම සහධම්මිකා රක්ඛන්ති'ත්‍යාදි. "සාරක්ඛා නාම ගබ්භෙපි පරිග්ගහිතා හොති මය්හං එසාති, අන්තමසො මාලාගුළපරික්ඛිත්තාපි"යි දෙශනාරොපිතස්වරූපා සාරක්ඛා නම්. "සපරිදණ්ඩා නාම කෙහිචි දණ්ඩො ඨපිතො හොති යො ඉත්ථන්නාමං ගච්ඡති එත්තකො දණ්ඩොති" යි දෙශිතස්වරූපා සපරිදණ්ඩා නම් යන මොවුන් අතුරෙහි;

**විසඞ්කෙතං හොති**–සඞ්කෙත වැරැද්දේ වෙයි; සඟවෙසෙස් නො වෙයි යනු තාත්පර්‍ය්‍යාර්ථයි. **ඉතො**– මේ අඞ්ගත්‍රයයෙන්; **කිඤ්චවන වා**–උක්තසඞ්කෙත්‍යාදියට කටයුතු භක්තපචනාදි කෘත්‍යයෙන්; **ගච්ඡන්තස්ස**–මාගමුන් පිරිමිනට පිරිමින් මාගමිනට දෙන හසුන් පතිගණ්හනාදි කොට යන්නාහට තිරුවැනැ යි සේයි. **න නාලංවචනීයතා**–සවාමිහු විසින් ඇය මත්තෙහි නිග්‍රහසඞ්ග්‍රහ වශයෙන් කිසිවක් නො කිණියහැකි වැ නො හලබව ය. **පණ්ණත්තිං වා**–සඤ්චරිත්තසිඛපද නැමැති පණත් හෝ; **අලංවචනීයභාවං වා**–නො කිණිය හැකි වැ හලබව හෝ; **ඉත්ථන්නාමා නාම**–මෙනම් මාගම්; **ආගමිස්සති**–ධර්මශ්‍රවණාදි පිණිස එන්නී ය. **චිත්තං ජානෙය්‍යාථ**–සිත්අසර දන්නේ යි. **අසැඳැපු වා**– අතික්තෙනකට හෝ; **ඛිණාසවස්සාපි**–රහත්හට ද; සෙසු පුහුදුනන්ට ම කිය යුතු කිමැ යනු සම්භාවනාර්ථ අපි යන්නෙන් ද්‍යොතිත යි. **තදුභයං**–පණත් අලංවචනීයබැව්; **සමාපජ්ජන්තස්ස**–සඤ්චරිත්තං සමාපජ්ජන්තස්ස; **ජානනවිජානනා**–දෙක ම දන්නා සිත හා සමඟ;

## පඤ්චමං.

---

**තස්මාති**–යස්මා එවං වුච්චති; **එත්ථ ච**– මේ උපකරණයාවස්ථායෙහි වනාහි; **සභාගට්ඨානෙ** යන්නට අපිපද යි **කම්මකරණට්ඨානෙ** යනු. **මිගලුද්දකාදයො පන**– මිගලුද්දකමච්ඡබන්ධකාදීහු; **සකකම්මං**–මෘගමාරණාදිස්වකර්ම; **එමහ**–සාමහය; **තුලා**–තලාත; **පිට්ඨසඞ්ඝාට**–දොරබා; **ආලෙපොකාසං ඨපෙත්වා** යි සබඳ. **අවසෙසලෙපොකාසෙ**–අවශෙෂලෙපාවකාශයන්; **කුණ්ඩකිසඩිං**–භිත්තිය හා එක් කොට; ඇතුළෙහි ගහන්නෝ උර්ධ්වමුඛ කොට සුණු මැටි ගහති. එහෙයින් උල්ලිත්ත නම් වේ. පිටත්හි සුණු මැටි ගහන්නෝ අධොමුඛ කොට ලිම්පනය කෙරෙති. එහෙයින් අවලිත්ත නම් වේ. අන්තො උද්ධමුඛා ලිත්තා=උල්ලිත්තා. බහි අධොමුඛා ලිත්තා=අවලිත්තා. මෙසේ මැ ඇතුළතින් පිටතින් ලිප්ත හෙයින් උල්ලිත්තාවලිත්ත නම් වේ.

**අත්තනා**–තමා; **උද්දෙසො**–කියනලද්දේ; **එතිස්සා** කුටියා'ති අත්තුද්දෙසා කුටි. **බහිකුඩ්ඩෙ**– පිට භිත්තියෙහි; **පඨමං දින්නං**–පළමු කොට ගැසූ; **මහාමත්තිකපරියන්තං**– කටුමැටි කෙළවර; **සෙව පරිච්ඡෙදොති** සො එව මහාමත්තිකාලෙපො පරිච්ඡෙදො; **අබ්භන්තරිමෙන** අබ්භන්තරෙන–ඇතුළතින්; **එසෙව** ම-මෙ කිළියෙහි ද; **දීඝතො හාපෙත්වා තිරියං තිරියතො වා හාපෙත්වා දීඝං කෙසග්ගමත්තම්පි වඩ්ඪෙතුං න වට්ටතීති** යොජනා. **පමාණයුත්තො මඤ්චො**– නවවියත්හැද; **පච්ඡිම කොටියා**–පශ්චිමප්‍රමාණයෙන්; **යස්මා කුටිසඞ්ඛං න ගච්ඡති තස්මා**, වට්ටති–නො දෙසුවත් වටී.

**තං**–ඒ කුටිවාසතුව; **සොධෙත්වා**–ශුද්ධ කරවා; සමතල කරවා තබා; **පදභාජනෙ වුත්තනයෙනෙව**–සඟමැදට එළඹ මහලු සඟුන් මැද උක්කුටිකාසනයෙන් බද්ධාඤ්ජලි වැ හිඳ "අහං භන්තෙ සඤ්ඤාචිකං කුටිං කත්තුකාමො අස්සාමිකං" යනාදීන් පදභාජනියෙහි කී නියායෙන්; **යාචිත්වා**–කුටිවාසතුඅවලොකනයට ආරාධනා කොට; **සබ්බපරියාපන්නා සබ්බෙ වා**–සඞ්ඝපහොනක වූ සියලු භික්ෂූන් හෝ; **සඞ්ඝෙන වා සම්මතා** මෙ **තෙ භික්ඛූ**–සඟුන් විසින් ඥත්තිදුතියකම්මවදන් කියවා සම්මත දූත් දෙතුන් දෙනකු හෝ; **තත්ථ**– ඒ කුටිභූමියට; **වත්ථුදෙසනත්ථාය**-සාරම්භාදි බලා කුටිවාසතු දෙසන පිණිස; **නෙතබ්බා**- එළවියයුතුවෝ. **කිපිල්ලිකාදීනං ආසයාදීති** යන්නෙහි ආදිශබ්දයෙන් උපචිකානං වා ආසයො හොති, උන්දූරානං- පෙ-, අහීනං–පෙ-, විච්ඡිකානං -පෙ-, සතපදීනං -පෙ-, හත්ථීනං–පෙ-, අස්සානං ..පෙ-, සීහානං -පෙ-, ව්‍යග්ඝානං වා ආසයො හොතීත්‍යාදි ගෘහිත යි. **යාචිතෙහි**– කුටිවාසතුදෙශනාවට යාචිත මහණුන් විසින්;

**උපකරණත්ථං**– දරුසම්භාරෙපකරණ පිණිස; **දුක්කටානි** යනු මෙහි සාරම්භඅපරික්කමනාඛ්‍ය අඞ්ගවය සහිත වූව දෙ වෙයි. එකක් වූව එකෙක් ම වෙයි යනු අර්ථ යි. **උභයවිපන්නා**–උභය විපන්න වූව හොත්; **භාරබද්ධං**–දෙරබාව හෝ; **තිණකුටි** නම් මත්තේ මැටියෙන් සොයා එ මැටි රක්‍ෂා කරණ පිණිස මත්තේ තණයෙන් සොයන ලද්දී;

ඡට්ඨං.

---

මහන්තභාවො එතස්ස විහාරස්සාති=මහල්ලකො විහාරො. **අස්සාති** විහාරස්ස; **තදත්ථදස්සනත්ථං**– සස්වාමිකාර්ථය දක්වන පිණිස; විහරන්ත්‍යස්මින්ති=විහාරො. **සෙසං සබ්බං**–"විහාරං අත්තු

දෙසං" යනාදි සමුඨාන හා සමඟ සෙසු සියල්ල; **චේතියරුක්ඛං**-බොහෝදෙනා විසින් පූජිත දෙවොලෙහි සිටි වෘක්ෂය යි. **ජනක සෙළරං ආරබ්භ**-අභිනිෂ්ක්‍රමණ කරණ දවස් කැටි වැ ආ ජනක නම් අමාත්‍යසථවිරයන් අරබයා යි.

සත්තමං.

---

**උප්පන්නෙ දොසෙ**-ද්වේෂය උපන්කල්හි; **පුග්ගලො**-පුද්ගල තෙමේ; **තෙන**-ඒ; **උප්පන්නදොසෙන**-උපන්ද්වේෂයෙන්; **දූසිතො හොති**-දූෂිත වේ ද; **පකතිභාවං ජහාපිතො**- සෞම්‍යභාවය හෙවත් පරිශුඞභාවය හෙවත් පරිශුද්ධභාවාඞ්ගය ද්වේෂයා විසින් හළයේ වේ ද; මෙහි ද්වේෂය නම්, **ලොභො දොසො මොහො** යන හෙතුත්‍රයයෙහි ඇතුළත් වන හෙතුධර්මයෙකැ යි දත යුතු. දෞර්මනස්සවෙදනායෙන් වනැ යි සේයි. **දුට්ඨො දොසොති එතං එකස්ස පුග්ගලස්ස. නප්පතීතො**-සතුටු නුවූයේ; **පීතිසුඛාදීහි විවජ්ජිතො**-ප්‍රීතිසුඛාදීන් අපගත වූයේ; **න අභිසමො**-නො පැතිරෙණලද යන අර්ථ යි. සං පාරාජිකං **එතෙසං මූලානං අභාවතො** යන සබදි. **ඉදං පාරාජිකං අමූලකං නාම. තං පනාති** පාරාජිකං; **එතං**-ඒ ආපන්නානාපන්නභාවය; **ඉධ**- මේ සිඛයෙහි; **එත්ථ චාති** අදිට්ඨන්ති ආදිසු; **අත්තනො වා පරස්ස වා දිට්ඨසුතමුත වසෙන චෙතසා අපරිසඞ්කිතං** යනුයෙහි එබඳු කාමීක්ෂම තැනෙකැ මාගම හා පැවිදියන් හා දැක, ව්‍යතික්‍රම කළහ යි ගැණුම් දිට්ඨපරිසඞ්කිත නම්. සාවාටකුඩ්‍යාදීන් ව්‍යවහිත පැවිදියන් කෙරෙහි මාගම හඬ හසා අතික් විසඳෑ පිරිමියෙකු ඇතිබව් නො දැනැ ව්‍යතික්‍රම කළහ යි ගැණුම් සුතපරිසඞ්කිත නම්. විහාරපරියන්තයෙහි ලදරූමාගම් පිරිමිනීත් පුෂ්පගන්ධසුරාදීන් අනුභව කොට ගියතැන් දැක එහි ගඳ අසා 'මේ කාගේ ක්‍රියාවෙක් දෝ හෝ' යි පරීක්ෂා කරන්නහු විසින් දගබ මල් ගඳ පිඳු අරිටිපී ගඳ හැනු පැවිජිකෙනෙකුන් වෙරගඳ අසා "මොවුන්ගේ කාමීමාතා වන්නේ වෙ"යි කරණ සැක මුතපරිසඞ්කිත නම් වේ.

**භික්ඛුනො අනුරූපෙසු**-උබ්භජානුමණ්ඩලිකාදි භික්ෂුණින්ට මැ නියත පස්පරිජි මිස භික්ෂුහට අනුරූප අවශිෂ්ට එකුන්විසිපරිජියන් කෙරෙහි; **එකූනවීසතියා අඤ්ඤතරෙන** යනු බුඞාභිප්‍රාය ගෙණ, විනයපාලිවාචක ආචාර්යයන්ගේ මත ගෙණ කීයේ යි. **පදභාජනියෙහි චතුන්නං අඤ්ඤතරෙන** යනු පාමොක්උදෙස්හි ආ මාත්‍රය ගෙණ වදාළේ යි. එයින් ම කීහ, **විනයඅටුවා** ගැටපද විවරණයෙහි:- "චතුන්නං අඤ්ඤතරෙනාති පාතිමොක්ඛුද්දෙසෙ ආගතෙ ගහෙත්වා වුත්තං. ඉතරෙ අඤ්ඤතරෙනාපි **අනුඩං**

සෙනාසනස්ස සඞ්ඝාදිසෙසො වාති නො තකෙකාති ආචරියො"ති. **තං පන අනුද්ධංසනං කරෙති** යනු සම්බන්ධ යි. **තස්ස**– ඒ අනුද්ධංසන යෙහි; **කාසු**– චතුසු චොදනාසු; **චක්ඛුසංදස්සනා නාම**– පුහුලා දක්වීම නම්; "**ත්වං මෙථුනං ධම්මං පතිසෙවි**"ති ආදිනා නයෙන **පවත්තා** සංදස්සනා. ආදිශබ්දයෙන් අදින්නාදනාදි ගැණේ; **සීසං න එති**–ඇවැත්බවට නො පැමිණේ. අස්සමණො සිති ආදි යනුයෙහි ආදිග්‍රහණයෙන් කොණ්ඩොසි නිගණ්ඨොසි සාමණෙරොසි තාපසොසි ගහට්ඨොසි ජෙට්ඨබ්බතිකොසි උපාසකොසි දුස්සීලො පාපධම්මොසි අන්තොපූති අවස්සුතොසිත්‍යාදි ගෘහීත මේ ආදි වචනයන් හා; **සවිඛෙ**–කීකල්හි; **අභිවාදන**–වැඳීම්; **පච්චුට්ඨාන**–හුනස්නෙන් නැගීම්; **අඤ්ජලිකම්ම**–ඇඳිලි බැඳීම්; **සාමීචිකම්ම**–මඟ දී පහ වීම් ආදි ශ්‍රමණසාරූප්‍ය වත; **බීජනිකම්ම**– වීජනිපත්‍ර සැලීම ය. **තං**–අකරණං; **ආපත්ති පන සීසං න එති**- ඇවැත් වනාහි මුදුන් පත් නො වේ. **තෙනාති** චොදකෙන; **සමීපෙ ඨත්වා**–දෙළොස්රියනකින් දුරු නො වැ සිට; **හත්ථමුද්දාය**–මුද්‍රාපාශක ඇ[1] විසින්; **අයං අනුද්ධංසෙති නාම**–මේ චොදනා කරන්නේ නම් වේ.

**අපනෙය්‍යං**–පහ කෙළෙම් නම්; **අපි එව නාම**– යෙහෙකි; "**සචෙ අහං ඉමං පුග්ගලං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යං.**"**වන**– **එකන්තෙන**; **සාධු අස්ස**– සාධු භවෙය්‍ය; **එතෙන අවසෙසා සත්ත අධිප්පායා පටික්ඛිත්තා හොන්තීති** සම්බන්ධො. **අනුවිජ්ජකෙන**–පිළිවිස්නා විනයධරයා විසින්; **පටිච්ච තිට්ඨති**–පිළිගෙණ සිටී ද; **පටිජානාති**–ගිවිසී ද; **අමූලකභාවස්ස**-ඇවැත්මුල් නැති බව; **සමථෙහි**–සම්මුඛාවිනයාදි සත් සමථයෙන්; **අධිකරණීය භාවෙන**–සන්හිඳුවියයුතු බැවින්; **සමථා**–සත්තසමථයෝ; **යං හි**–විවාද අනුවාද කිච්ච ආපත්තිසඞ්ඛ්‍යාත යම් අධිකරණයක් පිණිස පවතිද්ද; **තං අධිකරණං**.

**දුක්කටං ච**–අවකාශ නො කැරවීමෙන් දුකුළා වේ. **සො**–ආණත්තො; **තස්සාති** ආණාපකස්ස; **තං** චුදිතකං. **චොදාපකස්සෙව** න චොදකස්ස; **වුත්තනයෙනාති** වාචාය වාචාය; **සොපි**–ඉගැන්වූයෙන් චොදනා කරණ අතික් ප්‍රයොග කරණ පුහුල් ද; **ද්වින්නම්පි ජනානං**–ප්‍රයොජ්‍ය ප්‍රයොජක දෙදෙනාහට මැ; **තථෙවාති** වාචාය වාචාය; **කම්මාධිප්පායෙන**– 'මූහුට නිග්‍රහවශයෙන් කම්යක් කළ මැනව' යන අභිප්‍රායයෙන්; **සත්තවිධම්පි කම්මං**–තජ්ජනීය, නියස්ස, පබ්බාජනීය, පටිසාරණීය, තිවිධුක්ඛෙපනීය සඞ්ඛ්‍යාත සප්තප්‍රකාර කම්; **ඨපනක්ඛෙත්තාතීති** රෙකාරෙ

1.. මුකනපාසාන්‍යා–බොහෝ.

අනාතික්කන්තො; වත්ථුස්මිං-චෝදකයා විසින් කියනලද ඒ වචනය; ඔසටෙ-සඟමැදැ කීකල්හි; අජෙසන්තං න වාති= නව එතං අයි ඉති-තට මුහු කියන දෝෂය ඇද්ද? යි; අනුවිජ්ජනාධිප්පායෙන-පුළුවුස්නා අභිප්‍රායයෙන්; ඔදිස්ස යනුවට අධිපද නියමෙත්වා යනු; උපසම්පදෙහානාති සඞ්ඝුපගමනං-උපසම්පත්ත ය යි ගිණී යෙන බව යැ.

## අඤ්ඤං.

අඤ්ඤභාගස්ස-දබ්බමල්ලපුත් මහතෙරුන්ගේ මනුෂ්‍යජාති භික්ෂුභාවයෙන් වෙන් වූ තිරච්ඡානජාතිඡගලකභාවයාගේ; ඉදං-මේ ඡගලක වස්තුව හෙවත් මේ එළු; අඤ්ඤභාගියං-අඤ්ඤභාගිය නම් වේ. වා-නොහොත්; අඤ්ඤභාගො- ඒ තිරච්ඡානජාති ඡගලකභාවසඞ්ඛ්‍යාත වෙන් වූ භාගය හෙවත් කොටසය; අස්ස-මේ ඡගලකයාහට වූ යි; අඤ්ඤභාගියං- ඡගලක තෙමෙ අඤ්ඤභාග ඇත්තේ නම් වේ; වත්ථු යනුයෙහි අධිපද අධිඨානං යනු; අට්ඨුප්පත්තියං- ශික්ෂාපදෙත්පත්තියෙහි; දබ්බො මල්ල පුත්තො නාමාති-දබ්බමල්ලපුත්ත නමැ යි; යො සො ඡගලකො වුත්තො-යම් මේ එළුවෙක් කියනලද ද; සො-ඒ එළු; ආයස්මතො දබ්බමල්ලපුත්තස්ස-ආයුෂ්මත් වූ දබ්බමල්ලපුත්හුගේ; මනුස්ස ජාති චෙව-මනුෂ්‍යජාතිය ද; භික්ඛුභාවො ච-භික්ෂුභාවය ද යන; යො අයං-යම් මේ; භාගො කොට්ඨාසො පක්ඛො-භාගයෙක් කොඨාසයෙක් පක්ෂයෙක් ඇත් දැයි, එකාත්ථී යි. තතො- ඒ මනුෂ්‍යජාති භික්ෂුභාව සඞ්ඛ්‍යාත දබ්බමල්ලපුත් කොටස්හු කෙරෙන්; අඤ්ඤස්ස-වෙන් වූ; තිරච්ඡානජාතියා චෙව-තිරච්ඡාන ජාතිය ය; ඡගලකභාවස්ස-ඒ ඡගලකභාවය යන; භාගස්ස පක්ඛස්ස කොට්ඨාසස්ස-භාගයට පක්ෂයට කොටඨාසයට; හි-යම් කාරණයෙකින්; හොති-වේ ද; තස්මා-එ කාරුණෙන්; අඤ්ඤභාගියසඞ්ඛං ලභති-අන්‍යකොඨාස නමැ යි ව්‍යවහාර ලැබේ. වා-නොහොත්; සො අඤ්ඤභාගො- ඒ පළමු වාක්‍යයෙහි විස්තර කොට කී අන්‍යභාගය; අස්ස-මේ මෙණ්ඩකයාහට; ඉති අත්ථි- යම් කාරුණෙකින් ඇද්ද; තස්මා අඤ්ඤභාගියසඞ්ඛං ලභති- එයින් අන්කොටසය යන ව්‍යවහාර ඇත්තේ නම් වේ. මයං-අපි; ඉමං-මේ ඡගලකයා; දබ්බං මල්ලපුත්තං නාම කරොමාති-දබ්බමල්ල පුත්ත නම් කරම්හ යි; වදන්තානං-කියන; තෙසං-ඒ මෙත්තිය භුම්මජක භික්ෂූන්; තස්සා නාමකරණසඤ්ඤාය-ඒ නාමසංඥා කරණයට; යස්මා ආධාරො- යම් හෙයකින් ආධාර ද; වත්ථු, අධිඨානං යනු පර්‍යාය යි; තස්මා-එහෙයින්; අධිකරණන්ති වෙදිතබ්බො-ඡගලකතෙමෙ අධිකරණ ය යි දත යුතු. තං හි

**සඞ්ඛාය**-ඒ නම් සංඥකරණයට පිහිට වූ එඑවා ම දක්වන පිණිස; **සච්චං කිර** -පෙ-, "කථං අධිකරණං අධිකරණස්ස අඤ්ඤභාගියං? විවාදාධිකරණං අනුවාදාධිකරණස්ස ආපත්තාධිකරණස්ස කිච්චාධිකරණස්ස අඤ්ඤභාගියං.-පෙ- කිච්චාධිකරණං විවාදාධිකරණස්ස අනුවාදාධිකරණස්ස ආපත්තාධිකරණස්ස අඤ්ඤභාගියං" යන පෙළින් අඤ්ඤභාගියතාව ද, "විවාදාධිකරණං විවාදාධිකරණස්ස තබ්භාගියං, අනුවාදාධිකරණං -පෙ- තබ්භාගියං, ආපත්තාධිකරණං-පෙ-තබ්භාගියං, කිච්චාධිකරණං කිච්චාධිකරණස්ස තබ්භාගියං" යන පෙලින් තබ්භාගියතාව ද දන්නා ලදී. "එකමෙකං හි අධිකරණං ඉතරෙසං තිණ්ණං තිණ්ණං අධිකරණානං අඤ්ඤභාගියං අඤ්ඤපක්ඛියං අඤ්ඤකොට්ඨාසියං හොති, වත්ථුවිසභාගත්තා. විවාදාධිකරණං විවාදාධිකරණස්ස තබ්භාගියං තප්පක්ඛියං තංකොට්ඨාසියං, වත්ථුසභාගත්තා. සෙසානිපි තථෙව" යනු අටුවා යි.

**විවාදාධිකරණාදීසු අඤ්ඤතරං සඞ්ඛාය න වුත්තං** ඉති යොජනා. **කස්මා**-කුමක් හෙයින් ද? යත්:-**අසම්භවතො**-අධිකරණයන්ගේ ගැන්මක් නැතිහෙයිනි; **මෙත්තියභුම්මජකා**-මෙත්තිය භුම්මජකයෝ; **චතුන්නං අධිකරණානං**-සතර අධිකරණයන් කෙරෙන්; **කස්සචි අඤ්ඤභාගියස්ස අධිකරණස්ස**-කිසි අඤ්ඤභාගියඅධිකරණයක්හුගේ; **කිඤ්චිදෙසං ලෙසමත්තං න හි උපාදියිංසු**-එකදෙශලෙශමාත්‍රයක් නො ගත්හු. මේ වචනයෙන් සතර අධිකරණයන්ගේ ලෙසයක් ඇත්තා සේ සිතති. **න ච චතුන්නං අධිකරණානං ලෙසො නාම අත්ථි** යුහු. **ජාතිලෙසාදයො ලෙසා**-ජාතිලෙසාදි ලෙසයෝ; **පුග්ගලානංයෙව වුත්තා**-පුද්ගලප්‍රතිබද්ධ කොට ම කියන ලදහු. .

**ජාතිලෙසාදයො** යන්නෙහි ආදිශබ්දයෙන් නාමගොත්‍රාදි ලෙශ ගත්හු. ජාති නම් ක්ෂත්‍රියබ්‍රාහමණාදිජාති ය. නාම නම් මේ සිඛපදයෙහි **එළු දබ්බමල්ලපුත්ත** නම්, එළි මිත්මෙත්තෙණ නමැයි තබා ගත් නම් සෙයින් චොදකය තබා ගත් නමුදු බුද්ධරක්ඛිතාදි නමුදු නාම නම්. ගොත්‍ර නම් **ගොතමමොග්ගල්ලානාදි** ගොත්‍ර යැ. ලිඞ්ග නම් දීඝත්වාදිආකල්පනානාත්වාදි යි, කෘෂ්ණාදිවර්ණනානාත්ව ද යන මේ යි. ආපත්තිලෙස නම් ලහුකාදිස්වරූපයෙන් තුබූ පවිති ඇවැත්; පත්ත නම් ලොහපාත්‍රාදි යි; චීවර නම් පාංශුකූලාදි යි; උපජ්ඣාය නම් චුදිතකයාගේ උපාධ්‍යායහ; ආචාර්‍යයෝ චුදිතකයාගේ ප්‍රව්‍රජ්‍යාචාර්‍යයහ; සෙනාසන නම් චුදිතකයා ම වසන ප්‍රාසාදාදි; **විවාදාධිකරණාදීනං න වුත්තානි** යොජනා. **තඤ්ච නාමං** යනු සම්බන්ධ යි. **අඤ්ඤභාගියාධිකරණභාවෙ ඨිතස්ස**- අන්‍ය කොට්ඨාස වූ ආධාරභාවයෙහි සිටි; **තස්ස ඡකලකස්ස**- ඒ

ඡකලකයාහට; **ථෙරං පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙතුං කොචි දෙසො ලෙසමත්තො හොති** යි යොදනු. **එත්ථ**- දෙස ලෙස යන මෙහි; **දිස්සති** යනුයෙහි අර්ථ **අපදිස්සති** යනු; **අස්ස**- මේ ඡකලකයාහට; **අයන්ති**-දබ්බමල්ලපුත්‍රයැයි; **වොහරියන්ති**- කියනු ලැබේ නු යි; **දෙසො**-දෙස නම් වේ. **අධිවචනං**-නාමාන්තර යෙකි. **අඤ්ඤම්පි වත්ථු**-දබ්බමල්ලපුත්‍ර ය යන මේ නාමය යම් වස්තුයෙක පිහිටියේ ද එයින් ඡකලකසඞ්ඛ්‍යාත අන්‍යවස්තුයෙහි;

**ලිස්සතීති** සේයි. **සිලිස්සති**-ඇලේ; කෙසේ ඇලේ ද? යත්:- **වොහාරමත්තෙනෙව**-ව්‍යවහාරමාත්‍රයෙන් මැ; **න තු අත්ථතො** යු තැති. **ඊසකං**-ස්වල්පමාත්‍රයක්; **අල්ලීයතීති**-ඇලේ නු යි; **ලෙසො**- ලෙස නම් වේ. **ජාතිආදීනංයෙව**- ජාත්‍යාදීන් අතුරෙන් මැ යන මෙයින් දෙසලෙස දෙදෙනා එකාර්ථබව කීවා වෙත්. මෙ මැ කීහ:- “යස්මා දෙසලෙසා අත්ථතො එකං, බ්‍යඤ්ජනතො නානං. තස්මා කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදායාති පදං උද්ධරිත්වා දස ලෙසා ජාති ලෙසොති ආදි වුත්තං”යි. **පදභාජනෙ වුත්තං** යනු සම්බන්ධ යි. **අඤ්ඤභාගියස්ස යස්ස අධිකරණස්ස**-යම් අධිකරණයක්හුගේ; **තං**- ඒ අඤ්ඤභාගිය අධිකරණය; **අට්ඨුප්පත්තිවසෙනෙව**-ශික්ෂාපදෝත්පත්තියට හෙතු වූ පූර්වපාලිකථායෙන් මැ; **යස්මා ආවිභූතං, තස්මා**- එහෙයින්; **තං**-‘අඤ්ඤභාගියස්ස අධිකරණස්ස’ යන පදය; **අවිභජිත්වා**-[1]විභාග නො කොට; **අධිකරණන්ති වචනසාමඤ්ඤතො අනුද්ධාරවසෙන පවත්තානි, යානි චත්තාරි අධිකරණානි**-යම් සතර අධිකරණ කෙනෙක් ඇද්ද; **තෙසං**-ඒ සතර අධිකරණ යන්ගේ; **අඤ්ඤභාගියතා ච**- අන්‍යපාක්ෂිකත්වය ද; **තබ්භාගියතා ච**-එතත්පාක්ෂිකත්වය ද;

**යස්මා අපාකටා**-යම්හෙයකින් අප්‍රකට ද; **විනයධරෙහි ඤාතබ්බා ච**-විනයධරයන් විසින් දතයුතු ද; **තස්මා**- එහෙයින්; **තඤ්ච**-තබ්භාගිය අඤ්ඤභාගියතාව ද; **අවසානෙ**- පදභාජනා වසානයෙහි; **ආපත්තඤ්ඤභාගියෙන චොදනං ච**- අඤ්ඤ භාගිය ආපත්තියෙන් චොදනාව ද; **ආවිකාතුං**- ප්‍රකාශ කරණු පිණිස; **ඉධ චාති**-ඉමස්මිං සික්ඛාපදෙ ච; **අමූලකසික්ඛාපදෙ චාති අත්ථො. තථසඤ්ඤිනො** යනුයෙහි තථසඤ්ඤ නම් සඟවෙසෙස් ඇවැත් අවදනවූ දූක පරිජිඇවැතැ යි සිතා පරිජියෙන් චොදනා කිරීම යි.

**නවමං.**

---

1. ආවිභාවිත්වා-කඞ්ඛාවිතරණී.

**අස්සාති**-'සමග්ගස්ස සඞ්ඝස්සා'ති පදස්ස; **සමානසංවාසකොති**-ලද්ධිනානාසංවාසක කම්මනානාසංවාසකයන් නැතිහෙයින් සමානසංවාසකතෙමේ; **සමානසීමායං ඨිතො**-එකසීමෙහි සිටියේ; **අයං කථං නාම භිජ්ජෙය්‍යාති**- 'මේ සඞ්ඝ කෙසේ කවරද බිඳේ දෝ?'හෝ'යි රැ දහවල් සිතා; **භෙදාය**-සඞ්ඝභෙද පිණිස; **වායමෙය්‍ය**-උපාය සොයා ද; පක්ෂපර්‍යෙෂණාදිව්‍යායාම කෙරේ ද; **තං**- ඒ සඞ්ඝභෙදකරණය; **භෙදකාරවත්ථුවසෙන**- "ඉධූපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති ධම්මං අධම්මොති දීපෙති" යනාදි ක්‍රමයෙන් ඛන්ධකයෙහි වදාළ භෙදකරවස්තු වශයෙන්; **අට්ඨාරසවිධං හොති**-අටළොස් වැදෑරුම් වේ. **තං කාරණං ගහෙත්වා** යනු සම්බන්ධ යි. **දීපෙය්‍ය චෙව**-හුවා ගෙණ ප්‍රකට කොට කියා ද; **න පටිනිස්සජ්ජෙය්‍ය ච**-ගත්පරිද්දෙන් මැ ගෙණ නො හරී ද; **යෙ**-ලජ්ජීසුපෙසල යම් මහණකෙනෙක්; **අඩ්ඪයොජනමත්තං**-"සමන්තා අඩ්ඪයොජනං භික්ඛූනං භාරො"යි බැවින් අඩයොදුනක් පමණතැන්; **ගන්ත්වාපි**-"දූතං වා පණ්ණං වා පෙසෙත්වා වදතොපි ආපත්තිමොක්ඛො නත්ථි සයමෙව ගන්ත්වා"යනාදි කී බැවින් තමා ගොස් මැ;"අගිලානානං දූරෙපි භාරො යෙව"යි කී බැවින් ලෙඩුන් සඳහා අඩයොදුන් ගත්හු. නො ලෙඩ වුව දුරට යා යුතු ය යි සේයි. **යො අයං වචනක්ඛමො වුත්තො සො** වචනක්කමො; **වචනීයො, අස්ස**-හවෙය්‍ය; **එසො ච**-'මා ආයස්මා' යනාදියෙහි වනාහි; **එකලද්ධිකො හොතු**- එක අදහස් ඇති වේවා. **අඤ්ඤමඤ්ඤසම්පත්තියා**- සමානදිට්ඨිසමානචිත්තතාසඞ්ඛ්‍යාත අන්‍යොන්‍ය සම්පත්තියෙන්; **සම්මොදමානො**-මොනවට තුෂ්ට වනුයේ; නො සමහයන් නන්සිම්හි වෙන් වෙන් වැ පාමොක් උදෙසන බැවින්, **එකතො පවත්තපාතිමොක්ඛුද්දෙසො**-එක් වැ පවත්නා පාමොක්උදෙස් ඇත්තේ යි. 'සඞ්ඝමජ්ඣෙපි ආකඞ්ඛිත්වා වත්තබ්බො' යනාදි බැවින් සඟමැද ද; **සොත්ථිභාවො තස්ස භික්ඛුනො**- ඒ මහණහට මතු සඞ්ඝභෙදයෙන් අවදනා පරිජී නොහොත් සභවෙසෙස් ඇවැත් නො අවදනා බැවින් ස්වස්තිභාව යි. **සාධාරණපඤ්ඤත්ති** යනු මෙහෙණට ආනන්තරිය කර සඞ්ඝභෙද වන හෙයින් නො වෙයි. පරක්කමණවස්තුයෙහි පැණවූ හෙයිනි.

## දසමං.

---

**තස්සෙව**-ඔහුගේ මැ; **දිට්ඨිං**-ලද්ධි; **ඛන්තිං**-ක්ෂාන්ති, කැමැති බව; **රුචිං**- අභිප්‍රාය; **ගහෙත්වා**- ගෙණ; **අනුපටිපජ්ජනකා**- අනු වැ පවත්නා; **වග්ගං** යී සේ යි. **අසාමග්ගිපක්ඛියං**-නො සමඟපක්ෂය සෙවුනා; **තස්ස සඞ්ඝභෙදාය පරක්කමන්තස්ස වග්ග**

ත්‍ථාය ච පක්ඛවුඩ්ඪිඅත්‍ථාය ච ඊතාති අත්‍ථො. **තිණ්ණං උද්ධං**-තුන් දෙනාට මත්තෙහි භික්‍ෂූහු; **න හි සඞ්ඝො සඞ්ඝස්ස කම්මං කරොති** යනු නිග්‍රහවශයෙන් කරණ කම් ගෙණ කීහු. **එකීභාවං**-ක්‍ෂීරොදකය මෙන් එක්බවට; **පදස්ථෙනා**-පදස්‍ථි හෙයින් මැ; **උත්තානමෙව**-ප්‍රකට මැ යි.

## එකාදසමං.

---

**දුබ්බචසභාවො**- දුර්වසකසවභාවයට හෙතු වූ පාපෙච්ඡාදි එකුන්විසි ධමුන් විසින් සමන්විත වැ තමා කෙරෙහි පැවැති අනුසාසනා තෙපුල් ආදරබුහුමන් ඇති වැ නො ගැන්මෙන් දුර්වසක වන බැවින් දුර්වසකසවභාව ඇත්තේ යි. **පාතිමොක්ඛස්ස**- ප්‍රාතිමොක්‍ෂයාගේ; නිදාන පාරාජිකා සඞ්ඝාදිසෙස අනියත විත්‍ථාරඛ්‍ය පඤ්චවිධ උද්දෙසානමක ප්‍රාතිමොක්‍ෂයාගේ; **අන්තො**-ඇතුළත්හි; **වචනමානෙසු**-පවත්නා සිඛපදවිශෙෂයෙහි ය යන අර්‍ථ යි. **පසාදසංවත්තනිකෙන**-පහදනුවට වැටෙන්නාවූ; **තෙන**-එහෙයින්;

## ද්වාදසමං.

---

**ගාමං වා නිගමං වා ති එත්ථ**-ගාමං වා නිගමං වා යන මෙහි; **නගරම්පි**- රජධානිය ද; **අන්තොගධමෙව**- ග්‍රාමයාගේ ග්‍රහණයෙන් මැ ඇතුළත් වේ. 'ගාමං වාති එත්ථ නගරම්පි ගාමගහණෙනෙව සඞ්ගහිතං' යනු අර්‍ථකථා යි. ප්‍රාකාරපරික්‍ෂෙප නැති ආපණසහිත වූයේ නියම්ගම් නම් වේ. මෙ මැ කීහ:- 'අප්පාකාරපරික්ඛෙපො සාපණො නිගමොති වෙදිතබ්බො'යි. **තත්ථ පටිබද්ධ**-ඒ ග්‍රාමාදියෙහි පිළිබැඳි; **පච්චයතාය**-චීවරාදි සතරපස ඇතිබැවින්; **තං නිස්සාය**-ඒ ග්‍රාමාදිය නිසා; **පුප්ඵදානාදිහි**-පුප්ඵදානඵලචුණ්ණමත්තිකාදන්තකට්ඨවෙළුවජ්ජිකාජඞ්ඝපෙසනිය යෙන් යන අර්‍ථ යි. **කුලදූසකො**- සැදැහැසපත් කුලන් ලාභ නිසා පුප්ඵදානාදීන් සගෙණෑ එසේ නො කරණ ලජ්ජීසගුන් කෙරෙහි කුලන්ගේ සැදැහැ දුස්වන බැවින් කුලදූසක නම් වෙයි යු තැති. **මාලාවච්ඡරොපනාදයො**-කුලන් සගන්නට මල්රුක් රොපනාදි; රොපාපන සිඤ්චන සිඤ්චාපන ඔචිනන ඔචිනාපන ගන්ථන ගන්ථාපන යන මෙ ගෘහිත යි ආදිශබ්දයෙන්. **පාපසමාචාරා**-ලාමකආචාරයෝ; **ඉමිනාති**-ඉමිනා පාලිවචනෙන; **පබ්බාජනීයකම්මාරහතං දස්සෙති**. භගවා. **යස්මිං ච විහාරෙ වසති** යනු ගමින් පිටත වෙහෙර ගෙණ කීහු; ගම වෙහෙර ගම්හි මැ ගැණෙන බැවින්. **ඡන්දගාමිතාදීහි පාපනවත්ථුස්මිං**- ඡන්දගාමිතාදි සතර අගති ගමනින් යොජන වත්හි;

## තෙරසමං.

---

**පඨමං ආපත්ති**-පළමු කොට ඇවැදම. **එතෙසන්ති**-මෙ ධර්මයන් නවදෙනාට තු සි; **පඨමාපත්තිකා**-ප්‍රථමාපත්තික නම් වෙත්. **ඉතරෙ පන යාවතතියකාති වෙදිතබ්බා** යනු සම්බන්ධ යි. **ඉතරෙ පන**-අනික් සතර ධර්මයෝ වනාහි; **තතියෙ ච චතුත්ථෙ ච දිවසෙ හොන්ති**-තුන්වන සතරවන දවස් වේ තු යි. **ජරගු**-ශවරය; **තතියකො ච චතුත්ථකො ච**- තෘතීය චතුර්ථ යි; **යථා** වුච්චති; **පටිජානාති**- මම මෙනම් ඇවතක් අවන් සබ්‍රම්සරනට නො අරෙජන විසින් මූවහ කෙරේ ද; **තත්‍ර**- 'ජනං පටිජානාති' යනුයෙහි; **ආපන්නො ච හොති**-සඝවෙසෙස්ඇවතෙක් වේ ද; **පක්ඛන්තො ච හොති**-උබෙවුනී කම් කොට පහ කාරණ නො ලදුයේ වේ ද; **අනන්තරායිකො ච හොති**-ගමනබාධක වූ රජ චොරාදි අන්තරාය නැත්තේ වේ ද; **පහු ච**- තෙමෙ සබ්රම් සරුන් කරා යන්නට අරෙජන්නට තිසි වේ ද; **තත්ථ**-මාතිකා යෙහි; **සොපි**-ඒ මහණ ද; **තත්ථ**-ඒ ඇවැත්හි; **වත්ථුවසෙන වා**-ශුක්‍රමොචනාදි ව්‍යතික්‍රම විසින් වෙවයි; **නාමමත්තවසෙන වා**-නාමමාත්‍රවශයෙන් හෝ; 'නාමමත්තවසෙනාති පාඨො නාම ගොත්තවසෙනාති ලිඛන්ති' යනු ගැටපද යි. හෙළගැටපදයෙහි ද 'නාමමත්තං'යි ගෙණ'මෙනම් ඇවතැ'යි අර්ථ ගත්හු. **අරුණං උට්ඨාපෙති**-ඇවැත් අවන් දවස් රෑ ගෙවා අරුණු නඟා ද; **තස්ස ත්ත්‍ති** යි සම්බන්ධ යි. රාජන්තරායොති ආදිසු රාජා ආගච්ඡති අයං රාජන්තරායො. චොරා ආගච්ඡන්ති අයං චොරන්තරායො. දවඩාහො වා ආගච්ඡති ආවාසෙ වා අග්ගි උට්ඨහති අයං අග්ගන්තරායො. මෙඝො වා උට්ඨෙති ඔඝො වා ආගච්ඡති අයං උදකන්තරායො. බහූ මනුස්සා ආගච්ඡන්ති අයං මනුස්සන්තරායො. භික්ඛුං අමනුස්සා ගණ්හන්ති අයං අමනුස්සන්තරායො. චණ්ඩමිගා ව්‍යග්ඝාදයො ආගච්ඡන්ති අයං වාලන්තරායො. භික්ඛුං සප්පාදයො ඩංසන්ති අයං සිරිංසපන්තරායො. භික්ඛු ගිලානො වා හොති කාලං වා කරෙති වෙරිනො වා තං මාරෙතුකාමා ආගච්ඡන්ති අයං ජීවිතන්තරායො. මනුස්සා එකං වා බහූ වා භික්ඛූ බ්‍රහ්මචරියා චාවෙතුකාමා ගණ්හන්ති අයං බ්‍රහ්මචරියන්තරායො. එවරූපෙසු දසසු අන්තරායෙසු; **සභාගං දිස්වා**-අවෛරීසභාගයා දැක; **සභාගමත්තමෙව පමාණං**- 'අවෙරිසභාගමත්ත මෙවාති' අධිප්පායො.

**න වසෙන**-නො රිසින් මැ; **අථ ඛො**-අභිප්‍රාය කිම? යත්:- **අක්ඛාමෙන අවසෙන**-සඝවෙසෙස් ඇවද පිළියම් නො කළාහට සගමොක් වරදනා බව හෙතු කොට ය යනු අභිප්‍රාය යි. **යථා පටිච්ඡන්නාය**-ති පරිද්දෙන් පිළිසෙවූ; **තත්ථ**-'නාමමත්තවසෙන වා' යන්නෙහි; **සුක්කවිසට්ඨීති**-සුක්කවිසට්ඨි යනු; **වත්ථුමෙවව**-ඇව

තට වත් වූ ශුක්‍රමොචනාදි ව්‍යතික්‍රම නමුදු වෙයි. **ගොත්තඤ්ච**- මෙ මැ සුක්කවිස්සට්ඨි ය යන ඈ තෙපුල් සවජාතියෙන් අතික් තැන කට නො යාදී රක්නා බැවින් ගොත්ත නමුදු වෙයි. මෙ මැ කීහ, ගැටපදයෙහි:- 'වත්ථු නාම වීතික්කමං අසුචිමුච්චනං. ගොත්තනාති ගා ත්‍රායත ඉති ගොත්‍රං. සවජාතිඃ සි.' **නාමඤ්ච**-ව්‍යතික්‍රමයෙන් අවන් දෙෂයට සවජාතිනාම ද වෙයි. **ආපත්ති ච**- ව්‍යතික්‍රමයෙන් අවන් ඇවැත් නමුදු වෙයි. මෙ මැ කීහ, ගැටපදයෙහි:- 'වීතික්කමෙනාපන්නාපත්ති නාමං තස්ස නාමං සි.' **සුක්කවිස්සට්ඨි කායසංසග්ගන්ති ආදිවචනෙනාපි**- මේ වස්තුගොත්‍රවයය කියන විශෙෂවචනයෙන් ද; **සඞ්ඝාදිසෙසොති වචනෙනාපි ආපත්ති ශොති වචනෙනාපි**-මේ සාමාන්‍යවචනයෙන් ද;

**තත්ථෙව**- එ සඟමැදදී මැ; **ආගතාගතානං භික්ඛූනං**- පලමුකොට අරෙජනතැනට බැහැරින් ආ ආනාක් ආගන්තුකාදි උප සපන් සඟනට; **වත්තභෙදඤ්ච**-පාරිවාසිකක්ඛන්ධකයෙහි පාරිවාසිකයනට වදාළ සුවාතුවතින් යම් වතක් බිඳීම ද; **රත්තිච්ඡෙදඤ්ච**- එකසෙනස්නෙහි පුවතක්පුගුලකු හා අරුණු නඟනවිසින් කරණ සහවාසයෙන් හෝ, පුවතක්සඟුන් පියා හුදකලාවාසය කිරීමය යන විප්පවාසයෙන් හෝ, ආගන්තුකාදීනට නො හැර දීම යන අනාරොචනයෙන් හෝ රාත්‍රිච්ඡෙද ද නො කොට; **පරිවාසං සොධෙතුං**-වෙහෙර මහතින් ආ අමුතු මහණුන් සොයා ගෙණ අරෙජ අඛණ්ඩ කොට වැස පරිවාස ශුඩ කරන්නට; **තත්ථෙව වා සඞ්ඝමජ්ඣෙ**- වත් සමාදන් කළ එ මැ සඟුන් මැදයෙහි හෝ; **එකපුග්ගලස්ස වා සන්තිකෙ**-මහසඟුන් නැඟී විසිර ගියකලැ අන්තොසීමායෙහි මැ සිටි පුගුලකු කෙරෙහි හෝ සිහි නො එළවා ඛිහිසිමැ එලෙඹිකල සඳහන්වූවිගස තමා හා යෙමින් සිටි ඒ පිරිස ම එක් පුගුලකු කෙරෙහි හෝ අමුතුපුගුලකු වුව උහු කෙරෙහි හෝ අරෙජ; **පක්කන්තභාණෙ**- පුවතක්නන්හිත්; සඟ කමට නිසි තන්හි ය සි සේ යි; නොහොත් පියවිතන්හි, ඇවැත් නො අවන් තන්හි ය යි යේයි. **පච්චූසසමයෙ**-පෙරරුණෙහි; අළුයම්හි.

**පරික්ඛිත්තස්ස**-ප්‍රාකාරදීන් පිරිබෙව් කළ; **පරික්ඛෙපාරහට්ඨානතො**- විහාරපර්‍යන්තයෙහි හත්තසාලා ගිලන්ගේ ඈ සෙනස්නෙහි පිරිබෙව් ඇත එහි හෝ, නැත දියහෙමෙහි සිට මාගම් දෑමු බදුන්දෙවිදිය හෙනතැන හෝ, සෙනස්නෙන් දුරු වූ චෛත්‍යාඞ්ගණ බොධ්‍යඞ්ගණයෙහි හෝ සිට බලමැදුම්පිරිමියකු අත් පහරු බල පමණින් දෑමූ මිටියෙන් ගන්නා පහණක් හෙනතන්හි පරික්ඛෙප ස්ථාන නම්. එයින්, **ඔක්කම්ම**-පහ වැ සිට; **ගුම්බෙන**-ලැහැබින්; **වතියා**-වැටින්;

**ඉමස්මිං වත්ථුස්මිං**-මේ කථායෙහි; **චූලසුඤ්ඤතො**-'මේ පමණකලක් පිරිසුදුමි' යි කීවාහට ඔහු කී ශුද්ධදවස් අනන්ත කොට දුන්නෙන් උපසම්පන්න වූ දවස් දක්වා පිරුව මනා මහාසුඤ්ඤත පිණිස මඳ දවස් පිරුව මනා බැවින් චූලසුඤ්ඤත නමි. **රත්තිපරිච්ඡෙදං**-තමා ඇවැත් පිළිසෙවූ රාත්‍රිපරිච්ඡේදය සිහි නො කොට ගත හෙන්නාහට; **තත්ථ**-ඒ සකලෛකදෙසයෙහි; ඔධානඤ්ච සමොධානඤ්ච =ඔධානසමොධානං; තං යස්ස සො පරිවාසො **ඔධානසමොධානො**. අග්ඝෙන සමොධානං= අග්ඝසමොධානං. තං යස්ස සො පරිවාසො **අග්ඝසමොධානො**. නානාවත්ථුකානං ආපත්තීනං සමොධානං= මිස්සකසමොධානං; තං යස්ස සො **මිස්සකසමොධානො** පරිවාසො. **අන්තරාපත්තිං**-පිරිවෙස් වසන කලැ හෝ මානත් පුරණකලැ හෝ මානත්ත අබ්භානාරහ කලැ හෝ යන මිහි යම් අතුරෙකැ අතික් සඟවෙසෙස් ඇවතක්; 'මූලායපටිකස්සනෙන පරිවුත්ථදිවසෙ මානත්තාචිණ්ණදිවසෙ ච සබ්බෙ ඔධුනිත්වා' යනු අටුවා බැවින් මිහි **පරිවුත්ථදිවසෙ** යනු උපලක්ෂණ කොට 'මානත්තාචිණ්ණදිවසෙ ච' යනු දු ගතයුතු. **ඔධුනිත්වා**-මූලායපටිකස්සන විසින් මකා හැර; **සමොදහිත්වා**- පක්ඛිපිත්වා යුතැති. **අග්ඝෙන**-අග විසින්; රාත්‍රිපරිච්ඡේද විසින්.

## විනිච්ඡයමුඛමාරං.

---

**පරිවාසකො**-ත්‍රිවිධපරිවාසයෙන් එක්තරා පරිවාසයෙකින්; **ඉධ**-මේ පාලියෙහි; **යත්‍ර**-යම් සමානසංවාසසීමායෙකැ; **ඔසාරෙතබ්බො**-එලවියයුතු; ඇතුළත් කට යුතු ය යි සේ යි. **සාතිසාරා**-සප්‍රතීකාරයෝ යි. **අයං**-මේ පරිවාසාදි; **තත්ථ**-ඒ සඟවෙසෙසැ; **අනුධම්මතා**-මාර්ගානුකූලප්‍රතිපත්තිප්‍රයොග යි. **ලොකුත්තරං ධම්මං අනුගතා**-ලොවුතුරුදහම් අනු වැ පැවැත්තාවූ; අවවාදානුශාසනිය වූ; **සාමීචිධම්මතා**-ව්‍රතධර්ම යි. ලොකොත්තරධර්මානුගතප්‍රතිපත්තිධර්මය යු තැති.

## සඞ්ඝාදිසෙසකණ්ඩං.

---

**එකො භික්ඛු**-මනුෂ්‍යජාතිවිඥපුරුෂයකු නැති වැ හුදෙකලා වූ මහණ; **එකාය**-එසේ මැ එකලා ස්ත්‍රිය හා; **චක්ඛුස්ස රහො**-චක්ෂුසට අක්ඛිනිඛණනාදි නොපෙණෙනතන්හි; **සොතස්ස රහො කිඤ්චාපි ආගතො**-අජ්ඣාචාරවශයෙන් පියම් කථා නො ඇසෙනතැන ආයේ මී නමුදු; **පිහිතකවාටස්ස** යන්නෙන් අපිහිතවාර වුව තිරෝවැත් බව කී වෙයි; **වාරෙ**- චාරෙකදෙශ එළිපත හෝ තත් සමීපයෙහි හෝ; **වාදසඞ්ඝෙපි**-හුදෙක් දෙරකඩ හුන්නේ මතු

නො වේ. මහණහු හුන්තැනින් ඇතුළත්හි දෙළොස් අත් පමණ තන්හි දු; **නිද්දායන්තො**-'ඇස් විවර කෙරේ දෑ හෝ' යන ශඞ්කා ඇති බැවින්; **අන්ධො**-පධානභූතං චක්ඛුස්ස රහො යන අඟ නැත් තෙන්. **නිපජ්ජිත්වා**-සමීපයෙහි හෙවැ; **නිද්දායන්තොපි**-ගාඪ නිද්‍රාපත්ත වැ නිදන්නේ ද; මෙයින් ප්‍රමත්ත නො වැ බක්සිනි සෙනෙන්[1] පවත්නා කපිනිද්‍රායෙන් නිදන්නේ ද නිරුවැත් නො කෙරේ යනු ලැබේ. **ඉත්ථීනං සතම්පි**-විඥපුරුෂයකු අසන්නිහිත බැවින් මාගම් ශතයකුදු;

**අලංකම්මනියෙ**-කුඩ්‍යාදීන් ප්‍රච්ඡන්න හෙයින් මැ අලංකම්ම නිය වූ; **එතං ච**-**නිසජ්ජං** යන මෙහි; **යෙන වා සාති එත්ථ වාසද්දො** විකප්පත්ථො. තස්මා කාරෙතබ්බො වා පටිජානමානො, න වා කාරෙතබ්බො අපටිජානමානොති අත්ථො. **මෙථුනාදීනි ආරොපෙත්වා**-"අයේ‍යා මයා දිට්ඨො මාතුගාමෙන සද්ධිං මෙථුනං ධම්මං පටිසෙවන්තො" යනාදි ක්‍රමයෙන් මෙවුන්දම් ආරෝපණය කොට; **තෙන**-ඒ සම්පටිච්ඡනයෙන්;

**රහස්සාදෙන**-මාගම හා රහස් වැ හිඳ "හසිතලපිතකාය සංසග්ගාදි කෙරෙමි"යන තදස්සාදරාගහෙතුයෙන්; **අක්ඛිඅඤ්ජනාදිතො පට්ඨාය**-ඇස අඳුන් ගැහීමෙහි පටන්; **සබ්බපයොගෙ**-නිවාසනපාරුපණාදි හැම පියොවිහි; **නිසජ්ජාය පාචිත්තියං** යනු යෙන් සුඛසිතින් හුන්නහු කරා ආ මාගම කෙරෙහි රහස්සාද වුව නිරුවැතැ යි ගන්න.

**පඨමානියතං.**

---

**අනාපත්තිං කරොති** යනු 'අනන්ධයා කායසංසග්ගෙන් අනාපත්ති කෙරෙයි. අබධිරයා දුට්ඨුල්ලවාචායෙන් අනාපත්ති කෙරෙයි' යනු ප්‍රත්‍යෙකයෙන් යොදා දන්න. බධිරො චක්ඛුමාපි දුට්ඨුල්ලවාචාපත්තියා අනාපත්තිං න කරොති, අන්ධො අබධිරොපි කායසංසග්ගෙන අනාපත්තිං න කරොති යි ද සාධ්‍යාහාර කොට යොදනු. හැමතැන ම ප්‍රතිපක්ෂනයින් ඇවැත් කරන්නාහු මැ යි. එත්ථ කායවාචාචිත්තතො සමුට්ඨානං කථන්ති චෙ? කායසංසග්ගං හි සමාපජ්ජන්තො දුට්ඨුල්ලං භණති, දුට්ඨුල්ලං වා භණන්තො නිසීදතීති සම්භවති. දුට්ඨුල්ලමෙව වා සන්ධාය වුත්තං.

**දුතියානියතං.**

---

1. වබක්සිනිසිනි-ඔබාහෝ.

**නට්ඨං වා**-චෞරාදීන් ගැන්ම හෝ; **විනට්ඨං වා**-උපචිකාදීන් කා වෙසෙසින් නැසීම හෝ; **චීවරාසා වා උපච්ඡින්නා**ති–'අසුකස්මිං නාම කුලෙ චීවරං ලභිස්සාමි' යි චීවරයෙහි ආශාව හෝ උපච්ඡින්න ද යත; **සඞ්ඝස්ස**-සඟුන් විසින්; පඤ්චානිසංසෙ අඤ්ඤත්ථ ගන්තුං අදත්වා සඞ්ගණ්හනත්ථෙන කඨිනං. ස්ථිර මිත්‍යර්ථඃ. **අත්ථතං**– 'ඉමාය සඞ්ඝාටියා කඨිනං අත්ථරාමි' යනාදීන් අත්ථරිත ද; **උබ්භතෙ**-උද්ධෘතකල්හි; **තත්‍ර**- එ කෙළින්හි; **පඤ්චන්නං** ජනානං වට්ටති යනු පඤ්චවග්ගකරණීය හෙයින් නො වෙයි. කෙළින් අතුරණ මහණහු හා සී තියා යි. **කඨිනත්ථාරාරහස්සා**ති එත් පුබ්බකරණං ජානාති, පච්චුද්ධාරං–, අධිට්ඨානං–, අත්ථාරං–, මාතිකං–, පළිබොධං–, උද්ධාරං–, ආනිසංසං ජානාතීති ඉමෙහි අට්ඨහි අඞ්ගෙහි සමන්නාගතො කඨිනත්ථාරාරහො නාම. එත් පුබ්බකරණං නාම ධොවනවිචාරණඡෙදනබන්ධනසිබ්බනරජනකප්පකරණං. **අනුමොදම** යන බහුවචනනිර්දෙශය තමා කෙරෙහි ගෞරවයෙනි. **තෙසමෙව**-තෙහි එව.

**අනාමන්තචාර** නම් චාරිත්‍රශික්ෂාපදයෙහි කීතියායෙන් විද්‍යමාන භික්ෂුහු නො පිළිවිස අන්කුලයට යෑම යි. **අසමාදානචාර** නම් තමින් ඉටු සිවුරු නො ගෙණ වියෝ වැ විසීම යි. **යාවදත්ථ චීවර** නම් "කාලෙපි ආදිස්ස දින්නං අකාලචීවරං" යි වදළබැවින් සහසතු වැ ලැබුන සිවුරු කැමැති පමණ නො ඉටා නො විකපා තිබීම යි. **ගණභොජන** නම් අන්ත්‍යිමපක්ෂයෙන් සතරදෙනකුන් කෙරෙහි අකප්පියපවාරණයෙන් පවරණලදු ව ගැන්ම යි. **යො ච තත්ථ චීවරුප්පාදො**ති "තත්ථ කඨිනත්ථතසීමාය මතකචීවරං වා හොතු, සඞ්ඝං උද්දිස්ස දින්නං වා, සඞ්ඝිකෙන තත්‍රුප්පාදෙන ආභතං වා, යෙන කෙනචි ආකාරෙන සඞ්ඝිකං චීවරං උප්පජ්ජති තං තෙසං භවිස්සතී" ති අත්ථො.

**පක්කමනන්තිකා**-කෙළින් අතුළ මහණු චීවරකරණපළිබොධ තිමවා ආවාසයෙහි නිරපෙක්ෂ වැ වෙහෙර සීම් ඉක්මීම අන්ත කොට ඇති මාතිකා යැ. **නිට්ඨානන්තිකා**– කෙළින්අතුළස් වූ සිවුරුපිළි ලදින් ආවාස අනපෙක්ෂ වැ බිහිසීමැ සිවුරු නිමීම අන්ත කොට ඇති මාතිකා යැ. **සන්නිට්ඨානන්තිකා**–'එ මැ සිවුරු පිළියෙන් සිවුරු නො ද කෙරෙමි, මා කෙළින් අනුමෙවු වෙහෙර නො ද යෙමි' චාරිකා ගියතැනැ කළ සනිටුහන් අන්ත කොට ඇති මාතිකා යැ. **නාසනන්තිකා**-එ මැ සිවුරුපිළි ලදින් චාරිකා ගිය තැනැ කරණකල නට්ඨවිනට්ඨදඩ්ඪසඞ්ඛ්‍යාත නැසුම් අන්ත කොට ඇති මාතිකා යැ. **සවණන්තිකා**-එ මැ සිවුරු ලදින් 'සිවුරු කොට ගෙණ එමි' යි ගිය තැනැ අන්තරුබ්භාර කළබව ඇසීම

අන්ත කොට ඇති මාතිකා යැ. **ආසාවච්ඡෙදිකා**-ආවාසාලය පියා දායකයන් පැවරූ තැනැ ලැබෙමි යන චීවරාසායෙන් ගිය තැනැ නො ලැබීමෙන් ආසාවච්ඡේදය අන්ත කොට ඇති මාතිකා යැ. **සීමාතික්කමණන්තිකා**-වස් විසූ වෙහෙරින් අන්වෙහෙර ගියවු කෙළින් අතුළුවෙහෙර නො එන තෙක් බිහිසිමැ පස්මස ඉක්මීම අන්ත කොට ඇති මාතිකා යැ. **සහුබ්භාරනී**-ආවාසාලය නො පියා චාරිකා ගියහු නැවත වෙහෙර ආ කලැ දුවිධකඨිනුබ්භාර යෙන් එක්තරා එකක් සමඟ ඇති මාතිකා යැ යි; **සෙසපලිබොධාභාවං**- ආවාසපලිබෝධයාගේ අභාවය; ආවාසයෙහි ඇල්ම නැතිබව.

**පරමො පරිච්ඡෙදො**-දසාහ අධික කොට ඇති කල; **ඛොම**-කොමුසිවුරු; ඛොම නම් ගසෙකැ නම. එ ගස වැහැරියෙන් වියූ සිවුරු ද කාර්‍යයෙහි කාරණොපචාරව්‍යවහාරයෙන් 'ඛොමං'යි යුහු. **කප්පාසං** යනු දු මෙසේ මැ යි. කොස නම් තිහිරි පතැ. මෙයින් කළ සිවුරු කොසෙත නිබ්බත්තං=**කොසෙය්‍යං** යනු වේ. **සාණ** යනු ඛොම සේ මැ යි. **භඞ්ගං**[1]-මෙ මැ සතරක්හු මුසු කොට වියූ සිවුරු; කරණප්‍රකාර විසින් ලද නම්. ගසෙක් යැ යෙත් මැ. මේ පක්ෂයෙහි ඛොම සේ මැ යි. **තදනුලොමානං වා**-දුහුල් ද, එනම් දෙශයෙන් ලද නම් ඇති පත්තුණ්ණපට ද, **සොමාර**දෙශයෙහි උපන් සොමාරපට ද, චීන දෙශයෙහි උපන් චීනපට ද, සෘද්ධිවශයෙන් නිර්මිත සිවුරු ද, අනුරුද්ධමහ තෙරුන්ට දෙවඟනක දුන්නා සේ දෙවියන් දුන් සිවුරු ද යන තදනුලොමයන් අතුරෙන් හෝ; **අඤ්ඤානි** චීවරස්ස; **අධිට්ඨාතුං**-ඉමං සඞ්ඝාටිං ඉච්චාදි වක්ෂ්‍යමාණ නම් ගෙණ ඉටන්නට; **අනුජානාමි**-අනුදන්මි. **න විකප්පෙතුං**-සඞ්ඝාටිං යනාදි නමින් විකපන්නට නො අනුදන්මි. **අධිට්ඨහන්තෙන**-සිවුරු නමින් ඉටන්නහු විසින්; **තස්සානි** චීවරස්ස; **තත්‍ර**-ඒ අධිෂ්ඨානයෙහි; **සචෙ හත්ථපාසෙ හොති**-ඉදින් දෙලොස්රියනින් දුරු නුවුව; **සාමන්තවිහාරෙ වා හොති**-එදා මැ ගොස් එදා මැ එන සමීප විහාරයෙහි වී නම්; **ඨපිතට්ඨානං සල්ලක්ඛෙත්වා** යි කී බැවින් සිවුරු ඉටනකල පළමු තුබූ තැන ඇත මැනැ ම ය තැත මැනැ ම ය ඉටන් අරා; **අනතිරිත්තප්පමාණා**-උක්තප්‍රමාණයෙන් අධික නො වූ පමණ ඇත්තී; වස්සානපරියන්තයෙහි අධිෂ්ඨානවිජහනය වත් **පච්චුද්ධරිත්වා විකප්පෙතබ්බා** යනු කුමට කිවු ද? යත්:— හිම කලැ පළමු දවස් පටන් ගෙණ අනොතාදසාහයෙහි මැ වැසිසළු තියමින් පහ කොට විකැපිය යුතු ය යි කී නියා යි. පච්චුද්ධරණය

1. භඞ්ගං නාම සුත්තාදීහි පඤ්චහි මිස්සෙත්වා
කතවත්ථං-ටීකා & සමන්තපාසාදිකා.

පිණිස නො වේ. කස්පිලිසනැ ද මෙසේ මැ යි. **පාවාර** නම් පිඩාම්; **කොජව** නම් කොඳුපලසි. **සෙනාසනපරික්ඛාරත්ථාය දින්නපච්චත්ථරණෙ ච**-හඳනා පොරෝණා පිණිස හො දී හුදෙක් හැඳපුටුයෙහි හෝනා පිණිස තමා අයත් කොට දුන් පසතරණැ ද; **අධිට්ඨාති**-පිරිකරචොළ නමින් පසතරණ නමින් ඉටූ; **හීනායාවත්තනෙන**-සිල් නො පස් විකා ගිහිබවට යාමෙන්; **කාසාව ලෙබා**-[illegible] සිවුරු ද; **විනිවිද්ධෙනෙව**- විනිවිද්ධ වූයෙන් මැ යි. රක්ඛති අධිට්ඨානං; **සූචිකම්මං කත්වා**-දසදවස ඇතුළත හිදියම් කොට;

**එතස්මිං අන්තරෙ**- එදතුරෙහි, දසදවස් ඇතුළත්හි; **අකුබ්බන්තො** යනු **අතික්කාමයතො** යනුයෙහි අර්ථ යි. **පුබ්බභාගෙ**- ආපත්තිදෙසනාවට පූර්වභාගයෙහි; **අස්සාති** පාචිත්ති යස්ස; **නිස්සග්ගියම්පෙව ච**- නිසැදුන් ඇත්තේ මැ වේ. **අරුණුග්ගමනෙ**- අරුණයාගේ නැගීමෙහි; **තං**- සිවුරු; **මෙ වා බහූනි වා හොන්ති**-එකාබද්ධ නො වැ වෙන වෙන තුබූ සිවුරු වී නම්; **ඉමිනා ලක්ඛණෙන**-මේ ක්‍රමයෙන්; දෙදෙනාට තිසැදූ සිවුරු දෙනකල වනාහි එකක්හු විසින් 'ඉමං මයං චීවරං ආයස්මතො දෙම' යි දිය යුතු. **වත්ථුකිත්තනමෙව**-වස්තු කීර්තන මාත්‍රය මැ යි. **ඉමිනා ඉදං මය්හං දින්නන්ති නිස්සජ්ජිතුං න පවිදෙන්තස්ස දුක්කටං**.

**අතික්කන්තසඤ්ඤිනො වෙමතිකස්ස ච දුක්කටං**-පරිභොගං සන්ධාය වුත්තං; **අවිස්සජ්ජිතෙ විස්සජ්ජිතසඤ්ඤිනොති** කස්සචි අදිනෙන අපරිච්චජන දින්නං පරිච්චත්තං මයාති එවංසඤ්ඤිනො; **අනට්ඨෙ නට්ඨසඤ්ඤිනොති** අත්තනො චීවරෙන සද්ධිං බහූනි අඤ්ඤෙසං චීවරානි එකතො ඨපිතානි, බහූහිපි තානි චොරා හරන්ති තත්‍රෙස අත්තනො චීවරෙ අනට්ඨෙ නට්ඨසඤ්ඤී හොති. එස නයො අවිනට්ඨාදීසුපි. **අවිලුත්තන්ති එත්ථ** පන ගබ්භං භින්දිත්වා පසය්හාවහාරවසෙන අවිලුත්තන්ති වෙදිතබ්බා. ෂඩ්ආපත්තිස්කන්ධ නම්: ආජීවහෙතු උත්තරිමනුස්සධම්මාරොචන යැ, සඤ්චරිත්ත යැ, පරියායෙන් උත්තරිමනුස්සධම්මාරොචනථුල්ලච්චය යැ, පණීතභොජනවිඤ්ඤත්තිපාචිත්තිය යැ, මෙහෙණගේ අට පාටිදෙසනීය යැ, සූපොදනවිඤ්ඤත්තිදුකුළා යැ යන මේ යි. දෙඇවැත්කඳු නම් දිඨිඅපටිනිස්සජනයෙහි ඤත්තිපරියොසානයෙහි දුකුළා යැ. කම්මවදන් පරියොසානයෙහි පචිති යි. **ගණනූපගතා**-සිවුරු අතට ආතැන පටන් දිවසගණනාවට නැඟිබවය. "න තාව තං ගණනූපගං යාව න හත්ථං ගච්ඡතීති, යාව ආහරිත්වා වා න දින්නං, තුම්හාකං භන්තෙ චීවරං උප්පන්නන්ති පහිණිත්වා වා අනාරොචිතං, තාව ගණනං න උපෙති, අනධිට්ඨිතං වට්ටති. යදි පන ආනෙත්වා වා

දින්නං හොති, උප්පන්නං වාති සුත්තං, තතො පට්ඨාය දසාහමෙව පරිහාරං ලභතීති. **අකිරියාති**-කායවාචාවිඤ්ඤත්තිතො අනධිට්ඨානෙන ච අවිකප්පනෙන ච ආපජ්ජනතො අකිරියාති.

**පඨමං.**

---

**යෙන කෙනචි**-යම්කිසි සිවුරක් හා; **එකූපචාරො**-ප්‍රාකාර පරිබාදීන් පරික්ෂිප්ත වූ, එකකුලස්වාමික වී නම් එකූපචාර යැ. **නානූපචාරො**-අපරික්ෂිප්ත වූ එකකුලායත්ත නමුදු පරික්ෂිප්ත වූ නානාකුලායත්ත වී නමුදු නානූපචාර යි. **ගාමො**-එකකුටිකාදිග්‍රාම; **නිවෙසනං**-වටරක් ආදි ගැමින් පිටතගේ;නිවෙසනාදි හැම ගැමින් පිටතැ යි ගත යුතු. ඇතුළු ගම්හි වුව ගමට කී පරිහාර ලැබෙන බැවින්. **උදොසිතොති** 'යානාදිභණ්ඩානං සාලා' යි උක්තස්වරූප උදොසිත නම්. **අට්ටොති** පටිරාජාදිපටිබාහනත්ථං ඉට්ඨකාහි කතො බහලභිත්තිකො චතුපඤ්චභූමිකො පතිස්සයවිසෙසො; **මාලො**-එක්කැණිමඬුලු ගත් සිවුරුස්ගේ; **පාසාදො**-දීඝපාසාදො; **හම්මියං**-මතුයෙහි ආකාශාඞ්ගණ කොට කළ මුණ්ඩච්ඡදනප්‍රාසාද; **නාවා**-නැව යි. **සත්ථො**-ජඞ්ඝසත්ථසකටසත්ථවසයෙන් දෙවැදෑරුම් වූ සත්වාමුළු. **ඛෙත්තං**-කුඹුරු ඈ කෙත්; **ධඤ්ඤකරණං**-කල විටි. **ආරාමො**-පුප්ඵාරාමඵලාරාම; **විහාරො** යි එකසෙනස්තකුදු කියනු. **රුක්ඛමූලං**-හිරු මධ්‍යම්පිපයෙහි හැසිරෙණදවස් මැද සිටි සඳැ ඡායාව පැතිරෙණ තැනින් පිරිසුන් රුක්පා; **අජ්ඣොකාසො**-විඤ්ඣාටවි ආදි අග්‍රාමක අරණ්‍යයෙහි හා මත්ස්‍යබන්ධයන් දිය පිටින් ගොස් නැවත ගෙහි ලග්නට නො එන පමණ දුරැ සමුද්‍රවිපත යෙහි හා ලැබෙන සත්තබ්භන්තරය; මෙහැම ප්‍රත්‍යෙකයෙන් ඒකොපචාර නානොපචාර වශයෙන් විවිධ වේ. **නික්ඛෙපට්ඨානානං**-තිබියයුතු ස්ථානයන් අතුරෙහි; **හත්ථපාසාතික්කමෙ**-දෙරියන්වියතින් දුරැතන්හි; **ගිලානස්ස භික්ඛුනො**-තුන්සිවුරු පරිහරණ නොකොට ගත හෙන ගිලන්පැවිද්දහට; **තං ඨපෙත්වා**-ඒ සම්මුතිය හැර; **එකරත්තම්පි** යනුයෙහි අපි යනුයෙන් 'කිමඞ්ග පන දිරත්තාදිකං' යනු දක්වූහු. ,**විප්පවසෙය්‍ය**- වදාළ පසළොස් තැනින් පිටතැ අරුණු නැගිමෙන් වෙන් වැ වසන්නාහට; **වුත්තනයෙන**-සනිස්සග්ගියවිනයකම්මන්ති ආදිනා නයෙන;

**සන්තරුත්තරෙන**-හඳනා පොරෝණා පමණකින්; **පච්චාගන්තබ්බං**-යෙහෙන් සෙමෙන් නැවත සිවුරු තුබූතැනට ඉය යුතු. **නට්ඨො වා සීඝතරං පච්චුද්ධරිතබ්බා**-ඉතිමෙ නො යෙම්හි ධුරනිබෙව් කරන්නහු විසින් රෙගසුබ තැන-ම සිට පසිදිරිය යුතු. **ඉධ අපච්චුද්ධරණං** අකිරියා.

**දුතියං.**

---

**අත්තනො භාගපටිලාභවසෙන**-තමහට පත් කොඨාස-භාග ලැබීම් හෙයින්; **අත්තනො වා ධනෙන**-අත්තනො කප්පාසසුත්තාදිනා ධනෙන; **මාතිකානි**-මාතරෙ; ජනෙත්තියො. **එත්ථ ච**-මේ මාතිකායෙහි; අපරික්ඛිත්තස්ස පරික්ඛෙපාරහට්ඨානස්ස දුබ්බිජානත්තං දස්සෙතුං අපි ච භික්ඛුනීනන්ති ආදි වුත්තං. සචෙ විහාරෙ සන්නිපතිතභික්ඛුහි සද්ධිං එකාබද්ධා හුත්වා යොජනසතම්පි පූරෙත්වා නිසීදන්ති යොජනසතම්පි උපචාරසීමාව හොතීති අත්ථො. **භික්ඛුණීසඞ්ඝං. ආරාමප්පවෙසන**-මෙහෙණගේ අරමට වැදීම ද; **සෙනාසනපුච්ඡන**-සඟසතු දසවිධසෙය්‍යා පුච්ඡනය; **සෙනාසනගාහ**-ශයනාසනග්‍රාහය ද; ආදි ශබ්දයෙන් නිස බිදීම් ආදි ගත්හු. **මහාදීපො**-ජම්බුදීපාදි; **අන්තරදීපො**-ලඞ්කාදීපාදි;

**එවං කාතබ්බා**-එසේ මැ කතිකා කට යුත්තේ ය. **පරිච්චාගපඤ්ඤාණට්ඨානං**[1]-පරිත්‍යාගය දනෙන තැනැයි; පැණෙන තැනැයි සේයි. **ධුවකාරා**-සතතක්‍රියාවෝ; **පාකවට්ටං**-දන්වට; **වත්තන්ති**-පවතී ද; **යතො**-යම් වෙහෙරකින්; **භික්ඛූ භොජෙන්ති**-සඟුන් ගෙණ ඇරැ ගෙයි වලඳවද්ද; **සබ්බත්ථ**-හැමතන්හි ම; **එකස්මිං ධුවකාරට්ඨානෙ**-එක් සතතක්‍රියා තැනෙකැ; **ථොකතරා භික්ඛූ හොන්ති**-සඟහු මඳ වූ නම් හෝ; **එකමෙව වා වත්ථං හොති**-එක ම පිළියෙක් වී නම් හෝ; **මාතිකං**-ශික්ෂාප්‍රඥප්තිස්ථාන; **ආරොචෙත්වා**- එක්තැනෙකැ මඳ, එක්තැනෙකැ බොහෝ යැ, එක පිළි ය, ධ්‍රුවකාරස්ථාන බෙහෙව, කොයි කොයි දෙන්නෙ? යැ යි උපාසකයා පිළිවිස එකාබද්ධ වැ දෙළොස් රියනකින් දුරැ නො වැ එක්බැඳියවුන්ට;

**ඉච්ඡමානෙන**-කැමැත්තහු විසින්; **සඞ්ඝං**-සිහින්; **සොජතුං**- එක් කරන්නට; **කාලබ්භන්තරෙ**- දසදවස ඇතුළත; **සබ්බං**- මාසං අනතික්කන්තෙ අතික්කන්තසඤ්ඤිනො යන්නාදි සියල්ල.

**තතියං.**

---

**මාතිතො වා පිතිතො වා**-තමාගේ හෝ ඇගේ හෝ මවගේ හෝ පියාගේ හෝ අඹයෙහි උපන්; **යාව සත්තමයුගං**-සත්වන මීමුතුන් යුගළුව දක්වා; **අසම්බද්ධාය**-මෙ දෙ අතුරැ යම් තැනෙකුන් හා අසම්බද්ධ වූ; **කප්පං කත්වා**- කප්බිදු ඔබා; **පරිභොගසීසෙන**-'අනුභව කෙරෙමි'යි සිතිනැයි සේයි. **අංසෙ**-දසුරැයෙහි;

---

1. පරිච්චාගපඤ්ඤත්තිට්ඨානං--ගණ්ඨි.

**මජ්ඣෙ**-මුදුනෙහි; **උස්සීසකං කත්වා**-හිසැ තබා; **දහරස්ස**-තම හට ලදරු; **උබ්බන්ධනාදීසු**-ලිප් බැඳීම් ආදී; **ධොවිත්වා උක්ඛිත්ත මත්තං**-දෙව නැඟු මාත්‍ර ඇති සිවුර; **අඤ්ඤං වා**-වහන්කසු පත් පයි[1] ආදී අත්කිසි පිරිකරක්;

**චතුත්ථං.**

---

**උපචාරං මුඤ්චිත්වාපි**-උපචාරය හැර; දෙළොස් රියනකින් දුරු වැ ය යි සේ යි. **පඨමපරිස්සාවනම්පි**-පැරැහැන්පටකුදු;

**පඤ්චමං.**

---

**අඤ්ඤත්‍ර**-සෙසුකලැ; **අඤ්ඤස්ස වා ඤාතකපවාරිතෙ**-අනෙකක්හුගේ නෑපැවරුවන්; **තස්සෙව අත්ථාය**-ඔහු මැ සඳහා;

**ඡට්ඨං.**

---

අභි යන්නෙහි අත්‍ථි නැතැ යි සේ යි. පාරුපණය, **පරිභෙසි තබ්බං**-ධැමින් සෙමෙන් සෙවිය යුතු. **සන්තරුත්තරෙන චරති**-හඳනා පොරෝණායෙන් ඇවිදී නම්; දෙක ම නව දෙක විනවා නම්; **විඤ්ඤාපනපයොගෙ** යනු අචජිත්තචිවරසඟනට සවගසඟුන් සිවුරු විනවන වත් "**කථං හි නාම තුමෙහ මොඝපුරිසා න මත්තං ජානිත්වා බහුං චීවරං විඤ්ඤාපෙස්සථ**"යි සවගසඟුන් විසින් නිගෙණ මෙ සිඛ පැණවූ බැවින් කීහු.

**සෙසකං ආහරිස්සාමීති**-සෙසූ ඉතිරි කඩ පසු වැ ඇරැ දෙමි යි බොහෝ ද ගෙණ යන්නාහට ද; **සෙසකං තුය්හමෙව හොතූති වුත්තස්ස**-සෙසු ඉතිරි දෑ තුඹ ම ගන්නේ ය යි කියනලද්දහට ද;

**සත්තමං.**

---

**අපදිසිත්වා**-කියා; **හිරඤ්ඤාදිකං**-අමුරන් ආදි කොට ඇති; **සංහරිත්වා**-රැස් කොට; **වොහාරවචනං**-ආදරවචන යි. **ආයාචනෙ**-යාච්ඤයෙහි; **පරිවිතක්කෙ**-කැමැති වීමෙහි; **ආයතාදිසු**-අයම්සරස් ආදියෙහි; **සාධු**-කල්‍යාණ-පෙ- යන මොහුගේ; **ආපජ්ජන්ත චෙ** යන මොහු හා සම්බන්ධ යි. **පයොගෙ**-සූත්‍ර පයෙහිෂණාදිප්‍රයොගයෙහි; **කල්‍යාණකම්‍යතා**-අග හෙයින් බොහෝ කැමැතිබව යැ;

**අට්ඨමං.**

---

1. පොත්පයි-බොහෝ.

**අනුපඤ්ඤත්තිසදිසං**-අනුප්‍රඥප්තියක් වැන්නී; **ගච්ඡ**-එහි; **එකස්ස පඨමා කතා**-එකක්හට පෙළම කරණලද;

නවමං.

---

**රජතො**-රජහු කෙරෙන්; **භොගං භුඤ්ජිතබ්බං**-අනුභව කටයුතු බත්වැටුප් ආදි ඉසුරු; **හිරඤ්ඤාදිකං අකප්පියං**-අමුරන් රත්රන් මුතු ඈ අකැපය; **ආගමනසුද්ධිං**-වස්තුසවා මිහු විසින් කැපතෙපුලෙන් එවීම් පිරිසුදු බව; **ආගමනස්ස**-ඊම; **ආනීතං** යි **දායකයා** තමා ද දූතයා ද අළුවා කියන්න. **රජතං**-රිදී; **මුත්තා**-විදි නො විදි හැම මුතු; කුෂ්ඨරොගයට බෙහෙත් පිණිස ඉවසත් වටි. **මණි**-ජාතිඵලිකා ආදි කොට නිලපීතාදි භෙද ඇති අවිද්ධාවෙධිත හැම මැණික්; **වෙළුරිය** ද මණි හා සම විනිශ්චය යි. **සඞ්ඛො**-ධමනසක්; පුලුනා සක්. රන්බදසක් අනාමාස යි. පැන්සක් දෙවිය ද නො දෙවිය ද ආමාස යි. සෙසුසක් අඤ්ජනාදි බෙහෙත් සඳහා පාත්‍රාදි භාණ්ඩමූලභාවයෙහුදු ඉවසත් වටී. **සිලා**-රන් හා එක් කොට විරුවා කළ මුංවන්සල; සෙසුසල කර පහස්නාදි පිණිස ඉවසත් වටී. **පවාළං**-දෙවි නො දෙවි විදි නො විදි පබළු; කබලු පිළිම දගප් පියුම්පතුදු නො ද ගත යුතු. නො පැහැරිය යුතු. **ලොහිතඞ්කො**-ලේවන්මිණි; **මසාරගල්ලං**-මොහොරුගල්මිණි; මෙදෙක සව්ථා අනාමෘශ්‍ය යි.

**යුත්තපත්තකාලෙන**-සුදුසු කාලෙක්හි; **අත්ථො**- වැඩෙක්; **කප්පියකාරකො**ති කිච්චකරු; **ඉතරම්පි**-නො හමුයෙහි දැක්වූවිහු ද; **ආගමනකාරණං විනාසෙති**- "සිදිනා ආදි කළ හොත් ස ඨතින් එක් ඨෙනක් බිඳැ ගියා වෙසි යුතැනි"යනු **විනාශනය** යි. **එත්ථා**ති චොදනා ලකුණෙහි; **මුඛවෙවටිකකප්පියකාරකො නාම**-අඤ්ඤස්ස සමීපෙ ඨිතො සුත්වා 'ආහර භො, අහං අය්‍යස්ස චීවරං චෙතාපෙත්වා දස්සාමී'ති වදති, දූතො 'හන්ද භො දදෙය්‍යාසී'ති තස්ස හත්ථෙ දත්වා භික්ඛුස්ස අනාරොචෙත්වාව ගච්ඡති, අයං මුඛවෙවටිකකප්පියකාරකො; **මුඛවෙවටිකො**-තෙපුල් විකාරඇත්තේ ය යි යුතැනි. අපරෙ භික්ඛුනො උපට්ඨාකස්ස වා අඤ්ඤස්ස වා හත්ථෙ අකප්පියවත්ථුං දත්වා 'ථෙරස්ස චීවරං දදෙය්‍යාසී'ති එත්තොව පක්කමති අයං **පරම්මුඛකප්පියකාරකො**; භික්ඛුනා නිද්දිට්ඨෙසු[1] චතුසු වෙය්‍යාවච්චකරෙසු ඉමස්මිං රාජසික්ඛාපදෙ වුත්තනයෙන **පටිපජ්ජිතබ්බං**, දූතෙන නිද්දිට්ඨෙසු[1] චතුසු වෙය්‍යාවච්චකරෙසු සතක්ඛත්තුම්පි සහස්සක්ඛත්තුම්පි චොදෙත්වා

---

1. නිද්දිට්ඨ-යි හැම.

කප්පියභණ්ඩමෙව සාදිතුං වට්ටති. "අනුජානාමි භික්ඛවෙ යං තතො කප්පියං සාදිතුං, න ත්වෙවාහං භික්ඛවෙ කෙනචි පරියායෙන ජාතරූපරජතං සාදිතබ්බං පරියෙසිතබ්බන්ති වදාමී"ති වුත්තත්තා තො චෙ දෙති, අඤ්ඤං කප්පියකාරකං ඨපෙත්වාපි ආහරාපෙතබ්බං. මූලසාමිකානං කථෙතුම්පි අකථෙතුම්පි වට්ටති. අනිද්දිට්ඨෙසු පිසු කප්පියකාරකෙසු අඤ්ඤාතකඅප්පවාරිතෙසු විය පටිපජ්ජිතබ්බං. සචෙ සයමෙව චීවරං ආනෙත්වා දදන්ති ගහෙතබ්බං. නො චෙ, න කිඤ්චි වත්තබ්බං. දෙසනාමත්තමෙවෙතං 'දූතෙන චීවරචෙතාපන්නං පහිණෙය්‍යා'ති. සයං ආහරිත්වා පිණ්ඩපාතාදි අත්ථාය දදන්තෙසුපි එසෙව නයො.

අජ්ජුණ්හො භන්තෙ ආගමෙහීති අජ්ජ එකදිවසං තිට්ඨ, අධිවාසෙහීති අත්ථො. අප්පිතන්ති[1]–තිබ්බවය, කියා පිහිටුවූබව ය යි යේ යි.

දසමං.

---

චීවරවග්ගො.

---

එකෙනාපි යන්නෙහි අපිශබ්දයෙන් 'කිම්පන විහි බහූහි වා' යනු කීවා වෙත්. කොසියංසුනා–තිහිරිපකඬුඅසෙකිනුදු; අනන්තමසො–අධමාන්තයෙන්; තස්ස කරණට්ඨානෙ–ඒ ඇතිරිය එළු ලොමින් කරණතන්හි; වාතවෙගෙන නිපතිතෙනාපි–තමා රිසින් කිරීම් තිබියැ දී සුළඟින් බහා ලූයෙනුදු; කොසියංසූනි සන්ථරිත්වා– කෞශෙයාංශු අතුටැ; කාදළිකාදීහි– හුළුකැන්[2] ආදීන්; සනනබ්බනාලක්ඛණා–යම් කැමැති වෙළක් වත තාක් වඩා හිඳිනා හෝනා පමණ කිරීම සවභාව කොට ඇත්තේ යි. "සන්ථතං නාම සන්ථරිත්වා කතං හොති අවායිමං" යනු පදභාජන බැවින් වියවා කරන් නිරුවැති. විතානාදිකරණෙන–වියන්, පිරියම් කල බිමැ සිවි රක්නට අතුරණ බුමුතුරුණ, පවුරු වැනි කබතර, මඤ්චපීඨභිසි–කන්වසින් කිරීමෙහිද;

පඨමං.

---

සුද්ධකාළකානං–ජාතියෙන් හෝ රජනෙන් හෝ හුදු කළු; අඤ්ඤෙසන්ති අමිස්සිකානං–සෙසු පැහැ ඇති එළුලොම් හා නො මුසු වූවන්ගේ;

දුතියං.

---

1. ජප්පිතන්ති. 2. හුහුකැන්.

**කපිලවණ්ණානං**-කිඹුල්වණුන්ගේ; **තූලසිච්ඡා**-කිරුම් කිරු; **කිරියාකිරියං**- වුත්තපරිච්ඡේදෙන අගහණං අකිරියා, සන්ථත කරණං කිරියා.

**තතියං.**

---

**පටිලද්ධානිපි** යන්නෙහි අපි යන්නෙන් 'අඤ්ඤෙන කතං පටිලභිත්වා පරිභුඤ්ජති ආපත්ති දුක්කටස්ස'යි වදාළ දුකුළා ද නිස්සැගි වූ සන්ථත නො නිසද වලඳ ගැන්මෙන් වන දුකුළා ද සංගෘහීත යි. **පරිභුඤ්ජිතුං න වට්ටතියි** යනුයෙන් දුකුළා වන බව කිවා වෙත්. **අනෙනාති අඤ්ඤො**-පළමු සන්ථතය කළදවසින් මතු සහවුරුද්දෙන් ඇතුළත් ය යන අර්ථ යි. **ගිලානස්ස භික්ඛුනො**-සන්ථතය ගෙණ නොයා හෙන මහණහට; **සං සන්ථතසම්මුතිං දෙති**-සයතැනැ සහවුරුද්දක් ඇතුළත සන්ථත කොට ගන්නට ඤත්තිදුතියකම්මවාචායෙන් යම් සම්මුතියක් දේ ද; **අනුවස්සං**-හවුරුදු පතා;

**චතුත්ථං.**

---

**දුබ්බණ්ණකරණත්ථාය**-දුර්වර්ණ කරණ සඳහා; **යස්මිං**- යම් සන්ථතයෙකැ; **සකිම්පි**-එක්වටෙකැ ද වී නම්; **එකපස්සතො**-එක් පසෙකින්; **වට්ටං වා**-වට කොට වෙවයි; **ඡින්දිත්වා ගහිතඨානං**-කපා ගත් මුහුණට වටින්; **එකදෙසෙ වා**-එක් දෙසෙකැ එක් තැනෙකැ වෙවයි; **විජටෙත්වා**-විදහා පියා; **එවං**-මෙසේ විජට නය කොට මුසු කළකල්හි; **අසති පන**-පුරාණ සන්ථතය නැති කල්හි වනාහි; **සන්ථතවිස්සජ්ජනවත්ථුස්මිං**-ධුතඞ්ගතෙචීවරිකයන් චතුත්ථචීවරසඞ්ඛ්‍යායෙන් සන්ථත හරණවත්හි; **පඤ්ඤත්තං**-'සඞ්ඝාදෙයාවිනිපාතනෙ කාරණං නත්ථි. පරිභොගත්ථාය නෙසං දස්සාමීති'යි සන්ථතය සිවුරු නො වනබව දක්වන පිණිස පණවන ලදී.

**පඤ්චමං.**

---

**වත්ථුමත්තදීපනමෙව**- වත උපත්තියා ගෙණ හැඟවීම ය; **සහත්ථෙන**-තමා අතින්, කිසි ශරීරාවයවයෙකින්; **අසන්තෙපි**-නැතිකල්හි මැ; **තං හරාපෙතුං**-ඔහු ලවා ගෙන්වා ගෙණ යාම;

**වාසාධිප්පායෙන**-තුන්යොදනක් ඇතුළතැ හෝ හිමැ හෝ වූ වාසයෙකැ වාසය කරණු සඳහා ගොස්; **තතො පරං හරණෙ**-එහි උද්දෙසාදි නො ලදින් එයින් මතුයෙහි වූ අනෙක් තැනෙකැ ද

වාස සඳහා වැලිඳු තුන්යොදනකුදු ගෙණ යාමෙහි ද; මේ ලක්‍ෂණයෙන් එසේ මැ ඉතුදු අනෙක්තැනකට, ඉතුදු අනෙක්තැනකට දූ යි සුඛ සිතින් වැලිඳු වැලිඳු මතුමතුවට යන විසින් සියක්යොදුනුදු ගෙණ යනුවහට දෙස් නැති. **අක්‍ඛන්දං**– අනුයුත්තාදි යම් අනෙකෙකු ලවා; **ඛටභණ්ඩනති** කත්‍ා භණ්ඩං, කම්බලකොජවසත්ථාදි යං කිඤ්චි, අන්තමසො **සුත්ත**කෙන බද්ධමත්තමපි; එළලොමින් කළ බඩු; **පඨමං පවිලාභොති** වුත්තත්තා අචිත්තානිස්සග්ගපටිලාභොති පුන නියොජනං හරිතුං ලභති. **යානෙ**–ගැල් ඇ යානයෙහි; **අජානන්තස්ස** යානෙ පක්ඛිපනෙත්‍ා හරපෙති නාම, තං ලභති. **අහරණපච්චාහරණං**-තුන්යොදුන් ඇතුළත්හි මැ එ මගින් හෝ අන්මගින් හෝ නැවත ගෙණ ඒමක් නැතිබව ය; **අචිත්තකං**–පණත් නොදන්නේ හෝ දූන ද සිවුරු ඇ පිරිකර ලොම් ඇලුනු බව් නො දූනැ තුන්යොදුන් ඉක්මවා නම් රුත්නට ද මේ ඇවැත් වනුයෙන් අචිත්තක යි.

**ජඨං. සත්තමං.**

---

**කහාපණොති** සුවණ්ණමයො වා රූපියමයො වා පාකතිකො වා; පාකතිකො යි පියවිකාහවණට නම්. **ලොහමාසකොති** තම්බලොහාදීහි කතමාසකො; **දාරුමාසකොති** සාරදාරුනා වා වෙළුපෙසිකාය වා අන්තමසො තාලපණ්ණෙනපි රූපං ඡින්දිත්වා කතමාසකො. **ජතුමාසකොති** ලාඛාය වා නියාසෙන වා රූපං සමුට්ඨාපෙත්වා කතමාසකො. **යෙ වොහාරං ගච්ඡන්තීති** ඉමිනා පන පදෙන යෙ යෙ **යත්ථ** යත්ථ ජනපදෙ යදා යදා වොහාරං ගච්ඡන්ති අන්තමසො අට්ඨිමයොපි චම්මමයොපි රුක්ඛඵලබීජමයොපි **සමුට්ඨා**පිතරූපොපි අසමුට්ඨාපිතරූපොපි සබ්බො **සඞ්ගහීතො**. ඉච්චෙතං **සබ්බ**මපි රජතං ජාතරූපං ජාතරූපමාසකො වුත්තප්පභෙදො සබ්බොපි **රජතමාසකොති** චතුබ්බිධං නිස්සග්ගියවත්ථුං හොති. **ඉධ**–මෙතැනැ; **රජතනෙනව**– රිදී යැ යි මැ; **නිප්පරිග්ගහං වා**–අස්වාමිකය හෝ; **තදෙව**–[1] යට කී පරිද්දෙන් ම; අත්තනො අත්ථාය දීයමානං වා සාදිච්චි ඕතං නිප්පරිග්ගහං වා යි යුතැති. **අඤ්ඤස්ස**–ස්වාමීන්ට; **හිරඤ්ඤ**–කාවණු; **වට්ටති**–ඇවැත් නැති. **තීසු වාරෙසු** යෙන කෙනචි පටික්ඛිත්තං පටික්ඛිත්තමෙව හොති. **අසන්තබද්ධෙසූති** සිථිලබද්ධෙසු. **රූපියං** යනු රත්රන් රිදී මසු කාවණු සතරට සාධාරණ නම්. "අකප්පියනානා සඞ්ඝස්ස නිස්සජ්ජිතී න වුත්තං. යස්මා පන තං පටිග්ගහිතමත්තමෙව, න නෙන කිඤ්චි **කප්පියං** චෙතාපිතං, තස්මා උපායෙන පරිභොගදස්සනත්ථං සඞ්ඝමජ්ඣෙ නිස්සජ්ජිතබ්බන්ති වුත්තං." "සඞ්ඝ**මජ්ඣෙ**යෙව න පුග්ගලගණමජ්ඣෙ" යි යුතැති.

---

1. තදෙවාති ජාතරූපරජතමෙව-විසා.

**අඤ්ඤෙන**–ආරාමිකාදි අනෙකෙක්හු විසින්; **රුක්ඛච්ඡායාපි**–රුක්දියහෙලම නොඉක්මුනු සේවලල්ල ද; මෙයින් ඉක්මුනු සෙවන වටි. **නො චෙ ඡඩ්ඩෙන්ති** අථ නෙව ගහෙත්වා ගච්ඡන්ති න ඡඩ්ඩෙන්ති කිං මය්හං ඉමිනා ව්‍යාපාරෙනාති යෙන කාමං පක්කමන්ති. **පඤ්චඞ්ගසමන්නාගතො**– ඡන්දදොසමොහභයාගති නො යන, ඡඩ්ඩිතා ඡඩ්ඩිත දන්නා පසඟින් යුත්; **අනිමිත්තං කත්වා**–අක්ඛීනි නිමීලෙත්වා නදියා වා පපාතෙ වා වනගහනෙ වා ගූථං විය අනපෙක්ඛන්ත පතිතොකාසං අසමන්නාහරන්තෙන පාතෙතබ්බන්ති අත්ථො. එවං ජිගුච්ඡිතබ්බෙපි රූපියෙ භගවා පරියායෙන භික්ඛූනං පරිභොගං ආචික්ඛි.

**අරූපියෙන්ති** බරපත්තාදිනෙ; **රූපියසඤ්ඤිනොති** සුවණ්ණසඤ්ඤිනො; **වෙමතිකස්සාති** සුවණ්ණං නු ඛො බරපත්තං නු ඛොති සංසයජාතස්ස; **සඞ්ඝචෙතියාදීනං අත්ථාය**–මහසඟ සෑ ගණ පුහුල් සඳහා; **ගණ්හන්තස්ස**–තිසැඟිවත් ගන්නාහට ද; **මුත්තාමණී ආදීනි** මුත්තා මණි සඞ්ඛො සිලා පවාළං ලොහිතඞ්කො මසාරගල්ලං සත්තධඤ්ඤානි දසිදසං ඛෙත්තවත්ථු පුප්ඵාරාමඵලාරාමාදි; **පටිග්ගණ්හන්තෙන** ච–තමාට ද සඞ්ඝචෛත්‍යාදී පිණිස ද ගැන්මෙහි;

අට්ඨමං.

---

**කතාදිවසෙනාති** කතම්පි අකතම්පි කතාකතම්පි. තත්ථ කතං නාම සීසූපගං ගීවූපගං හත්ථූපගං පාදූපගං කට්‍යූපගං. අකතන්නාම ඝනකතං වුච්චති. කතාකතං නාම තදුභයං. සීසං උපගච්ඡතීති=සීසූපගං. යස්ස කස්සචි සීසාලඞ්කාරස්සෙතං අධිවචනං. එස නයො සබ්බත්ථ. **පරිවත්තනං**–පෙරළි කිරීම සි. **යං පරිවත්තෙන්ති**–යමක් පෙරළි කොට ගණී ද; **තස්ස**–ඒ මෙරමාගේ පෙරළි කොට ගන්නා දූය වෙවයි; **ධනස්ස වා**–තමා ඇයත්ත වෙවයි; **රූපියභාවො**–පලමු සිඛයෙහි නිර්දිෂ්ට රන් රිදී මසු කාවණුබව;

නවමං.

---

**චීවරාදීනං** යන්නෙහි ආදිග්‍රහණයෙන් චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්පච්චය චූර්ණපිණ්ඩ දන්තකාෂ්ඨ දසිකසුත්තාදී ගත්හු. **කයවික්කයන්ති** ගණුදෙනු නම්; **කයං චෙව**–ගැන්ම ද; **වික්කයඤ්ච**– දීම ද යන මේ සි. **ඉමිනා**–මෙ ගෙණ; **ඉමිනා ඉමං දෙහීති** වචනං වත්වා අත්තනො සන්තකං වා පරහත්ථං, පරස්ස

වා සන්තකං අත්තනො හත්ථං ආරූළ්හමත්තමෙව දුක්කටං. උභයං සමාපන්නො නිස්සග්ගියං. **චෙතාපෙති**-විකුණා; **පාචිත්තියං දෙසෙතබ්බමෙව**- නිසැගිපචිති දෙසිය යුතු. සුද්ධපාචිත්තිය නො දෙසන්නැ.

### දසමං.

### එළකලොමවග්ගො.

**අඩ්ඪාළ්හකොදනං**- තලඇට ලක්‍ෂයක් හෝ උද අඩ තෙලෙස්පලමක් හෝ ගන්නා මගධ නැළියෙන් දෙනැළියෙකැ සාලේ බත්; **අනුපහත**-නොකඩ; **සුධොතවිත**- මනා කොට පැහැසි; **අනුත්තණ්ඩුලං**-නොසාල්; **අකිලින්නං**-නොවිලික්සුනු; **අපිණ්ඩිතා**-කැටි නො වූ; **සුවිසදං**-සවක්; **කුන්දමකුලරාසිසදිසං**-කොඳකැකුළු රැසක් වැනි; **අවස්සාවිතොදන**-තියනා පක් බත්; **නාතිඝනො**-ඉතා බොල් නුවූ; **නාතිතනුකො**-ඉතා තුනු නො වූ; **හත්ථහාරියො**-නො වගුරුවා අතින් ගෙණ යා හැකි; **සබ්බසම්භාරසඞ්ඛතො**- සියලු කුළුබඩුයෙන් මනා කොට පිළියෙල කරණලද; **ඔදනගතිකා එව**-ප්‍රසන්නහෙයින් ඔදනගතිකයෝ මැ යි. **හෙට්ඨිමරාජිසමං තිට්ඨති**-රාජිය ඇතුළත් හා සම වැ සිටී ද; **ගිරෙන වා**- ගිරටකින් වේවයි; **ජිණ්ණකස්ස**- ගඟනසද; **සුත්තස්ස වා ගිරස්ස වා**-එ පාමුදුනෙ හසුරුවන හුය හෝ ගිරට හෝ; **ඝටසිමන්තං ඵුසති**-ගටස ගැනේ නම්; **ඵුසිතකං**-ඉතිරි වැ; **අපත්තා**-ඉටත් විකුපුන් නො පොහොනාබැවින් පාත්‍ර නම් නො වෙත්. වලදත් දෙස් නැති; **කස්මා**-යම් හෙයකින් ප්‍රමාණයුක්ත ද එහෙයින්; **සමණසාරුප්පෙන**-මහණුන්ට සරුප් වන සේ; **පක්කං**-'අයොපත්තො පඤ්චහි පාකෙහි මත්තිකාපත්තො ද්වීහි පාකෙහි'යි කී නියායෙන් පිසනලද; ද්වීහි පාකෙහි යි එකකින් කලු නොවන හෙයින් කීහු; එක් පාකයෙන් මැ කලු වූව හොත් ඉටත් පොහො යි යෙත්; **ලබ්භා**-තමා සතු කොට ලදින් පාක ද මිල ද තිමි පය දූක හෝ අසා හෝ යි සේ යි. **කාකණිකමත්තම්පි**- කුඹලුට වේවයි කඹුරට වේවයි යටත්පිරිසෙයින් දෙවියැටසමාරකුදු; **එකං පන්නං අධිට්ඨාය**-දෙ පා එකවිට ඉටත් දෙ පය ම නොයි වෙනබැවින් එක පාක් ඉටා; විකප්පෙතුං පන බහූනිපි ලබ්භන්ති.

### පඨමං.

**ඌනානි**-නො පිරුණු; **ඉත්ථම්භූතස්ස ලක්ඛණෙ**-මේ ප්‍රකාර යෙන් වූවහුගේ ලක්‍ෂණයෙහි; ලක්‍ෂණ නම් ඌනපඤ්චබන්ධන බව යි. **විඤ්ඤාපෙතුං වට්ටති**-නොපැවරුවනුදු ඉල්ලත් වටී.

**හෙට්ඨිමපරියන්තන්ති**-මූලවට්ටිසමීපෙ පන පත්තවෙධකෙන විජ්ඣියමානො කපාලස්ස බහලත්තා භිජ්ජති තස්මා හෙට්ඨා විජ්ඣිතබ්බා. **පත්තවෙධකෙන**-පා විදුනා කටුයෙන්; **මකචි**-තියද; **බද්ධසිලෙසාදිනාති** උණ්හආමිසස්ස විලියනත්ථං සුඛෙහි පන මධුසිත්ථලාඛාසජ්ජුරසාදීහි අබද්ධිත්වා; බදුලු ඈ බදගම්ලාටු ආදීන් බැන්ද යුතුය මැසියයුතු ය යුතැති **චාණිකං ඛාපෙත්වා**-සකුරු විරුවා; **ලොහමණ්ඩලං**-ලොහෙමඩල; **අඝොපෙන්තා**-ගපත්.

**පත්තගාහාපකෙන**- ඡන්ද දෙස මොහ භයාගති නැති ගහිතාගහිත දන්නා ය යන පසගින් යුත් පාත්‍ර ගන්වන්නහු විසින්; **විජ්ජමානගුණං වත්වා**- "අයං භන්තෙ පත්තො පමාණයුත්තො සුන්දරො ථෙරානුරූපො"යි පාත්‍රයෙහි විද්‍යමාන අනුසස් දක්වා කියා; **අපටිච්ඡන්තස්ස වා**- 'කිමෙම අසෙදසදත පත්තෙන'යි අපිස්සතොස් බැවින් හෝ; **නෙනාති** සඞ්ඝනවකෙන; **පත්තපරියන්තො නාම**-මෙසේ පෙරළි කොට කෙළවර සිටි පාත්‍රය නමි; **අදෙසෙති** මඤ්චපීඨඡත්තනාගදන්තාදි අදෙසෙ, නොමනාතන්හි; **අභොගෙනාති** යාගුරන්ධන- රජන- පචනාදිනා අභොගෙන; නො සකස් කොට වලඳ ගණී ද. **විස්සජ්ජෙති**- අන්නට දේ ද; "සචෙ පන සද්ධිවිහාරිකො වා අන්තෙවාසිකො වා අඤ්ඤං වරපත්තං ඨපෙත්වා අයං මය්හං සාරුප්පො අයං ථෙරස්සාති ගණ්හාති වට්ටති. අඤ්ඤො වා තං පත්තං ගහෙත්වා අත්තනො පත්තං දෙති වට්ටති."

**අබ්බන්ධනොකාසං**-මුවවිට පටන් යටින් ව්‍යඬ්ගුලප්‍රමාණ එක ද රේඛාවක් නැති පය; **නඅපත්තස්ස**-තමා වලඳන පය වෛරග්‍රහණාදීන් තට පාත්‍ර ඇත්තාහට ද අනෙක් පයක් නො නැ නො පැවරුවන්ගෙන් විනවා ගණුත් ඇවැත් නැති. බුන් පා ඇත්තාහට මෙ මැ නය යි. **පවාරිතෙති** එත්ථ ච සඞ්ඝවසෙන පවාරිතට්ඨානෙ පඤ්චබන්ධනෙනෙව වට්ටති. පුග්ගලවසෙන පවාරිතට්ඨානෙ ඌනපඤ්චබන්ධනෙනාපි වට්ටති. **අඤ්ඤාතවිඤ්ඤත්තිති**-නො නැ නොපැවරුවන් කෙරේ විනවීම;

## දුතියං.

---

**ගිලානානං භික්ඛූනං**- ගිලන් මහණුන් විසින්; **පටිසායිතබ්බානි**-ලෙවැ වැලඳිය යුත්තාහු යි. **එතෙන**- 'පටිසායනියානි' යන මේ වචනයෙන්; **උග්ගහෙත්වා**- නො පිළිගත්බව දැන දැන නොපිළිගන්වා අතින් ගෙණ; **නික්ඛිත්තානානන්ති** අජ්ඣොහරණත්ථං; **තානි හි පටිසායිතුං න වට්ටන්ති**. උග්ගහ පටිග්ගහ නොවූයෙන් වලඳත් නොවටිත්. මෙහි පිළිගතයුතු වතක් නො පිළිගත් බව දැන දැන නහා ගත උග්ගහ නම. බිමැ තබා ද නො තබා ද නැවැත පිළිගන්වාගත පටිග්ගහ නමි. **භෙසජ්ජකිච්චං**-රෙග

සන්සිඳුවීම; වොහාරනි- නම් ඇත්තාහු යි. ගවාදීනං-ගො අජමහිෂාදීන්ගේ; මස් නො වැරූ සතුන්ගේ ගිතෙලුදු වෙඩරු දු නිසැගිමත් වේ. සෙසු ගිතෙලුදු වෙඩරු දූ දුකුලාවත් වේ. තල තෙල් ඈ මූත් පෙළ නො ආ නාලිකෙර නිම්බ කොසම්බ ආදි සෙසු තෙල් දුකුලාවත් වේ. මහුකිකා යි මීමැස්සන් දඹුවෙල්බැ මැස්සන් කණවෙමැස්සන් මහබමරමැස්සන් ගත්හු. චිරිකා නාම සපක්කා දීඝමක්ඛිකා. තුම්බලනාමිකා ච අට්ඨිමක්ඛිකා කාළමහාභමරා හොන්ති. තෙසං ආසයෙසු නියාසසදිසං මධු හොති; තං යාවජීවිකං. "ඛාමං උච්ඡුඵාණිතං වා කොට්ටිතං උච්ඡුඵාණිතං වා පුරෙභත්ත මෙව වට්ටතී"ති මහාඅට්ඨකථායං වුත්තං. "මහාපච්චරියං පන එවං සච්ඡුකපක්කං වට්ටති නො වට්ටතීති පුච්ඡිත්වා උච්ඡු ඵාණිතං පච්ඡාභත්තං නො වට්ටනකං නාම නත්ථීති වුත්තං. තං යුත්තං" යනු අටුවායි. ඛාම උච්ඡුඵාණිතානං ගිනි ගත් උගින් වූ සකුරු; තං වුත්තං යනු උගින් වූ හෙයින්; සකුරුපැනුදු සතවූ කැලි වෙ. නො ගිලන්හට ද සත්දවසක් වලඳත් වටී. න තෙසං වත්ථූනි- ඒ ගිතෙල් ආදීන් පිළිබඳ ඛීරාදිය පිළිගෙණ නො වේ. එතෙනාති 'පටිග්ගහෙත්වා' යන මේ වචනයෙන්;

එත්ථ-මේ සප්පි ආදීන් අතුරෙහි; යාවකාලිකවත්ථූනි-යව් කැලිමත් ඇති; යානි-යම් සප්පි ආදියක් ඇද්ද; තෙසං-ඒ සප්පි ආදීන්ගේ; වත්ථූනි-ඛීරාදි වස්තු; කාලෙ සංසට්ඨං-පැරුහුමා; නිබ්බට්ටිතං-පරහා මෙන් කළ; යාවකාලිකවත්ථූනං-යව්කැලි වත් ඇති; අඤ්ඤෙසං- මෙතෙලින් පිටත් සෙසු සප්පිආදීන්ගේ; වත්ථුං-ඛීරාදි වස්තුව; පචිතුං න වට්ටති යෙව-සම්පාක වන හෙයින් පිසත් නො වටී මැ යි. අනජ්ඣොහරණීයානි- වත්සහිත කොට පිළිගත් හෙයින් නොගිලිය හැක්කෝ යි. එයින් මැ සපතාහාතික්‍රම යෙහි නිරවැති. සන්නිධිං කත්වා-අපරාපරදිවසයට යහසේ තබා; අධිට්ඨහිත්වාති "ඉදානි අජ්ඣොහරණීයං න භවිස්සති. බාහිරභොගෙ භවිස්සතී"ති චිත්තං උප්පාදෙත්වා; ඉටු නොයිටුවා මූසු වුව වැළි දූ ඉපිය යුතු. සිත් උපයා මෙසෙයින් ඉටුයෙහි පිළිගහණ විදූහෙයි යෙත්. පාළියං අනාගතසප්පිආදීනි නාම මිගරෙහිතාදීනං සප්පි නවනීතසඬ්ඛ නාලිකෙරනිම්බකොසම්බාදීනං ච තෙලං; සිතුදකෙන ඛානනනි කොට්ටෙත්වා මද්දිත්වා රසං ගහෙත්වා කතං; 'සීතුදකෙන කතං' යී මීපුප් නො තකාරු ගත්බව කියත්. ඵාණිතගතිකා මෙව යී යව්කැලි නො වනබව කියත්. මේ සතැවුකැලිය දුකුලා වති. කාලවණ්ණා වා-පොත් කලු වැණිමෙහි හෝ; වත්ථූගණ නාය-වෙඩරුපිඬු සකුරුකැටි මීවදයෙන් තුඹු වත් ගණනින්;

කතියං.

---

ගිම්හානං-ගිම් සාරමස් අතුරෙහි; මාසො සෙසොති-මසෙක් අවසිටි ය යි කියහැකි කල; සෙසො-ඉතිරි යි. පඨමදිවසතො පට්ඨාය-(මැදින්දින අවපෑලවිය පටන් පොහොනැ මැදි පොහෝ අවසා තුන්මසක් ගියකලැ) පොසොන් අවපෑලවිය පටන්; කත්තිකමාසස්ස-හිල් මස; යාව පච්ඡිමදිවසො-යම් තාක් මැදි පොහෝ දවස් ද; කාලො වස්සිකසාටිකායාති ආදිනා කාලො වස්සිකසාටිකාය, සමයො වස්සිකසාටිකාය, අඤ්ඤෙපි මනුස්සා වස්සිකසාටිකචීවරං දෙනති යි; සතුප්පාදකරණෙන-සිහි එළවන පමණක් මතු කරණ විසින්; පාචිත්තියං-නිසැගි පචිති වේ. තෙන සික්ඛාපදෙන-අඤ්ඤාතකවිඤ්ඤත්ති සිඛ පෙදෙන්; විවටඞ්ගණයෙහි වැසිපොදින් සිරුරු තෙමනුවහට; ඔවස්සාපයතො යනුයෙන් ඝටාදීන් ඔවටනාසේ[1] නැඟවූහු. සෙ නැගි දියෙහි ද්‍රු සනහත් වටී. තථා යන්තෙන් බිඳුගණනා යෙන් නො ගෙණ නහානපරියොසානයෙහි දුකකට කිවා මෙන්.

චතුත්ථං.

---

වෙය්‍යාවච්චාදීනි-අත්පාමෙහෙ ආදියක්; පච්චාසිංසමානො-පසසස්තෙ[2]; අච්ඡින්දනතස්ස-කිපී නො ඉවසිය හි බලාත්කාරයෙන් පහරවා ගන්නාහට; සකසඤ්ඤයෙන් අච්ඡින්දනඅච්ඡින්දාපනයෙහි පාරාජිකා නැත. කිලමනය කොට ගන්නාහෙයින් ඇවැත් වේ. සකසඤ්ඤය යි පරිජිවත් නො වන සේ දක්වූහු. වත්ථුගණනාය ආපත්තියොති එකං චීවරං එකාබද්ධානි ච බහූනි අච්ඡින්දතො එකා ආපත්ති. එකතො අබද්ධානි විසුං ඨිතානි ච බහූනි අච්ඡින්දතො, 'සඞ්ඝාටිං ආහර, උත්තරාසඞ්ගං ආහරා'ති එවං ආහරාපයතො ච වත්ථුගණනාය ආපත්තියො. 'මයා දින්නානි සබ්බානි ආහරා'ති වදතොපි එකවචනෙනෙව සම්බහුලා ආපත්තියො. ආණත්තො බහූනි ගණ්හාති එකං පාචිත්තියං. 'සඞ්ඝාටිං ගණ්හ උත්තරාසඞ්ගං ගණ්හා'ති වදතො වාචාය වාචාය දුක්කටං. 'මයා දින්නානි සබ්බානි ගණ්හා'ති වදතො එකාය වාචාය සම්බහුලා ආපත්තියො. අඤ්ඤං පරික්ඛාරන්ති යං කිඤ්චි අන්තමසො සූචිම්පි.

පඤ්චමං.

---

තුරි-හොත්කන; වෙම-වෙම්දඬු; විඤ්ඤාපිතතන්තවායෙන-නො නෑ නො පැවරූ නො කැප පෙහෙර ලවා; තෙනෙව පන-නොකැප පෙහෙර ලවා ම;

ඡට්ඨං. සත්තමං.

---

1 ඔවුන් වටනා සේ.  2 දපසස්නෙ-හැම

දසන්නං අහානං සමාහාරො=දසාහං. **අනාගතා** යනු කත්තිකතෙමාසිපුණ්ණමාසඞ්ඛ්‍යාත මහපවුරුණු බලා සිටි; **පඨම කත්තිකපුණ්ණමං**- වප්පුණුපෝයෙහි; **පඨමපදස්සාති** දසාහානාගතන්ති පදස්ස; **අනුපයොගත්තා**-අනු වැ යෙදෙන බැවින් හෙවත් තුල්‍යාධිකරණවිසෙසන හෙයින්; **තානි දිවසානි**- එද වස්හි; **අච්චන්තමෙව**- නිරන්තරයෙන්, එක්වන්, දවස් පතා; **සබ්බම්පීති** එකම්පි බහුම්පි සඞ්ඝිකම්පි පුග්ගලිකම්පි. **තෙන**-'දසාහානාගතං කත්තිකතෙමාසිපුණ්ණමං' යන පාලියෙන්; **ජුණ්හපක්ඛස්ස**-පෙර අඩමස්හි; **එස**-මේ කාලය; **නික්ඛිපිතබ්බං**-නො ඉටා නො විකපා තිබිය යුතු ය. **අච්චෙකචීවරස්ස**-ආත්‍යයිකා චීවරයාගේ; ඉක්මන්සිවුර ය යනු පර්‍යාය යි. **අතික්කාමන**-ඉටා නො විකපා ඉක්මවන;

අට්ඨමං.

---

**වස්සං උපවසිත්වා**-පෙරවසැ වසෙළඹැ සුන් වස් නො වැ තුන් මස වැසැ; **ආදිසු විය**-උපසම්පජ්ජං අනාපුච්ඡං යනාදි විභඞ්ග පාඨමෙන්; **එත්ථ**- 'උපවස්සං' යන මෙහි; **අනුනාසිකො**-ආගම වූ නිග්ගහිත; **ඉමස්ස පදස්ස**- 'උපවස්සං' යන මේ පදයා; **පච්ඡිම කත්තිකපුණ්ණම**-හිල්මස මැදිපොහොයහි; **කාලෙ**-මසක් පමණ කල්හි; **ආරොපිතෙන**-වියත් නැඹුරු කොට නැගූ; **ආවිඤ්ඡනනා**-යොධදුන්නෙන්; **ඉඤ්ඤබිල**-දෙරටුව එලිපත; මෙතැන තවවියත් දුන්නෙන් මිතිය යුතු. **ධුමසඞ්ඝාතිපාතට්ඨානං වා**-දවස් පතා මග ඥුන් රැස් වන තැන වේවයි; **යාව තං සෙනාසනං මෙතබ්බං**-මිතියයුතු; **නිබ්බෙඨ්‍යාකාසාදි**-ආරාම ආරාමූපචාරයෙහි කඳවුරු බැඳ වුසුතැන්, ගුතෙනාකාස ගිතොකාස තිසිතොනාකාස තිපතෙනාකාස; **ගතා**-තසන; **විලුනන**-වොලො ගත්නා; **ආකොට්ටිත**-කොටන; **සන්නිහිත**-ලැගි සිටි; **පවාරණාමෙ නික්ඛිපෙය්‍ය**-හිල්මස කත්තික චොරභයින් සිවුරු සැඟවියැටි මගණ ගොදුරුගමැ තබන්නේයි. **තඤ්ච ඛො**-ඒ තිබීම ද; **කිඤ්චිදෙව කාරණං**-එබඳු තිසි කාල මනාවක් ඇතිකල්හි ය යි සේයි. **ගාමසීමම්පි ඔක්කමිත්වා**-තමා ගිය තැන් වෙහෙරින් දුරුබැවින් සිවුරු තුබූ ගම සීමට ද පෙර අරුණම අවුදු, ගාමපරිච්ඡෙදයට ය යි සේය; **ඔක්කමිත්වා**- වැදද හෙවත් බැසැ; **සාලාවි**- අම්බලම් දෙවොල් දෙරටු ඈ යම් කැප තැනෙකැ; සාලාවි යි සාමාන්‍යයෙන් කිබැවින් එ ගම්සිමින් ඇතුලත; ආරඤ්ඤකාඞ්ග රැකෙන පමණ දුරක් ලද අඟ නො බිඳැ ඉගි අරුණු නැගිය යුතු. අඟ බිඳෙතුදු ඇමැත් නො වදනා සඳහා ඇතුළුගම ද අරුණු නඟා සිවුරු පවත් දත යුතු. අඟ නො බිඳ ද බිඳ ද ඇත්ගම්සිම අරුණු නඟන්නට නො යා හෙත් පසුදුරා අරුණු නැගිකාලැ ඉරිය යුතු.

නවමං.

---

**සො හි**- ඒ ලාභය; **හත්ථං අනාරූළ්හොපි**- අතට නො ආයේ ද; **චීවරාදිවත්ථුං**-චීවරපිණ්ඩපාතාදි සතරපස; යටතින් සුණුපිඩකුඩු, දූහැටුදඬුකුඩු, දැහුයකුඩු ලාභ නම්. **නින්නං භුඤ්ජා**-යොමු වැ; **දෙථාති එත්ථ** න අසුද්ධතක අප්පචාරිතෙපි **සංඝස්සත්ථාය** පටියාදිතචීවරාදීනි දෙථාවුසො **සඞ්ඝස්සාති** වත්තුං වට්ටති. **අභිහටපටියත්තෙ** ච උද්දිස්ස **අත්තනො** ගෙහෙ ඨපිතභාගෙ ච **පයුත්ත** **වාචා** නාම **නත්ථීති** වුත්තත්තා. පයුත්තවාචා නම් 'දෙථ මෙ' යනාදි තෙප්ලි. **සඞ්ඝස්සෙව දාතබ්බං**-නො දුන වත් වූ පරිද්දෙන් පරිජී ආදි අවදනාබැවින් මහසඟහට ම දියයුතු. **යත්ථ-පෙ-ස්සාති ආදීනි** **වදන්තස්ස එත්ථ යත්ථ පටිසඞ්ඛාරිතං වා ලභෙය්‍ය** චිරට්ඨිතිකො වා **අස්ස, යත්ථ** වා පන **තුම්හාකං** චිත්තං **පසීදති තත්ථ දෙථාති** **වදන්තස්ස; ඤත්වා**-පදභාජනියෙහි '**සාමං ජානාති අඤ්ඤෙ** වා තස්ස ආරොචෙන්ති' යි කී නියෙන් මහසඟහට බසින් පිරිණැමූනු බව දැන;

**දසමං.**

---

**පත්තවග්ගො.**

---

**නිස්සග්ගියවණ්ණනා නිට්ඨිතා.**

---

**ජානිත්වා, ජානන්තස්ස මුසාභණනෙ, භූතං**-ඇති වත් කොට; **නිමිත්තත්ථෙති** කාරණයෙහි; **අවජානිත්වාති** තිත්පියෙහි **සඞ්කපෙත්වා අත්තනො** වාදෙ කාඤ්චි දෙසං සල්ලක්ඛෙත්වා නායං **මම** වාදොති අවජානාති, නැතැ යැ යි සේයි. **පටිජානනාදි** **වත්ථුස්මිං**-ඇත යනාදි හැඟවූවත්හි; **ආදිසද්දෙන** '**පටිජානිත්වා** අවජානාති, අඤ්ඤෙන අඤ්ඤං පටිචරති' යනාදි හැඟවූහු. **අනුප ධාරෙත්වා**-පරීක්ෂා නො කොට; **සහසා භණන්තස්ස**- වහා දුටු වා ද 'නො දිටිමි' යනාදි කියන්නාහට; **විසංවාදනපුරෙක්ඛාරතා**- 'මුසවා කියමි' යන සිත් පෙරදැරිබව; **තස්ස**-ඒ අණී යි. **පුග්ගලෙති** පුග්ගලස්ස සමීපෙ;

**පඨමං.**

---

**ඔවිජ්ඣන**-සටා විද බණන; **ජාති**-හීනුක්කට්ඨචණ්ඩාලඛත්තියාදි ජාතිය; **නාම**- ගුලැබු දලැබු[1] යනාදි හීනඋක්කට්ඨනාමය; **ගොත්ත**-මෙසේ මැ කෝසියගොත් ගොයුම්ගොත් ආදි ගොත්‍රය; **කම්ම**-කොට රැකිකම් වෙළෙඳකම් යනාදි කර්මය; **සිප්ප**-නළ කාරශිල්ප ගණන් ශිල්පආදි ශිල්පය; **ආබාධ**-මධුමෙහාදිආබාධය; මධුමෙහ පීඩාකර නො **වත්තෙන්** උත්කෘෂ්ට යි. **ලිඞ්ග**-අතිදීඝ

---

1. වැගුල් බුදුල-සිඛවලදවිනිය ගුලැබුදලා-බොහෝ.

ත්‍වාදි හීන යි. නාතිදීඝිත්‍වාදි උත්කෘෂ්ට යි. **කිලෙස**-සංක්ලේශ මැ හීන යි. **ආමසති**-සමාපත්ති මැ හීනය. සොතාපත්ති උත්කෘෂ්ට යි. **අක්කොසෙසු**-ආක්‍රොශයෙහි; ඔට්ඨොසි යනාදි හීන යි. පණ්ඩිතොසි යනාදි උකට්ඨ. **භූතෙන වාති** එත් භූතෙන ජාතිආදිනා, හීනං වදන්තො කිඤ්චාපි සච්චං වදති ඔමසිතුකාමතාය පනස්ස ආපත්ති. **අභූතෙන වාති** එත් උක්කට්ඨෙන හීනං වදන්තොපි කිඤ්චාපි අලිකං භණති ඔමසිතුකාමතාය පන ඉමිනා සික්ඛාපදෙන ආපත්ති. න පුරිමෙන. **සංකිලිට්ඨ**-සුබාසුබං; **අනඤ්ඤපදෙසෙන**-ඉඳුරු;

**යථා තථාවා**-පාලි ආගතානාගත යම්තම් වචනයෙකින්; **අනුපසම්පන්න** යනුයෙහි තෙපුල් දන්නා තිරිසනුදු ගත යුතු. **දවකම්‍යතා** නාම කෙළිහස්සාධිප්පායතා. **සබ්බත්ථ**-උපසම්පන්නානුපසම්පන්න හැම්දෙනා සම්පයෙහි ද පාලි ආගතානාගත වචනයෙහි ද පෙළා කී පචිති දුකුළාවන ද යන අර්ථ යි. **අත්ථ -පෙ- පුරෙක්ඛාරතා**-'චණ්ඩාලොසි'යනාදිපාඨයෙහි අර්ථ කියන්නාහට ද; පාලියා අත්ථං වණ්ණෙන්තො අත්ථපුරෙක්ඛාරො. ධම්ම නම් 'චණ්ඩාලො' යනාදි පාඨ මැ යි. පාඨං වාචෙන්තො ධම්මපුරෙක්ඛාරො. අනුසිට්ඨියං ඨත්වා "ඉදානිපි චණ්ඩාලොසි, පාපං මා අකාසි, මා තමොතමපරායනො අහොසී"ති ආදිනා නයෙන කථෙන්තො අනුසාසනිපුරෙක්ඛාරො. දුබ්භාසිතාපත්ති පනෙත්ථ වාචාචිත්තතො සමුට්ඨාති. 'පරම්මුඛාපි දවකම්‍යතාය වදතො දුබ්භාසිතමෙවා'ති ආචරියො.

**දුතියං.**

---

**භික්ඛුපෙසුඤ්ඤෙ**-භික්ෂුප්‍රියශූන්‍ය කරණ කේලාම්තෙපුල් එළවීමෙහි; 'භික්ඛුතො සුත්වා භික්ඛුනා භික්ඛුස්ස උපසංහරෙ පෙසුඤ්ඤන්ති අත්ථො' යනු අටුවා යි. **පියකම්‍යතාය වා**-අසන මහණහු තමාගේ ප්‍රියභාවය කැමැති වීමෙන් හෝ; **භෙදාධිප්පායෙන වා**-ආක්‍රොශ කළහු හා තමා කියන කේලාම් අසනුවහු හා දෙදෙනාගේ භෙද කැමැති වීමෙන් හෝ;

**මුත්තනයෙන**-දශාක්‍රොශවස්තුයෙන්; **අඤ්ඤපදෙසෙන**-පර්‍යායාක්‍රොශවස්තුයෙන්; චොරගණ්ඨිභෙදාදි පාලිමුක්ත ආක්‍රොශ යි. **පාපගරහිතායාති** එකං අක්කොසන්තං එකං ඛමන්තං දිස්වා 'අහො නිල්ලජ්ජො, ඊදිසම්පි නාම භවන්තං පුන වත්තබ්බං මඤ්ඤිස්සතී'ති කෙවලං පාපගරහිතාය.

**තතියං.**

---

**අනුපසම්පන්නං**- අනුපසපන්නහට; **තිපිටකධම්මං**- පෙලධම්; **පදං පදං වාචෙය්‍යාති** කොට්ඨාසං කොට්ඨාසං කත්වා වාචෙය්‍ය; අටුවායෙහි පදන්ති එකො ගාථාපාදො. අනුපදන්ති දුතියො පාදො. අක්ඛරන්ති එකමෙකමක්ඛරං. අනුබ්‍යඤ්ජනන්ති පුරිමබ්‍යඤ්ජනෙන සදිසං පච්ඡිමබ්‍යඤ්ජනං යි ගාථාත්මකදෙශනා කියේ ය. යං කිඤ්චි එකමක්ඛරං **අක්ඛරං**. අක්ඛරසමූහො **අනුව්‍යඤ්ජනං**. අක්ඛරානුව්‍යඤ්ජනසමූහො **පදං**. පඨමපදං පදමෙව දුතියං **අනුපදන්ති** එවමෙත්ථ නානාකරණං වෙදිතබ්බං යි චූර්ණිකදෙශනා සඳහා කියේ යි. **භණන්තස්ස**-කියවා දෙන්නාහට;

**අනුපසම්පන්නෙන සද්ධිං**-අනුපසපන්හු හා සමග; **එකතො උද්දෙසං ගණ්හන්තො**-සහොච්චාරණ විසින් කියවා ගැන්මෙහි ද; **සජ්ඣායං කරොන්තො**-එසේ මැ හැදෑරීමෙහි ද; **තස්ස සන්තිකෙ**-ඔහු සමීපයෙහි; **උද්දෙසං ගණ්හන්තො**-පෙලධම් කියවා ගැන්මෙහි ද; **යෙභුය්‍යෙන පගුණං ගන්ථං භණන්තස්සාති** සචෙ එකගාථාය එකො පාදො න ආගච්ඡති, සෙසං ආගච්ඡති, අයං යෙභුය්‍යෙන පගුණගන්ථො නාම. එතෙන නයෙන සුත්තෙපි වෙදිතබ්බො **ඛලිතට්ඨානෙ**-වරදනාතන්හි; **තං එවං භණාහීති, එකතො භණන්තස්ස අනාපත්ති. ඔසාරෙන්තස්ස** වාති සුත්තං උච්චාරෙන්තස්ස පරිසමජ්ඣෙ පරිසඞ්කමානස්ස.

## චතුත්ථං.

---

**උපරි**-මතුයෙහි; **සහසෙය්‍යං**-එක් වැ හෙවීම; **කප්පෙය්‍ය**-කෙරේ නම්; **සබ්බච්ඡන්න**- සෙවිත්තට තිසි ඉඟිකා ශිලා සුධා තෘණ පණිණාදි යමකින් හැම සොයනලද; **සබ්බපරිච්ඡින්නෙ**-ප්‍රාකාරාදි යමකින් වටා හැම මූවහ කරණලද සෙනස්නෙහි වේවයි; **යෙභුය්‍යෙනච්ඡන්නපරිච්ඡින්නෙ වා**-බොහෝ සේ සෙවූ පවුරු ආදි බැඳි හෝ සෙනස්නෙහි; **පුබ්බාපරියෙන වා**-පසුපෙරට ව වෙවයි; **ඡදනං අනාහච්ච**-බිම පටන් සෙවිත්නෙහි නො පැහැරැ; **දියඩ්ඪහත්ථුබ්බෙධෙන**-සබ්බන්තිමයෙන් වඩුයෙන් ගෙළරියන් උස් වූ; **එකූපචාරො හොති**-එක දෙරින් වැද නික්ම හසර කරණලදුයේ වී නම්; **චතුස්සාලං වා**-සිවුරැස් වුව මැනැ ම ය. **තත්ථ වා**-පෙරැ විසූ සෙනස්නෙහි වේවයි; **තාදිසෙ**-පාචිත්තියක්ෂෙත්‍ර; **තෙන වා**-ඒයේ පෙරෙවි ද එක් වැ හොත් අනුපසපන්හු හා වේවයි; **තස්මිං නිපන්නෙ**-ඒ අනුපසපන්හු හොත්කල්හි;

අනුපසම්පන්නෙන අනුපසම්පන්නසඤ්ඤී වෙමතිකො උපසම්පන්නසඤ්ඤීති තිකපාචිත්තියං. උපඩ්ඪච්ඡන්නපරිච්ඡන්නාදිසූති ආදිසඳෙහ සබ්බච්ඡන්නචූළකපරිච්ඡන්නෙන දුක්කටං, යෙභුය්‍යච්ඡන්නචූළකපරිච්ඡන්නෙන දුක්කටං, සබ්බපරිච්ඡන්නෙන චූළකච්ඡන්නෙන දුක්කටං, යෙභුය්‍යපරිච්ඡන්නචූළකච්ඡන්නෙන දුක්කටන්ති ඉමානි පාළිමුත්තකානි චත්තාරි දුක්කටානි. සබ්බච්ඡන්නසබ්බපරිච්ඡන්නාදිසු චාති එහි ආදිසඳෙහ සබ්බපරිච්ඡන්නෙන සබ්බච්ඡන්නෙන අනාපත්ති, උපඩ්ඪච්ඡන්නෙන චූළකපරිච්ඡන්නෙන අනාපත්ති, උපඩ්ඪපරිච්ඡන්නෙන චූළකච්ඡන්නෙන අනාපත්තීති තීණි ගහිතානි. පාචිත්තියවත්ථුසෙනාසනං යනුයෙහි යටතින් දුස්සකුටි ද ආපත්ත්‍යඞ්ග සෙනසුනි; චතුත්ථදිවසෙ යනු උපලක්ඛණ ය. සතරවන රැය ආදි කොට ඇම රැය ම හිරු අවාමට ගියතැන පටන් ය යි සේසි.

පඨමං.

---

තදහුජ්ජාතායපි යන්නෙහි අපි ශබ්දයෙන් පගෙව මහන්තරියා යනු දක්වූහු. පඨමදිවසෙපි–පළමු දවස්හි මැ, පළමු (වන) දවස් පටන් කොට ය යි සේසි. මාගම හා තුන්දවසක් එක් වැ ලැග්මෙන් මේ සිඛයෙන් ඇවැත් ඇවද සතරවන රැ සහසෙය්‍ය කිරීමෙන් දෙසිඛයෙන් දෙඇවැත් අවද්දි යි ගත යුතු.

ඡට්ඨං.

---

ඡප්පඤ්චාති සුතෙන ච අඨකථා යනුව. අගාථාත්මකදෙශනා යෙහි වාචාපමාණ විභක්ත්‍යන්ත වශයෙන් ගත යුතු යි. අඨකථා ධම්මං වා–ධර්මසඞ්ග්‍රහාරූඪ පුරාණාර්ථකථා පෙල හෝ; විඤ්ඤුනා පුරිසෙන විනා–කටයුතු නො කටයුතු දන්නා ශ්‍රවණොපචාරයෙහි සිටි මිනිස් පිරිමියකු නැති වැ. පුරිසවිග්ගහං ගහෙත්වා–මිනිස් පිරිමිවෙස් ගෙණ; න වට්ටති යි පචිති හැඟවූයේ යි. දුතියානියතෙ වුත්තලක්ඛණෙන යන්නෙන් මනුෂ්‍යපුරුෂයා දෙලොස් රියනක් ඇතුළත සිටිබව මැ කීවා වෙත්. පදාදිගණනාය–පූර්වෝක්තලක්ෂණ පද අක්ඛර අනුව්‍යඤ්ජන ගණනින්;

මාතුගාමස්ස–විඥමිනිස් මාගමකට. මනුස්සවිග්ගහතිරච්ඡානිත්ථිනං–මිනිස්වෙස් ඇති කින්නරාවන්ට; අඤ්ඤස්ස වා මාතුගාමස්ස–හුනස්නෙහි හිඳ අනෙක් මාගමකට; කිම්පිසො–කුමක්

අඍී කොට ඇත්තේ ද? කිමඤ්චං දීපෙති යුතැති. බණ දෙසීමෙන් හා විඥමනුෂ්‍යපුරුෂයක්හුගේ ආසන්න නො කිරීමෙන් හා වන් තෙන් කිරියාකිරියං යුතු.

සත්තමං

භූතස්මිං--ඇතිකල්හි; භික්ඛුස්සච භික්ඛුණීස්සච එෂපඤ්චා-පරි නිබ්බාණකල හා පුළුවුත්කල හා ඇරැදියහැකි මහණමෙහෙණුන් තබා; භූතාරෝචනවත්‍ථුස්මිං--මේ ජනමයෙහි සිඩ වූ උතුරුමිනිස් ධම් ගිගින්ට අරෙජනවත්හි; තථාරූපෙ කාරණෙ සති-පිරි නිවෙනකල පුළුවුත්කල ය යන කාරණයක් ඇතිකල්හි; පරි නිබ්බාණ නො වූ කල ද ඇවිටි ගන්නා ලබන්නහු විසින් උප සපන්හට කියත් වටි. එබඳු කරුණක් බලා නො ඇවිටි ගණුතුදු කියා· මෙ පිළිවෙත්කරුවාට වනාහි ඇවිටි නො ගත ද කියනු.

අඨමං.

අභිණ්හාපත්තිකස්ස භික්ඛුනො-අභික්ෂණාපත්තික භික්ෂුවක් හට; සංවරත්‍ථාය-සංවරණය පිණිස; ඔතප් උපයනු සඳහා. කුලානං ච-උපාසකකුල ද; පරියන්තං කත්වා-පරිච්ඡෙද කොට; අගථාකතිකාය-කතිකා නො කලපරිද්දෙන්; වත්‍ථුනා සධිං-අසුචිමොචනාදි වස්තුව හා සමඟ;

දුඡුල්ලාය දුඡුල්ලසඤ්ඤිනො වෙමතිකස්ස අදුඡුල්ලසඤ්ඤි නො තිකපාචිත්තියං. අනුපසම්පන්නස්ස-නෙරණහු පිළිබඳ;පුරිම පඤ්චසික්ඛාපදවීතික්කමසඞ්ඛාතං දුට්ඨුල්ලං වා- ශුක්‍රවිසර්‍ගාදි පූර්‍ව පඤ්චසික්ඛාපදව්‍යතික්‍රමසඞ්ඛ්‍යාත දුඡුල්ල නම් වූ අඩ්‍යාචාර හෝ; ඉතරං අදුට්ඨුල්ලං වා-අඩ්‍යාචාර ශුක්‍රවිසර්‍ගාදි පඤ්චශික්ෂා පදයෙන් පිටත් සෙසු අදුඡුල්ල අඩ්‍යාචාර වෙවයි; නෙරණ පැවිද් දත් ශුක්‍රවිසර්‍ගාදි කලහොත් අඩ්‍යාචාරපයර්‍ථාපන්න බැවින් වාලුක සලිලාදි දඬුවම් කට යුතු. අනුපසම්පන්නස්සපුරිමපඤ්චාති එතර් එකතො උපපන්න සාමණෙරිආදයො සීලවන්තාඋපාසකාදයො ච අධිපෙපතාති වදන්ති. වත්‍ථුමත්තං වා- 'අයං සුක්කවිස්සට්ඨිං ආපන්නො' යනාදි විසින් හෝ; ආපත්තිමත්තං වා- 'අයං පාරා ජිකං ආපන්නො' යනාදි විසින් හෝ; වුත්තලක්ඛණස්ස-පරිජී නො අවත්; සවත්‍ථුකො-වස්තු සමඟ සටින කොට;

නවමං.

**අතිරෙකචාතුමාසං ඔවස්සෙය්‍ය**-අධික සාරමසක් වැසි වට; බැහැර ගැසී ඉසුනු දියෙන් නො තෙමී ඉදි වැ ආසින් මැ හුනු වැසි දියෙන් එක්දවසකුදු තෙත් ව සාරමසක් ඉක්මුනු ශුඩපස්රැස් මැටිරැස්. **වුත්තනයෙන**-පදභාජනියෙහි කියනලදී. **වුත්තලක්ඛණෙන**-'පංසුතො වා' යනාදි ලක්ෂණයෙන්; **පිට්ඨිපාසාණෙ ඨිත**- අතලගල් පහණ පිට ඇලී තුබූ; **දෙවෙ**-පජ්ජුන්නයා; **ඵුසායන්තෙ**- වස්නා කල්හි; **විලෙඛන**-හිරි ගැඩීම්; **විකොපාපෙති** යනාදි ඛණාපෙති යන්නෙහි අර්ථ යි. යො භෙදනවිලෙඛනපචනාදීනි කරෙති සොපි ඛණතීච්චෙව වුච්චති ඛණාපෙන්තෙපි තථා.

**ඔකාසං අනියාමෙත්වා**-'ඉමං ඔකාසං ඛණ, ඉධ පොක්ඛරණිං ඛණ' යනාදි විසින් ඔකාසනියම පොක්ඛරණී ආවාටාදි ශබ්දයෙන් විපර්‍ය්‍යාය නොවන්නතත් මෙසේ කීමෙන් නිරවැත යන අභිප්‍රාය යි; **කන්දං ඛණාහි ආදීනි**- 'කන්දං ඛණ' යනාදීන් කණ, කොළ, සසු[1] යි අනියත කොට කීමෙන්, ඇවැත් නො වන බැවින් මෙසේ කියන්නාහට ඇවැත් නැත ද යන අර්ථ යි. **ගොකණ්ටකං වා**-ගොකුරයෙන් නැගී මැටි හෝ; **නදීතටං වා**-හෝ ගඟකඳුරැළි ආදීන්ගේ ඉවුරැ හෝ; **නඞ්ගලවණ්ණනමත්තිකාපිණ්ඩං**-සානතැනැ නඟුලෙන් කැඩී නැගී මැටිපිඩ; **අසඤ්චිච්ච**-බිඳිම් යි නො සිතා; **අසඤ්චිච්චාති** පාසාණරුක්ඛාදීනි වා පවට්ටෙන්තස්ස සාඛාරදණ්ඩකං වා ආකඩ්ඪව ආකඩ්ඪව ගච්ඡන්තස්ස පඨවි භිජ්ජති, සො තෙන භිජ්ජිස්සාමීති එවං සඤ්චිච්ච අභින්දන්තො අසඤ්චිච්ච භින්දන්තො නාම හොති. **අසතියාති** අඤ්ඤවිහිතො කෙනචි සද්ධිං කිඤ්චි කථෙන්තො පාදඞ්ගුට්ඨකෙන වා කත්තරයට්ඨියා වා පඨවිං විලිඛන්තො තිට්ඨති එවං **අසතියා** විලිඛන්තස්ස වා භින්දන්තස්ස වා; **අජානන්තස්සාති** අන්තොගෙහෙ ඔවට්ඨං ඡන්නං පඨවිං අකප්පියපඨවීති න ජානාති කප්පියපඨවීති සඤ්ඤාය විකොපෙති, ඛණාමි භින්දාමි දහාමීති වා න ජානාති කෙවලං සඞ්ගොපනත්ථාය ඛණිත්තාදීනි ඨපෙති ඩය්හමානකභෙජ්ජා වා අග්ගිං පාතෙති එවං අජානන්තස්ස ඛණිත්ත නම් යතුල් ආදි යි.

දසමං.

---

## මුසාවාදවග්ගො පඨමො.

---

**භූතගාම**-වෙමින් වැඩෙමින් හෝ සිටි, වැඩැ නැවැති හෝ වෘක්ෂාදීන්ගේ; **පාතව්‍යතාය**-ඡේදන භෙදනාදි කලකිරුම් නිමිත්ත කොට; **භවන්ති**-මුල් එරී තිල්බව් පැමිණී වෙමින් වඩිමින් සිටියහයි; **අහෙසුන්ති චාති** වැඩැ මහත් වැ සිටියහ යි; **ජායන්ති**

---

1. කුණුකුරැ ගස් යි-සෑම.

**වඩ්ඪන්ති** යනු **භවන්ති** යන්නෙහි අර්ථ යැ. **ජාතා වඩ්ඪිතා** යනු **අභෙසුං** යන්නෙහි අර්ථ යි. භවන්ති අභෙසුන්ති එකාලි කොයං භූතසද්දො. **රාසි**-වූවන් වන්නන්ගේ සමූහය යි. වන සමූහ ය යි ද කියනු ලැබේ. **ජායන්ති** ය යි සේ යි, වඩ්ඪන්ති ය යි සේ යි; වැඩී මහත් වැ සිටියහ යි. **ගාමොති** ගාම නම්; **රාසි**-ධම්මපුඤ්ජයයි හෙවත් ශුද්ධාෂ්ටකය යි. භූතානං දෙවතානං ගාමොති වා සො=භූතගාමො යි ද කියත් මැ. **භූතා එව වා ගාමො** යි ගාමවචනය දීඝගතාදියැ ගතශබ්දයා සේ වනපතාදියැ අතතශබ්දයා සේ 'භූත' යන පදයාගේ ස්වාර්ථයෙහි මැ වැටෙන පක්ෂ දැක්වූවා වේ.

**පතිට්ඨිත**-මුල් බැසැ පිහිටි; **හරිත**-නීල; **පාතව්‍යතා**-කල කිරීම, තැසීම. **ඡේදනභෙදනාදිහි** ඡේදනඡේදපනභෙදන භෙදපනපචනපචාපනෙහි; **අජූකඛං**-ජීවත් වැ සිටි; **අතිසුඛුම තිණම්පි**-ගබකිජු බඳු ඉතා සියුම් තණ ද; **සාසපබීජසෙවාලම්පි**-සර්ෂපබීජමාත්‍ර සෙවෙල් ද; **උබ්බරණ**-දියෙන් නැඟීම්.

හලිද්දිසිඞ්ගිවෙරාදි **මූලබීජ ය**. ඇසතු නුග ආදි **ඛන්ධබීජ ය**. උච්ඡුවෙළුනළාදි පුරුකෙන් හටගන්නා හෙයින් **ඵලුබීජ ය**. හිරි වෙරාදි **අග්ගබීජ ය**. මුග්ගමාසාදි **බීජබීජ යි**. **පතනවටවි**-ගොබ; **අනථසඤ්ඤිස්සාති** භූතගාමෙ බීජගාමෙ අභූතගාමාබීජගාම **සඤ්ඤිස්ස; අසඤ්චිච්ච**-ගමන් යන්නහු පය ගෙණ හෝ ඔබා යන සැරයටියෙන් හෝ තෘණපණ්ණාදි කැඩුන ද, කඩමි යන සිත් නැති වැ එසේ කඩන්නාහට ද; **අසතියා**-අනුපවිහිතසමෘතික වැ හෝ අතුන් හා බැණැ බැණැ හෝ පාදාඞ්ගුෂ්ඨාදීන් තෘණාදීන් කඩනුවට ද; **අජානිත්වා**-මේ භූතගාමය යි හෝ, මෙහිති හුන මෙ දයි හෝ, මින් මෙ බිඳෙයි කැපෙයි යනාදීන් හෝ නො දැනැ; **බීජජාතං**-වෘක්ෂාදිබීජයෙන් උපන්; මූලාදිබීජෙහි ජාතත්තා රුක්ඛාදීනි බීජජාතානීති වුත්තානි. තෙහි බීජෙහි ජාතං=බීජජාතං යි ගන්න. **යෙන කෙනචි අග්ගිනාති** කාෂ්ඨාග්නිගොමයග්නිආදීසු යෙන කෙනචි; අනාමසෝ ලොහඛණ්ඩාපි ආදිතෙතන. **ඣුසණෙනන**-පහරන්නහු විසින්;

**කප්පියන්ති වත්වාව**-කැප යැ යි කියා මැ; කප්පියං යනු යම් කවර බසෙකිනුදු කිය හැක්කැ යි කීහු මැ තෝ වජ්‍ර බුද්ධියෙහි:-"කප්පියන්ති වචනං සබ්බසබ්බභාසායපි වත්තුං වට්ට තීති වදන්ති"යි. **අටුවාසන්නයෙහි** 'වත්වාව කාතබ්බං' කිබැවින් පළමු කැප යැ යි කියා ම පසු ව ගිනි ආදිය එබියයුතු ය. පළමු

එව්ව ද එ නො නහාම ය යි සේ යි, එබූ නිය ආදිය උදුරා නො ගෙණෑ ම කැප යෑ යනු වරී මැ යි. වත්ථාති වුත්තත්තා භික්ඛූනං කප්පියං කත්වෙව වත්තබ්බං; ඉතරෙන යාය කායචි භාසායාති වදන්ති. **සම්පස්සාති**-ලොහමයසම්පස්ස; **නඛච්ඡෙදන**-නියකටු; **ධාරාය**-මුවාතින්; **වෙධං වා**-විදක් හෝ; **ඡෙදං වා**-කැප්මක් හෝ; **කප්පෙව**-කැප යෑ යි කියා ම; ගොමහිංසාදීනං ඛුරා අතිඛිණා, තෙහි කතම්පි අකතං හොති. කප්පිතබ්බා පන ඛුරා න හොන්ති. තෙහි වට්ටති. **බන්ධිත්වා**- වෙළා බැඳ; **වල්ලියා** යනුයෙහි වල්ලිය භාජනගතික බැවින් නො වටී. "තාලෙන බද්ධපුප්ඵකලාපෙ තාලස්මිං කතෙපි වට්ටති, තස්මිං පුප්ඵස්ස අත්ථිතායාති වදන්ති" යනු වජිරබුද්ධි යි. ලහුකගරුකෙසු ඨාතබ්බන්ති එතං විනයලක්ඛණං යනු අටුවා යි.

**මරිචපක්කාදීහි**-විලිකුන් මිරිස්පක් හෙල ලූනු සැලුනු ආදි හා දඳපක් අබීජ නම් වේ. මෙහ ම කැප බැවින් විලිකුන් පක් මැ කියනු. දූරූසිත්ථාදිය ඉඳුරා කැප නො කළ ද කැප මැ වෙයි යෙත් ඇදුරෝ. **තිලතණ්ඩුලෙසුපි**-කැප කළ මනා තල හා මුසු සාල් හි දු; **කපිත්ථඵලාදීනං**-ගිවුළු මරඳ නොරලුඵලාදීන්ගේ; **මිඤ්ජං**-මදුල; **කටාහං මුඤ්චිත්වා**-වියලි හෙයින් කපාලය හැර; **යඤ්ච**-අම්බපනසාදි යමක්; "අප්පහරිතෙ ඡඩ්ඩෙස්සාමීති ඉදං භූතගාම සික්ඛාපදස්ස අවිකොපනත්ථං වුත්තන්ති ධම්මදායාද සුත්තට්ඨකථාය වුත්තං. තස්මා හරිතෙ කචවරාදීනි ඡඩ්ඩෙතුං න වට්ටතීති ලිඛිතං" යනු ටීකා යි.

**පඨමං.**

---

**අඤ්ඤවාදකෙ**-සඟමැද චොදනාමාත වැ පුළුවුත්තා තබා අනෙකක් කීමෙහි ද; **විහෙසකෙ**-පුළුවුත්තා නො කියට් වැ ඇවැත් හිතින් අඤ්ඤවාද නො කොට මහසඟුන් වෙහෙසනු සඳහා නො බැණෑ හිඳීමෙහි ද; **යමත්ථං**-වස්තු ආපත්ති අතුරෙහි යමක්; **පුච්ඡති**-කිසි ව්‍යතික්‍රමයක් දැක "ආයුෂ්මත! ඇවතක් අවන්හි දැ?" යි පුළුවුස්සි ද; **තතො**-එයින්; **අඤ්ඤං වදතීති**- 'කො ආපන්නො කිං ආපන්නො' යනාදීන් අනෙකක් ම කියා නු යි; **අඤ්ඤෙන**-'කො ආපන්නො' යනාදි අන්‍යවචනයෙන්; **අඤ්ඤං**-චොදනා කළ අන්‍යවචනය; **පටිචරණස්ස**-පටිච්ඡාදනයට; අජ්ඣොත්ථරණයට. **විහෙසෙතීති**-එසේ මැ චොදනාමාත වැ මහසඟුන් වෙහෙසා නු යි; **වුත්තනන්ති** පදභාජනෙ වුත්තං.

**සාවසෙසං**-පාරාජිකා මුත් සෙසු ඇවතට; **අනුයුඤ්ජියමානො**-චොදනාමාන වූයේ; **අඤ්ඤෙනාති** අඤ්ඤවචනං; **තථා**-තමාගේ විප්‍රතිපත්තිප්‍රතිච්ඡාදක ඒ වචනයෙන්; **වික්ඛිපති**-විනය ධරයන් වික්ෂෙප කෙරේ ද; **තෙසං**-ඔවුන් දෙදෙනාට; **විහෙසක කම්මං ච**-මෙ සිඛයෙහි අනුප්‍රඥප්ති වූ විහෙසකකර්මය ද; **අනුඤ්ඤාතං**-ඤත්තිදුතිය කර්මවාක්‍යයෙන් වෙන වෙන අනුදන්නාලද; **තස්මිං**-ඒ විවිධකර්මය;

**ධම්මකම්මෙ**-අඤ්ඤවාදක විහෙසක නම් වූ විවිධ කර්මය ධර්මකර්ම වූ කල්හි; **අනාරොපිතෙ**-ඔහු කෙරෙහි නො පිහිටුවූ කල්හි; **තථා කරොන්තස්සාති**-අඤ්ඤවාදකත්‍වය විහෙසකං ච කරන්නහුස; **අජානන්තස්ස**-නො දත්; **ගෙලඤ්ඤෙන වා**-නො බිණිය හැකි මුඛරොගාදි ගිලන් බැවින් හෝ;

**සඞ්ඝස්ස භණ්ඩනාදීනි වා භවිස්සන්තීති**-මා මෙ කිව හොත් සඟනට භණ්ඩනකලහාදීහු වන්නාහ යි හෝ; **සියා කිරියන්ති** අඤ්ඤෙනඤ්ඤං පටිචරන්තස්ස කිරියං හොති. **සියා අකිරියන්ති** තුණ්හීභාවෙන විහෙසෙන්තස්ස අකිරියං හොති. *

**දුතියං.**

---

**උජ්ඣාපනකෙ**-උපසපන්හු උපසපන්හු ලවා ලාමක කොට සිතවීමෙහි ද; **ඛියනකෙ**-නොයෙක් උපසපනුන් සම්මුඛයේ නො ගුණ පැතිරවීමෙහි ද; **ඉමං නාම කරොන්තීති**-සෙනසුන් පැණවීම් ආදි කරන්නේ ය යි; **තස්ස**-ඔහට; **භික්ඛූහි**-භික්ෂූන් ලවා; **අවජානාපෙන්ති**-අවමාන කරවද්ද; **අවඤ්ඤාය**-අවමාන කොට; **ලාමකතො වා**-ලාමකයෙකු වතැ යි ලාමක කොට; **යෙන ච**-යම් වචනයෙකින්; **අවණ්ණං**-ගරහා, නුගුණ; **වුත්තන්ති** පාලියං වුත්තං; ඛියන අනුප්‍රඥප්ති යි.

**අසම්මතස්ස චාති**-කම්මවාචාය අසම්මතස්ස; **යස්ස කස්සචි සන්තිකෙ**-උපසම්පන්න අනුපසම්පන්න යමක්හු සමීපයෙහි; උපසම්පන්නකලැ සම්මත වැ හෙරණ පැවිදි වූවහු **ගෙණ සම්මතස්ස වා අනුපසම්පන්නස්ස** යී යුහු. අනුපසම්පන්නකලැ තෙලෙස්සම්මුති නො වරී. යස්ස පන වාතනස්ස සාමණෙරස්ස කෙවලං සඞ්ඝෙන

* විමතෙ : තත්ථස්ස අකිරියාකිරියන්ති විතණ්ඩාම
අකිරියං හොති. සික්ඛාපදන්තා සහ වුත්තං.

**වා සම්මතෙන වා භික්ඛුනා 'ත්වං ඉදං කම්මං කරොහී'ති භාරෙ කතො, තාදිසං සඞ්ඝස්ස අසම්මතස්ස වාති වුත්තං. පකතියා ඡන්දාදිවසෙන**-ප්‍රකෘතීන් ඡන්දාදීන්;

**තතියං.**

---

**මඤ්චසණ්ඨාපනෙ**-හැද සටහතින්; **සබ්බොපි- මසාරකො බුන්දිකාබද්ධො කුළීරපාදකො ආහච්චපාදකො** යි කියනලද චතුර්විධ සියලු මඤ්චය; මෙහි **මසාරක** නම් හැද පය විද වල ඇවුණු හැදය; **බුන්දිකාබද්ධ** නම් වලින් හැද පය ඩහවා කළ හැද ය. **කුළීරපාද** නම් කකුළුවන් පා සේ පා ඇති හැදය; **ආහච්චපාද** නම් ඇද වැල ම විද පා සිළු වද්ද ගැසූ පෝරු ඇද ආදිය යි. පුටුවෙහි ද මෙ තෙක් මැයි. **චොලෙන**-කඩින්; **ජවිං**-වටා සොට; **තාලිසපත්ත** නම් සුගන්ධජාතියෙකි. තම්ලුපතු, කොල්ලන්කොළ යැ යෙත්. **අණෙනා**-මෙදැතුරෙහි; **සංවෙල්ලිත්වා බද්ධං**-පෙළා දැඹි කොට බන් දෙය; **විප්පකං**-පුප්වා; **අවස්සිකසංකෙතා**-වහරෙ මසැ යි සම්මත නො ලද ද; **අසඤ්ඤිතා**-නො හඟතලද ද; **ඉතරෙසු චතුසු මාසෙසු**-අතික් වස්සාන සාරමසැ; **ඔවස්සකා**-තෙමෙන; **මණ්ඩපෙ ච**-සාධාමණ්ඩප පදරමණ්ඩපයෙහි ද; **සපථ**-ලක්දිව්* වැනි යම් තැනෙක; **සබ්බපථ**-හැමතැන; **විගතවලාහකං**-වාතවෙගයෙන් පහරණලද වැසිවලා ඇති වැ; **කාකාදීනං**-කවුඩුකොක්ආදීන් කදලු බැද; **නිබද්ධවාස**-නිත්‍යවාස ඇති; **රුක්ඛමූලෙ**-රුක්යට; **කදැචිපි**-නොවස්කල් ද; **යත්ථ ච**-යම් ප්‍රදෙශයෙක්හි ද; **යදා ච**-යම් කලෙක්හි ද; **ඉධ**-මෙ සිඛයෙහි; **සංඛෙමව**-සංග්‍රහයට ම; **න නිසීදන්ති**-අවුදින් කිසි චීවරාදි පිරිකරක් නො තබා ද, මා පමණයයි බලා නො ගණී ද යි යූ තැනි. **තස්ස පලිබොධො හොති**-ඒ ඇණවූ උපසම්පන්නට ම භාර වේ. **තං ච බො**-ඒ පණවන ලද මඤ්චාදිය ද; **සසමිං නිසිදන්ති සම්බන්ධො. ධම්මාසනාදියෙහි** ආවාසිකයන් විසින් නියොගයක් නැති වැ පැණවූයේ **පකතිසන්ථත** නම්. **සන්ථරපිතනෙනච සඞ්ඝං ගච්ඡති**-ඇතිරිවූයේ ම යි කිමට පැමිණේ. **අත්තනො පලිබොධං විය**-තමාගේ පිරිකරක් මෙන්; **අනාපුච්ඡිත්වා**-සමු නො ගෙණ; **අනිසාමෙනත්වා**-දක්වා නොදී; **අතික්කාමයතු**-එවමාදි ඇතුලත සිට ලෙඩ්ඩුපාතයක් ඉක්මේ ද; **පාදුඩාරෙන කාරෙතබ්බො** යනු බොජ්න්ඇල ලෙඩ්ඩුපාතයක් ඉක්ම සිටියෙන් කියේ යි.

---

* ලඟදිවු.

**ඵලකපීඨං** නාම ඵලකමයං පීඨං; අථවා ඵලකඛණ්ඩව දාරුමයං පීඨං ච; **අනොවස්සකෙ**-පබ්භාරාදි වැසි නො වස්නා තැනෙකැ; **ලගෙත්වා**-එල්වා; **අහං උක්කට්ඨරුක්ඛමූලිකො උක්කට්ඨ අබ්භොකාසිකොති** චීවරකුටිම්පි **අකත්වා අසමයෙ** රුක්ඛමූලෙ වා **අබ්භොකාසෙ** වා **පඤ්ඤපෙත්වා** නිසීදිතුං වා නිපජ්ජිතුං වා න වට්ටති. **විස්සාසිකපුග්ගලිකෙ අනාපත්ති** යනුයෙන් නො විස්වස් පුගුලාගේ පිරිකර දුකුලා කී වෙත්. **ඔතාපෙන්තස්ස**-මඤ්චාදිය අවු කවමින් සිට; **බුඩ්ඪතරා උට්ඨාපෙන්ති**-මහලුසඟහු උට්ඨාපනය කොට ගණිද්ද; **පලිබුද්ධං හොතීති** උපද්දුතං හොති. වළකා ගන්නා ලද්දේද් වේ දූ යි යුතැනි. **ආපදාසු**-ගහටක් ඇති කල්හි; **නිරපෙක්ඛතා**-අද මැ අවුදු නහා තබමි යන අපෙක්ෂා නැති බව ය; **පණත්** නො දන තමා නො තඟනුවහට කයින් වෙයි. නො කියනුවහට වචසින් වෙයි. **පණත්** දන මෙසේ **මැ** නො කරණුවහට චිත්තසහිත ඒ දෙකින් **සමුට්ඨිත** වේ. **ලෙඩ්ඩුපාත** ඉක්ම **ය** යනු ක්‍රියා ය. නො තඟනු ආදිය අක්‍රියා යි.

## චතුත්ථං.

---

**සබ්බපරිච්ඡන්නා** යි උපලක්ෂණ කොට ගෙණ සබ්බච්ඡන්නය ද ගත යුතු. **ගුත්තසෙනාසනෙ**-සබ්බච්ඡන්න වැ බහුජන සන්නිපාත නැති සෙනස්නෙහි; **පරිභරණෙව**-තමා පිළිබැඳි කොට පරිහරණයෙහිමැ; **පටික්ඛෙපො**-ඛන්ධකයෙහි පටික්ෂෙපය; පරිහරණ නො කොට අනුභවයට භූමත්ථරණවසයෙනි. **සෙනාසනපරිභොගෙ කප්පි**-බුමුතුරුණු විසින් සෙනසුන් පිළිබැඳි අනුභව කිරීමෙහි ඛන්ධකයෙහි ප්‍රතික්ෂෙප නැති. සෙනස්න පුගුල් වී නමුදු සෙනස්නෙහි නියම කොට ලූ රත්කල ආදි ද හුදු තමා පිළිබැඳි කොට වලඳත් නොම වටී. **එත්තකමෙව**-කැප ශය්‍යා විෂයයෙහි මෙතෙක් මැ යි. **සෙසං**-දූ ඇති නිසදුන් සිවුරුදු සැගෙණ දෙතැන් තුන්තැන්හි අවුණා කළ තණ ඇතිරිය ද එසේ ම කළ හුදු චතුප්[1] ඈ පත්ඇතිරිය ද යන සෙස්ස; **වස්සග්ගෙන**-වසගින්; **දිසංගමිකො**-ලග්නා දිගට ගමනී වැ යන්නේ; **ආරාමස්ස**-විහාරයා පිළිබඳ; **පරික්ඛෙපං**-පවුරු ඈ පිරිවෙව්; **අපරික්ඛිත්තස්ස**- අපරික්ෂිප්තයාගේ; **උපචාරං**- කෙළවර සෙනස්නෙන් දෙකැට පමණක් බඳ; **සෙලෙ පන**- ගල්හි පිහිටි ලෙනැ සුණුවම් කළ සෙනස්නෙහි යනාදි යම් සෙනස්නෙක්හි වනාහි; **අනාපුච්ඡාපි**- ආපුච්ඡා කොට ද නො කොට ද; දන දන නො පිළිවිස්ස දුකුලා වෙ යි යුතැනි.

---

1, චතු.

**උපචාරෙ**-වැලැත්හි ද වූ; බහි **ආසනනාය උපට්ඨානසාලාය වා**-පිටත්හි ආසන්න අගුප්ත බෝජුන්හල්හි හෝ; **මණ්ඩපෙ වා**-වැලැත මණ්ඩපයෙහි හෝ; **සන්නිපාතභූතෙ**-සන්නිපාතස්ථානවූ; **උද්ධරණාදීනි කත්වා**-අතුල ශය්‍යාවන් වේයන් නො කත සේ තගා තිබීම් ඈ කොට; **ගාමන්තරං**-අන් ගමකාව; **ගමනවිතතං උප්පන්නං**-ඉන් බැහැර යෙමි යි යන සිත් උපන. උපචාරසීමා නම්, හැම සෙනසුන් ඇතුළු කොට හෝ පිරිවෙන් ආදි ඇතුළු කොට හෝ ලු පවුරු ආදී පිරිබෙව්. පිරිබෙව නැත, මහසඟුන් වළඳන බෝජුන්හල් ආදි අවසන් සෙනස්නෙන් දෙලෙඩ්ඩුපාත. මෙ කීසෙයින් පිරිබෙව් හෝ දෙලේඩ්ඩුපාත හෝ උපචාරසීමාය යි දතයුතු.

## පඤ්චමං.

---

**න අඤ්ඤං**-අනිකක් ප්‍රත්‍යය කොට නො වේ. මා අඤ්ඤ කොචි පච්චයො හොති යි යුතැ ති. **අස්ස**-ජානං යන මේ පදයාගේ; සඞ්ඝයාගේ පාත්‍රාදි භාණ්ඩ තුබූ ගෙය රක්නා උපසම්පන්නයා **භාණ්ඩාගාරික** නම්. සූත්‍රාන්තාදි ගණ හදාරවන්නෝ **ගණවාචකාචාරීහු** නම්හු. **භණ්ඩාගාරිකස්ස බහූපකාරතං ධම්මකථිකාදීනඤ්ච ගුණවිසිට්ඨතඤ්ච** යුතැ ති.

**ධුවවාසත්ථාය**-නිත්‍යවාසය සඳහා; **පුබ්බං**-පළමු කොට; වස ගින් පමුණුවා දුන් සෙනසුන් ගෙණ වෙසෙමින් සිටියේ යි. **පවිසන්තස්ස නික්ඛමන්තස්ස වා තස්ස භික්ඛුනො** යි යොදනු; දියඩ්ඪහත්ථවිත්ථාරෙ මගෙහා උපචාරෙ **නාම**. **උපචාරං**-සමීපයට; **අනුපවිසිත්වා**-(යතා)වැද; **මහල්ලකො**-පමණ මහත්; **යතො**-යම් පාශ්වයෙකින්; **පවිසන්තස්ස**-සෙනස්නට වදනහු; **සම්බාධං**-ගහට; විහාරස්ස උපචාරෙ නාම දස්සනසවණූපචාරෙ;

**ආපදාසු**-පිඩතැ ලගුත් ජීවිතබ්‍රහ්මචරියන්තරාය ඇති කල්හි;

## ඡට්ඨං.

---

**අනෙකභූමකා පාසාදා**- තල සඞ්ඛ්‍යාත නොයෙක් බුමු ය සි සේ යි, මහල් ඇති; **කොට්ඨකා**-දොරටු; **චතුස්සාල**-සිවුරුස්; **ඨපෙත්වා ඨපෙත්වා**-තන්හි තන්හි සිටුව සිටුවා; **ද්වාරගණනාය**-දොරටුගණනින්; **අනාමසිත්වා**-නො ගෙණ; **මහාද්වාරං**-අනන දොරටුව; ඉඩ අගගිසාලාදී එව උපචාරෙ.

**උපට්ඨානසාලා**-බොජුන්හල්; ආදි ශබ්දයෙන් මණ්ඩපාදි ගන්නු. **අසම්බද්ධෙසු පරික්ඛාරෙසු**- සිපිළිබද්ධපරිෂ්කාරයෙහි; සම්‍යක් බඩ නො වනු අසම්බද්ධවචනයෙන් කියනලදි. **නික්කඩ්ඪනෙ වා** යන්නෙහි නික්කඩ්ඪාපනෙ යනු ශෙෂ යි. හෙවත් වා ශබ්දාර්ථ යි. **අත්තනො පුග්ගලිකෙ අනාපත්ති** යනු මතු වදළකල අත්තනො විස්සාසිකස්ස වා සන්තකො විහාරො යි කුමට කිහ? යත්:—මෙ ම කි පාඨයට අනුලොම් වන්නෙන් කීහු. **අනාපත්ති** අන්තෙවාසිකාදීනං;

### සත්තමං.

---

**උපරි අච්ඡන්නතලාය**- මත්තෙහි පෝරු නො අතුළාවූ තලාද මතු ඇති මහල්පට ය යි සේසි; **අඞ්ගෙ විජ්ඣිත්වා පවෙසිතපාදකං**-හැඳවල්හිස විද පාසිළු ගන්වා සිළුමුදුනෙහි ඇණ නොගැන්වූ හැඳ ආහච්චපාදක නම් වේ. **මඤ්චං වා පීඨං වා** යි විතීයාන්ත වචන කොට කීහු. **අභිභවිත්වා** යයි සේ යි. **අජ්ඣොත්ථරිත්වා**- මැඩ පුහුපුලු වැ; **නිසීදෙය්‍ය**-හිඳී ද; **වා**-නොහොත්; **එතං**-මේ; **භුම්මත්ථෙ**- සප්තම්‍යර්ථයෙහි; **උපයොගවචනං**- විතීයාවචනයෙකි. එහෙයින් මඤ්චෙ වා පීඨෙ වා යි සප්තම්‍යර්ථ වූ විතීයාන්තයාගේ අර්ථ කියනු පිණිස කීහු. **තුලාති**- තලාදින්; තලාදයැ[1] යි සේයි.

**තික්ඛපාචිත්තියං**-සඞ්ඝිකෙ සඞ්ඝිකසඤ්ඤී, වේමතිකො, පුග්ගලිකසඤ්ඤී යන විකල්පත්‍රයයෙහි තුන්පචිත්තෙක් වේ. **අවෙහාසකුටියාති භූමියං** කතපණ්ණසාලාදිසු **අනාපත්ති. සීසඝට්ටාය**-හිස ගැසෙන්නා වූ වෙහාසකුටියෙහි නිසජ්ජාදිය කරන්නාහට ද; **අපරිභොගං හොති**-යම්වෙහාසකුටියකගේ යටතලය පරිභොගාහී නොවේ ද; **උපරිමතලං**-මතුමාල; **පදරසඤ්චිතං වා**-පෝරු අතුරණ ලද හෝ වේ ද; **ආහච්චපාදකො**-ඇණ නො ගැන්වූ හැඳ පුටුයෙහි සිටියේ; **කිඤ්චි ගණ්හාති වා ලග්ගෙති වා**-උඩ බැඳි කිසිවක් ගන්නේ හෝ වේ ද, උඩ බැඳි අඩකුසාදියැ යම් පිරිකරක් එල්වන්නේ හෝ වේ ද; **පටාණි** නම් හැඳ පාසිළු නො ගිලිහෙන පිණිස පිටසැ හොවා ගසන ඇණ යි. **පාදසිඛානං**-මඤ්චපාදශීර්ෂයන්ගේ;

### අට්ඨමං.

---

**පිට්ඨසඞ්ඝාටස්ස සාමන්තා**-දොරබියලි පළල පමණ දොරබා අබියෙස් අධික කොට; **අග්ගළ** නම්, උඩෙළිය යෙත්. **සක වාටස්ස ද්වාරබන්ධනස්ස**-දොරපෝරු සහිත ද්වාරබන්ධනයාගේ;

---

1, තුලංමැද.

නොගොත්, සකවාටස්ස ද්වාරබන්ධනස්ස-උඩෙළුපතසහිතවූ දොර පෝරුයෙන් දොරබාව; නිච්චලභාවත්ථාය- නිශ්චලභාවය පිණිස; විවරණකාලෙ-විවෘත කරණ කාලයෙහි; ලහුපරිවත්තිකං කවාටං-මඳක් විවෘත කරණලද දොර; ඝට්ටිතං ආහනති- ඝට්ටිතය පහරණේ ය යි සේ යි, ගැසෙයි; ද්වාරබාහං ආහනති- දොරබාව ගැසෙයි; කෙන ආහනනෙන- ඒ පැහැරුමෙන්; අග්ගළඨපනාය-ඝන්තෙහි අග්ගල නම් අගුලු ය. මෙතැන අග්ගලය ගා සඝවාරිකමයෙන් තත්සහිත දොරපෝරුයෙන් යුත් දොරබාව කී බැවින් දොරබාව නිශ්චල වන පිණිස ය යන අර්ථ යි. තත්ථ-ඒ 'යාව ද්වාරකොසා අග්ගළඨපනාය' යනාදියෙහි; යාව ද්වාරකොසා-ද්වාර කොසය දක්වා; අග්ගළඨපනාය- සකවාට ද්වාරබන්ධනය නිශ්චල වනු පිණිස; පුනප්පුන ලිම්පිතබ්බො ලෙපොපෙතබ්බො යන; එව මෙත්ථ දළ්හබ්බො-පාඨසෙස ය යි සේයි; අධිකාරතො- ප්‍රස්තාව හෙයින්; ආලොකං සන්ධෙති පිධෙතීති= ආලොකසන්ධි. වාතං පිවතීති=වාතපානං; ආලොකසන්ධිවාතපානකවාටයන්ගේ, පරිකම්මත්ථාය-සපිරිතමය පිණිස; මතාතිච්ඡදනස්ස පරියාගනති- පරියාදං යන්නෙහි; පරියායං වුච්චති පරික්ඛෙපො- පරියාය යි පරික්ෂෙප කියනු ලැබේ. අධිඝාතබ්බං- විධාන කට යුතු යි. යස්මිං ඛෙත්තෙ වුත්තං- යම් ක්ෂෙත්‍රයෙක්හි වපුරණලද්දේ; තාව න සම්පජ්ජති-තව නො හැප්සෙ ද නොහොත් යම්තාක් නො හැප්සිති ද; අප්පහරිතෙ යන මේ පාලියෙහි වචනය මඳක් හැප්සුනේ ද අප්පහරිත ය යි නො ගතයුතු. අප්පිච්ඡො යනාදියෙහි මෙන් සර්වප්‍රකාරයෙන් නො හැප්සුනේ ම අප්පහරිත ය යි දතයුතු. වස්සෙ පන පතිතෙ- වැසි වට කල්හි වනාහි; සම්පජ්ජිස්සති- හැප්සේ ද; අධිඝතෙන්තා- විධාන කරන්නේ; පිට්ඨිවංසස්ස වා- වසෙලපාර්ශ්වයෙහි හෝ; කූටාගාරථූපිකාය වා-කුළුගෙයි කැරැල්ලෙහි හෝ; පස්සෙ-පාර්ශ්වයෙහි හෝ; ඡදනමුඛවට්ටියන්තෙන- සෙවෙනි කෙළවරින් බලන්නාහට හෙවත් සෙනත් තණින්, සෙනත්කෙළවරින්, අනතමූවව්පිනැයි සේයි. මග්ගෙන ජාදියමානෙ-තිණ්ණං මග්ගානං උපරි ය යි යොදනු. නිම්බකොසයෙහි පටන් වසල දක්වා මග්ගසණ්ඨානයෙ ජාදනමාර්ගයෙන් සෙවීම් නම් වේ. මාර්ග ගන්නාකල එකකු අත යවා සොයන පමණක් ගතයුතු. මෙහි, මග්ගෙන ජාදියමානෙ-යට සිට උඩ බලා මගින් සොයනකල්හි; මග්ගෙන ජාදනං ඉට්ඨකසිලාසුධාසු ලබ්භති. තිණ්ණං මග්ගානං පරියායෙන-සෙවෙනිමාර්ගයන් තුන්දෙනෙ තුන්ගේ පරික්ෂෙපයෙන්; මෙසේ විපරියයෙන් සෙවීම් නම් නිම්බ

**ඝොසය** යි කියනලද සෙමෙතිකෙළවර පටන් සිසාරවා සෙවීම මැ යි. 'ඉඩකාති ඡදනොපලා' යනු ටීකා යි. **තිණමුට්ඨිගණනාය ච**-තණකැරලිගණිතින් ද;

අතිරෙකචතාහිපරියායෙ අතිරෙකසඤ්ඤිනො ඌනකසඤ්ඤිනො වෙමතිකස්ස ච **තිකපාචිත්තියං. සෙතවණ්ණාදිකරණිති** සෙතවණ්ණකාලවණ්ණාදිමනෙකකබ්බතුවපි කාතුං ලබ්භති. **තිණකුටිකාසු**-තෘණකුටියෙහි ද; ගෙහි සෙවෙති ද බිත්ති ද තණයෙන් කළ කුටිකා තිණකුටිකා නම් වේ. **තෘණපණ්ණච්ඡදනකුටිකා** ය යි මැ ගන්නේ.

නවමං.

---

**සප්පාණකං එතනාති**-මේ ජලය සප්‍රාණ ය යි; **තුඩ**-ඒ සිඤ්චනය සිඤ්චාපනය යන දෙක්හි; මෙහි සිඤ්චනය නම් වත්කිරීම යි. **මාතිකං**-දිය පවත්නා ඇල; **සමවුඛං**[1] **කාරෙති**-දිය පැවැත්වියැටි **දසට** අභිමුඛ කෙරේ ද; **දිවසම්පි**-දවසක් මුළුල්ලේ ද; **සඤ්තු**-වැටේ ද; **අඤ්ඤතො නෙනානස්ස**-අතික් දිගකින් ගෙණ යන්නාහට; **ඉදං ච යං එවං පකතිපමාණෙ පරියාදනං ගච්ඡති** යන්නෙහි, **ඉදං ච**-මේ ආපත්ති වෙ යි යන වචනය ද; **එවං පකතිපමාණෙ**-මෙසේ බහා ලනලදකල්හි; **යං**-යම් ජලයෙක්; **පරියාදනං ගච්ඡති**-ක්‍ෂය විවට යේ ද; **ආවිලං හොති**-කැලඹේ ද; **නාදිසං සන්ධාය** වුත්තං යි යොදනු. **න මහා උදකං**-මහාජලය සඳහා කියනලද්දේ නො වේ.

**උභොසු ච වෙමතිකස්ස**-සප්පාණක අප්පාණක යන දෙක්හි ද විමති ඇත්තාහට; **පණුවන්** නො නස්නා සේ ගඩාදිය දියෙහි මැඩ නැව **ද** දියැ **තෘණපණ්ණාදිය එවුන ද**[3] අසංවිච්ච කළා නම් වේ. සිහි නැති වැ කෙළෙල් අසතියෙන් කළා නම් වේ. **අජානනස්ස**-පණුවන් ඇති බව නො දැනැ කළාහට; **තං ච උදකං නාදිසමෙව**-ඒ ජලය ද ක්‍ෂය වන ජලයක් බව ය, ගෙවෙන බව ය. වධකචිත්තය ඇත, සප්පාණකවග පළමුවන සිඛයට විෂය වන්නෙන් එයින් තොර කරණු පිණිස විනා වධකචිත්තෙනාති සුහු. **වධකචිත්තං විනා** යන්නෙන් **පණාතිපාතිවජ්ජං** කිහු.

දසමං.

---

**භූතගාමවග්ගො දුතියො.**

---

1. පමුඛං--කඞ්ඛාවිතරණී. 2. වධකචෙතනාය-කඞ්ඛාවිතරණී.

2. පණුවන් නො නස්නාසේ ගන්වා දියෙහි මැඩ නා!ඔවදනාදිය වැද තෘණපණ්ණාදිය එවුනු-ඇතම්.

**අට්ඨඞ්ගසමන්නාගතස්ස භික්ඛුනො**- "සීලවා හොති" යනාදි වූ අෂ්ටාඞ්ගයෙන් සමන්විත භික්ෂුවක්හට සජ්ඥයන් විසින් ඤත්තිචතුත්ථකර්මයෙන්, **යා භික්ඛුනොවාදකසම්මුති අනුඤ්ඤාතා** යි යොදනු. **සම්බහුලා**- දෙතුන් දෙනෙකුන් හෝ; **ඔසාරෙන්තො**-අට්ඨ ගරුධර්මයෙන් අවවාදවශයෙන් කියන්නේ; **ඔවදෙය්‍ය**- අට්ඨගරුධර්මපාඨොච්චාරණාඛ්‍ය අවවාද කරන්නා නම් වෙයි සේ යි.

**භික්ඛුනීසු උපසම්පන්නමත්තං වා**-භික්ෂුණීන් කෙරෙහි උපසම්පන්නමාත්‍රව හෝ; මෙයින් එකතොඋපසම්පන්නාව ගෙණ කීහු. **තිකපාචිත්තියන්ති** අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී වග්ගං භික්ඛුනීසඞ්ඝං වග්ගසඤ්ඤී ඔවදති, වෙමතිකො ඔවදති, සමග්ගසඤ්ඤී ඔවදති, ආපත්ති පාචිත්තියස්ස යි අධර්මකර්මයෙහි අධර්මකර්මසංඥි පක්ෂයෙහි වදළ තුන් පචිත්තෙක් වෙයි. **තථා වෙමතිකස්ස**-එසේ මැ විමති ඇත්තාහට තුන්පචිතියෙක් වේ. එ ද මෙසේ දතයුතු. අධම්මකම්මෙ වෙමතිකො වග්ගං භික්ඛුනීසඞ්ඝං වග්ගසඤ්ඤී ඔවදති, වෙමතිකො ඔවදති, සමග්ගසඤ්ඤී ඔවදති, ආපත්ති පාචිත්තියස්ස යි අධර්මකර්මපක්ෂයෙහි මැ විමතිවිචාරණයෙහි පචිති තුණෙක් වේ. **ධම්මකම්මසඤ්ඤිනො චාති**-ධර්මකර්මසංඥිහට ද තුන් පචිත්තෙක් වේ. හෙ මෙසෙයින් දතයුතු. අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී වග්ගං භික්ඛුනීසඞ්ඝං වග්ගසඤ්ඤී ඔවදති, වෙමතිකො ඔවදති, සමග්ගසඤ්ඤී ඔවදති, ආපත්ති පාචිත්තියස්ස යි තුන් පචිති වෙයි කියා මෙසේ නව පචිතියෙකි. මෙහි කර්ම නම් භික්ඛුනොවාදකසම්මුති කර්මයයි දත යුතු. **සමග්ගෙපි භික්ඛුනීසඞ්ඝෙ නවාති**-එත්ථාපි අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී සමග්ගං භික්ඛුනීසඞ්ඝං වග්ගසඤ්ඤී ඔවදති, වෙමතිකො ඔවදති, සමග්ගසඤ්ඤී ඔවදති යි කියා යට කී ක්‍රමයෙන් නවයෙකැ යි මෙසේ අටළොසෙක් වේ. **සමග්ගම්හය්‍යාති**, **අය්‍යා**-ආර්ය්‍යයෙහි යි යේයි, ස්වාමීනි; **සමග්ගම්හාති**-සමගයම්හ යි; **වුත්තෙ**-කීකල්හි; **අඤ්ඤං ධම්මං**-අෂ්ට ගරුධර්මයෙන් පිටත් අනෙක් ධර්මයක් කියන්නාහට ද; **අනිය්‍යාතෙත්වා** යනු "වත්තන්ති භගිනියො අට්ඨ ගරුධම්මා" යි පිළිවිස "වත්තන්ති" යි කීකලැ "එසො භගිනි ඔවාදො" යි නො කියා අවවාදපිණ්ඩා නො කොට ය යුතැති. **නිය්‍යාතෙතබ්බොති** අප්පෙතබ්බො යනු අටුවා යි. **අට්ඨගරුධම්මපාළිං උද්දිසං දෙති**- අෂ්ටගරුධර්මපාළිය කියවා දේ ද; **පරිපුච්ඡං දෙති**-එහි අර්ථ කියා ද; **ඔසාරෙහි අය්‍යාති වුච්චමානො**-ආර්ය්‍යයෙහි, ගරුධර්මය කියව යි ආරාධනා කරණකල්හි; **ඔසාරෙති**-කියා ද; **පඤ්හං**

**පුච්ඡො කථෙති**-ගරුධම්මනිශ්‍රිත වූ හෝ ස්කන්ධාදිනිශ්‍රිතවූ හෝ ප්‍රශ්නය භික්ඛුනිය විසින් විචාරණලද්දේ කියා ද; **අඤ්ඤස්සත්ථාය භණති**-භික්ඛුසාමණේරාදී අනෙකෙක්හු පිණිස බෙණේ ද; **පරිපුණ්ණූපසම්පන්නතා**-උභතොපසම්පන්න බව;

**පඨමං.**

---

**තිකපාචිත්තියන්ති** අත්ථඞ්ගතසඤ්ඤී, වෙමතිකො, අනත්ථඞ්ගතසඤ්ඤීති විකප්පත්තයෙ; **එකතොපසම්පන්නන්ති** භික්ඛුනී සඞ්ඝෙ උපසම්පන්නං; භික්ඛුසඞ්ඝෙ උපසම්පන්නම්පන ඔවදතො පාචිත්තියමෙවාති **අට්ඨකථායං** වුත්තං. **උද්දෙසාදිනයෙන අනාපත්ති**-උද්දේශං දෙති, පරිපුච්ඡං දෙති යනාදි නයින් අනාපත්ති යි.

**දුතියං.**

---

**භික්ඛුනියා**-භික්ෂුණිය විසින්; **එකරත්තිං වසනට්ඨානම්පි**-එකරැයකුදු වසනලද්දා වූ ස්ථානය භික්ඛුනුපස්සය නම් වෙයි යේයි. **මෙ පාචිත්තියානි**-පළමු සිඛයෙන් හා මෙ සිඛයෙන් හා පචිතිහු දෙදෙනෙක් වෙත්. **තීණි හොන්ති**-පළමු වන දෙ වන තුන්වන සිඛයෙන් තුන් පචිති කෙණෙක් වෙත්, **සම්මතත්තා හි**-සම්මත හෙයින් වනාහි; **ගරුධම්මොවාදමූලකං**-අෂ්ටගරුධර්ම යෙන් කරණ අවවාදය මූල් කොට ඇති; **පාචිත්තියං අස්ස නත්ථි** යි යොදනු.

**තිකපාචිත්තියන්ති** "උපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤී, වෙමතිකො, අනුපසම්පන්නසඤ්ඤී භික්ඛුනුපස්සයං උපසඞ්කමිත්වා අඤ්ඤත්‍ර සමයා ඔවදති, ආපත්ති පාචිත්තියස්ස"යි වදාළ තුන් පචිති වේ. **යෙන කෙනචි**-එකතොපසම්පන්නාවට අෂ්ටගරුධර්මයෙන් වේවයි අනෙකකින් වේවයි අවවාද කරන්නාහට දුක්කට යි. **ඉතරන්ති**-උභතොපසම්පන්නං. **අඤ්ඤෙන ධම්මෙන**-අෂ්ටගරු ධර්මය හැර අනෙක් ධර්මයෙකින්; **සමයෙ**-ගිලන්කල්හි භික්ඛුනුපස්සයට එළඹ අෂ්ටගරුධර්මයෙන් අවවාද කරත් අනාපත්ති යි. **උද්දෙසාදිනයෙන**-පෙළ අටුවා කියවා දීම් වසයෙන්;

**තතියං.**

---

**චීවරාදීනං** යන්නෙහි ආදි ශබ්දයෙන් පිණ්ඩපාතාදි තුන්පසය ද සක්කාරගරුකාරාදීහු ද ගැණෙත්. **අඤ්ඤතර හෙතු**-එක්තර එකක් හෙතු කොට; **භික්ඛූනි**-භික්ඛු යන්

නෙහි; **සම්මතා භික්ඛු**-ඤත්තිචතුත්ථකම්මයෙන් භික්ඛුනොවාදක සම්මුතිය ලද භික්ෂූහු; **ඉධාධිප්පෙතා**-මේ ශික්ෂාපදයෙහි අභිමත යෝ යි. **එවරූපෙ භික්ඛු**-මෙබඳු භික්ෂූන්ට; **අවණ්ණකාමතාය**-නුගුණ කැමැති බැවිනැ යි සේයි, අයස කැමැති බැවිනැ යි යේ යි, ආමිෂය හෙතු කොට ගෙණ භික්ෂුණීන්ට අවවාද කෙරෙති යි මෙසේ කියන්නාහට;

**ධම්මකම්මෙ තිකපාචිත්තියං**- "ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී. වෙමතිකො, අධම්මකම්මසඤ්ඤී එවං වදති ආපත්ති පාචිත්තියස්ස" යි වදාළ තිකපාචිත්තිය වේ. මෙහි කම්ම නම් යථොක්ත භික්ඛුනොවාදකසම්මුතිකර්මය මැ යි. **සම්මතං වා අසම්මතං වා අනුපසම්පන්නං වාති** යොජනා. **අසම්මතං වා**-අසම්මත භික්ඛුවක්හට ද; **තදුභ**-ඒ සම්මත අසම්මත දෙක්හි; **යා**-යමෙක්; **භික්ඛුකාලෙ සම්මුතිං ලභිත්වා**-උපසම්පන්න කාලයෙහි භික්ඛුනොවාදකසම්මුතිය ලදින්; **පකතියා**-ස්වභාවයෙන්; **චීවරාදිහෙතු ඔවදන්තං පන**-චීවරාදිප්‍රත්‍යය හෙතු කොට ගෙණ අවවාද කරන්නාහට වනාහි; **අනාමිසන්තරතා**-චීවරාදි ආමිෂාධ්‍යාශයක් නැතිබව ය.

## චතුත්ථං.

**අඤ්ඤාතකං** - නාමගොත්‍රයෙන් අප්‍රසිද්ධ භික්ෂුවක්හු; **තත්ථ හි**-ඒ චීවරපටිග්ගහණසිඛයෙහි; **භික්ඛු පටිග්ගාහකො**-භික්ෂුණිය විසින් දෙන්නාවූ සිවුර පිළිගන්නා හෙයින් භික්ෂු තෙමේ ප්‍රතිග්‍රාහක ය. **ඉධ**- මේ සිඛපදයෙහි; **භික්ඛුනීති**-භික්ෂුණී තොමෝ ප්‍රතිග්‍රාහක යි.

## පඤ්චමං.

**තස්ස**-ඒ සිබ්බනය පිණිස නියොග කරන්නාවූ ආණාපකයා හට; **ආරපථෙ ආරපථෙ**-සූචිමාර්ගයෙහි මාර්ගයෙහි; හිදිමලින් මලැ ය යි සේයි. මෙහි හිදිකටුව පුරා සියක් විටක් හැස් නහා ඇද්ද එක් එක් ආරපථයෙක් නම් වෙ යි දත යුතු. **එකවාචාය**-'චීවරෙ යං කත්තබ්බං තං සබ්බං තව භාරො'' යන මේ එක වචනයෙන්; **සම්බහුලානි පි**-බොහෝ ද වූ ආපත්තිහු, **ආණාපකස්ස හොන්තීති** සම්බන්ධ.

**තිකපාචිත්තියං**- "අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී, වෙමතිකො, ඤාතිකසඤ්ඤී චීවරං සිබ්බති වා සිබ්බාපෙති වා ආපත්ති පාචිත්තියස්ස" යි වදාළ පාචිත්තියත්‍රය වේ. **ථවිකාදීති** උපාහනත්ථවිකාදි; **වුත්තලක්ඛණං සිබ්බාපනං වාති** ආරපථෙ ආරපථෙ සිබ්බාපනං.

## ඡට්ඨං.

**සංවිදහිත්වා** ගමනකාලෙ-අද යම්හ, සෙට යම්හ යි යනාදීන් එක් වැ බැණ ගෙණ යන කල්හි; **සඞ්කෙතං කත්වාති අසෙථා**-කාලමග්ගවාරාදීන් සලකුණු කොට යන අර්ථ යි. 'අජ්ජ වා සෙව වා පරෙ වා ගච්ඡාමාති සංවිදහිත්වා' යනු පාඨ යි. **එකං අද්ධාන සඞ්ඛාතං මග්ගං වා**-අද්ධාන ය යි කියනලද එක් මාර්ගයකට හෝ; **එකතො අද්ධානමග්ගං වා**-එක් වැ අද්ධානමාර්ගයට හෝ; පැමිණ යන්නාහට ගාමූපචාරොක්කමනයෙන් ද අඩ්ඪයොජනාති ක්‍රමයෙන් ද පාචිත්තිය වේ යනු සම්බන්ධ යි. **සත්ථගමනීයො**-සත් වාවන් හා කැටි වැ මිස නො යා හැකි මඟ යි සත්ථගමනීය නම්. **සෙසං** යන්නෙන් සාසඞ්කසම්මතාදි ගත්හු. මෙහි සොරුන් හොත්තැන් හුන්තැන් සිටිතැන් කෑතැන් පූතැන් පැණෙන මඟ සාසඞ්ක නම්. සොරුන් විසින් කෙටුවන් මැරුවන් පහළවුන් වොළල්‍ර ගත්නාලද්දවුන් ද පැණෙන මඟ සප්පටිභය නම්. **තත්ථාති** අකප්පියභූමියං; **අන්තරාරාමං**-ඇතුළු අරම ද; **ආසන සාලා** නම් විහාරපරියන්තයෙහි ද ග්‍රාමමධ්‍යයෙහි ද සඞ්ඝයා වල දන පිණිස කරණලද්දේ යි. **තිත්ථියසෙය්‍යාස්ඵාති**-තිත්ථකාරාමය ද යන මේ සතර; **ඨපෙත්වා**-තබා; **සෙසං**-සෙස්ස; **අකප්පිය** භූමි නම්. **තත්ථ ඨත්වා**-ඒ අකප්පියභූමියෙහි සිට; **වාරවිසඞ්කෙතං පන**-නික්මෙම්හ යි කී දෙර තබා අනෙක් දොරකින් යාමෙන් වාරවිසඞ්කෙතය ද; **මග්ගවිසඞ්කෙතං වා**- එසේ මැ මාර්ග විසඞ්කෙතය ද; **කත්වාපි**- කොට ද; **ඨපිතං උපචාරං යාව න ඔක්කමති තාව අනාපත්ති** යි යොදනු. **අඩ්ඪයොජනාතික්කමෙන පාචිත්තියන්ති** යොජනා.

**භික්ඛුපාචිත්තියන්ති** සංවිදහිතෙ **සංවිදහිතසඤ්ඤිනො, වෙමතිකස්ස, අසංවිදහිතසඤ්ඤිනො** යි පාචිත්තියත්‍රය වේ. **යො ච**-යම් භික්ෂුවක්; **භික්ඛුනියා අසංවිදහන්තියාපි**- භික්ෂුණිය සල කුණු නො කරවා ද; **කෙවලං**-හුදෙක්; **අත්තනාව**-තෙමේ මැ; **සංවිදහති**-සලකුණු කෙරේ ද; **සමයෙ**- සත්ථගමනීයාදිකාලයෙහි; **විසඞ්කෙතෙන වා**- කාලවිසංකෙතයෙන් වෙව යි; **ආපදාසු** යන්නෙහි රට බුන්කල ජනයන් පලනාකලි. **මග්ගපටිපන්නති**- මාර්ගයට ප්‍රාප්ත වීම ය; **අවිසඞ්කෙතං**-කාලඅවිසඞ්කෙතය;

**සත්තමං.**

---

**කීලාපුරෙක්ඛාරෙ** යන්නෙහි ලොකාස්වාද මෛත්‍රීසංස්තව වශයෙන් හෙවත් ලොකාස්වාදමෛථුනසංස්තව වශයෙන් නැඟී කෙළනා සිත් පෙරදූරි කොට; **සංවිදහිත්වා** ය යි සේ යි; **අභිරුහනකාලෙ**-නැඟෙනකල්හි; **සඞ්කෙතං කත්වාති අසෙථා**-සලකුණු කොට ය යන අර්ථ යි. **උද්ධගාමිනින්ති** යන්නෙහි, **කීලාවසෙන**-ලොකාස්වාද කෙළිවශයෙන්; **නදියා**-නදියගේ; **උද්ධං**

ය යි සේ යි, **පටිසොතං**-උඩුගඟට; **ගච්ඡන්තිං**-යන්නා වූ; **නාවං අභිරූහෙය්‍ය** යනු අධ්‍යාහාර කොට යොදනු. **අධොගාමිනින්ති** යන්හෙහි, **තථෙව**-එසේ මැ කීලාවශයෙන්; **අධො** ය යි සේ යි; **අනුසොතං**-යටිගඟට; **ගච්ඡන්තිං**-යන්නා වූ; **නාවං අභිරූහෙය්‍ය** යි එසේ මැ අධ්‍යාහාර කොට යොදනු. **තිත්ථප්පටිපාදනත්ථං**-තොටට පමුණුවනු පිණිස; **උද්ධං වා**-උඩුගඟට හෝ; **අධො වා**-යටගඟට හෝ; **යං පන නාවං හරන්ති**-යම් නැවක් ගෙණ යෙද්ද; **එත්ථ**-එහි ගිඳ යන්නාහට; **අනාපත්ති**-නිරවැති. **අසඤ්චිච්ච -පෙ- වචනං**-අසඤ්චිච්ච තිරියං තරණාය යනු විභීයාපීයෙහි පසුවම්වචනයෙකි **යා තිරියං තරණා**-යම් නැවක් තොමෝ තොටට යේ ද; **තං ඨපෙත්වාති අත්ථො**-ඒ තබා යන අර්ථ යි. **සගාමකතීරපස්සෙන**-ගම් සහිත නදීපාශ්වයෙන්; **ගාමන්තරගණනාය**-ගම්හිමින්, පාචිත්තිය වෙයි යොදනු. **අගාමක-පෙ-පාචිත්තියං**-ගම් නැත්තා වූ තීරපාශ්වයෙන් ද යොදනක් පළල ඇත්තා වූ නදීමධ්‍යයෙන් යනකල්හි අඩ්ඪයොජනගණනායෙන් ද පාචිත්තිය වේ.

අට්ඨමං.

---

**භික්ඛුනියා**-භික්ෂුණිය විසින් සපයනලද්දේ; **තස්ස**-ඒ භික්ෂුහුගේ; **නෙව ඤාතකපවාරිතානං ගිහීනං සන්තිකෙ**-නො නෑ නො පැවරූ ගිහීන් කෙරෙහි ද; **නාතකනො ඤාතකපවාරිතානං**-තමාගේ නො නෑ නො පැවරූ; **ගිහිනං සන්තිකෙ**-ගිහීන් කෙරෙහි ද; **නිප්ඵාදිතං** ය යි සේයි, **ලද්ධබ්බං භත්තන්ති අත්ථො**-ලැබිය යුතු කොට කරණලද යන අර්ථ යි. **සමාරබ්භං** යි යේයි, **පටියාදිතස්ස**-සපයන ලද්දහට; **එතං නාමං**-මෙ නමෙකි. **ගිහිනං**-ගිහීන්ගේ; **සමාරම්භා**-සම්පාදනය: **ගිහිසමාරම්භා**-ගිහිසමාරම්භ නම් වේ. **භික්ඛුනියා**-භික්ෂුණිය විසින්; **පරිපාචනතො**-සැපයීමකට; **පුබ්බ** ය යි යේ යි, **පඨමතරංයෙව**-පළමු කොට මැ; **යං-භික්ඛූනං-පෙ-භත්තං**-භික්ෂූන් පිණිස ගිහීන් සම්පාදිත වූ යම් භක්තයෙක් ඇද්ද; **තං ඨපෙත්වා** යි යොදනු. **තඤ්ච ඛො**-ඒ පාචිත්තිය ද;

**උභයත්ථ**-පරිපාචිත අපරිපාචිත දෙක්හි;

නවමං.

---

**උපරි**-මත්තෙහි; **උපනන්දස්ස**-උපනන්දයාගේ; **චතුක්කංසිකම්බපදෙන ච**-**අචෙලක**වග්ගයෙහි චතුක්කංසිබපදය හා ද; **එකපරිච්ඡෙදං**-අර්ථ හෙයින් සම යි.

දසමං.

---

ඔවාදවග්ගො තතියො.

---

**එකොති** යන්නෙහි, '**එකදිවසිකො**-එකදවසෙක යන අර්ථයි. උපාසකයන් විසින් එකදවසක් මැ වැලඳිය යුතු ය යි පණවනලද ආහාරය යි සේයි. **ආවසථපිණ්ඩොති** යන්නෙහි, **ඉමෙසං වා**-මේ පාෂණ්ඩයන්ට ය යි හෝ; **එත්තකානං වා**-මෙතෙක් පාෂණ්ඩයන්ට ය යි හෝ; **එකං පාසණ්ඩං වා**-එක් සමයාන්තරයකට ය යි හෝ; **එත්තකමෙව වාති**-මෙතෙක් සාලේ බත් දිය යුත්තේ ය යි; **එවං**-මෙසේ; **භත්තං වා**-ආහාරයක් හෝ; **අනොදිස්ස**-නො උදෙසා නියම නොකොට; **පඤ්ඤත්තං භොජනං**-පණවනලද්දවූ පඤ්චවිධභොජනයෙන් එක්තරා එක්භොජනයෙක් ආවසථපිණ්ඩ නම්. **එකතො ගුත්වා**-එක් වැ බැණැ ගෙණැ; **අජ්ජ එකස්මිං**-අද එක් තැනැකැ දී දෙම්හ; **සෙව එකස්මින්ති**-සෙට එක් තැනැකැ දී දෙම්හ යි; **එවං අනියතට්ඨානෙ වා**-මෙසේ අනියතස්ථානයෙහි හෝ නියතස්ථානයෙහි හෝ; **පඤ්ඤත්තො**-පණවනලද්දවූ ආහාරය එක් දවසක් මැ භුඤ්ජිතබ්බ ය යි සේ යි; **තෙසං සන්තකස්ස**-ඒ උපාසකවරුන් සතු ආහාරය;

**අනුවසිත්වා**-නැවත එහි ලැගැ ලැගැ; **ගිලානස්ස**-අගිලාන සඞ්ඛ්‍යා ඇත්තාවූ ගිලන්හට ද; **යො ච සකිං වා භුඤ්ජති**-යම් භික්ෂුවෙක් එක්දවසක් වලඳා ද; **ගච්ඡන්තො වා**-යන්නේ ගමිකහෙයින් නැවත එයින් මැ වලඳා ද; **අන්තරාමග්ගෙ එකදිවසං**-අතරමග එක් දවසක් ඔහු ම සන්තකය ආගන්තුක වැ වලඳන්නාහට ද; **ගතට්ඨානෙ එකදිවසං**-ගියතැනැ එක් දවසක් ඔහු ම සන්තකය ආගන්තුකහෙයින් වලඳා ද; **පච්චාගච්ඡන්තොපි**-නැවත ඒ මාර්ගයෙහි එන්නේ ද; **යාවදත්ථං**-කුක්ෂිපූරණය වන පරිද්දෙන්; **න පඤ්ඤත්තං**-උපාසකයා විසින් සම්මත නො කරණලද ආහාරය ද; **පඤ්ච භොජනානි ඨපෙත්වා**-පඤ්චප්‍රකාර භොජනය තබා.

**පඨමං.**

---

**දුතියෙ**-දෙවෙනි ශික්ෂාපදයෙහි; **ගණභොජනෙ** යන්නෙහි, ගණස්ස භොජනං=ගණභොජනං; තස්මිං ගණභොජනෙ. ඒ ගණභොජනය නිමිත්ත කොට ගෙණ පාචිත්තිය වෙයි සේයි. **යෙසං-පෙ-අපෙථා**-නිමන්ත්‍රණයෙන් හෝ විඤ්ඤත්තියෙන් හෝ ඔදනාදි වූ පස් භොජනයන් අතුරෙන් අඤ්ඤතරභොජනයක්; **තෙහි ලද්ධෙ**-ඒ භික්ෂූන් ලද කල්හි; ඒ භොජන ගණභොජන නම යන අර්ථ යි. **කොචි**-කිසි උපාසකයෙක්; **යෙන කෙනචි**-යම් කිසි; **වෙවචනෙන වා**-ඔදනයට භත්ත ය අන්න ය ආහාර ය යනාදි පරියායවචනයෙකින් හෝ; මේ පඤ්චවිධභොජනයැ සවකීයනාමය

අකප්පිය ය. භික්ෂා ගත මැනව, මාගෙන් ව්‍යඤ්ජන ගත මැනව යනු ද නම් කැපයට. **භාසන්තරෙන වා**-මගධ වචනයෙන් පිටත් සිහල දමිළාදි වචනාන්තරයෙකින් වෙවයි; **තෙ**-ඒ භික්ෂූහු; **එවං**-මෙසේ අකප්පියපවාරණයෙන්; **එකතො වා**-එක් කොට හෝ; **නානතො වා**-වෙන් වෙන් කොට හෝ; **නිමන්තිතා**-පවරණලද්දහු; **එකතො වා**-එක් වැ හෝ; **නානතො වා**-වෙන වෙන හෝ; **ගන්ත්වා**-ගොස්; **එකතො ච ගණ්හන්ති**-දෙලොස්රියනින් නොයික්ම සිට ඉදින් ගණිද්ද; **තස්ස දුවිධස්සාපි**-විවිධ වූ ඒ භොජනයාගේ; **එවං පටිග්ගහණෙ**-මෙසේ එක් වැ පිළිගැන්මෙහි; **අඤ්ඤභායිනානං**-කෙළින් අතුළු වෙහෙරවත් භික්ෂූන්ට; **කිඤ්චිදෙව චීවරෙ කත්තබ්බං කම්මං කරොන්ති**-චීවරයෙහි වූ පැදීම ආදි කිසි යම් කටයුත්තක් කෙරේ ද;

දුතියං

---

**පඤ්චහි භොජනෙහි නිමන්තිතස්ස**-පඤ්චවිධභොජනයෙන් නිමන්ත්‍රණය කරණලද්දහට; **-පෙ-පාචිත්තියන්ති සම්බන්ධො. යෙන යෙන උපාසකෙන**-යම් යම් උපාසකයකු විසින්; **තස්ස තස්ස**-ඔහු ඔහුගේ; **භොජනතො**-භොජනයෙන්; **උප්පටිපාටියා වා**-නො විකපා උප්පටිපාටින් හෝ; විකපා උප්පටිපාටි වුව ද දෙස් නො වන හෙයින් වාශබ්දයෙන් කෙවලඋප්පටිපාටිය මැ නො ගතයුතු **අවිකප්පෙත්වා වා**-නො විකපා හෝ; **පරස්ස පරස්ස භොජනෙ**-අනෙකක් අනෙකක්හුගේ භොජනය වැලඳීමෙහි; පාචිත්තිය ඇවැත් වෙයි සේයි. **භත්තපච්චාසං**-භක්තප්‍රත්‍යාශාව;

**එකසංසට්ඨානි වා**-මුසු වූ ආහාරයන් වළඳන්නාහට; **මෙ තිණ්ණි නිමන්තනානි**-දෙතුන් නිමන්ත්‍රණ කෙණෙකුන්; **එකතො කත්වා**-එක් කොට; **සකලෙන ච ගාමෙන**-සියලු ගම්වැස්සන් විසින් ද; **පූගෙන**-ගණ ගණ වූ ජනයා විසින්ද; **යෙසු යත්ථ කත්ථචි**-ඒ නිමන්ත්‍රණවය අතුරෙන් යම් කිසිවක් වළඳ ද; **නිමන්තියමානො වා**-අකප්පියපවාරණයෙන් නිමන්ත්‍රණ කරණ ලද්ද වැ; **ක්‍රියා**-ක්‍රියා නම් පරම්පරභොජනය වැලඳීමය. අවිකප්පනය හෝ පවාරිතපන්තින් නො වැලඳීම හෝ අක්‍රියා යි.

තතියං

---

**පහෙණකත්ථාය**-පඬුරු පිණිස; **පටියත්තෙනන්ති**-සපයනලද; **අතිරස**-පූ ය; **මොදකං**-මුංකැරලි නොහොත් මුංකිරිපූ ය; **සක්ඛලිකාදීහි**-ලාලු ආදි වූ; **යෙහි කෙහිචි ඛජ්ජකෙහි**-යම් කිසි කෑ

දෙයකින් ද; **මන්ථෙහීති**-මන්ථෙහි යන්තෙහි; **පාථෙය්‍යත්ථාය**-මාර්ගෝපකරණ පිණිස; **පටියත්තානි**-සපයනලද; **යෙන කෙනචි**-යම් කිසි; **සත්තු**-බද්ධාබද්ධභෙද; මෙහි බද්ධ නම් පිඬු ය. අබද්ධ නම් හත්සුණු යි. **තිල**-තල ද; **තණ්ඩුලාදීහි**-බැදිසහල් ආදීන්; **අභිසඞ්ඛතඤ්ච පවාරෙය්‍යා**ති සම්බන්ධො. **ද්වත්තිපත්තපූරා**ති යන්තෙහි, **මුඛවට්ටියා**-මූවවිටැහි; **හෙට්ඨිමලෙඛං**-යට රෙඛාව; **අනතික්කන්තා**-නො ඉක්මූනා වූ; **ද්වෙ වා තයො වා පත්තපූරා**-පාත්‍රපූරයෝ දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් හෝ; **පටිග්ගහෙතබ්බා** යි සම්බන්ධ කරණු. යට දෙපාත්‍රය ථූපීගත වී නමුදු මෙ සිඛයෙන් දොෂ ඇතැයි නො හැගේ. ථූපීගත සිඛයෙන් දොෂ වෙයි යෙත්. **ලද්ධට්ඨානතො සබ්බාසන්නං**-ලද්දවූ ස්ථානයට සියලු විහාරයෙන් ආසන්න වූ; **ආසනසාලං වා**-බොජුන්හලට හෝ; **විහාරං වා**-විහාරයට හෝ; **ගන්ත්වා**-පෙ-**දාතබ්බං** යනු හා සම්බන්ධ යි. **වා**-නොහොත්; **යත්ථ වා පන නිබද්ධං පටික්කමන්ති**-යම් තැන කට වතාහි නිත්තෙන් ගොස් වලඳ ද; **තත්ථ ගන්ත්වා**-ඒ නිබද්ධ වැ වලඳන ස්ථානයට ගොස්; **එකං පත්තපූරං**-එක් පාත්‍රයක්; **අත්තනා ඨපෙත්වා**-තමහට තබා; **සෙසං**-සෙස්ස; **භික්ඛුසඞ්ඝස්ස දාතබ්බං**-භික්ෂුසඞ්ඝයාහට දිය යුතු යි. **යථාමිත්තං පන**-මිත්‍රපරිපාටීන් හෙවත් විශ්වාසයන් වූ පරිද්දෙන්, සිත් තුඹූ පරිද්දෙන්; **දාතුං**-දෙන්නට; **න ලබ්භති** [1]-නො ලැබේ. තමා නො කැමැත්තනට නො දීම නො ලැබෙ යි සේයි.

**න මත්තං ජානිත්වා**-මාත්‍රා නො දැන; **පටිග්ගහණවත්ථුස්මිං පඤ්ඤත්තං**-මූවවිටි සම වූ තැනින් අධික කොට ගන්නා වස්තුයෙහි පණවනලදී. මාත්‍රා නම් මූවවිටි සම වූ තුන් පාත්‍රය යි. **තිකපාචිත්තියං** යන්තෙහි අතිරෙකවත්තිපත්තපූරයෙහි අතිරෙකඅනතිරෙකසඤ්ඤී ය වෙමතික යි. **න පහෙණකත්ථාය න පාථෙය්‍යත්ථාය වා පටියත්තං**-පඬුරු පිණිස, මාර්ගෝපකරණ පිණිස නො සපයන ලද්දෙන් ගන්නාහට ද; **තදත්ථාය පටියත්තසෙසකං වා**-ඒ පඬුරු මාර්ගෝපකරණ පිණිස සපයා ඉතිරි වූවා ද; **ගමනෙ වා පටිප්පස්සද්ධෙ**-ගමන් වැළකී කල්හි ද; **අසෙසකතා**-නො ඉතිරිබව;

**චතුත්ථං.**

---

**භුත්තාවීති** යන්තෙහි, භුක්තවා-කෑයේ යි. **යෙන පඤ්චන්නං** -පෙ- **අජ්ඣොහරිතං**-පඤ්චවිධභොජනයන් අතුරෙන් සාසපමාත්‍රයකු දු යමක්හු විසින් වලඳනලදද; **සො**-හෙතෙමේ;

---

1. න ලභති-කඞ්ඛාවිතරණී.

එවං වුච්චති-මෙසේ භුත්තාවී යැයි කියනු ලැබේ. **අසනං පඤ්ඤායති**-කෑම පෙණෙයි; **භොජනං පඤ්ඤායති**- පාත්‍රාදියෙහි භොජනය පෙණෙයි. **හත්ථපාසෙ ඨිතො**-දෙරියන්වියතෙකැ සිටියේ; **අභිහරති**-එළවයි. **තත්ථ**-ඒ පඤ්චාඞ්ගයෙහි; **යස්මා අසනං පඤ්ඤායතීති ආදිනා**-කෑම පෙණෙයි යන මේ වචනයෙන්; **විප්පකතභොජනො පවාරිතොති වුත්තො**-අඩාල බොජුන් ඇත්තේ පවාරිත යැයි කියනලදී. **සො ච විප්පකතභොජනො**-යමෙක් විප්‍රකෘත බොජුන් ඇත්තේ ද; **තෙන**-ඔහු විසින්; **කිඤ්චි භුත්තං**-කිසිවක් කනලද; **කිඤ්චි අභුත්තං**-කිසිවක් නො කන ලද; **යම්භුත්තං**-යමක් වලඳනලද ද; **තං සබ්බාය**-ඒ කෑම පිණිස; **භුත්තාවීති සඞ්ඛං ගච්ඡති**-භුත්තාවී යි නීමට යම් හෙයකින් පැමිණේ ද; **තස්මා භුත්තාවීති වචනෙන, කිඤ්චි අත්ථසිද්ධිං න පස්සාම**-කිසි අර්ථසිද්ධියක් නො දකුමු. අහෙහි කියන ලද අසනං පඤ්ඤායති යන මේ වචනයෙන් ම විප්‍රකෘතභොජන වූයේ පැවැරී අවද්දි යනු හැඟෙන හෙයින් "භුත්තාවීති වචනෙන විසුං කිඤ්චි අත්ථසිද්ධිං න පස්සාම"යි කියූ වෙත්.

**එතං**-භුත්තාවී යන මෙ; **පටික්ඛිපිතබ්බං භොජනං හොතීති අත්ථො**-ප්‍රතික්ෂෙප කට යුතු භොජනයෙක් වෙයි යන අර්ථ යි. **යඤ්ච අස්නාති**-යමක් වලඳා ද; **තං ච භොජනං හත්ථපාසෙ ඨිතෙන අභිහටං පටික්ඛිපති**-හත්ථපාසයෙහි සිටියහු විසින් එළවනලද යම් භොජනයක් ප්‍රතික්ෂෙප කෙරේ ද; **තං**-ඒ භොජනය; **ඔදනො -පෙ- වෙදිතබ්බං**-ඔදන ය, කුම්මාස ය, සත්තු ය, මච්ඡ ය, මංස ය යන මොවුන් අතුරෙන් එක්තරා එකෙකැ යි මැ දත යුත්තේ යි. **භුඤ්ජන්තානං**-වලඳන්නවුන්ගේ; **භොජනකාලෙ**- වලඳනකල්හි; **ගහිතගහිතට්ඨානෙ ඔධි පඤ්ඤායති**-ගත් ගත්තන්හි අවධි පැණේ ද; **සො ඔදනො හොති**-ඒ ඔදන නම් වෙයි සො යනු අධ්‍යාහාර කොට යොදනු. **පවාරණං ජනෙති**-පැවැරී ජනක වේ. **ආවිඤ්ඡිත්වා**-සිසාරා; **පිවිතුං සක්කා හොති**-බොන්නට පිළිවන් වේ ද; **යා යස්සා හත්ථෙන ගහිතොකාසෙපි ඔධි න දිස්සති**-අතින් ගත් අවකාශයෙහි දු යම් යාගුවකගේ ඔධි නො පැණේ ද; **සා**-ඒ යාගුතොමෝ; **පවාරණං න ජනෙති**-පැවැරී නො උපදවා. **උසුමාය විගතාය**-උෂ්ණත්වය විගතකල්හි; බහු **පණ්ණඵලකළීරෙ**-බොහෝ වූ පණ්ණඵලකළීරයන්; කළීර නම් හුණකිළිල වෙබඩ ආදියට සාමාන්‍ය නමෙකි. **අයාගුකෙ නිමන්තනෙ**-එක් වැ ලා බත් දෙම්හ යි පැවැරූකල්හි අයාගුක නිමන්ත්‍රන බතැ කඤ්ජිකාදි වත් කොට හබු නො වූවා

1. පඤ්ඤායති-සබ්බාවිතරණී.

හඹු ගත මැනැවැ යි මෙසේ පැවැරීමෙහි ය යුතත්. එක් වැ ලං නො වැලඳිය හෙත දූය යි සිතා; යාගුං දස්සාමාති–නැවත හඹු දෙම්හ යි; කඤ්ජිකං–කාඩි; පක්කයිතෙලසූ–කකියන්නාවූ; කඤ්– අල; මූල–නෙළුම්දලු; එළෙයි වා–ගෙලබටු කැකිරි ආදි වූ; යෙහි කොහිචි–යම් කිසිවෙකින්; කතං–කරණලද; භත්තං–ආහාරය ද; යාගුම්පි–මුග්ගමාසාදීන් කරණලද රස ද; නොහොත් මච්ඡමංස අමිශ්‍ර වූ ජලයාගු ද; පවාරණං න ජනෙති–පැවැරි ජනක නො වේ; තං සඤ්ඤා–ඒ පැවැරිජනක වූ භොජනය දූනැ;

පණිහි අසනහෙනා පඬාය–විලුම්තෙලවර පටන්; කතොපරි– ඒ අඩස්තෙයහපද්සෙන් ඇත සිට එළවනලද ආහාරය වලකත් නානම; පවාරණා න හොති යි යොදතු. උපනාමෙති–නතු කෙරේ ද; අනභිහරිත්වාව–හස්තපාත්‍රාධාරයෙන් පය නඟා නො ගෙණ මැ; භත්තපච්ඡිං–බත් පැස; පරිවිසනකස්ස–ඇවිස්නා හට; සා–ඒ භත්තපච්ඡිතොමෝ; තතො–ඒ භත්තපච්ඡියෙන්; අඟුලිචලනාදිනා කායවිකාරෙන වා–ඇඟිලි සැලීම් බැම නැඟීම් ආදි වූ කායවිකාරයෙන් හෝ; අලං–පමණැ යි හෝ; මා දෙහීති– නො ම දෙ යි හෝ; රසං ගණ්හථාති–රස ගණුව යි; එතෙතා සමංසකං රසං අභිහරති–එකෙක් මස් සහිත රස එළවා ද; ඉමං ගණ්හථ යි නො ඉඳුරා පැවැරි නො ගෙණා තාක් කියා එළවූ යමකුදු වලකත් පැවැරීම වෙයි යතු වනවිනිශ්චයන්‍ය යි. වංසකළීර–හුණකිළිල්; පනසාදීහි–කොස් ආදීන්; කළීරසූපං– කිළිල්මහලු; පනසබ්‍යඤ්ජනං– කොස්මහලු; න අභිහනති අකප්පා–කැප නො කරණලද යන අර්ථ යි. තං පන–ඒ කැප කිරීම වනාහි; කප්පියකතාදීහි සතානි විනයකම්මාකාරෙහි යන්නෙහි සපත විනයකර්ම නම් කප්පියකත ය, පටිග්ගහිතකත ය, උච්චාරිතකත ය, හත්ථපාසෙ ඨිතකත ය, භුත්තාවිනා කත ය, භුත්තාවිනා පවාරිතෙන ආසනා අවුට්ඨිතෙන කත ය, අලමෙතං සබ්බන්ති වුත්තෙන කත ය යන මේ යි. පඤ්චහි සමණකප්පෙහි යන්නෙහි, පස් සමණකැප නම්: නඛය, අග්ගි ය, සත්ථ ය, නිබ්බට්ට බීජ ය, නො බීජ ය යන මේ යි. අලමෙතං සබ්බන්ති අවුත්තන්ති යන්නෙහි, වචීභෙදං කත්වා–වාග්භෙද කොට; අලමෙතං සබ්බං යි මෙසේ; අවුත්තං හොති–නො කියනලද්දේ වේ ද යන අර්ථ යි. යං–යම් භොජනයෙක්; අතිරිත්තං යි සේයි, කප්පියං–කැප; අකතං–නො කරණලද ද; යං ච පන න ගිලානාතිරිත්තං– යම් භොජනයෙක් ගිලානාතිරිත්ත නො වේ ද යන; තං උභයම්පි– ඒ දෙක ද; අනතිරිත්තං–කැප නො කරණලද්දද නම් වේ. අති රිත්තං පන–අතිරිත්තය වනාහි; තස්සෙව පටිපක්ඛනයෙන වෙදි

තබ්බං-ඒ අනතිරිත්තයටම ප්‍රතිපක්‍ෂහයින් දතයුත්තේ යි. මෙහි ප්‍රතිපක්‍ෂය නම් සත් විනයකර්මයෙන් කැපකිරීමය, ගිලානාතිරිත්ත ය යි. මංසගිරං වා-මස්වැදැල්ලක් හෝ; කැබැල්ල ය යි ද කියත්. උපකාලේපි කාලෙ-වේලා ආසන්නකල්හි; භික්ඛුනා-භික්‍ෂුහු විසින්; පිණ්ඩං-ආහාරය; අභිහටං-හස්තපාශයීයට එළවනලද්ද ව; උපනීතං-නතු කරණලද්ද; කප්පියං කාතුං-කැප කරන්නට; ලභති-ලැබේ; තස්මිං කප්පියෙ කතෙ-ඒ ආහාරය කැප කළකල්හි: භුඤ්ජන්තස්ස-වළඳන්නාහට; අඤ්ඤං ආමිසං ආකිරන්ති-අනික් ආමිෂයක් ඇවිසිද්ද; තං-තමා කැප කරණ ලද දෙය හා මිශ්‍ර වූ ඒ ආහාරය; සො-ඒ පළමු කැප කළාවූ හෙතෙම; පුන කාතුං න ලභති-නැවත කැප කරන්නට නො ලැබේ. න කෙවලං ච තස්ස-හුදෙක් ඔහට මතු නො වේ.

අථ බො-වැලි කිමෙක් ද? ක්‍රියාක්‍රියං යන්නෙහි වැළකීම ක්‍රියා ය, කැප නො කිරීම අක්‍රියා යි.

පඤ්චමං.

---

අභිහට්ඨුං පවාරෙය්‍යාති යන්නෙහි, අභිහරිත්වා-එළවා; භික්ඛු-මහණ; හන්ද-හිඳ; ඛාද වා-කයි කියා ද; භුඤ්ජ වාති-අනුභව කර යි කියා ද; එවං පවාරෙය්‍ය-මෙසේ පවරන්නේ යි; ආසාදනං ය යි ශේයි, චොදනං ය යි සේයි, මඞ්කුකරණභාවං-කර බහනා බව; අපෙක්ඛමානො-කැමැත්තේ; අභිහට්ඨුං පවාරෙය්‍ය යි යොදනු.

අඤ්ඤස්සත්ථාය-අනෙකක්හු පිණිස; හරතෙනා- ගෙණ යන්නේ; භජායිති-යා යි; දෙති- දේ ද;

ඡට්ඨං.

---

උපාදය-පටන් කොට; ආමං වා-අමු වූ හෝ; පක්කං වා-විලිකුත් හෝ;

රොමන්ථකස්ස- ලොමු කොටන්නාවූට; රොමන්ථං- ලොමු කොටීම්; භික්ඛවෙ-මහණෙනි; අනුජානාමි-අනුදනිමි. රොමන්ථ නම් හනුවලනය යි.

සත්තමං.

---

**සන්නිධිකාරො**-තබා තිබීම; **අස්ස**-මේ භොජනයට තු යි; **සන්නිධිකාරං**-ඒ භොජනයතෙමෙ සන්නිධිකාර නම් වේ. **යං**-යම් පාත්‍රයෙක්; **ගණ්ඨිකපත්තස්ස වා**- ලොහොපෙත් තෙලු මැසූපාත්‍රයාගේ; **සිනෙහො**-තෙල්; **සො**-ඒ සිනෙහය; **උණ්හෙ ඔතාපෙන්තස්ස**-අතාදෙර ජටයි; අවු සාවන පාත්‍රයෙන්; **පග්ඝරති**-සිලියේ ද; **තෙහි සන්නිහිතං**-ඒ සාමණෙරයන් විසින් තබා තබන ලද්ද; **සයං පටිග්ගහෙත්වා**-තමා විසින් අහර පිළිගෙණ; **අපරිච්චත්තමෙව**-සාමණෙරයන්ට පරිත්‍යාග නොකැරුවූ මැ; **කප්පිය භොජනං**-කුලදූසන වෙජ්ජකම්මාදීන් ද, උත්තරිමනුෂ්‍යධර්මාරොචනයෙන් ද, සාදිතරූපියයෙන් නිපන්නා ද මනුෂ්‍යමාංසාදි දශමාංසය වර්ජිත ව කැපභොජනය; **දුතියදිවසෙ**-දෙවනදවස්; **භුඤ්ජන්තස්ස පාචිත්තියං. යාමකාලිකං**-සන්නිධි වූ යාමකාලිකය; **සති පච්චයෙ**-එබඳු කරුණක් ඇතිකල්හි; **අජ්ඣොහරතො**-පෙරවරු ද පස්වරු ද වළඳත්තාහට; **සබ්බවිකප්පෙසු**-සියලුප්‍රභෙදයෙහි; **අපරම්පි පාචිත්තියං වඩ්ඪති**-නැවත ද පාචිත්තියෙක් වඩී. මෙහි සියලු ප්‍රභෙද නම්: කප්පියභොජනය, ථුල්ලච්චය ජනක වූ මනුෂ්‍යමාංසය, දුක්කටජනක වූ අවශෙෂමාංසය යන මේ යි. යමෙක් පැවැරී ඇවද සන්නිධිකාරක වූ කැප නො කළාවූ කැප ආහාරය පෙරවරු වළඳා නම් ඔහට වන්නාවූ සන්නිධි ද, අනතිරිත්ත විසින් වන්නාවූ පාචිත්තිය ද, සන්නිධිකාරක වූ මාංසය කැප නො කරවා පෙරවරු වැළඳීමෙන් වන්නාවූ ථුල්ලච්චය සමග වන පාචිත්තියද්වය ද, අවශෙෂමාංසයෙහි දුක්කටයා හා සමග වන්නාවූ පාචිත්තියද්වය ද යන මේ සඳහා සබ්බවිකප්පෙසු යනු කීහු.

**අපරම්පි** යන්නෙහි අපර නම් අනතිරිත්තප්‍රත්‍යයෙන් වන පාචිත්තිය යි. **සචෙ**-ඉදින්; **විකාලෙ**-නො වේලෙහි; සන්නිධි භොජනය, **අජ්ඣොහරති**-වළඳා නම්; **අනතිරිත්තපච්චයා**-අනතිරිත්තප්‍රත්‍යයෙන්; **සබ්බවිකප්පෙසු**-උක්තප්‍රකාර සියලු ප්‍රභෙදයෙහි අනාපත්ති යි යොදනු. මෙහි විකාලයෙහි කැප කිරීම නැතිහෙයින් අනතිරිත්තපච්චයා සබ්බවිකප්පෙසු යුහු. විකාල ප්‍රත්‍යයෙන් පාචිත්තිය ඇමැත් වේ ම ය යි ගත යුතු. **අවසෙසෙසු**-අවශෙෂ වූ ද යාවකාලිකාදිවස්තූන් කෙරෙහි;

**යාවකාලිකාදීහි සංසට්ඨානිපි**-යාවකාලික ය යාමකාලිකය යන මොවුන් හා මුසු වූ සත්තාහකාලිකය යාවජීවිකය යන මොහු; **එවං**-මෙසේ මැ නො කැපයෝයි යැමෙන් පාචිත්ති ගත යුතු; **තං තං**-ඒ ඒ කාලිකය; **අසම්භින්නරසං වා හොති**-අමිශ්‍ර වූ රස

හෝ වේ ද; **තෙන**-ඒ සත්තාහකාලිකය හා; **තස්මායෙව හි**-එහෙයින් මැ; **භික්ඛවෙ**-මහණෙනි; **සත්තාහකාලිකෙන**-සත්තාහකාලිකය හා එක් කොට; **තදහු පටිග්ගහිතං**-එදවස් පිළිගන්නා ලද; **යාවජීවිකං**-යාවජීවිකය සත් දවසකට වටනේ ය යි; **අවධිං**-මෙසේ දිවසනියමක් නො කොට; **පටිග්ගහිතං සත්තාහං කප්පතීති**-සත්තාහකාලිකය හා එක් කොට පිළිගන්නාලද යාවජීවිකය සත් දවසකට වටනේ ය යි; **වුත්තං**-පදභාජනියෙහි කියනලදී. පටිග්ගහිත වූයේ සත්දවසකට කැප ය යි මෙසේ දිවසනියමය නො කොට පදභාජනියෙහි කීහෙයින් විකපටිග්ගහිතතන ජ්‍රාහං යනාදි කීහු. **තෙන සද්ධිං**-ඒ සත්තාහකාලික යාවජීවික හා සමග; **මුඛසන්නිධි නාම හොති** යන්නෙහි, **මුඛෙ සන්නිධි**=මුඛසන්නිධි. **තං සබ්බං**-අනෙකාවූ අනෙකාපාක සයම්පාක ය යන ඒ සියල්ල; **තඞ්ගතමෙව**-එහි මැ සඞ්ග්‍රහයට යේ. පූතපාක වූ සයම්පාකයයි මේ විශෙෂණබලයෙන් ගතයුතු. අනුපසම්පන්නයන් විසින් පෙර පිසූවා නැවත පිසීම ය යි කියනලද සයම්පාකයයි සේයි. පූතපාකය යනු ගෘහස්ථාදීන්ගේ හෙවත් සජිපිෂාදීන්ගේ පචනය පසුව මැ භික්ෂූහු විසින් කරණ පචනය හෙයින් පූතපාකං යුහු.

## අට්ඨමං.

---

**යථා හි ආජඤ්ඤයුත්තො රථො**-ආජානීය සෛන්ධවයන් යුක්ත වූ රථය තෙමේ; **ආජඤ්ඤරථොති**-ආජඤ්ඤරථ ය යි යුක්ත ශබ්දයට ලොප් කොට; **යථා හි වුච්චති**-යම් හෙයකින් වහාහි කියනු ලැබේ ද; **එවං**-එසේ මැ; **පණීතසංසට්ඨානි** යන, **ඉධාපි**-මෙහි දු; සංසට්ඨශබ්දයාහට ලොප් කොට **පණීත භොජනානි** යුහු. **ඔදනොති**-ඔදන ය යි; **වුත්තලක්ඛණො**-උදකෙ ජහො=ඔදනො යි මෙසේ වුත්තලක්ඛණ වූ; **සබ්බොපි මච්ඡො**-සියලු මස්; **මච්ඡොයෙව**-මත්ස්‍ය නම් මැ වේ. **සුද්ධානි**-සප්තවිධ ධාන්‍යයෙන් නිෂ්පන්න වූ භොජනය හා අමිශ්‍රහෙයින් මැ ශුද්ධ වූ; **තත්‍රායං විනිච්ඡයො**-ඒ ප්‍රණීතභොජනවිඥප්තියෙහි ලා මේ විනිශ්චය යි. **සාලිභත්තං විය**-හැලින් නිෂ්පන්න වූ බත් මෙන්; **සප්පිභත්තං නාම**-සප්පියෙන් නිෂ්පන්න වූ බත් නම් දෙයෙක්; **යස්මා නත්ථි**-යම් හෙයකින් නැද්ද; **ඉමිනා**-මෙයින්; **ගහෙත්වා**-සප්පි ගෙණ; **භුඤ්ජාහීති**-වළඳු යි; **කප්පියභණ්ඩං වා දෙති**-කප්පාසසුත්තාදි වූ කප්පියභාණ්ඩයක් හෝ දේ ද; **යථාවත්ථුකමෙව**-පාචිත්තිය ම වේ. **ඉමිනා සප්පිනා භුඤ්ජාති ගාවිං වා දෙති**. **අජිකාසප්පිආදීහි**-එළුසපපි ආදීන්; **සබ්බපදෙසු**-නවනීතාදි

සියලු පෙදෙහි; එකට්ඨානෙ-එකකුලෙන් හෝ; නානාට්ඨානෙ වා-නන්කුලෙන් හෝ; සබ්බම්පි සප්පිආදිං-සියලු සපපි ආදීන් හා සමඟ; විස්සන්දපෙත්වා-විනාවා; පටිලද්ධං-ප්‍රතිලබ්ධ වූ භොජනයා; එකතො-එක් කොට; සම්භින්නරසං කත්වා-විවෙක වැ නො පෙණෙනපරිද්දෙන් මිශ්‍ර කොට;

ගිලානස්ස සෙසකෙ-ගිලානයාගේ ශෙෂ වූ ආහාරයෙහි ද; අකතවිඤ්ඤත්තියා පටිලාභෙන-නොතෑ නො පැවරූවන් විනවීමෙන් ලදබව;

## නවමං.

අත්තනො සන්තකම්පි අප්පටිග්ගහිතං අජ්ඣොහරිතුං භික්ඛුනො න වට්ටති යි පදයොජනා කරණු. තස්ස-ඒ ප්‍රතිග්‍රහණයාගේ; ලක්ඛණං-ලක්ෂණය; වුත්තවිපල්ලාසෙන වෙදිතබ්බං-කිවාට විපරියාසයෙන් දත යුතු. මෙහි විපරියාස නම්, හත්ථපාසයෙහි සිට කයින් කායප්‍රතිබද්ධයෙන් නිස්සග්ගියෙන් දෙන්නා කයින් හෝ කායප්‍රතිබද්ධයෙන් හෝ ගැන්ම යි. තං-හත්ථපාසයෙහි සිට කායාදි එක්තරා එකෙකින් දෙන්නා වූ ඒ වස්තුව; තස්ස-ඒ ශරීරයාගේ; අන්තිමසො-අධමාන්තයෙන්; මජ්ඣිමනාපි-බලමැදුම්පිරිමියක්හු පහ කොට තිබිය හැකි මස්ඛවයෙනුදු; අන්තිමසො යනු සංහාරිමයට අධමපක්ෂයා ගෙණ කීහු. මත්තෙහි අන්තිමසො යනු, මත්තෙහි අනාපජ්ජනක රූක්ඛපණ්ණෙන යන්නට සම්බන්ධ කරණු. මෙහි පිළිගන්නා වස්තුව ද එයට ආධාර කොට දෙන වස්තුව ද බලමැදුම් පුරුෂයෙකු ගත හැකි බර ය යි දත යුතු. ඉධ-මේ ප්‍රතිග්‍රහණවිෂයෙහි; පටිබද්ධපටිබද්ධං නාම-ප්‍රතිබද්ධයෙන් ප්‍රතිබද්ධයෙක් නම්; නත්ථි-නැති; මෙහි කායප්‍රතිබද්ධයෙහි ගැහී තුබූ සියඅකුදු වී නම් කායප්‍රතිබද්ධ ය යි ම ගණුත් මුත් ප්‍රතිබද්ධයෙන් ප්‍රතිබද්ධ ය යි නො ගත යුතු. නාසිකාය-නාසිකායෙහි; නත්ථුකරණියා-නැහැඹරැයෙන්; දීයමානම්පි-දෙන ලබන යමක් ද; අකල්ලකො වා-නො ගිලන් ද; ආභොගමත්තමෙව-පිළිගන්මි යන සිත ම;

පුබ්බාභොගෙ ච සති-පූර්වාභොගය ම ඇතිකල්හි; මෙහි පූර්වාභොග නම් කිසිවෙක් මේ පාත්‍රයෙහි යමක් ගත් නම් ඒ මා විසින් පිළිගත්තෙ ම ය යන චෙතනාව යි. පත්තෙන පටිග්ගණ්හිස්සාමීති-පාත්‍රයෙන් පිළිගන්මි යි; තං පතති යි යොදනු. අභිහටභාජනකො-ඇවිස්නා පිණිස හත්ථපාසයට එළවූ භාජන

යෙන්; **තත්ථ**-ඒ ප්‍රතිග්‍රහණයෙහි; **තස්ස**-ඒ අඞ්ගයාගේ; **ඔරිමන්තෙන**- මෑත කෙළවරින්; **එකතො කූපගතෙ**- එකෙක් ලිංහිතනියෑ වේ ද; **තස්මිං ඨිතො**-ඒ හස්තපාසයෙහි සිට; **මජ්ඣිමො පුරිසො යං උක්ඛිපිතුං සක්කොති එවරූපං භාරං පවෙට්ටන්තො මෙ කායො සාමණෙරා** යි පද යොජනා කරණු. **ආරොපෙන්ති**-නඟද්ද; **එකදෙසෙනාපි ඨපෙන්ති**-තමන් නඟා ගත් භාරයෙන් එකදෙශයෙකිතුදු භික්‍ෂුහු **පසාරිතහත්ථෙහි** තබා ලද්ද; **යං රජං පතති** යි යොදනු. **තං පන**-ඒ දුක්කටය වන ආහාර වනාහි; **පටිග්ගහෙතබ්බො දෙථාති**-පාත්‍රය පිළිගත්වා දෙව යි; **අනාදිසිත්වා වා**-නො ගෙණ හෝ; **තතො තතො**-ඒ ඒ දිශාවෙන්; **සකට්ඨානතො**-සවකීය ස්ථානයෙන්; **චවිත්වා**-ගිලිහී; **පතනන්තං හි**-හෙන්නේ වනාහි; **නෙව වොච්ඡින්නං**-ඉදින් කැඩුනේ වී නම්, නො හොත් **නෙව වොච්ඡින්නං පතනන්තං හි** නෝ ගන්නා. **උග්ගහිතකං නාම හොති**- අතුරෙහි ගත්තේ වී නම් උග්ගහිතක නම් වේ. **අපස්සාසිතුං වා**-වැතිරෙන්නට ද;[1] **ආලම්බිතුං වා**-එල්බෙන්නට ද; **අඞ්කුරාදි**-අඞ්කුර මූල් පුස් ආදී වූ; **යං අඤ්ඤං උප්පජ්ජති**.

**තත්ථ**-ඒ චතුර්විධ කාලිකයන් අතුරෙහි; **සබ්බම්පි ධඤ්ඤං වා**-අනුලෝම් සහිත සියලු ධාන්‍ය ද; **ඵලාළුකසඞ්ඛාතං ධඤ්ඤානුලොමං නවවිධං මහාඵලසඤ්ඤා** යි යොදනු. **තාල**-තල්; **නාළිකෙර**-පොල්; **පනස**-කොස්; **ලබුජ**-දෙල්; **අලාබු**-ලබු; **කුම්භණ්ඩ**-කොමඩු; පුසුල්. **පුස්සඵල**-පුසුල්පත; **තිපුස**-තියඹරා; **එළාලුක**-කැකිරි; **අපරණ්ණඤ්ච**-මුගමාසාදි අපරණ්ණ ද; **වනමූලපත්තපුප්ඵඵලාදි යඤ්චඤ්ඤම්පි ආහාරත්ථං ඵරති** යි යොදනු. **ආහාරත්ථං ඵරති** යි සේයි, ආහාරකෘත්‍යය සපයා දෙයි සේයි. **චොචපානං**-ඇටකෙසෙල්පනු; **මොචපානං**-බරුස්කෙසෙල්පනු ද; ඇටකෙහෙලින් පිටත් සෙස්ස මූළුල්ල බරුස්කෙහෙල් නම් වේ. **මධුකපාන** නම් සියදෑ මිදිරසයෙහි දිය වත් කොට යොදන ලද්දේ යි. **මුද්දිකපාන** නම් දියෙහි ලා මිදිපක් මැඩ ගත්තේ යි. **වෙත්ත**-වේපතී. **තින්තිණික**-සිතිඹලා යි. **මාතුලුඞ්ග**-ලප්නාරගී. **කොසම්බ**-කොහොම්පක්; **කරමන්දාදි**-කරඹ ආදී වූ; **නෙසං අනුලොමානි යානි ච බුද්ධකඵලපාකානි** යි යොදනු. **මූලඵලාදි අවසෙස**-මූලඵලාදී අවශේෂයන් අතුරෙන්; **යං**-යමෙක්; **ඛාදනීයත්ථං නෙව ඵරති භොජනීයත්ථං න ඵරති. ආහරෙය්‍ය**-මුඛයට ප්‍රවේශ කෙරේ ද; **අනාහාරෙපි උදකෙ**-ආහාර නො වන්නා ද වූ උදකයෙහි; **ආහාරසඤ්ඤාය**-ආහාරසංඥයෙන්; **කුක්කුච්චායන්තානං -පෙ- වුත්තං. දන්තපොණෙ ච**- දැහැටි

1. පැතිරෙන්නට ද.

දඬෙහි ද; දත් ශුද්ධ කරණ හෙයින් දන්තපොන නම්. පූ සොධනෙ[1] යන ධාතු යි. මුඛද්වාරං ආහටං ඉදන්ති- මේ දැහැටි දඬු මුඛද්වාරයට එළවන ලද ය යන; සඤ්ඤාය-සංඥායෙන්; සුඛුමචාලයනනානං -පෙ- වුත්තං. දන්තපොනපරිභොගෙන-අජ්ඣොහරණීය නො කොට දැහැටිදඬු පරිභොගයෙන් ද; කාලොදිස්සං නාම-සපීදශටාදි කාලය උදෙසා පණවන ලද හෙයින් කාලොදිස්ස නම් වේ. ධූමාදිඅබ්භොහාරියානාහාරො-ආපත්ත්‍යඞ්ග නො වන්නාවූ ධූමාදි යක්හුගේ නො වීම ය.

දසමං.

භොජනවග්ගො

---

අචෙලකාදීනං-නග්නශ්‍රමණාදි වූ; අඤ්ඤතිත්ථියානං-අන්‍ය පක්ෂයට ගිය තීර්ථකයනට; අවචජ්ජිත්වා අවචජ්ජිත්වා-තබ තබ කොට; තෙසං සන්තිකෙ-ඒ තීර්ථකයන් සමීපයෙහි; බාහිරලෙපං දෙන්තස්ස-තෙල් ආදි බාහිරඅලෙව්[2]දෙන්නාහට ද; අනනුඤ්ඤාතත්තා-බාහිරලෙපය තබා අජ්ඣොහරණීය වූ අනු නොදත්;

පඨමං,

---

එතං අනාචාරමෙව- මෙ ගයනාදි අනාචාරය මැ; පච්චයං කත්වා-කාරණ කොට; යදා පන-යම් කලෙක්හි; අස්ස-ඒ අනාචාරයෙහි පවත්නා කැමැත්තාවූ භික්ෂුහුගේ; දස්සනූපචාරං වා සවණූපචාරං වා සො එකෙන පාදෙන විජහති යි යොදනු. අජ්ඣාකාසෙ දස්සනූපචාරස්ස ද්වාදසහත්‍ථප්පමාණං යි යොදනු. තෙහි අනතිරිත්තභාවොයෙව-ඒ කූඩාදීන් පටිවජ්ජනන වීම මැ. උභින්නම්පි-උපසම්පන්න සාමණේර දෙදෙනාහට; කලිසාසනාරොපනෙ-"ඛාණු විය තිට්ඨති, සුනඛො විය නිසීදති" යනාදි වූ දුරුක්තවචන කීමෙහි; ආචරිතුකාමතා-හැසිරෙණ කැමැතිබව;

දුතියං.

---

සහ උභොහි ජනෙහිති යන්නෙහි, උභොහි ජනෙහි-ජයම්පති හෙවත් අඹුසැමි දෙදෙනා හා; සහ ඉති-එක් වැ වැටේනු යි; සභොජනං-ඝරය තෙමේ සභොජන නම් වේ. මේ අනාචාරි[3]

1. පුන සොධනෙ-හැම. 2. බාහිරතෙල්-හැම. 3. අත්වණී-හැම.

සමාසවාක්‍යයෙහි උභොශබ්දයාගේ උකාරයහට ලොප් කොට භකාරසථ ඔකාරයහට ලොප් නො කොට අලුක් සමාස හෙයින් කීහු. දෙවන වාක්‍යයෙහි භුඤ්ජිතබ්බං=භොජනං[1] යි ව්‍යාපත්සිද්ධ හෙයින් ගෙණ උභශබ්දයා හැර භොජන[2] ශබ්දයා හා සමාස කීහු. භොජනෙන සහ වත්තතීති=සභොජනං යි සමාස යි. අථවා–තො භොත්; සභොජනෙති යන්නෙහි, සභොගෙ-භොග සහිත ය යි යේයි, භොග සහිත කුලෙහි; මෛථුනරාගයෙන් යුත් මාගම් පිරිමි නීන් ඇති ගෙහි ය යි සේ යි. මෙයට අනුපඛජ්ජ යනු සම්බන්ධ කරණු. රාගපරියුට්ඨිතපුරිසස්ස-රාගයෙන් රක්ත පුරුෂයාහට; ඉත්ථි භොගො–ස්ත්‍රී තොමෝ භොග නම් වේ. අස්ස-සභොජනෙ යන මේ පදයාගේ; පදභාජනෙ-පදභාජනියෙහි; ඉත්ථි මෙව භොති-ස්ත්‍රී මැ පුරුෂයහට භොග වෙ යි කියා ද; පුරිසො වා ති-පුරුෂ ද ස්ත්‍රියට භොග වෙයි. තස්මිං කුලෙ–ඒ ගෙහි; සං සයනි ඝරං–යම් හෙවිනා ගෙයෙක් ඇද්ද; චතුස්සාලාදිසු සානස්ස තස්ස මහල්ලකස්ස යි සම්බන්ධ යි. චතුස්සාල නම් වටරකි.[3] එහි කළ මහල්ලක ගෘහයාගේ; හත්ථපාසං–දෙරියන් වියත; 'වසල ඉක්මී මෙන් මැ පචිති වෙ යි යෙති. වසල නො ඉක්ම දිගින් ගෙහි හිඳුත් දොස් නැතැ යි යෙත්' යන මේ විනයසන්නයෙහි කිවා ද බැලිය යුතු. ඛුද්දකස්ස-ක්ෂුද්‍රශයනිඝරයාගේ; වෙමජ්ඣං–වසල; උභොසු නික්ඛන්තෙසු-සයනිඝරයෙන් දෙදෙනා නික්මුනු කල්හි දු; අවීතරාග-නොසන්හුන් රාග ඇති; ජයම්පතිකානං–මාගම් පිරිමිනී දෙදෙනාගේ; සන්නිසින්නා-එක් වැ උන්බව;

## තතියං, චතුත්ථපණ්ණමාණි.

සභත්තා සමානො-බත් ඇත්තේ; අනපෙත්වා උපචාර සීමාය–විහාරයාගේ ඇතුළු උපචාරසීමායෙහි; යං–යම් භික්ෂු වක්හු; පකතිවචනෙන ආපුච්ඡිතුං සක්කා හොති–දෙලොස් රියනට ඇසෙන සේ බණින පියවිවචනයෙන් විචාරන්නට පිළිවන් වේ ද; තාදිසං–එබඳු භික්ෂූහු; වාරිතනං ආපජ්ජාමිති වා–වාරිතා කෙරෙමි යි හෝ; පුරෙභත්තං පච්ඡාභත්තං යන්නෙහි පුරෙභත්ත නම් යම් ආහාරයෙකින් නිමන්ත්‍රණය කරණ ලද ද ඒ ආහාරය නො කෑකාලය බව යි. පච්ඡාභත්ත නම් අඩමාත්තයෙන් අරුණොද්ගමනයෙහි යම් ආහාරයෙකින් නිමන්ත්‍රණ කරණ ලද ද ඒ ආහාරය වැලඳූ කාලය යි. යෙන භත්තෙන–යම් ආහාරයෙකින්; නිමන්තිතො–අකප්පියනිමන්ත්‍රණයෙන් බොහෝදෙනාගේ හෝ එකකුගේ හෝ නිමන්ත්‍රණය ගත යුතු.

1. භොගො. 2. භොග. 3. වවරත්, වට්රකි.

**වුත්තලක්ඛණං**-ගණභොජනයෙහි කියනලද ලක්‍ෂණ ඇති; **දුවිධම්පි සමයං ඨපෙත්වා**-චීවරදාන චීවරකාර යන දුවිධ සමය තබා; **අවීතිවත්තෙ මජ්ඣන්තිකෙ**-හිරු මධ්‍යාහ්නයෙන් පහ නො වූ කල්හි; **චතුබ්බිධා අනුපඤ්ඤත්තියො** යන්නෙහි. “යො පන භික්ඛු නිමන්තිතො සභත්තො සමානො පුරෙභත්තං කුලෙසු චාරිත්තං ආපජ්ජෙය්‍ය පාචිත්තියං”යි වූව, “සන්තං භික්ඛුං අනාපුච්ඡා පුරෙභත්තං පච්ඡාභත්තං අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං”යි මෙසේ කුමැ යි කිම? යත්:—පච්ඡාභත්තයට අග වැ සිටි හෙයින් පච්ඡාභත්තයෙක් නම් පුරෙභත්තයක් ඇති වැ වේ දැ යි හඟවන පිණිස හෝ එක සම්බන්ධ හෙයින් හෝ යැ යි දත යුතු. එහෙයින් ඒ හැර “අඤ්ඤත්‍ර සමයා”යි කියනලද සමය දෙකක් නො: චතුර්විධ අනුපඤ්ඤත්තිය දත යුතු. මෙහි “සන්තං භික්ඛුං අනාපුච්ඡා” යනු හා “පච්ඡාභත්තං” යනු හා ආපත්තිකර යැ යි දතයුතු. “අඤ්ඤත්‍ර සමයා” යි උක්තකාලමය අනාපත්තිකර යැ යි දත යුතු. **පටික්කමන**-ආසනශාලාව; **භත්තියඝරානි**-නිත්තෙන් බද්දෙන ගෙය; **සන්තං භික්ඛුං අනාපුච්ඡා** යන්නෙහි කුලයට යෙමි යන සිත් උපන්කල දෙලොප් රියනින් ඇතුළත ඇති භික්‍ෂුහු නො විචාරීම ය; **ක්‍රියාක්‍රියං** යන්නෙහි ක්‍රියා නම් යෑම ය. අක්‍රියා නම් නො පිළිවිස්ම යි.

ජඨං.

---

**චාතුමාසපච්චයපවාරණාති** යන්නෙහි, **චත්තාරෝ මාසෙ**-සාරමසක්; **ගිලානපච්චයපවාරණා**-ගිලානප්‍රත්‍යයෙන් පැවැරීම යි. මෙහි සප්පිනවනීතාදි භෙසජ්ජපඤ්චකය ම ගතයුතු. සෙසු භෙසජ්ජය මෙහි නො ගත යුතු. **සබ්බසඞ්ගාහකං**-“චාතුමාසපච්චය පවාරණා අඤ්ඤත්‍ර පුනපවාරණාය අඤ්ඤත්‍ර නිච්චපවාරණාය” යන මෙ සියල්ල; **වත්ථුවසෙන වුත්තං**-ශික්‍ෂාපදෝත්පත්තිවශයෙන් කියනලද. **අයම්පනෙත්ථ අත්ථො**-මෙහි ලා මතු කියන්නාවූ මේ වනාහි අර්ථ යි. පාලියෙහි පුනපවාරණාව ද නිච්චපවාරණාව ද තබා චාතුමාසපච්චයපවාරණා නොමෙව් ඉවසිය යුත්තී යැ යි කිහෙයින් අවශෙෂවය ඉවසිය යුත්තේ යැ යි ඇඟෙතී සිතා එ දෙක සාදිතව්‍යබව හඟවන පිණිස, **චාතුමාස-පෙ-සාදිතබ්බා** යි කීහු. මෙහි පුනපවාරණා නම් නැවත සාරමසකට බෙහෙදින් පැවැරීම යි. වදාළේ මැ යි, අජේඨාපපත්තියෙහි:- “තෙන හි ත්වං මහානාම සඞ්ඝං අපරම්පි චතුමාසං භෙසජ්ජෙන පවාරෙහී”යි. නිච්චපවාරණා නම් යාවජීවයෙන් මැ සඞ්ඝයා බෙහෙදින් පැවැරීම්. වදාළේ මැ යැ, “තෙන හි ත්වං මහානාම සඞ්ඝං

ගසජ්ජෙන යාවජීවං පවාරෙති"යි. **තතො**-එ බෙහෙදින් පැවැරී මෙහි; **එත්තකායෙව රත්තියො එත්තකානි වා භෙසජ්ජානි සාදිතබ්බානීති**[1] **රත්තීහි වා භෙසජ්ජෙහි වා පරිච්ඡෙදො කතො හොති** යි යොදනු. **අඤ්ඤභෙසජ්ජකරණීයෙ**-හරිටකාදි වූ අනික් බෙහෙදෙකින් කරණීයයක් හෙවත් කටයුත්තක් ඇති කල්හි; **අඤ්ඤං භෙසජ්ජං විඤ්ඤාපෙන්තස්ස**-සකුරු ආදි අනික් බෙහෙදක් විනවන්නාහට ද; **තිකපාචිත්තියං**-තතුත්තරියෙහි තතුත්තරියසඤ්ඤි තතුත්තරියෙහි අතතුත්තරියසඤ්ඤි වෙමතිකවසයෙනි. මෙහි තතුත්තරිය නම් "යෙහි භෙසජ්ජෙහි පවාරිතො යාසු ච රත්තීසු පවාරිතො තතො උත්තරිං අධිකං" යන අර්ථයි. **යථාභූතං**-යථාස්වරූපය; -පෙ- කියා විනවන්නාවූ ගිලානයාහට ද අනාපත්ති වෙයි යේයි. **පරියන්තාතික්කමො ති**-රාත්‍රිභෙසජ්ජ දෙදෙනාගේ පරිච්ඡේදය ඉක්මීම ය යනු;

**සත්තමං.**

---

**උය්‍යුත්තන්ති** යන්නෙහි **කතඋය්‍යොජනං**-කරණලද උයෝගය (ඇති)යි යේයි. **ගාමතො නික්ඛන්තන්ති අධිප්පායො**-ග්‍රාමයෙන් නික්මුනාමැ ය යන අර්ථයි. මෙහි ග්‍රාමයෙන් නික්මැ එක්තැනෙක හුනහොත් ය යන අර්ථ වෙයි. වදාළේ මැ යි:-"උය්‍යුත්තා සෙනා නාම ගාමතො නික්ඛමිත්වා නිවිට්ඨා හොති පයාතා වා"යි **චතුරඞ්ගිණිං** යන්නෙහි හස්ති අශ්ව රථ පදාතියොධ ය යන සිවුරඟසෙනගි. **පතිරූපකාරණෙ අසති**-ජීවිතබ්‍රහ්මචරියාන්තරායාදි ප්‍රතිරූප කාරණයක් නැතිකල්හි; **යත්ථ ඨිතො පස්සති**-යම් තැනෙක සිටියේ දකී ද ඒ ස්ථානය දස්සනූපචාර නම්. **තං පන විජහිත්වා**-තමා පළමු කොට සිටියාවූ ඒ ස්ථානය විජහනය කොට; **අනනුඤ්ඤාතොකාසතො**-අනුනොදත් දස්සනූපචාරාදි අවකාශයෙන්; **අඤ්ඤත්‍ර දස්සනං**-එක්තරා එක් තැනෙක්හි සිට බැලීම ය.

**අට්ඨමං.**

---

මෙහි **ද්විරත්තතිරත්තං** යනු නිරන්තරසංයොගයෙහි ද්විතීයා යි. **ගිලානස්ස කරණීයෙන වා**-ගිලනහට බෙහෙත් සපයනු ආදි කටයුත්තෙකින් හෝ; **වසතො**-එ සේනායෙහි වසන්නාහට ද; **පටිසෙනාරුද්ධාය**-සතුරු සෙනගින් වැළකූ සෙනායෙහි වසන්නාහට ද; **කෙනචි පලිබුද්ධස්ස**-ඊශ්වරවෛරීආදි කිසිවක්හු

---

1. විඤ්ඤාපෙතබ්බානීති-කඞ්ඛාවිතරණී.

විසින් උපද්‍රව ඇති මැ වසන්නාහට ද; ඊශ්වරජනයා විසින් 'වලඳු ගියමැනැව්' කීකලැ නො වලඳු ගියහොත් උපද්‍රව කරණ හෙයින් ඔවුන් විසින් මෙසේ පළිබුද්ධයහට ද අනාපත්ති යි. **ආපදාසු**-ජීවිතබ්‍රහ්මචරියන්තරායයක් ඇතිකල් හි ද; **ගිලානාදීනං**. **අභාවොති**-ගිලාන ය, ගිලානකරණීය ය, සතුරුසෙනගින් වැලකීම ය, උපද්‍රව ය, ආපදාය, උමතුආදිය යන මොවුන්ගේ අභාවය යන; **ඉමානෙත්ථ තීණි අඞ්ගානි** යි යොදනු.

**නවමං.**

---

**උගගනත්වා උගගනාත්වා**-උඞට නැඟිනැඟී; **එත්ථ**-මේ සථාන යෙහි ලා; **යුජ්ඣනතීති**-යුධ කෙරෙත් නු යි; **උය්‍යොධිකං**-ඒ සථානය උය්‍යොධික නම් වේ. **බලගගං**-සෙනාවගේ; **අගගං**-ගණන; **ජානනති එත්ථාති**-මෙහි ලා දනිත් නු යි; **බලගගං**-ඒ ගණනසථානය බලග්‍ග නම් වේ. **සෙනාය**-සෙනාවගේ; **බ්‍යූහං**-රථාකාරයෙන්, සකටාකාරයෙන්, පද්මාකාරයෙන් යනාදීන් සෙනා සිටීම සෙනාව්‍යූහ නම් වේ. නිවෙස නම් මෙතැනැ ඇත්ඇණිය මෙතැනැ අස්ඇණිය යනාදීන් සිටිවීම යි. චාදස පුරිසා අසසඅ ත්ථිති=චාදසපුරිසො; කො සො? හත්ථිති ගත්හෙයින් චාදශ පුරුෂකෙණෙක් මේ හස්තිහට ඇත්හු නු යි හස්තිතෙමෙ චාදශපුරුෂ නම් වේ. මෙ කී ලක්‍ෂණ හෙයින් **චාදසපුරිසො**-චාදශපුරුෂ නම්; **හත්ථි**-හස්ති යි. **උපචාරං** මුඤ්චිත්වා [1] යන් තෙහි තමා සිටියාවූ සථානය ද බලමින් සිටි ප්‍රයොගය ද හැර යන අර්ථ යි.

**දසමං.**

**අචෙලකවග්ගො**'

---

**පිට්ඨා** - ස ඞල් පිපිආදියෙන්; **කතං මජ්ජං**-කරණලද මද්‍ය ය; **සුරා**-රග නම් වේ. මෙහි මජ්ජ නම් පිට්ඨාදීන් කරණලද්දේ ය. තෙමෙ මැ මද ජනවනහෙයින් මජ්ජ නම් වේ. **පුප්ඵාදිකතො**-පුෂ්පාදීන් කරණලද්දවූ; **ආසවො**-ආසවය තෙමෙ; **මෙරයං** මෙරය නම් වේ. මෙහි පුප්ඵාදීන් කරණලද්දෙය මැ සචිරප්‍රවෘත්ත හෙයින් ආසව නම් වේ. සුර නම් පුරුෂයක්හු විසින් කරණලද හෙයින් සුරා නම් වේ. මෙරය නම් පුරුෂයක්හු විසින් කරණලද හෙයින් මෙරය නම් වේ. **බීජතො පට්ඨාය**- සම්භාර රැස් කොට පැසෙනු පිණිස සැල වත් කල තැන් පටන්; **අමජ්ජං**-මජ්ජ නො වන්නාවූ මජ්ජවර්ණ ගන්ධ

---

1. උපචාරං මුඤ්චිත්වා—කඞ්ඛාවිතරණී

රස ඇත්තාවූ; **ලොණසොවීරකං** වා-මච්ඡමංසාදි ද නොයෙක් ඖෂධය ද එක් කොට කළාවූ තුන්හවුරුද්දක් තුඹුකල්හි ගත් තාවූ ලොණසොවීරකය ද; **සුත්තං** වා-බීජගාමයෙන් පෙරළී ගිය; සුත්තං යනු භෛෂජ්‍යවිශෙෂයකට නම් **වාසගාහාපනත්ථං**-සුවඳ ගන්වනු පිණිස;

පඨමං.

---

**හසාධිප්පායස්ස**-හස්නාභිප්‍රාය ඇති ව; **ඵුසතො**-පහරණා හට; **ඉධ ච**-මේ ශික්‍ෂාපදයෙහි ද; **භික්ඛුස්ස** භික්ඛුනිපි-භික්ෂුහට භික්ෂුනී ද; **භික්ඛුනියා භික්ඛු ච**-භික්ෂුණියට භික්ෂු ද; **අනුපසම්පන්නා එව**-අනුපසම්පන්නයෝ මැ යි.

දුතියං.

---

**උදකකීළිකා** වුමවනි ජලයෙහි කෙළි තොම කියනු ලැබේ. **උපරිගොප්ඵකෙ උදකෙ**-බොලවත් දියට අධික වූ දියෙහි; **නිමුජ්ජති වා**-කිඹිසිතේ හෝ වේ ද; **උම්මුජ්ජති වා**-හිස නඟ නගා; **තරති**-එතෙර වේ ද; **කට්ඨලාය වා**-කැබිලිත්තෙන් හෝ; **උදකං හනතො**-දිය පහරණාහට; **විකබල්ලං** වා-තුනු කලල් හෝ; **ඛිපනකීළාය**-දම්තකෙළියෙන්; **කීළතො**-කෙළනා හට; **අත්ථජොතනකං**-අර්ථ ප්‍රකාශ කරන්නාවූ; **අක්ඛරං ඡින්දිතුං**-අකුරක් අඳනට ද; අනෙක් හිරක් නො හැඳ තමා සිතූ අභිප්‍රාය දියෙහි අකුරක් ඇඳ පහනා කැමැති වැ අඳුත් වරී සේයි.

තතියං.

---

**සො භික්ඛු**-යම් මහණෙක්; **පඤ්ඤත්තෙන**-බුදුන් විසින් පණවනලද ශික්‍ෂාපදයෙන්; **උපසම්පන්නෙන වුච්චමානො**-උපසම්පන්නයන්හු විසින් කියනු ලබන්නේ; **අසික්ඛිතුකාමතාය**-නො හික්මෙනු කැමැති ව; **ඉදං-පෙ-ආදිනා**, **ඉදං**-මේ ක්‍රියාව; **සල්ලෙඛාය**- කෙලෙසසල්ලිඛනයට; **න සංවත්තති**-නො වෙටෙයි. **පවෙණිආගතන්ති**-සඞ්ගීතිකාලයෙහි පර්‍යාය පරම්පරාගතං, න අනතරු කෙතවි අව්‍යතෙනන උප්පාදිතං. **උග්ගහං ගහෙත්වා**-අසා එත පාලික්‍රම ගෙණ; **එතං අම්හාකං ආචරියානං උග්ගහො**-මෙ අපගේ ආචාරීන්ගේ පාලිය; **එවං පරිපුච්ඡානි**-මේ අර්ථකථා ය යි; **ගණ්ඨනස්ස** -පෙ-

චතුත්ථං.

---

**භිංසාපනත්ථං**-භය එලවනු පිණිස; **රූපාදීනි**-භයානක රූපාදීන්; **උපසංහරෙය්‍ය**-එළවා ද;

**පඤ්චමං.**

---

**සයං සමාදහනස්ස**-තමා විසින් ගිනි දල්වන්නාහට; **අරණිසණ්ඨාපනතො පට්ඨාය**-ගිනිදඬු සැපයීම් ආදිය පටන්; **සමාදහාපෙන්තස්ස**-අනුන් ලවා ගිනි දල්වන්නාහට; **බහුම්පි සමාදහිතෙ**-බොහෝ ගිනි දැල්වූකල්හි ද; **පතිතාලාතං උක්ඛිපන්තස්ස**-පෙණෙහෙල්ල නගන්නාහට ද; **තථා දුක්කටමං** යි යොදනු. **තඤ්ච**-ඒ පතිතාලුක්ඛිපනය ද; **අවිජ්ඣාතං**-දු බැසැ ගිය නො නිවී පෙණෙල්ල; **යථාඨානෙ ඨපෙන්තස්ස**-යථාස්ථාන යෙහි තබන්නාහට දුක්කට වෙයි සේයි. **විජ්ඣාතං පන**- නිවී පෙණෙල්ල වනාහි; **ජලයතො**-ගින්නෙහි ලන්නාහට; **වීතච්චිකඞ්ගාරං වා**-ගිනිසිළු[1] නැති අඟුරු හෝ; **විසිබ්බෙන්තස්ස**- තප්නාහට;

**ඡට්ඨං.**

---

**අභිසඞ්ඛරොති**-පිළියෙල කෙරේ ද; **සරජෙන වාතෙන**-රජස් සහිත වාතයෙන්; **ඔකිණ්ණස්ස**-ගැවසී ගත්තහුගේ; **කායෙ**-ශරීරයෙහි; **ද්වීසු වා තීසු වා උදකඵුසිතෙසු පතිතෙසු**-දෙතුන් ජලබින්දු කෙණකුන් හුනුකල්හි; ඒ වාතවුට්ඨිසමය යි දතයුතු. **න මත්තං ජනිතබ්බා**-මාත්‍රා නො දැන කල් යවා නහන වස්තුයෙහි පණවනලදී. **උක්කිරිතබ්බා**-කැනු; **ආපදාසූති** යන්නෙහි භමරු දීන් අනුබද්ධකල්හි උදකයට වදනාහට ද **අනාපත්ති** ය යි ගත යුතු. **නදීපාරගමනස්ස වා**-නෙමී ගෙණ දියෙන් එතෙර වීමක් ද;

**සත්තමං.**

---

**අට්ඨමෙ**-අට වන ශික්ෂාපදයෙහි; **අලභිති**-ලද නු යි භික්ෂු තෙමේ ලාභ නම් වේ. **ලාභො එව**-ලාභ ය යි සඞ්ඛ්‍යාත භික්ෂු තෙමේ මැ; **ලාභො**-ලාභ නම් වේ. **කිං අලභි**-කුමක් ලද ද? යත්:- **චීවරං**-සිවුර යි. **කීදිසං**-කෙබඳු ද? යත්:- **නවං**-අළුත් වූ; **ඉති**-මෙසේ; **නවචීවරලාභෙනාති**-අළුත් සිවුරු ලද භික්ෂූහු විසි නැ යි; **වත්තබ්බෙ**-කිව මනාකල්හි; **අනුනාසිකලොපං අකත්වා**-නිග්ගහීතයාට ලොප් නො කොට; **නවංචීවරලාභෙනාති වුත්තං**-නවංචීවරලාභෙන යි කියනලදී. **පටිලබ**

---

1. යිතිපුළු- හැම.

**නවචීවරෙනාති අලත්ථා**-ලද්දවූ අළුත් සිවුරු ඇත්තහු විසින් යන අර්ථ යි. නවචීවර නම් කප්බිඳු නො එබූයේ[1] යි. **මජ්ඣෙ ඨිතපදද්වයෙ**-නවචීවරලාභෙන යි සමස්තපදයාගේ මධ්‍යයෙහි නවං පන භික්ඛුනා යන මේ පදද්වයෙහි; පදද්වය අතුරෙහි යැ යි යේ යි. **පනාති**-පන යන මේ පදය; **නිපාතමත්තං**-නිපාතමාත්‍ර යෙකි; **කංසනීලෙන වා**-ලෝහමලයෙන් හෝ; **පත්තනීලෙන වා**-යම් කිසි පත් නීලයෙකින් හෝ; **මොරක්ඛිමණ්ඩල**-මයූර අක්ෂියෙහි කෘෂ්ණමණ්ඩලයක් පමණ හෝ; මොනර අක්ෂිමණ්ඩලය ද මඞ්කුණපිටියට කුඩා වුව නො වටී. මහත් වුව දොස් නැති.

**කප්පකතෙන**-කප්පකතය හා එක් කොට; **අකප්පකතෙන**-අකප්පකතය; **සංසිබ්බිතෙ**-ගෙත්තම් කළ කල්හි ද; **අග්ගළ**-මැඩලි ලිම හෝ එබැ ම පෙරළීම් කඩ; **අනුවාත**-දිග නුවා යි; **පරිභණ්ඩසු** සරස නුවායෙහි; **පච්චාරොපිතෙසු** යි යොදනු. මෙහි **ක්‍රියා** නම් නිවාසනපාරුපනය ය. **අක්‍රියා** නම් කප්බිඳු නො එබීම යි.

**අට්ඨමං.**

**සන්තිකභාවං**-ආසන්න බව ද; **අසන්තිකභාවස්ස**-දූරු බව ද; **දත්වා**-දී; **තතොපට්ඨාය**-එතැන් පටන් කොට; **පරිභොගාදයො වට්ටන්ති**-පරිභොග විස්සජ්ජන අධිෂ්ඨාන යන මොහු වටිත්. **යෙන පන භික්ඛුනා** -ඒ චීවරපටිග්‍රාහක භික්ෂූහු විසින්; **අපච්චුද්ධාරං**-චීවරප්‍රතිග්‍රාහකයා විසින් නො පසුදුළ හෝ; **යෙන විනයකම්මං කතං**-යමක්හු විසින් විනය කර්මසංඛ්‍යාත ප්‍රතිග්‍රහණය කරණ ලද ද; **තස්ස වා විස්සාසෙන**-ඔහුගේ විශ්වසින් හෝ; **තං පන**-ඒ පසුදුළ සිවුර; **ක්‍රියා ක්‍රියං** යන්නෙහි වැළඳගැන්ම ක්‍රියා ය. අපච්චුද්ධරණය අක්‍රියා යි.

**නවමං.**

**අපනෙත්වා**-පහ කොට; **නිදහෙය්‍ය**-තබන්නේ යි; **දුන්නික්ඛිත්තං**-නපුරු කොට තබන ලද්ද; **පටිසාමෙන්තස්ස**-සඟවා තබන්නාහට ද;

**දසමං.**

**සුරාපානවග්ගො.**

**මහන්තෙ පන**-මහත් වූ හස්තිඅශ්වාදි මහත් සතුන් කෙරෙහි; **උපක්කමමහන්තතා**-උපක්‍රම මහත් බැවින්;

**පඨමං.**

1 නො එබූයේ

**යෙ පාණකා**-යම් ප්‍රාණීකෙණෙක්; **පරිභොගෙන**-අනුභව යෙන්; **මරන්ති**-මියෙද්ද; **තෙහි**-ඔවුන් විසින්; **සප්පාණකං**-සප්‍රාණක වූ; **තාදිසං**-එබඳු වූ ජලය;

දුතියං.

---

**යස්ස අධිකරණස්ස**-යම් අධිකරණයක්හුගේ; **වූපසමාය**-සන්හිඳුවනු පිණිස; **එසො ධම්මො වුත්තො** යි යොදනු. **නිහතං**-සන්හිඳුවනලද; **අධිකරණං**-අධිකරණය; කර්මධාරය යි. **වූපසමනයං පනස්ස**-ඒ අධිකරණයාගේ වූපසම නය වනාහි; **උච්චාලෙය්‍ය**-සොලවන්නේ යි; **යථාධිප්පායභාවෙන පතිට්ඨාතුං**[1] **න දදෙය්‍ය**-පළමු තුබූ පරිද්දෙන් සිටීම නො දෙන්නේ යි. **තං පන අධිකරණං ධම්මෙන නිහතං** යි යොදනු. **පටිකොසන්ති**-වළකා ද; **තං සඤ්ඤාපෙත්වා**-ඔහු ගිවිස්වා[2]; **කාතබ්බං**-කටයුත්තේ යි. **ඉතරථා**-පටිකොසනය කළහු සන් නො හිඳුවා **නෙරෙත්** නම්; **උභයෙ**[3]-ධර්මකර්ම අධර්මකර්ම දෙක්හි; **යථාධම්මං නිහතභාවා**-ධර්ම වූ පරිද්දෙන් සන්හුන් බව; **ජානනතා**-ධර්මයෙන් සන්හුන්බව දන්ම ය;

තතියං.

---

**දදන්ති**-දූන්; **ඉදං**[4]-මේ දුබ්ලය; **කස්සචි**-කිසිවක්හට; **න ආරොචෙස්සාමි** යි යොදනු. **පටිච්ඡාදනත්ථමෙව**-සඟවනු පිණිස මැ; **සොපි**-හෙ ද; **අඤ්ඤස්සපි**-අනෙකක් හට ද සඟවනු පිණිස මැ කියයි කියා; **එතෙනුපායෙන**-මෙ මැ ක්‍රමයෙන්; **යාව කොටි න ඡිජ්ජති තාව සමණසතම්පි ආපජ්ජති** යි යොදනු. **සො**-ඒ තුන්වැනි වැ ඇසූයේ; **නිවත්තිත්වා**-වැළකා; **යෙන**-ආපත්තියට අවන්නාවූ යමක්හු විසින්; **අස්ස ආරොචිතං**-ඒ විතීයයහට කියනලද ද; **තස්සෙව ආරොචෙති**-ඒ කී තැනැත්තහුට මැ කියා ද; **එවං**-මෙසේ; **තතියෙන පුග්ගලෙන**-තෘතීයපුද්ගලයා විසින්; **දුතියස්ස ආරොචිතෙ**-ආපත්ති අවන්නාවූ විතීයය හට ඇරෙවිත කල්හි; **කොටිච්ඡින්නා හොති**-කෙළවර සුන්නා නම් වේ. යෙන දුතියෙන අස්ස තතියස්ස ආරොචිතං; **තස්සාති** දුතියස්ස; යෙන යි ගත් විතීයයාගේ ම තස්සෙව යි මෙ **සිඛවලද** කියේ. **කඞ්ඛාවිතරණී සන්‍යෙහි** එක් පක්‍ෂයක් කීහු.

**දුබ්බල්ලාය ආපත්තියා ආදිපදෙ පාචිත්තියං** යන්හෙහි දුබ්බුල්ලාය ආපත්තියා දුබ්බුල්ලසඤ්ඤී, අදුබ්බුල්ලසඤ්ඤී, වෙමතිකො

---

1. යථාඨිතභාවෙන පතිට්ඨාතුං-කඞ්ඛාවිතරණී. 2. ගිවිස්සවා—ඇතම. 3. උභයෙසු-කඞ්ඛාවිතරණී. 4. තං-කඞ්ඛාවිතරණී.

යන මේ ත්‍රිකයෙන් දුට්ඨුල්ලාය ආපත්තියා දුට්ඨුල්ලසඤ්ඤී යන මේ ආදිපදයෙහි පාචිත්තිය යි සේ යි. ඉතර වූ අදුට්ඨුල්ලසඤ්ඤී, වෙමතිකො යන මේ දෙක්හි දුක්කට යි. **අනුපසම්පන්නස්ස**- අනුපසම්පන්නයාගේ; **දුට්ඨුල්ලං**- සුක්කවිස්සට්ඨිය හා සමග පාණාතිපාතාදි පස් දුට්ඨුල්ල වූ අජ්ඣාචාරයෙහි ද; **අදුට්ඨුල්ලං වා අජ්ඣාචාරං**- විකාලභොජනාදි අදුට්ඨුල්ල වූ අජ්ඣාචාරයෙහි ද; **දුක්කටමෙව**- දුක්කට මැ යි. **පතිරූපං භික්ඛුං අපස්සන්තො**- සභාගභික්ෂුවකු නො දක්නාහට ද; **පඤ්ඤායිස්සති සකෙන කම්මෙන**- ස්වකීය කර්මයෙන් සඞ්ඝයාහට පැණෙයි.

චතුත්ථං.

---

**සො ච**- ඒ ඌනවර්ෂයා ද; **උභයත්ථ**- පරිපූර්ණ වර්ෂය අපරිපූර්ණ වර්ෂය යන දෙතන්හි;

පඤ්චමං.

---

**ජුඩකං වා**- සුංවත් හෝ; **පරිභරිතුකාමා**- වළඳා යනු කැමැත්තාවූ; **කතකම්මා චෙව අකතකම්මා ච යෙ චොරා මග්ගපටිපන්නා** යි යොදනු. **තෙසු**- ඔවුන් කෙරෙහි; **ඉධ**- මේ ශික්ෂාපදයෙහි; **ථෙය්‍යසත්ථසඤ්ඤා**- ථෙය්‍යසත්ථ යන නම යි. **ථෙය්‍යසත්ථභාවං ඤත්වා තෙන සද්ධිං සංවිධාය මග්ගං ගච්ඡන්තස්ස තස්ස** යි යොදනු.

**මනුස්සෙසු අසංවිදහන්තෙසු**- මනුෂ්‍යයන් තමා හා බැණැ ගැන්මක් නැති කල්හි; **සයමෙව සංවිදහිත්වා ගච්ඡන්තස්ස**- තමා මැ බැණැ ගෙණැ යන්නාහට ද;

ඡට්ඨං.

සත්තමං.

---

**තෙ**- ඒ අන්තරායකරධර්මයෝ; **පඤ්චවිධා** යි යොදනු. **කම්ම** නම්, පඤ්චානන්තර්‍ය්‍යකර්මය හා භික්ෂුණීදූෂකකර්මය යි. එයින් භික්ෂුණීදූෂකකර්මය මොක්ෂාන්තරාය මැ කෙරෙයි, ස්වර්ගාන්තරාය නො කෙරේ. **කිලෙස** නම්, නියතමිථ්‍යාදෘෂ්ටිකර්මයෝ යි. **විපාක** නම්, අහේතුකප්‍රත්‍යයෙන් උපන් පණ්ඩක උභතොව්‍යඤ්ජනක ජාත්‍යන්ධ ජාතිබධිර තිරශ්චානගතයන යන මොහු යි. **උපවාද** නම්, ආර්‍ය්‍යෝපවාද යි. **පඤ්ඤත්තිවීතික්කම** නම්, බුදුන් විසින් පණවනලද සප්තාපත්තිස්කන්ධව්‍යතික්‍රමය යි. **පඤ්ඤත්තිවීතික්කමන්තරායිකෙ සන්ධාය**- ප්‍රඥප්තිව්‍යතික්‍රමඅන්තරායිකයන් පිණිස; **යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා**- සර්වඥයන් විසින්

යම් මේ අන්තරායකරධර්මකෙනෙක් කියනලදහු ද; **තෙ පටිසෙවතො**- ඒ අන්තරායකරධර්මයන් සෙවුනාහට; **නාලං අන්තරායායාති**-අන්තරායට සුදුස්සෝ නො වෙති සි; **වුත්තං**- පාලියෙහි කියනලදී. **අට්ඨිකඞ්කලූපමා කාමාති ආදියි** යන්නෙහි ආදි ශබ්දයෙන් **මංසපෙසූපමා කාමා අසිසූනූපමා කාමා** යනාදි ගත්හු. **සො භික්ඛු**- ඒ මේ මෛථුනව්‍යතික්‍රමයෙහි දෙෂ නුදුටු වාවූ මහණ; **සුත්වා**-ඔහු මෙසේ දෘෂ්ටි ගත් බව අසා; **අවදන්තානම්පි**- "මා ආයසමා" යනාදින් නො කියන්නා හට ද; **ආකඩ්ඪිත්වා**-බහා ගෙණැ; **තත්‍රාපි**-ඒ සඞ්ඝමධ්‍යයෙහි දු; **තස්ස අප්පටිනිස්සජ්ජන**-දෘෂ්ටි නො හැරීමෙහි ඕහට ද; **ඉතගරසඤ්ඤුව අවචනෙ**-සඟමැදට බහා ගෙණැ සෙසු භික්ෂූන්ට නො කීමෙහි ද; **අථ**-එතෙකුදු වුව;

**අසමනුභාසියමානස්ස**- සමනුභාසනාකර්ම නො කරණ ලද්දහුට ද; මේ අරිට්ඨ භික්ෂුහට බන්ධකයෙහි උත්ක්ෂෙපණීයකර්ම කළ හෙයින් ආදි කොට සමනුභාසනා කර්ම කොට එ දෘෂ්ටි නො හල කාලැ පාපිකාදෘෂ්ටියගේ අප්පටිනිස්සග්ගයෙහි උත්ක්ෂෙපණීයකර්ම කෙරෙති සි දත යුතු. මත්තෝ සික්ඛයෙහි දු උත්ක්ෂෙපණීයකර්ම කළහු හා සමඟ සම්භොගාදි කරණුවහට ආපත්ති සි දතයුතු. අරිට්ඨ භික්ෂුහට සමනුභාසනා කොට උත්ක්ෂෙපණීය කර්ම කළ හ සි දත යුතු. එහෙයින් මෙ සික්ඛයෙහි ආදිකර්මිකයහට ද ආපත්ති මැ සි. එසේ වුව හොත් "**ආදිකම්මිකස්ස අනාපත්ති**" සි කුමට කීහ? යත්:—පොත් නැතිකලැ පිරිවහන[1] වහන්සේ වරුන්දූ මූබාරුඪ හෙයින් කීහ සි දත යුහු. මෙ මැ කීහ, **වජිරබුද්ධිෂෙයි**:-"පාලියං ආදිකම්මිකස්ස අනාපත්තීති මූබාරුළ්හ වසෙන වුත්තන්ති වෙදිතබ්බං" සි. මෙහි මූබාරුළ්හ ය යනු සමීඥ යන් ගෙණ නො වෙ. පෙල "යථා යෙ මෙ" යන තැනැ යථා යනු යථා නාලං අන්තරායාය ශී යොදනු. අන්තරායට යම් සේ සමර්ථ නො වේ ද, භගවතා දෙසිතං ධම්මං අහං තථා ආජානාමි සි යොදනු.

අට්ඨමං.

---

**තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමීති ආදිවාදිනා**-මේ ආදි කියන්නහු හා; **ධාරණා අනුධම්මොති** වුච්චති සි යොදනු. **අනුලොම වත්තං දිස්වා**-භික්ෂූන්ට අනුකූල පැවතුම් දැකැ; **යස්ස න කතො**- යමක්හට නො කරණ ලද ද; **අයං**- මේ භික්ෂුතෙමේ, අකටානුධම්මනම් වේ. **තාදිසෙන සද්ධින්ති අකටො**- එසේ වූ භික්ෂුහු හා සමඟ ය යන අර්ථ සි. **නානුපවාරෙපි**-නොයෙක්

---

1, පිරිවහන—හැම.

දොර ඇති; **එකාවජ්ජනෙන**- එකාවජ්ජන වූ සෙතස්නෙහි; **නිපජ්ජෙය්‍ය**- හොත්තේ වී නම්, පාචිත්තිය වේ යි යේයි. **සාපෙ**- ඒ ධර්මාමිෂසම්භොග දෙක්හි; **ආමිසපරිභොගෙ**- ආමිෂපරිභොගයෙහි ඒ ත්‍රිවිධ උත්ක්ෂේපණීයකර්ම කරණ ලද්දහට; **එකපයොගෙන**-එක් ප්‍රයොගයෙන්; **බහුම්පි දදතො**-බොහෝ දු දෙන්නාහට ද; **එකං පාචිත්තියං**, **විච්ඡින්නෙ සති**-කඩ කොට දීමක් ඇතිකල්හි; **උද්දිසන්තස්ස**- කියවා දෙන්නාහට ද; **උද්දිසාපෙන්තස්ස වා**-කියවා ගන්නාහට ද; **පදසො ධම්මෙ**-පදසොධර්මයෙහි; **වුත්තනයෙන**-කී පරිද්දෙන්; **පදාදීහි ආපත්ති පරිච්ඡෙදො වෙදිතබ්බො** යි යොදනු. **සංවාසෙ**- එකකම්ම එකුද්දෙසාදිසංවාසයෙහි; **කම්මපරියොසානවසෙන ආපත්ති පරිච්ඡෙදො වෙදිතබ්බො** යි මෙයට ද යොදනු.

නවමං.

---

**චරා**ති යි යේයි, කිම් ද **ගච්ඡ** ය. **පිරෙ**ති යි යේයි, කිම් ද පර අය; **අමාමක**-මාගේ ය යි මමත්වයක් නැත්තව; **විනස්සා**ති **නස්ස**-නැසිය; **දූසකො නාසෙතබ්බො**- භික්ෂුනිදූසකයා නැසිය යුත්තේ ය. **මෙත්තියං භික්ඛුනිං නාසෙථා**ති-මෙත්තියා නම් මෙහෙණ නසව යි යන; **අයං**-මේ; **ලිඞ්ගනාසනා නාම**-ලිඞ්ගනාසනා නම් වේ. **අජ්ජතග්ගෙ තෙ ආවුසො සමණුද්දෙස**-ඇවැත් වූ සමණුද්දෙසය; **තෙ**-තා විසින්; **අජ්ජතග්ගෙ**-අද පටන් කොට; **න චෙව සො භගවා සත්ථා අපදිසිතබ්බො**-**භගවා**-භාග්‍යවත් වූ; **සො සත්ථා**- ඒ ශාස්තෘ තෙම; **න චෙව අපදිසිතබ්බො**-මගේ ශාස්තෘ ය යි නො මැ කිය යුත්තේ යි. **අයං**-මේ; **දණ්ඩකම්මනාසනා නාම**- දණ්ඩකර්මනාශනා නම් වේ. **සඞ්ඝණ්හෙය්‍ය**-තලවන්නේ යි;

දසමං.

---

**සප්පාණක වග්ගො.**

---

**එතස්මිං සික්ඛාපදෙ**- තොප කියනලද මේ ශික්ෂාපදයෙහි; **යං වුත්තං**-යමෙක් කියනලද ද; **තං**-එ; **යාව න අඤ්ඤං භික්ඛුං ව්‍යත්තං විනයධරං පරිපුච්ඡාමි, තාව න සික්ඛිස්සාමීති අත්ථො** යි යොදනු. **අනාදරියභයා**- යට "**අනාදරියෙ පාචිත්තියං**" යි සික්ෂාපද කීහෙයින් අනාදරයෙහි භය ඇති වැ; **ලෙසෙන**-ලේශයෙන්; **එවං වදන්තස්ස**-"යාව න අඤ්ඤං භික්ඛුං" යනාදි ක්‍රමප්‍රකාරයෙන් කියන්නා හට; **සික්ඛිතුකාමෙනෙව හුත්වා**-

හික්මෙනු කැමැති වැ මැ; **ආජානිතබ්බං** යන්නෙහි වජ්ජිතබ්බ පුග්ගලාදි පරිවජ්ජිතබ්බං. **ඉමස්ස**-මේ පදයාගේ; **තුලයිතබ්බං**- අර්ථපරීක්ෂා කිරීම් වශයෙන් සූත්‍ර ය, සූත්‍රානුලෝම ය, ථෙරවාද ය, අත්තනොමති ය යන මේ සතර පදෙසයෙහි බහා ලා සම කට යුත්තේ යි.

**උභොහිපි**- උපසම්පන්න අනුපසම්පන්න දෙදෙනා විසින් ද; **ඉදං න සල්ලෙඛාය**-මේ සල්ලෙඛ පිණිස නො වැටෙන්නේ ය යි; **අපකතඤ්ඤුතෙන**- සූත්‍රාභිධර්මයෙන්; **වුච්චමානස්සාපි**- කියනලද්දහට ද;

**පඨමං.**

---

**සජ්ඣායවසෙන**-හැදෑරීම් වසයෙන්; **පරිවත්තියමානෙ වා**- පිරිවහනකල්හි ද; බුද්ධ නම් පුල්ලවවය ය; අනුබුද්ධ නම් පාචිත්ති ය යි. මෙ මැ තිසෙන් පඤ්චලහුකාපත්තිහු ඔවුනොවුන්ට බුද්ධානු බුද්ධ නම් වෙත්. බුද්ධ නම් කුඩා ය. අනුබුද්ධ නම් එයට කුඩා වූයේ යි. **යාවදෙවාති** යන්නෙහි; **තෙසං**- බුද්ධානුබුද්ධකශික්ෂා පදයන්ගේ; **සංවත්තනමරියාදපරිච්ඡෙදවචනං**-වැටෙන්නාවූ හිම පිරිසිඳිනා වචනයෙකි; **එතානි හි**- මේ ශික්ෂාපදයන් වනාහි; **යෙ**-යම් කෙණෙක්; **උද්දිසන්ති**-කියවා දෙද්ද; **සජ්ඣායන්ති වා**-හදරද්ද; **කප්පති නු ඛො**- කැප දෝ; **න කප්පති නු ඛො**- නො කැප දෝ හො යි කරන්නාවූ; **කුක්කුච්ච**-කුකුස් ය; **විප්පටිසාර**-විපිළිසර සඞ්ඛ්‍යාත පිඩා ය; **විහෙස**-මොහ; **විචිකිච්ඡා**-සැක; **මනොවිලෙඛා ච**- සිත් නො සිලුටු කිරීම යන මොහු; **යාව උප්පජ්ජන්තියෙව**- යම් තාක් උපදිත් ම ද; **තාව**- ඒ තාක්; **තෙසං**- ඒ භික්ෂූනට; **සංවත්තන්ති**-පවතිත්; **අථ වා**- නොහොත්; **යාවදෙවාති**- යාවදෙව යන නිපාතය; **අතිසයවවත්ථාපනං**- අතිශයෙන් නිශ්චය කිරීමෙහි හො වැටෙ; **තස්ස**-ඒ යාවදෙව යන නිපාතයාගේ; **සම්බන්ධො**-සම්බන්ධය; **සංවත්තන්තීති ඉමිනා**- සංවත්තන්ති යන මොහු හා; **කුක්කුච්චාය**- කුකුසට; **විහෙසාය**-වෙහෙසට; **විලෙඛාය**- මනොවිලෙඛයට; **අති විය**- අතිශයෙන් මැ; **සංවත්තන්තියෙවාති**-වැටෙන්නාහු මැ යැ යි; **වුත්තං හොති**-කී නම් වේ.

**තස්මා**-එබැවින්; **සුත්තන්තෙන වා**- සූත්‍රාන්තයන් හෝ, **ගාථායො වා**- ගාථාවන් හෝ; **අභිධම්මං වා**-අභිධර්ම හෝ; **තාව පරියාපුණස්සු**-පළමු කොට හදරව; **පච්ඡා**- පසු වැ; **විනයං පරියාපුණිස්සසීති**-විනය හදරයි;

**දුතියං.**

---

**උපොසථමසෙන උද්දිස්සමානෙ**- පොහෝ හෙයින් උදෙසන ලබන කල්හි; පාලියෙහි **එවං වදෙය්‍ය** යනු හා සම්බන්ධ යි. **සො**-හෙතෙම; **යං අනාචාරං ආචරිත්වා**- යම් ව්‍යතික්‍රමයක් කොට; **ධම්මෙන**- භූතවස්තුයෙන් ද; **විනයෙන වා**- චොදනා සාරණයෙන් ද; **තෙ**- තා විසින්; **සො**-හෙතෙම; **එවං ආරොපිතෙ මොහෙ**-මෝහය මෙසේ ආරෙපණය කළ කල්හි; **පුන මොහෙති**-නැවත භික්ෂූන් මුළා කෙරේ ද; **නාරොපිතෙ මොහෙති අත්ථො**- මොහාරොපණය නො කළ කල්හි පාචිත්තිය නො වෙයි යන අර්ථ යි.

**යෙන**-යමක්හු විසින්; **විත්ථාරෙන න සුතං**-විස්තරයෙන් තිමවා ප්‍රාතිමෝක්‍ෂය නො අසන ලද ද; **යෙන**-යමක්හු විසින්; **ඌනකද්වත්තික්ඛත්තුං වා විත්ථාරෙන සුතං**-උනු වූ දෙතුන් වරෙකැ විස්තරයෙන් අසනලද ද යන මෙහි; උනු වූ දෙතුන් වරෙකැ විස්තරයෙන් ඇසීම නම් දෙවරෙකැ විස්තරයෙන් නො අසා තුන්වෙනිවර තිමවා ඇසීම යි. මෙසේ අසන ලද්දහට ද; **අනාපත්ති** යනු හා සම්බන්ධ යි. **යො ච න මොහෙතුකාමො**-යමෙක් භික්ෂූන් මුළා කරණු නො කැමැත්තේ ද; **මොහාරොපණං** යන්නෙහි මොහ නම්, ඥත්තිදුතිය කර්මයෙන් කරන්නාහට නමෙකි.

**තතියං.**

---

**පහරිතුකාමතාය**-ගසනු කැමැති සිතින්; **සචෙපි මරති**- ඉදින් මෙලේ නමුදු; **පාචිත්තියමෙව**-පචිති මැ යි.

**කෙනචි විහෙඨියමානස්ස**- මාතුගාමාදි කිසිවක්හු විසින් වෙහෙසනලදු වැ ඔහට පහර දී ගැලවෙන්නාහට ද; **මොක්ඛාධිප්පායස්ස**- චෞරාදීන් උපද්‍රැත වැ ඔවුන් කෙරෙන් ගැලවෙනු කැමැති වැ පහර දී ගැලවෙන්නාහට ද;

**චතුත්ථං**

---

**උච්චාරෙය්‍ය**-නඟා ද යන; **එත්ථ**- මෙහි, **සචෙ පන**- ඉදින් වනාහි; **උග්ගිරිත්වා**- නඟා; **විරද්ධෙ**-වැරැද්ද; **පහාරං දෙති**-ප්‍රහාරය දේ ද; **න පහරිතුකාමතාය දින්නත්තා**-නො ගසනු කැමැතිවැ දුන්බැවින්; **දුක්කටමෙව**- දුකුළා මැ යි. 'බවමි' යි සිතා නඟා ගත් අත එ මැ අවස්ථායෙහි සිටැ බැවීම සිඩ නො වූ හෙයින් මෙ

සිඛයෙන් ද වන පචිති නො වී ය. 'බවමි' යන සිත මුත් 'ගසමි' යන සිත නො උපන් හෙයින් වැරද්ද ඇත ද, ගසන යට සිඛයෙනුදු පචිති ඇවැත් නැති. දුකකට මෙ සිඛයෙන් වේ මැ යි.

පඤ්චමං.

---

**චුදිතකො**- චොදනා ලබන තැනැත්තේ; **තංඛණංයෙව**- ඒ චොදනා කළ කෙණෙහි මැ; **චොදෙති මන්ති**-මට ය චොදනා කරන්නේ යැ යි; **සචෙ ජානාති**-ඉදින් දනී ද; **චොදකස්ස පාචිත්තියං**-චොදනා කළහට පචිති ඇවැත් වේ.

ආචාරවිපත්තියෙහි මැ ආජීවවිපත්ති ගැණෙන හෙයින් මෙහි ආජීවවිපත්ති වෙන නො කීහු. අමූලක වූ පාරාජිකායෙන් චොදනා කළකල්හි සඟවෙසෙස් වෙයි. සීලවිපත්ති මැ වූ අමූලක සඟවෙසෙසින් චොදනා කළ කල්හි මේ සිඛයෙන් පචිති ඇවැත් වේ. ආචාරවිපත්තියෙන් ද ආජීවවිපත්තියෙන් ද විශෙෂයෙහි දී පාරාජිකා තබා සෙසු ආජීවවිපත්තියෙන්ද දෘෂ්ටිවිපත්තියෙන් ද චොදනා කරන්නාහට දුකකට මැ යි. **තථසඤ්ඤිස්ස**- සඟවෙසෙස්හි ද සඟවෙසෙස් නො වූයෙහි ද සඟවෙසෙස් යන සංඥ ඇත්තාහට ද;

ඡට්ඨං.

---

**තුවං**- තා; **ඌනවීසතිවස්සොසි**- ඌනවිංශතිවර්ෂී ය යි; **මඤ්ඤෙ**-සිතමි; තා විකාලයෙහි වැළඳුවහ යි සිතමි යි යනාදීන්; **අඤ්ඤස්මිං උප්පාදනපච්චයෙ අසති**-කුකුස් උපදවන්නට සුදුසු වූ අනෙක් ප්‍රත්‍යයක් නැතිකල්හි; **එවං**- මෙසේ; **සඤ්චිච්ච**- ඌනවිංශතිවර්ෂීබව් දත්කල්හි විකලැ වැළඳූබව ද දූනැ දූනැ; **උප්පාදෙන්තස්ස**- කුකුස් උපදවන්නාහට ද;

**න උප්පාදෙතුකාමස්ස**-සැක උපදවනු නො කැමැතියහට ද; **කෙවලං**-හුදෙක්; **හිතෙසිතාය**-හිතවිත්තයෙන්;

සත්තමං.

---

භණ්ඩනකලහෙහි **විවදිතං**- භණ්ඩනකලහදෙකින් වැඩුනාවූ; **විවාදාධිකරණං**- විවාදාධිකරණයට; **ආගතානං**- අවන්නාවූ භික්ෂූන්ගේ; මෙහි භණ්ඩන නම් ඔබරට පූර්ව කොට කරණ ක්‍ෂුද්‍ර කලහ යි. කලහ නම් මහා කලහ යි. **සුතිසමීපං**- බස් ඇසෙන තැනි. **සොස්සාමීති**-අසමි යි; **චොදෙතුකාමතාය ගච්ඡතො තස්ස** යී යොදනු. **තුරිතගමනෙපි**-රහස් බැණැ බැණැ

යන්නවුන් පස්සෙහි රහස් අසනු කැමැති වැ වගා යාමෙහි ද; **බහියනෙපි**- රහස් බැණැ බැණැ යන්නවුනට පෙරට වැ යෙමින් සිටැ රහස් අසනු කැමැති වැ පසු බසිමින් සිටැ එලිඑලි යාමෙහි ද; **අස්ස**- ඔහට; **සං මන්තයමානෙසු**-යමක් මන්ත්‍රණය කරණකල්හි;

**ඉමෙසං සුත්වා**-මොවුන්ගේ මන්ත්‍රණය අසා; **සියා කිරියං**-ක්‍රියායෙන් ද වන්නේ යි. **සියා අකිරියං**- අක්‍රියායෙන් ද වන්නේ යි. මෙහි ගොසින් ඇසීම ක්‍රියා නම් වේ. තමා හුන් තැනට අවුත් බණනකල්හි මුයෙන් නො බැණැ ඇසීම අක්‍රියා නම් වේ. වචීකර්‍ම නම් උකැසි නො පැහැරීම්.

අට්ඨමං.

---

**ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන** යන්නෙහි **විනය** නම් චොදනා සාරණාව යි. **සත්ථුසාසන** නම් ඤත්ති අනුසාවණාදි සම්පත්ති යි. **අනුසාවණා** නම් කර්‍මවාක්‍ය යි. පච්ඡා සූයතෙ ඉති අනුසාවනං[1] යනු වේ. මේ ධර්‍මවිනය ශාස්තෘශාසනයෙන් කරණ ලද, **අපලොකන—පෙ—ඉමෙසං චතුන්නං කම්මානං**-මේ සතර කර්‍මයන්ට; **ඡන්දං දත්වා පච්ඡා ඛියනධම්මං ආපජ්ජන්තස්ස වාචාය වාචාය පාචිත්තියන්ති** යනු හා සම්බන්ධ යි. **කිත්තෙන්තො**- කියා; **රුච්චති**-අභිමත යි. **තාදිසානංයෙව**- ඒ **කණ්ටක** සාමණෙරාදීන්ගේ මැ; **සම්මාවත්තං දිස්වා**-භික්ෂූන්ට අනුකූල පැවතුම් දැකැ; **පවෙසනා**- සඞ්ඝයා කරා ගැන්ම; **දුරුත්තවචනෙහි**- පරුෂතෙපුලෙන්; **භික්ඛූ**- භික්ෂූන්; **ඝට්ටෙන්තස්ස**- ඝට්ටන්නාවූ; **මුඛරස්ස භික්ඛුනො**- දෙඩමලු භික්ෂුහට; **නෙව වත්තබ්බො**- චොදනා සාරණා නො මැ කිය යුත්තේ ය. මෙහි චොදනා නම් ආපත්තීන් කීම යි. සාරණා නම් ඒ ආපත්තීන් නිශ්චය කිරීම්. **අවන්දියො කාතබ්බොති**-නො වැඳිම් කටයුත්තේ යි යොදනු. **එවං**- මෙසේ; **යම්පන අවන්දියකම්මං අනුඤ්ඤාතං** යි යොදනු. **අපසාදියං**-උෟරුවිවරණාදි අපසාදකරය; **උපස්සයෙ**-මෙහෙණසස්නෙහි; **එවරූපං යං කම්මං** යි යොදනු. **තස්ස**- ඒ කර්‍මයාගේ; **කම්මංයෙව**- කර්‍මලක්‍ෂණය; **ඔසාරණාදිනි**- ඔසාරණාදීහු; **යස්මා න**-යම් හෙයකින් නො වෙද්ද; ඔසාරණාදි වූ නාමාන්තරයකට නො ගොස් අපලොකනනාමයෙන් මැ සිටි හෙයින් මෙතෙම කර්‍මලක්‍ෂණ නම් වෙයි සේයි.. **භික්ඛුනිමූලකං**- භික්ෂුණීන් මුල් කොට; **අපි ච භික්ඛූනම්පි ලබ්භති**-නැවත භික්ෂූන්ට ද අපලොකන කර්‍ම ලැබේ. **අවජිතනවිවරාදිනං** යන්නෙහි

1. පච්ඡා සූයත ඉති අනුසාවන යනු වේ- ඇතම්.

ආදිශබ්දයෙන් ජීර්ණචීවර නෂ්ටචීවර දෙදෙන ගත්හු. **චීවරාදීනි අදෙන්තානි වා**- චීවරාදීන් දෙන්නහු විසින් ද; **පරි—පෙ—පරි** භොක්තව්‍ය[1] වස්තූන් ද අපනෙතව්‍ය වූ වෘක්ෂාදි වස්තූන් ද අනුභව කරන්නවුන් විසින් ද පහ කරන්නවුන් විසින් ද; **කථා රූපං වා**-එබඳු අනෙක් ධර්මකථාවක් කරන්නවුන් විසින් ද;

**ඉමස්ස**- මේ භික්ෂුහට; **නෙව සුත්තං ආගච්ඡති**- මාතිකා නො ද පුහුණු ය. **නො සුත්තවිභඞ්ගො**- ඒ මාතිකාවට වදාළ පදභාජනීය නො ද පුහුණු ය. **සො**- හෙ තෙම; **අත්ථං අසල්ලක්ඛෙන්තො**-විනයෙහි අර්ථ නො සලකා; **ව්‍යඤ්ජනච්ඡායාය**-ව්‍යාකරණයෙහි දක්ෂ හෙයින් ව්‍යඤ්ජනලෙශයෙන්; **අත්ථං පටිබාහති**- නැති අර්ථයක් කියා ද ඇති අර්ථය පිරිහෙලා ද; **අවසෙසා**-අවශෙෂ වූ අපි හැම දෙන ම[2]; **එවං උබ්බාහිකවිනිච්ඡයෙ**-මෙසේ වෙන් කොට ගත් විනිශ්චයෙහි; **නිස්සාරණා**-පහ කිරීම;

**ආගමෙ කාලෙ**-එන්නාවූ කාලපක්ෂයෙහි; **කතපවාරණා පච්චුක්කඩ්ඪනා**-කරණලද්දවූ පවාරණාපච්චුක්කඩ්ඪනා තොමෝ; **තිණවත්ථාරකසමථෙ**-තිණවත්ථාරකසමථයෙහි සබ්බසඞ්ගාහක ඤත්ති ද; **එකතො ඤත්ති ච**-කලහ කොට බුන්නාවූ දෙරුස සඞ්ඝයා එක් කොට තබන්නාවූ ඤත්ති ද; **එකෙකස්මිං පක්ඛෙ**- දෙරුස සඞ්ඝයා නැවත තමතමන් කෙරෙහි දී තබන්නාවූ ඤත්ති ද එක් කොට; **එකෙකා ඤත්ති චාති**-එකෙක ඤත්ති ද යි;

**සා**-ඒ ඕසාරණා තොමෝ; **සාපිය**-වැසිසළු සිවුරු; ඤත්ති චතුර්ථකර්මයෙන් භික්ඛුනීඕවාදසම්මුති මුත් අනෙක් සම්මුතියෙක් නැති. **උක්ඛිත්තානුවත්තිකා** නම් ත්‍රිවිධ උත්ක්ෂෙපණීයකර්ම කරණලද භික්ෂූහු අනු වූ භික්ෂුණී යි. **අට්ඨ යාවතතියකා** යන් නෙහි, අට යාවතතියකයෝ නම් සඞ්ඝාදිසෙසෙහි කී “**සමග්ගස්ස සඞ්ඝස්ස**” යනාදි වූ සතරතෙම භික්ෂූන්ට සතරක් වශයෙන් ද භික්ෂුණීන්ට සතරක් වශයෙන් ද අටයාවතතියක නම් වෙත්. **තෙ ඉමෙ**-ඒ මොහු; **යාවතතියකා**-යාවතතියකයෝ නම් වෙත්.

**අවසෙසා තෙරස සම්මුතියො**- යට කියනලද පණ්ණරස යෙන් සීමාසම්මුතිය ද සෙනාසනගාහාපකසම්මුතිය ද තබා අවශෙෂ වූ තෙළෙස් සම්මුතීහු ද; සෙනාසනගාහාපකසම්මුතිය ලඝුකර්මයෙහි මැ අන්තර්ගත වන හෙයින් නැවත සෙනාසනගාහාපක සම්මුති යි කීහු. **ධම්මො**-ධර්මය; **එතෙසු**- මේ කර්මයන් කෙරෙහි;

**නවමං**.

---

1. පරිභුඤ්ජිතව්‍ය—හැම. 2. හැම දෙනාමු—හැම.

**ආරොචිතවත්ථුං තාව අවිනිච්ඡිතං තාව විනිච්ඡයකථා වත්තමානා** යි යොදනු. මෙහි **ආරොචිතවත්ථුං** යනාදි ස්‍යාද්‍යන්ත නො තබා කරණ කම්ම පිණිස කීහු. ස්‍යාද්‍යන්තිං **ඨපෙත්වා** යනාදි ස්‍යාද්‍යන්තීන් කරණ කම්ම පිණිස කීහු. **එතස්මිං අන්තරෙ**- ආරොචිත වස්තුව විනයධරයන් විසින් විනිශ්චය කෙරෙමින් සිටි මෙ දෙඅතුරෙහි;

**අධම්මකම්මසඤ්ඤිස්ස පන**- ධර්මකර්ම අධර්මකර්ම දෙක්හි අධර්මකර්මය යන සංඥා ඇත්තාහට ද; **ක්‍රියා** නම් යෑම ය. **අක්‍රියා** නම් සෑද නො දීම යි.

## දසමං.

**එකාදසමෙ මිත්තො** නම් දෘඪමිත්‍ර නො වූ මිත්‍ර යි. **සන්දිට්ඨො** නම් දුටුවිරූ මිත්‍ර යි. **සම්භත්තො** නම් දෘඪමිත්‍ර යි. **සන්ථුතො**-විශ්වස්ත[1] ද;

**විස්සජ්ජියං**-අන්‍යනට දිය හැක්කාවූ; **වෙභඞ්ගියං**-බෙදිය හැක්කාවූ; **අවසෙසා**-අවශෙෂ යි; **සඞ්ඝස්ස**-සඞ්ඝයා විසින්; **විස්සජ්ජෙතුං විභජිතුං වා නෙව වට්ටන්ති. ගණපුග්ගලානං විස්සජ්ජෙතුං වා විභජිතුං වා න වට්ටන්ති** යි ප්‍රත්‍යෙකයෙන් යොදනු. **විභත්තානිපි**-බෙදන ලද්දැහු ද; **ථාවරෙන ථාවරම්පි**-ථාවරයෙන් ථාවරය ද; **අකප්පියෙන වා**-අකප්පිය වූ හෝ; **මහග්ඝකප්පියෙන වා**-මහඝකප්පිය වූ හෝ; **ඉතරෙන**-ඉතරයෙන්= අථාවරයෙන්; **ඉතරං**-අථාවරය ද; මෙහි **අකප්පිය** නම් සවර්ණමය මඤ්චපීඨාදි යි. **මහග්ඝකප්පිය** නම් දළමය මඤ්චපීඨාදි යි **ලාමකානි**[2]-නපුරු සෙනසුන්; **කුම්භී**-සැළ ද; **අරඤ්ජරසණ්ඨානං**-බොහෝ දිය ගන්නා සැළසටහන්; **භාණකං**-පාති ද කටාර හෝ තාලි ද කිලි ය යි ද යෙත්. **පසතමත්තං**-පතක් පමණ; **කාලලොහ** නම් යකඩ යි. **කංසලොහ** නම් තලි ආදි කරණ[3] කස්ලෝ යි. **වට්ටලොහ** නම් වැට ආදි කැරූ විරුවා වත් කරණ ලෝ යි. "වට්ටලොහ නාම පීතවණ්ණං" යනු **විනයසන්න** යි. **සීහලදීපෙ පාදගණ්හනකො**-සිංහලද්වීපයෙහි පස්නැළියක් දිය ගන්නා අතලය; පාද නම් මගධරටැහි ලාසුයෙහි ලහසුමත්ගණීයි[4] යනු **කඞ්ඛාවිතරණීසන්න** යි. **තතො**-පස්නැළියක් දිය ගන්නා හෙයින් අඩපසතයකුදු වඩා දිය ගන්නා අතලය; **භිඞ්කාර**-අභිෂිකොතාදක වත් කරණ කෙඬි බඳු කෙඬි; **පටිග්ගහ**-අත් සෝධන විල්[5]; **උළුඞ්ක**-ලූ; **දබ්බි**-යටුවම්; **කටච්ඡු**-සැඳි; **පාති**-

1. විශ්වාස-හැම. 2. ලාමකානී-කඞ්ඛාවිතරණී. 3. තදකරණ-හැම.

4. { මගධරහි ලාසියෙහි ලහුසුමත් ගණී යි. / මගධරටහි ලාසියෙහි ලහුසුමෙජ ගණී යි. } 5. තඹවිල්-ඇතැම.

තලි; **කටක**-තැටි; **සරක**-කච්චෝරම් හෙවත් මලා; **සමුග්ග**-වෘත්තාකාර කරඬු; **අඞ්ගාරකපල්ල**-වක්ගිනිකබල්; **ධූමකටච්ඡු**-ගන්ධිකයන්ගේ දුමොලොසු වැනි දුමොලොසු[1] ආදීහු ද;

**අයපත්තකා**-යපාත්‍රය ද; **අයථාලකං**-යතල්ල ද; **තම්බලොහථාලකං**-තඹලොහමය වූ තල්ල ද; **කංසලොහ**-කස් ලොහො; **වට්ටලොහ**-වැට ආදියට ගන්නා වට්ටලොහය ද යන මෙයින් කරණලද; **භාජනවිකති**-භාජනවිකෘතිහු; **ගිහිවිකටානි වා**-ගෘහස්ථයන් සතු වූවාහු හෝ; **අඤ්ඤම්පි කප්පිය**-අනාමාස ලොහො හැර කැප වූ; **ලොහභණ්ඩ**-ලොහපරිෂ්කාර යෙහි; **භාජනීයං**-භාජනීයවස්තු කියම්හ යි සේයි. **අඤ්ඤම්පි** යනු යටැ කී කංසලොහ වට්ටලොහ තම්බලොහාදි ලොහ හා මෙ සියල්ල අකප්පිය ජාතරූප රජතාදියට අන්‍ය හෙයින් අඤ්ඤම්පි කප්පියලොහභණ්ඩ යනු මෙයින් ගත්හු. **අඤ්ජනී**-අඳුන්නල; **අඤ්ජනිසලාකා**-අඳුන්ලා; **නත්ථුදානං**-නැහොරුය; **කණ්ණමලහරණී**-කන්සැඳි; **සූචි**-හිඳිකටු ය; **සූචි**-පත්හිඳ ය යනු **හෙළු කඞ්ඛාවිතරණී** යි; **ඛුද්දකොපි**[2]-කුඩා ද වූ; **පිප්ඵලකො**-කතුරු ය; **ඛුද්දකං**-කුඩා වූ; **ආරකණ්ටකං**-හිඳිවිය ය; **මුද්දිකං**-යතුරුමුන්ද ය; **කුඤ්චිකං**-කොස්ස ය; **තාලකං**-යතුරු ය; **කත්තරයට්ඨිවෙධකො**[3]-සැර යටිපිලිය ය; **භෙණ්ඩිවාලකො**-පාරුවලල්ල ය; **යථා තථා**-යම් තම් පරිච්ඡෙදකින්; **ඝනකතලොහං**-ඝන කොට කරණලද ලොවට ය; **විප්පකතලොහභණ්ඩඤ්ච**-නො නිමාම් වූ ලොහ භාණ්ඩ ද යන; **සබ්බං**-මෙ සියල්ල; **භාජනීයං**.

**ධූමනෙත්ත**-දුම්නල; **ඵාලක**-සීවැල්; **දීපරුක්ඛ**-පහන් රුක හෙවත් වැට සේයි. **දීපකපල්ලිකා**-පහන්කබල්; අත්වැට ද එහි මැ ඇතුළත් වේ. **ඔලම්බකදීප**-එල්වනවැට[4] ද; මේ ගරුභණ්ඩ යනු හා සම්බන්ධ කරණු. **ඉත්ථිපුරිසතිරච්ඡානරූපකානි**-ස්ත්‍රී පුරුෂ තිරච්ඡාන රූපකයෝ ද; **අඤ්ඤානි වා භණ්ඩානි**-සෙසු ලොහභාණ්ඩයෝ; **භිත්තිච්ඡදනකවාටාදිසු**-භිත්තිච්ඡදන යෙහි ද දෙරකවුළුයෙහි ද; **උපනෙතබ්බානි**-එළවිය යුත්තෝ යි. **අන්තමසො ලොහබිලකං උපාදාය භිත්තිච්ඡදනකවාටාදිසු උපනෙතබ්බානි අඤ්ඤානි වා සබ්බානි ලොහභණ්ඩානි** යි සම්බන්ධ යි. **අන්තමසො**-අධමාත්‍රයෙන්; **ලොහබිලකං උපාදාය**-පුඩුඇණ පටන් සියල්ල ගරුභාණ්ඩ යි. **ගිහිවිකටානි**

1. දුඹොලොසු-ඇතැම්. 2. ඛුද්දකො-කඞ්ඛාවිතරණී.
3. කත්තරයට්ඨිවෙධකො-ඇතැම්. 4. { එවලු වැට ද. / එලවලු:වැට ද. }

**වා**-ගෘහස්ථයන් සන්තක වූවාහු හෝ; **වට්ටන්ති**-වටිත්; යටැ කියනලද ධූමනෙත්තාදි සියල්ල තමා සතු කොට ලද හොත් සාඞ්ඝික කොට හෝ ගෘහස්ථයන් සතු කොට හෝ වැලඳ ගත යුතු. සාඞ්ඝික වැ ලද්දෙය නිසා නො වේ. සාඞ්ඝික වී නම් ගිහිවිකටාති යනු අයුත්ත යි. **තිපුභණ්ඩෙපි එසෙව නයො**-තුඹයෙන් කරණලද දෙයෙහි ද ලොහභාණ්ඩයට කී නය මැ යි.

**ඛීරපාසාණමයානි**-ක්ෂීරපාෂාණයෙන් කරණලද; **තට්ටිකා**-තැටි; **ගරකාදීනි**-මලා ආදීහු ගරුභාණ්ඩයෝ මැ යි. ඛීරපාසාණ නම් මොලොක් පහණ යි. **ඝටකො**-පැන් ගන්නා කළය ද; **තෙලභාජනං වා**-තෙල් වත් කොට තබන්නාවූ භාජනය ද; **පාදගණ්හනකො** යි ගිහියනට සාරුප්ප හෙයින් කීහු. මෙ දෙක ඛීරපාසාණමය යි දත යුතු. **සුවණ්ණ**-රත්රන්; **රජත**-රිදී; **ආරකූට**[1]-අරළුලෝ; **ජාතිඵලිකභාජනානි**-දූමාණ මය භාජනයෝ අනාමාස හෙයින් ගිහිවිකට වූවාහුත් නො වටිත්. **සෙනාසනපරිභොගෙ පන**-සෙනාසනපරිභොගයෙහි වනාහි; **ආමාසම්පි**-කාංසලොහාදි ඇල්ලියහැකි දෑ ද; **අනාමාසම්පි**-රත්රන් ආදි වූ නො ඇල්ලියහැකි දෑ ද; **සබ්බං වට්ටති**-සියල්ල වටී;

**වාසිආදිසු**-වෑ පොරෝ ඈ පරිෂ්කාරයෙහි විනිශ්චය කියම්හ යි සේයි. **දන්තකට්ඨච්ඡෙදන**-දැහැටිදඬු කැපීම් මාත්‍රයෙන් ද; **උච්ඡුතච්ඡනමත්තෙනා**-උක්දඬු සස්නා මාත්‍රයෙන් ද; **අඤ්ඤං මහාකම්මං**-ගස් කැපීම් ආදි වූ අනෙක් මහාකර්මාන්තයක්; **තාය වාසියා කාතුං න සක්කා** යි යොදනු. **යෙන යෙනචි ආකාරෙන**-යම් කිසි ආකාරයෙකින්; **කතා**-කරණලද; **සෙසා වාසි ගරුභණ්ඩා** යි යොදනු. **ඵරසු පන**-පොරොව වනාහි; **අන්තමසො**-යටත් පිරිසෙයින්; **වෙජ්ජානං**-වෙදුන්ගේ; **සිරාවෙධනකොපි**-සිරා වෙධය ද= සිර විදිනා කටුව ද ගරුභණ්ඩ යි. **කුඨාරි පන**-කෙටේරිය ද; **කථා ගරුභණ්ඩමෙව** යි යොදනු. **යා පන කුඨාරී ආවුධසඞ්ඛෙපෙන කතා අයං අනාමාසා** යි යොදනු. **කුද්දාලො**-හුදල්ල ද; **දණ්ඩබන්ධනිඛාදකං**-මිට ඇත්තාවූ නියන් ද; **අගරුභණ්ඩං නාම නත්ථි**-අගරුභණ්ඩ නම් දෙයෙක් නැති. **සමමුඛපජ්ජිදණ්ඩබණ්ණනකං පන**-මුසුන්දඬු විදිනා කටුව වනාහි; **අදණ්ඩකං**-දඬු නැත්තේ; **ඵලමත්තමෙව**-ඵලමාත්‍ර වූයේ ම; දඬු නැති වැ කටුව මැ ය යි සේයි. **යං සමමුඛපජ්ජිදණ්ඩබණ්ණනකං**-මුසුන් දඬු විදිනා යම් කටුවෙක්; **සිපාටිකාය පක්ඛිපිතබ්බා සකකා පරි**

---

1. ආරකූට-ඇතම්.

**හරිතුං තං භාජනීයං** යි යොදනු. **සිපාටිකා** නම් කරවියල්ල යි. **සිඛරම්පි**-තොරපතය ද; **නිඛාදනෙනෙව සඞ්ගහිතං**-දණ්ඩබද්ධනිඛාදනයට මැ අනුලෝම්. **යෙහි මනුස්සෙහි**-යම් මිනිස් කෙණකුන් විසින්; **විහාරෙ**-විහාරයෙහි ද; **වාසිආදීනි දින්නානි හොන්ති**-වෑ පොරෝ ආදි වූ පරිෂ්කාරයෝ දෙන ලද්දහු වෙද්ද; **ඝරෙ දඪ්ඪෙ වා**-ගෙය දා ගියකල්හි හෝ; **විලුත්තෙ වා**-හස්තිආදීන් විසින් බිඳ පූ කල්හි හෝ; **භන්තෙ**-වහන්ස; **නො**-අපට; **උපක්ඛරෙ**-වාසි ආදි පරිෂ්කාරයන්; **දෙථ**-දුන මැනව; **පුන ආහරිස්සාමාති**[1]-නැවත ගෙණෙම්හ යි; **තෙ චෙ වදන්ති**-ඉදින් දුන් ඒ මනුෂ්‍යයෝ කියද්ද; **දාතබ්බානි**-වාසි ආදි ඒ පරිෂ්කාරයෝ දිය යුත්තෝ ය යි මෙසේ යොදා අර්ථ බිණිය යුතු.

**කම්මාර**-කඹුරහ; **කංසකාර**-ලොහොකරුවහ; **චුන්දකාර**-ලාසුවඩුවහ; **නලකාර**-කුළුපත්තහ; **මණිකාරයෝ** නම් මැණික් විදිනා මැණික් සැට්ටරු යි. **පත්තබන්ධකයෝ** නම් යපත් විදිනෝ යි. යපත් විදිනෝ නම් බුත් පාත්‍ර බඳනා හැව්[2] කෙණෙක් ලු. "පත්තබන්ධකො නාම පත්තස්ස ගණ්ඨි ආදි කාරකො, පටිමානං සුවණ්ණාදිපත්තකාරකොතිපි වදන්ති" යනු වජ්‍රබුද්ධි යි. **අධිකරණී**-කිණිරි; **මුට්ඨි**-මිටි; **සණ්ඩාස**-හඬුව; **තුලාදීනි**-තරාදිය ආදි වූ; **සබ්බානි ලොහමයඋපකරණානි**-සියලු ලොහමය උපකරණයෝ; **සඞ්ඝස්ස**-සඞ්ඝයා කෙරෙහි; **දින්නකාලතො පට්ඨාය**-දුන් තැන පටන් කොට ගරුභාණ්ඩයෝ යි. **තිපුකොට්ටක**-තුඹු සිඳුනහ; **සුවණ්ණකාර**-තරුලහ; **චම්මකාර**-සොම්මරහ; **අයම්පන විසෙසො**-මේ අප මතු කියන්නේ වෙනසෙකි. **තිපුච්ඡෙදනකසත්ථං**-තුඹු කපන්නාවූ ශස්ත්‍රය ද; **සුවණ්ණච්ඡෙදනකසත්ථං**-රන් කපන්නාවූ ශස්ත්‍රය ද; කතුරු යි. **කතපරිකම්මචම්ම**-කරණලද චිත්‍රකම් ඇති චර්මය; **ජිඤ නිකා බුද්ධිකා සජ්ජිති**-කපන්නාවූ කුඩාකැත්ත ද නියන ද යන; **ඉමානි භාජනියානි**-මොහු බෙදිය යුත්තෝ යි. **නහාපිතතුන්නකාරඋපකරණෙසුපි**-කරනැවැමිසන්නාලින්ගේ උපකරණයෙහි ද; **මහාකත්තරිං මහාසණ්ඩාසං මහාපිප්ඵලකං ඨපෙත්වා** යි යොදනු. **මහාපිප්ඵලකං**-මහකඩ කතුර[3]; **සබ්බං**-මෙ තුණින් පිටත් සියල්ල; **වට්ටති**-බෙදන්නට වටී. **ඉතරානි**-ඒ භාජනියට ඉතර වූ මහාකත්තරි ආදි වූ එ තුණ ගරුභාණ්ඩයෝ යි.

---

1. පුන ආහරිස්සාම දෙථාති-කඞ්ඛාවිතරණී. 2. හැව්-ඇතැම්.
3. මහකණ්ණක තුඩකතුර-මහකඩක කතුර-ඇතැම්.

**වෙතනවලලිආදිකා**-වේවැල් ආදි වූ; **අඩබාහුපපමාණා යා කාචි වලලි** යි යොදනු. අඩබාහු නම් උරෙහි සිට වැලමිට දක්වා මෙ දෙ අතුරෙහි යි; අඩබාහුති කපප රතො පණය යාව අංසකූටං. නොහොත් විදත්ථිචතුරඞ්ගුල හෝ යි. **තතථ ජාතකා වා**-ඒ සාඞ්ඝික විහාරයෙහි හටගත් තාවූ; **රකඛිතගොපිතා**-රක්ඛිත ගොපිතා යන බස අර්‍ථ: "ආරකඛසංවිධානෙන රකඛිතතතා රකඛිතා ච මඤ්ජූසාදිසු පකඛිතතං විය ගොපිතතතා ගොපිතා ච" යනු චාර්‍යය[1] භගවතු පිණිස කීහු. සාඞ්ඝිකභූමියෙහි ජාත වූව ද රක්ඛිත ගොපිත් නො වේ නම් ගරුභාණ්ඩ නො වෙසි යන අභිප්‍රාය යි. **සා වලලි**-ඒ වැලිතොමෝ; **උපනෙතුං**-එළවන්නට; **වටටනි**-වටී. **සුතත**-හූ; **මකචි**-නියඳ; **වාක**-වැහැරි; **නාලිකෙරහිර**-පොල් කොසුමය වූ හෝ; **චමමමයා රජ්ජුකා වා**-සම්මය වූ රැණ හෝ; **යොතතානි වා**-කඹ හෝ; **සඞඝසස සනතකං ගරුභණ්ඩං** යි යොදනු. **වාකෙ ච නාලිකෙරහිරෙ ච**-නියඳ ආදි වැහැරි[2] ද පොල්කොසු ද; **වටෙටතවා**-වටා=කරකවා; **කතා**-කරණලද ද; **එකවටටා වා**-එක්වැල වූ රජ්ජුතොමෝ; **සඞඝසස සනතකා**-සඞ්ඝායත්ත වී; **ගරුභණ්ඩා**-ගරුභාණ්ඩ යි. **සුතතං පන** හූ ද; හූ ලනු කොට නො දී තිකම් කරකැවූව ද භාජනීය හෙයින් සූත්‍රයට ආචටෙටතවා යනු නො කීහු. **අනා වටෙටතවා දිනනමකචි**-නො අඹරා දුන්නාවූ නියඳ; **නාලි කෙරහිර ච**-නාලිකෙරහිරයෝ ද භාජනීයයෝ යි.

**අටඨඞගුලසූචිදණ්ඩකමතෙනා**-උසින් අටඟුලක් පමණ ඇති වටින් ගෙලදිවැ පත්හිත්දඬක් පමණ ඇත්තාවූ; **යො කොචි වෙළු** යි යොදනු. **තතථ ජාතකො**-ඒ සාඞ්ඝිකභූමියෙහි උපන්නා වූ; **සොපි වෙළු**; **පාදගණ්හනතක**-මගඩනැලියෙන් දිය පස්නැලියක් ගන්නාවූ; **තෙලනාලි පන**-හුණුදඬෙ තෙල් නල ද; මෙහි මගධනැලි නම් අටපත් ගන්නා නැලිය යි. **උපා හනදණ්ඩකො**-වාන්කොක්ක ද; **ඡතතදණ්ඩො**-කුඩපුඬුව ද; **ඡතතසලාකා**-කුඩයෙහි ගොනැස් ද යන මේ සියල්ල; **එතථ**-මේ වෙළුමයෙහි ලා බෙදිය යුතු භාණ්ඩ යි.

**මුඤ්ජපබබජ**-මුදුතණ ද; **බබබජකථ**-බබුස්තණ ද; **මුට්ඨිපප මාණම්පි**-මිටක් පමණ ඇත්තා ද වූ; මුෂ්ටි නම් තණ කැරැල්ල යි; **අවසෙසඡදනතිණං**-මෙ දෙකින් අවශෙෂ වූ ගෙ සෙවිලි තණ ද; **තිණසඞඛමෙතථ**-තෘණසඞ්ඛ්‍යා

---

1. ආචාර්‍යය-නැම. 2. නියඳ ආදි වැල් වැහිලියෙන් ද-නැම.

වට ගියාවූ; **තාලපණ්ණාදිසු**-තල්පත් ආදීන් අතුරෙහි; **යං කිඤ්චි**-යම් කිසි; **එකපණ්ණම්පි**-එක පතකුදු; **බහි ආරාමම්**-ආරාමයෙන් පිටත; **සඞ්ඝිකෙ**-සාඞ්ඝික වූ; **තිණවත්ථුස්මිං**-තෘණභූමියෙහි=තණවත්තෙහි; **තම්පි**-ඒ තෘණ ද; **අට්ඨඞ්ගුලප්පමාණෙ**-මුවවිට අටඟුලක් පමණ ඇත්තාවූ; **ගිඤ්ජකාවසථෙ**-පුස්පත්ගෙඩිය ද; මෙයින් පුස්පත් භාජනීය බව කීහු.

**මත්තිකා**-මත්තිකා තොමෝ; **පකතිමත්තිකා වා**-පියෙවි මැටි වෙව යි; **පඤ්චවණ්ණා වා**-මකුල් ගුරු ආදී වූ පඤ්චවර්ණ මැටි වෙව යි; **සුධා වා**-සුණු වෙව යි; **සජ්ජුරස**-සදෙලමල ද; **කංකුට්ඨ**-කොකැටිකිරි ද; **සිලෙසාදිසු වා**-ගිවුළුපැනි ආදී වූ ලහටු ද; **දුල්ලභභණ්ඩෙ**-අරමට; **ආනෙත්වා**-උපාසකවරුන් විසින් ගෙණ ඇරැ; **දින්නා වා**-දෙන ලද්දී හෝ; **තාලපක්කප්පමාණං**-තල්පකක් පමණ වූයේ; **සිඞ්ගු**-සුහි; **හිඞ්ගුල**-හිඟුලි; **හරිතාල**-සිරියෙලි; **මනොසිලා**-රත්සිරියෙල්; **අඤ්ජනානි**-අඤ්ජනයෝ ද; අඳුන්දූලි යි හිඟුල් ආදිය මත්තිකාවට අනුලොම් යූ තැති.

**වෙළුම්හි මුත්තප්පකාරෙ යො කොචි දාරුභණ්ඩො** යි යොදනු. **අපි ච**-තව ද අර්ථයෙක් ඇති. **දාරුවෙළුචම්මපාසාණාදි සබ්බාපි විකති දාරුභණ්ඩෙන සඞ්ගහිතා** යි යොදනු. **තත්ථ**-ඒ මිශ්‍රයෙහි අර්ථ කියම්හ යි සේයි **මඤ්චපීඨෙසු**[1]-මඤ්චපීඨයන් හා; **අසඞ්ගහිතානි**-අසඞ්ගෘහීත වූ; **ආසන්දිකාදීනි**-ආසනාදිහු ද; **ආදි** ශබ්දයෙන් සත්තඞ්ග, භද්දපීඨ, පීඨිකා, එළකපාදපීඨ, ආමලවට්ටිකාදි ගත්හු. **අන්තමසො**-අධමාන්තයෙන්; **පලාලෙන**-පිදුරෙන් හෝ; **පණ්ණෙහි වා**-තාලපණ්ණාදි පතින් හෝ; **කතපීඨං උපාදාය**-කරණලද පුටුවෙහි පටන් කොට; **සබ්බානි ආසනානි**-සියලු ආසනයෝ ද; **වඞ්කචලකං**-වක් පොහොරුව ද; **දීඝචලකං**-දික්පොහොරුව ද; **ධොවනචලකං**-සිවුරු සෝධන පොහොරුව ද; **ඝට්ටනචලකං**-සිවුරු ඝට්ටන පොහොරුව ද; **ඝට්ටනමුග්ගරො**-සිවුරු ඝට්ටන මුගුර ද; **දන්තකට්ඨච්ඡෙදනගණ්ඨිකා**-දැහැටිදඬු කපන කොලොඹුව ද; **දණ්ඩමුග්ගරො**-සතරරියනක් පමණ ඇති මුගුර ද; නොහොත් අතකොළුව ද; "දණ්ඩමුග්ගරො නාම යෙන රජිතච්චරං පොථෙන්ති" යනු වජ්‍රබුද්ධිටීකා යි. **නාවා**-නැව ද; **අම්බණං**[2]-

1. මඤ්චපීඨෙ-කඞ්ඛාවිතරණී.

2. { අම්බණන්ති ඵලකෙහි පොක්ඛරණී විය කතං
පානීයභාජනං-විනයත්ථමඤ්ජූසා.

පරිෂ්කාර තබන දෙණ ද; **රජනදොණි**-රදන්දෙණ ද; රදන් දෙණ නම් පිසූ පඬු වත් කරණ දෙණ යි. **උදකපටිග්ගහො**-දිය පැස ද; **දාරුමයො වා**-දඬුමය වූ හෝ; **දන්තමයො වා**-හස්තිදන්තාදි දළමය වූ හෝ; **වෙළුමයො වා**-හුණුපොත්තෙන් කරණලද හෝ; **සපාදකොපි**-පා ඇත්තා ද වූ; **අපාදකොපි**-පා නැත්තා ද වූ; **සමුග්ගො**-බෙහෙත් සත්පොඬි දී චතුරශ්‍ර[1] කොට කරණ ලද සුමුඟ ද; **මඤ්ජූසා**-දඬෙන් දළින් හෝ හුණ දඬෙන් හෝ කෘතවෘත්තාකාරමඤ්ජූසා ද දෙණපෙට්ටි ද කියත්. **පාදගණ්හනකො**-දිය පස්නැළියක් ගන්නෙන්; **අතිරෙකප්පමාණො**-අධිකප්‍රමාණ වූ; **කරණ්ඩො**-කාෂ්ඨමය වූ කරඬුව ද; **උදකදොණි**-දියදෙණ; **උදකකටාහං**-දියඹකිලිච්ලි; **උළුඞ්කො**-ලූ; **කටච්ඡු**-සැන්ද ද; **පානීයසරාවං**-පැන් වසන මලාව ද; **පානීයසඞ්ඛො**-පැන්සක ද; **සඞ්ඛථාලකම්පන**-හෙළිවත්නම් ආදි වූ සක්තල්ල වනාහි භාජනීය යි.

**දාරුමයො**-දඬෙන් කරණලද; **උදකතුම්බො**-දියලබුව ද; දිය තිබෙන පිණිස කළාවූ මහසැළ ද; **පාදකඨලිකං**-තො දෙව් පා තබන පාදකඨලිකා ද; පාදපීඨ ද එහි මැ සඞ්ගෘහීත යි. **මණ්ඩලං**-පාත්‍ර තබන පාත්‍රමණ්ඩලය; **දාරුමයං වා හොතු**-දඬෙන් කරණලද්දේ වේවා යි; **චොලපණ්ණාදිමයං වා**-කඩින් පණීණ යෙන් වේවා යි කරණලද ද; **සබ්බං**-සියල්ල; **තථා ගරුභණ්ඩං** යි යොදනු. **ආධාරකො**-පාත්‍රාධාරය ද; **පිධානකං**-පාත්‍රපත ද; **තාලවණ්ටං**-වෘත්තාකාර වූ තල්වැට ද; **බීජනී**-චතුරශ්‍ර වූ බීජනිය ද; **චඞ්ගොටකං**-සුමුඟ ද; තොකොත් පුළුළ් ද; කරණ්ඩ විශෙෂයෙකැ යෙත් මැ යි. **සට්ඨිසම්මුඤ්ජනී**-හිරටාමුසුන් ද; **මුට්ඨිසම්මුඤ්ජනී**-හිදිකොළ මුසුන් ද; **සට්ඨිසම්මුඤ්ජනී** නම් දඬු කළ කොළමුසුන්හිරටාමුසුනි. **මුට්ඨිසම්මුඤ්ජනී** නම් දඬු නැති මිටි කොළ යි. **එකෙසුපි**-පාත්‍රාධාරාදි වූ මෙහි[2] ද; **දාරුවෙළුපණ්ණ චම්මාදිසු යෙන කෙනචි කතං ඛුද්දකං වා මහන්තං වා යං කිඤ්චි ගරුභණ්ඩං** යි යොදනු. **එමග**-වැඹි; **තුලා**-තලාද; **සොපානඵලකාදිසු**-හිනිපෙති ආදීන් අතුරෙහි ලා; **යං කිඤ්චි**-යම් කිසිවෙක්; **දාරුමයං වා**-දාරුමය වූ හෝ; **පාසාණමයං වා**-පාෂාණමය වූ හෝ; **ගෙහසම්භාරූපගං**-ගෙ තවාමට යුක්ත වූ; **යො කොචි**-යම් කිසිවෙක්; **කටසාරකො**-කළාල් පැදුරු ආදි වූ කටසාරකය ද; **යං කිඤ්චි භුම්මත්ථරණං**-

1. { බෙෂත් සත්පො බෙශෂර කොට, / බෙහෙත් සත්පොඬි චෙරශ්‍ර කොට, / බෙහෙත් සත්පොඬි දී චෙරශ්‍ර කොට.
2. මොහු-හැම.

චොලපණ්ණාදිමය වූ යම් කිසි බුමතුරණයෙක්; **යං කිඤ්චි අකප්පියචම්මං**-සිහචම්මාදි වූ යම් කිසි අකප්පියචම්ම ද යන සියල්ල ගරුභාණ්ඩ යි. **භූමත්ථරණං කාතුං වට්ටති**-අකප්පිය සම් බුමුතුරුණු කරන්නට වටී. **සබ්බං මඤ්චප්පමාණං චම්මං**-මඤ්චප්‍රමාණ වූ සියලු කැප සම්;

**උදුක්ඛලං**-වන; **මුසලං**-මොහොල; **සුප්පං**-කුල්ල; **නිසදං**-දඟල; **නිසදපොතකො**-දපොය; **පාසාණදොණි**-ගල්දෙණ; **පාසාණකටාහං**-ගලින් කපා කරණලද තාලි යි; **සබ්බං කසිභණ්ඩං**-නගුල් වියදඬු ආදි වූ සියලු කෘෂිභාණ්ඩ; **චක්කයුත්තං**-සක් යෙදූ; **සබ්බං යානං**-සියලු යාන ද; **මඤ්චපීඨානං පාදා ච**-මඤ්චපීඨයන්ගේ පාදයෝ ද; **අටනියො ච**-හැඳ වල් ද; **වාසිඵරසුආදීනං දණ්ඩානි චෙති**-වෑ පොරෝ ආදීන්ගේ දඬු ද යන; **එතෙසු**-මොවුන් කෙරෙහි ලා; **යං කිඤ්චි අනිඝිතං**-සැසැ නො නිමවන ලද යම් කිසිවෙක් ඇද්ද; **තං**-ඒ; **භාජනීයං** සිං **තුච්ඡිතමට්ටං පන**-සැසැ මට කරණලද්දේ වනාහි; **ගරුභණ්ඩං හොති**-ගරුභාණ්ඩ වේ. **අනුඤ්ඤාතවාසියා දණ්ඩො**-යම් වාසියක් තොමෝ කරවියල්ලෙහි ලා පරිහරණය කරන්නට පිළිවන් ද හෝ තොමෝ අනුඤ්ඤාතවාසි නම් වේ. එසේ වූ වාසියගේ දඬ ද; **ඡත්තං**-පණ්ණතාලාදි වූ ඡත්‍ර ද; **මුට්ඨිපණ්ණං**-මිටිතලපත ද; **කත්තරයට්ඨි**-සැරයටිය ද; **උපාහනදණ්ඩකො**-වෑන්කොක්ක ද; **අරණිසහිතං**-මෝල සහිත වූ ගිනිදඬ ද; **ධම්මකරණො**-ඔබරුව ද; **පාදගණ්ඨනකතො**-දිය පස්නැලියක් ගන්නෙන්; **අනතිරිත්තං**-මහත් නො වන්නාවූ; **ආමලකතුම්බං**-ඇඹුලුකල්කයෙන් කරණලද පද්ද ද; **ආමලකඝටො**-එසේ ම ඇඹුලුයෙන් කරණලද කළය ද; **ලාබුකතුම්බං**-ලබුපකින් කරණලද පද්ද ද; **ලාබුඝටො**-ලබුපැනය ද; **විසාණකතුම්බං**-ගවරඟ ආදීන් කරණලද පද්ද ද; **තතො පරං**-එයින් අන්‍ය යටැ අප කියනලද දෙයින් සෙස්ස; **යථාගතමෙව**-ගෙණ ආ පරිද්දෙන් මැ; **සිඞ්ගුකරණ්ඩකො**-සුඟු කරඬුව; **අඤ්ජනකරණ්ඩකො**-අඳුන්කරඬුව; **ගණ්ඨිකා**-සඟළසිවුරේ ඔබන ගැට; **විධො**-පටි මූවවිට සිටිනා වීඨය ද; **අඤ්ජනී**-අඳුන්නල ද; **අඤ්ජනිසලාකා**-අඳුන් ලා ද; **උදකපුඤ්ජනී**-දිය පිස්නා ලැල්ල ද;

**මනුස්සානං**-මනුෂ්‍යයන්ට; **ඝට**-කළය ද; **පිඨරාදි**-මහසැළ ආදිය; පිඨර නම් පුසන්දඬු ලන බඳන යනාදි වූ; **කුලාල භාජනං**-කුඹල්වලඳ; **පත්තකටාහං**-පාත්‍ර පියන කබල් ද;

**අඞ්ගාරකටාහං**-වක්ගිතිකබල් ද; **ධූමදානං**-දුම් දෙන්නාවූ නල ද; **දීපරුක්ඛකො**-පාන්කඳ; **දීපකපල්ලිකා**-පහන් කබල් ද; **චමනිසීකා**-ගඩුළු ද; **ඡදනිසීකා**-පතුළ ද; **ථූපිකාති**-කොත ද යන මෙ; **සබ්බං**-සියල්ල; **වුත්තනයෙසු** **එතෙසු පන ගරුභණ්ඩෙසු වෙළුආදි යං කිඤ්චි** යි යොදනු. **ඵාතිකම්මං කත්වා**-වෑඩිකම් කොට; **ගහෙතබ්බං**-ගත යුත්තේ යි. **කඤ්චනකො**-කොතලය; **ඉදමෙත්ථ භාජනීයං. එත්ථ**-මෙ මත්තිකාභාණ්ඩයෙහි ලා; **ඉදං භාජනීයං**-මෙ බෙදිය යුතු දෑ යි.

**යථා ච මත්තිකාභණ්ඩෙ**-මත්තිකා භණ්ඩයෙහි ලා කුඩිකා තොමෝ; **යථා භාජනීයං**-යම් සේ භාජනීය ද; **එවං**-එපරිද්දෙන්; **ලොහභණ්ඩෙ**-ලොහභාණ්ඩයෙහි; **කුණ්ඩිකා**-කුණ්ඩිකා තොමෝ; **භාජනීයකොට්ඨාසමෙව භජති**-භාජනීය කොට්ඨාසය මැ සෙවුනි; **ඉති**-මෙසේ; **යං**-යමෙක්; **භාජනීයං**-බෙදියයුතු ද; **විස්සජ්ජනීයම්පි**-විස්සජ්ජනීය ද යන; **තං එතං විස්සජ්ජනීය වෙභඞ්ගියසඞ්ඛාතං**-හේ මේ විස්සජ්ජනීය වෙභඞ්ගිය යි කියනලද; **අඤ්ඤං පරික්ඛාරං දත්වා**-අනෙක් පරිෂ්කාරයක් දී; **ඉතරං පන**-ඉතර වු ගරුභාණ්ඩය වනාහි; **සබ්බත්ථ**-සියලු පරිෂ්කාරයෙහි; අනුපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී, අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී, වෙමතිකො බියනි යි **තිකදුක්කට** වේ. **පකතියා පන**-ස්වභාවයෙන්; **ඡන්දාදි වසෙන**-ඡන්දාදි වූ සතරඅගති වසයෙන්; **කරොන්තානං දිස්වා**-කරන්නනු දැක; **කො අත්ථො තස්ස දිනෙන**[1]-ඕහට දීමෙහි ලා කවර අර්ථයෙක් දැ යි ඛීයනය කරන්නාහට ද; **ලද්ධාපි විනිපාතෙස්සන්ති**-ලද්දෙය ද නසයි ඛීයනය කරන්නාහට ද; **න සම්මා උපනෙස්සන්ති**-මනා කොට අනුභව නො කෙරෙ යි; **ඛීයන්තස්ස**-ඛීයනය කරන්නාහට ද;

**එකාදසමං.**

---

**සබ්බං**-සියලු විනිශ්චය; **තිංසකකණ්ඩෙ**-තිසැගි කාණ්ඩයෙහි; **පරිණාමනසික්ඛාපදෙ**-"යො පන භික්ඛු ජානං සඞ්ඝිකං ලාභං අත්තනො පරිණාමෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං" යන මේ ශික්ෂාපදයෙහි; **වුත්තනයෙන**[2]-කීපරිද්දෙන්; **වෙදිතබ්බං**-

---

1. දින්නෙන-කඞ්ඛාවිතරණී. 2. වුත්තනයෙනෙව-කඞ්ඛාවිතරණී.

දත යුත්තේ යි. **අයමෙව හි**-මේ අප මතු කියන්නේ වනාහි; **විසෙසො**-වෙනසි. **තත්ථ**-ඒ පරිණාමන ශික්ෂාපදයෙහි; **ඉධ**-මේ ශික්ෂාපදයෙහි තමහට නො වන හෙයින් සුද්ධිකපාචිත්තිය වේ.

**ද්වාදසමං.**

---

## සහධම්මිකවග්ගො.

——)○(——

**ඛත්තියජාතියස්ස**-මාතෘ පිතෘ දෙපක්ෂයෙන් ක්ෂත්‍රියජාති හව; **ඛත්තියාභිසෙකෙන**-ක්ෂත්‍රියාභිෂේකයෙන්; **මුද්ධනි අභිසිත්තස්ස**-මුදුනෙහි ලා වත් කරණලද අභිෂික්ත තොයය ඇති; **න නික්ඛන්තො රාජා ඉතො ති**-රජතෙමේ මෙ සයනිඝර යෙන් නො නික්මුනේ නු යි; **අනික්ඛන්තරාජකං**-සයනිඝරය තෙමෙ අනික්ඛන්තරාජක නම් වේ. **අනික්ඛන්තරාජකෙ**-අනික්ඛන්තරාජක වූ; **තස්මිං සයනිඝරෙ ති අත්ථො**-ඒ සයනිඝරයෙහි යෑ යන අර්ථ යි. **මහෙසි**-මෙහෙසි තොමෝ; **රතනං** වුච්චති-රතන යෑ යි කියනුලැබේ. **නීහටන්ති**-නීහත නම්; **නික්ඛන්තං**-නික්මීම යි. **අනීහතං රතනං**-නො නික්මුනාවූ ස්ත්‍රීරත්නය; **ඉතො**-මේ සයනිඝරයෙන් නු යි; සයනිඝරය තෙමෙ අනීහතරතනක නම් වේ. **අනීහතරතනකෙ**-අනීහතරතනක වූ; **තස්මිං සයනිඝරෙ ති අත්ථො**-ඒ සයනිඝරයෙහි ය යන අර්ථ යි. **උම්මාරං**-එළිපත;

**රඤ්ඤො**-රජහුගේ; **අන්තෙපුරප්පවෙසනවත්ථුස්මිං**-අන්තඃපුරයට වදනා වස්තුයෙහි පණවන ලදී. **තිකපාචිත්තියං**-අප්පටිසංවිදිතෙ අප්පටිසංවිදිතසඤ්ඤී, පටිසංවිදිතසඤ්ඤී, වෙමතිකො යි තිකපාචිත්තිය යි. **පටිසංවිදිතසඤ්ඤිස්ස**-පටිසංවිදිතයෙහි පටිසංවිදිත යෑ යන සංඥා ඇත්තාහට ද; **න ඛත්තියාභිසෙකෙන අභිසිත්තස්ස වා**-ක්ෂත්‍රියාභිෂේකයෙන් අභිෂික්ත නො වූවාහට ද; **උභොසු නික්ඛන්තෙසු වා**-දෙදෙන නික්මුනු කල්හි ද; **උභින්නං වා**-දෙදෙනා අතුරෙහි ලා; **අඤ්ඤතරස්මිං**-එක්තරා එක්කෙණකුන්; **නික්ඛන්තෙ වා**-නික්මුනුකල්හි ද; **සයනිඝරං පවිසන්තස්ස**-සයනිඝරයට වදනාහට ද; **ඛත්තියතා**-ක්ෂත්‍රියාභිෂේකයෙන් මුදුනෙහි අභිෂිකෙතාදකය වත් කළබව; **අප්පටිසංවිදිතතා** තමා එන බව නො පිළිවිසී බව ය. **ක්‍රියා** නම් යෑම ය. **අක්‍රියා** නම් නො පිළිවිසිබව යි.

**පඨමං.**

---

**උපභොග** නම් ශරීරස්පර්ශ ලදින් අනුභවනීයදෙය යැ. **පරිභොග** නම් ශරීරස්පර්ශ නො ලදින් අනුභවනීය දෑ යි. **පරික්ඛිත්තස්ස**-පරික්‍ෂිප්ත විහාරයාගේ; **අන්තො පරික්ඛෙපෙ**-ඇතුළුපරික්‍ෂෙපයෙහි ද; **අපරික්ඛිත්තස්ස**-අපරික්‍ෂිප්තවිහාරයාගේ; **ද්වින්නං ලෙඩ්ඩුපාතානං අන්තො**-ලෙඩ්ඩුපාතයන් දෙදෙනාගේ ඇතුළත තුබූවාවූ; **රතනං වා රතනසම්මතං වා උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා පාචිත්තියං** යනු සම්බන්ධ යි. **පරික්ඛිත්තස්ස**-ගොරූපයන්ගේ ප්‍රවෙශනිවාරණය පිණිසැ කරන්නාවූ; **අන්තොපරික්ඛෙපෙන**-ඇතුළත්හි පරික්‍ෂෙපයෙන් ඇතුළ අජ්ඣාවසථ නම් වේ. **අපරික්ඛිත්තස්ස**-ගොරූපයන්ගේ ප්‍රවෙශනිවාරණය පිණිසැ කරණ ලද වතිආදින් නැත්තාවූ ඝරයාගේ; **මුසලපාතබ්භන්තරං**-ගෙහි සිට දැමූ මුසලය යම් තැනෙකැ ගේ ද මෙ අතුර අජ්ඣාවසථ නම් වේ. මෙයින් පිටතැ තුබූවාවූ රතනය හෝ රතනසම්මතය හෝ ගන්නාහට ද පචිති වෙ යි සේයි. **ජාතරූප** නම් රත්රන්. **රජත** නම් රිදී යි. ජාතරූප රජත දෙක තමා පිණිසැ ගන්නාහට නිසැගි පචිති වෙයි. එ මැ ජාතරූප රජත දෙක සඞ්ඝ ගණ පුග්ගල චෙතිය නවකම්ම යන මොවුන් පිණිසැ ගන්නාහට දුක්කට යි. **අවසෙසෙ මුත්තාදිරතනෙ**[1]-ජාතරූප රජත දෙක තබා අවශෙෂ මුක්තාදි රතනයන්; **සබ්බෙසම්පි අත්ථාය**-තමා පිණිසැ ද සඞ්ඝ ගණ පුද්ගල චෛත්‍ය නවකර්මාන්තය යන මොවුන් හැමදෙන පිණිසැ ගන්නාහට; **දුක්කටමෙව**-දුක්කට වේ මැ යි. **කප්පියවත්ථුං වා**-කප්පාසසූත්‍රාදි වූ කැප වස්තුවක් වෙව යි; **අකප්පියවත්ථුං වා**-ජාතරූපරජතාදි අකප්පිය වස්තු වෙව යි; **තාදිසං**-මාතෘසන්තක වූ එබඳු කැප වස්තුව; **සඤ්ඤාණං කත්වා**-රූපිය ගණනහෙයින් හෝ නීලාදි වස්ත්‍ර වශයෙන් හෝ සලකුණු කොට; **නික්ඛිපිතබ්බං**-තබා තිබිය යුතු යි. **සො පුච්ඡිතබ්බො** යි යොදනු. **සචෙ සඤ්ඤාණෙන සම්පාදෙති**-පළමු බලා තුබූ සලකුණු හා සම කොට කියේ වී නම්; **දාතබ්බං**-දිය යුත්තේ යි. **නො චෙ**-ඉදින් සලකුණු හා සම කොට සම්පාදනය නො කෙළේ වී නම්; **විචිනාහි වත්තබ්බො**-සොය යි කිය යුත්තේ යි. **තෙසු අසති**-පතිරූපක වූ භික්‍ෂුකෙණකුන් නැතිකල්හි; **සචෙ පන දීඝස්ස අද්ධුනො අච්චයෙන**-ඉදින් බොහෝකලක් අයාමෙන්; **සමාදපෙත්වා**-අරවයි;

"උද්දිස්ස අරියා තිට්ඨන්ති,
එසා අරියාන යාචනා."

---

1. අවසෙසෙසු මුත්තාදිරතනෙසු-කඞ්ඛාවිතරණී.

**අනුසන්ධිතත්ථානෙ ගහෙත්වා නික්ඛිපනස්ස අනාපත්ති** යනු හා සම්බන්ධ යි. **ආමාසං**-ආමාස වූ; **රතනසම්මතං**-රතනසම්මත වූ; **යං හොති**-යමෙක් වේ ද; **තං**-ආමාස වූ රතනසම්මතය; **යං හොති ආමාසං රතනසම්මතං තං විස්සාසං වා තාවකාලිකං වා**-පෙ-**ගණ්හන්තො** යන මේ හැම තැන් මැ අනුසන්ධිතාර්ථයෙන් පිවතැ යි ගත යුතු යි.

දුතියං.

**සන්තං භික්ඛුං අනාපුච්ඡා** යන; **ඉදං**-මේ වචනය; **චාරිත්තෙ වුත්තනයෙනෙව**-චාරිත්‍ර ශික්ෂාපදයෙහි කියනලද නය ඇත්තේ මැ යැ. යටැ කීවා හා සම යැ යි සේයි. **සචෙ පස්සෙ භික්ඛු හොන්ති**-ඉදින් පාර්ශ්වයෙහි සමීපයෙහි භික්ෂූහු ඇත්තෝ වූ නම්; **මග්ගා අනොක්කම්ම චරන්තස්ස පන**-සමීපයෙහි භික්ෂූන් ඇත ද වී නම් මාර්ගයෙන් පහ නො වැ ඇවිදිනාහට වනාහි; **ආපුච්ඡනකිච්චං නත්ථි**-ආපුච්ඡන කෘත්‍යයෙක් නැති; **වුත්තනයෙන**-යටැ කී නයින්; ප්‍රථමපාදයෙහි දුක්කට යි. ද්විතීයපාදයෙහි පාචිත්තිය යි සේයි.

**පටික්කමන** නම් ආසන සාලාව යි. **ඉදං පන ක්‍රියාක්‍රියං**-ක්‍රියා නම් යැම ය. අක්‍රියා නම් අනාපුච්ඡාව යි.

තතියං.

**භෙදනමෙව**-භෙදනය මැ; **භෙදනකං**-භෙදනක නම් වේ. ස්වාර්ථයෙහි කප්‍රත්‍යය යි. **තං**-ඒ භෙදනය; **අස්ස අත්ථීති**-මේ පාචිත්තියාපත්තියට ඇත් නු යි; **භෙදනකං** පාචිත්තියාපත්තිතොමෝ භෙදනක නම් වා. **අස්ස** යී කියා පාචිත්තිය ශබ්දයා ගෙණ කීහු. **එවරූපෙ සූචිඝරෙ**-අස්ථිමය දන්තමය විෂාණමය යැ යන මෙබඳු වූ සූචිඝරයන්; **තං**-ඒ වුත්තප්පකාර ඇති සූචිඝරය;

**අරණිකෙති** අරණිධනුකෙ; **අඤ්ජනියා**-අඳුන්තලැ ද; **අඤ්ජනිසලාකාය**-අඳුන්ලායෙහි ද; **වාසිජටෙ**-වැදඹු නො ගැලවෙන පිණිසැ ලන අසි දන්ත විෂාණමය පිලියෙහි ද; **එතෙසු**-මොවුන් අතුරෙහි ලා; **යං කිඤ්චි**-කිසිවක්; **අසිආදිකිං කාරෙන්තස්ස**-අසිආදීන් කරවන්නාහට ද;

චතුත්ථං.

**මසාරකාදිසු අඤ්ඤතරං**–

“මසාරො බුන්දිකාබද්ධො[1] කුලීරාහච්චපාදකො,
මඤ්චා චතුබ්බිධො වුත්තො බුන්දෙතාදිච්චබන්ධනා” යි

1. මසාරඉණිකාබද්ධො-හැම.

කියනලද සතර මඤ්චයන් අතුරෙහි එක්තරු එකෙකි. තත්‍ථ මසාරකොති මඤ්චපාදෙ විජ්ඣිත්වා තත්‍ථ අටනියො පවෙසෙත්වා කතො. බුන්දිකාබද්ධොති අටනීහි මඤ්චපාදෙ ඩසාපෙත්වා පල්ලඞ්කසඞ්ඛෙපෙන කතො. කුළීරපාදකොති අස්සමෙණ්ඩකාදීනං පාදසදිසෙහි කතො වා යො පන කොචි වඞ්කපාදකො අයං වුච්චති කුළීරපාදකො. ආහච්චපාදකොති අයං පන ආහච්චපාදකො නාම මඤ්චො අඞ්ගෙ විජ්ඣිත්වා කතො හොතීති එවං පුරතො පාළියංයෙව වුත්තො. තස්මා අටනියො විජ්ඣිත්වා තත්‍ථ පාදසිඛං පවෙසෙත්වා උපරි ආණිං දත්වා කතමඤ්චො ආහච්චපාදකොති වෙදිතබ්බො.

බුන්දිකාබද්ධොටනිදණ්ඩො[1] පිඨිපාදෙ මසාරකො,
කුළීරපාදෙ තබ්බඞ්ගො විද්ධඞ්ගාහච්චපාදකො.

**පීඨම්පි තාදිසමෙව**-පුටුව ද මඤ්චයට කීසැටි මැ යි. **තං පන**-ඒ පීඨය වනාහි; **ඡෙදනකං ඡෙදනකසදිසමෙව**-ඡෙදනමෙව=ඡෙදනකං;තං අස්ස අත්‍ථීති ආපත්ති ඡෙදනකං යි විග්‍රහ හෙයින් සම යි.

**පමාණාතික්කන්තං**-ප්‍රමාණාතික්‍රාන්ත වූ මඤ්චපීඨය ලදින්; **ඡින්දිත්වා**-කපා අනුභව කරන්නාහට ද; **යථා**-යම් සේ; **පමාණමෙව**-ප්‍රමාණය මැ; **උපරි දිස්සති**-මත්තෙහි පැණේ ද; **එවං**-එපරිද්දෙන්; **නිඛණිත්වා**-වළ කැණැ එහි ලා ඇණ බහාලා අනුභව කරන්නාහට ද; **උත්තානං කත්වා** උඩු බල්ලා පෙරළා පියා අනුභව කරන්නාහට ද; **අට්ටකං බන්ධිත්වා**-අටුකොටු උඩ බැඳැ අනුභව කරන්නාහට ද;

**පඤ්චමං.**

---

**තූලං**-තුලය; **ඔනද්ධං**-වළඳනලද්දේ; **එත්‍ථාති**-මේ මඤ්චපීඨයෙහි නු යි; **තූලොනද්ධං**-තූලොනද්ධ නම් වේ. **චිලිමිකං පත්‍ථරිත්වා**-කඩරෙදි අතුරා; **තූලං පක්ඛිපිත්වා**-පුළුන් බහාලා; **උපරි**-මත්තෙහි; **චිලිමිකාය**-කඩරෙද්දෙන්; **ඔනද්ධන්ති වුත්තං හොති**-වළඳනාලද්දැ යි කියන ලද්දේ වේ.

**බිම්බොහනං චෙත්‍ථ, එත්‍ථ**-මේ කප්පියපරික්ඛාරයෙහි ලා; **බිම්බොහනං**- මාවුලාව; **සීසප්පමාණමෙව වට්ටති**-ශීර්ෂප්‍රමාණ වූයේ මැ වටී. **යස්ස**-යම් බිම්බොහනයකුගේ; **විත්‍ථාරතො**-පළලින්; **තීසු කොණෙසු**-ධජඉසක් බඳු තුන් කොණයෙහි;

---

1. මුනිබද්ධොටනිදණ්ඩො-ඇතම්.

**ඞිනානං අන්තරං**-කොණයන් දෙදෙනාගේ අතුර; **විදත්ථිචතුරඞ්ගුලං හොති**-එක්වියත් සතරඟුලෙක් වේ. **මජ්ඣ**-මධ්‍යය; **මුට්ඨිරතනං**-මිටිරියනෙක් වේ. **දීඝතො**-දිගින්; **දියඩ්ඪරතනං**-එක්රියන් එක්වියනෙක් හෝ ය. **විරතනං වා**-දෙරියනෙක් හෝ යි.

ඡට්ඨං.

---

**සන්ථතසදිසං සන්ථරිත්වාති** "සදසන්තෙන පුබ්බෙ වුත්ත නිසීදනං උපමෙති" යනු **වජ්‍රබුද්ධිටීකා** යි. **එකස්මිං අන්තෙ**-එක් කෙළවරෙක්හි; **සුගතවිදත්ථිප්පමාණං**-තථාගතවියතක් පමණ කොට; **ද්වීසු ඨානෙසු**-දෙතෙනක්; **ඵාලෙත්වා**-පලා; **කතාහි**-කරණලද; **තීහි දසාහි**-තුන් දරයෙකින්; **යුත්තස්ස පරික්ඛාරස්සෙතං නාමං**-යුක්ත වූ පරිෂ්කාරයට මෙ නමෙකි.

සත්තමං.

---

**කණ්ඩූති** කච්ඡු; **පිළකාති** ලොහිතතුණ්ඩිකා සුඛුම පිළකා; **අස්සාවොති** අරිසභගන්දරපමෙහාදීනං වසෙන අසුචි පග්ඝරණං; **ථුල්ලකච්ඡාබාධොති** මහාපිළකාබාධො වුච්චති යනු අටුවා යි. **කණ්ඩු**-කණ්ඩුති යැ. **පිළකා**-පොළ යැ. **අස්සාවථුල්ලකච්ඡාබාධානං**-වැහෙන්නාවූ මහත් කස් ආබාධ යන්ගේ; **පටිච්ඡාදනත්ථං**-වසන පිණිසැ; **අනුඤ්ඤාතචීවරං**-අනුදත්තාවූ චීවරය යි.

අට්ඨමං.

---

**එත්ථ**-මේ ශික්ෂාපදයෙහි; **යං වත්තබ්බං**-කිය යුත්තාවූ යමෙක් ඇද්ද; **තං සබ්බං**-ඒ සියල්ල;

නවමං.

---

දසමං.

---

රතනවග්ගො.

---

**පාටිදෙසනීයෙසු**-පාටිදෙසනීයයෙහි ලා; **පඨමෙ**-ප්‍රථම ශික්ෂාපදයෙහි; **අන්තරඝරං පවිට්ඨායාති වචනතො**-අන්තරඝරං පවිට්ඨාය යි වදාළ හෙයින්; **සචෙ**-ඉදින්; **අන්තරරථිකාදිසුපි ඨත්වා දදමානාය තස්සා හත්ථතො** යි යොදනු. **සචෙ සිකොපි ගණ්හාති** යි යොදනු. **රථියා**-වීථි යෙහි ද; **ව්‍යූහෙ**-කොවේකණ[1] ද; **සිඞ්ඝාටකෙ**-සතරමංසන්ධි

---

1. { කෝවෙ කතය. / කෝවෙකතය.

යෙහි ද; තුන්මංසන්ධියක් ගැණේ. **ඝර**-කුලගෙරෙහි ද; **රථියාදිසු ඨත්වා දදමානාය තස්සා** යි යොදනු. **තස්ස**-ඒ පාටිදෙසනීයයාගේ; **දෙසෙතබ්බාකාරො**-දෙසයිතව්‍ය වූ ආකාරය; **ගාරය්හං ආවුසොති ආදිනා නයෙන**-ගාරය්හං ආවුසො යනාදි නයින්; **සික්ඛාපදෙ දස්සිතොයෙව**-ශික්ෂාපදයෙහි මැ දක්වන ලද්දේ වේ.

**යථා චෙතං, එතං**-මේ ශික්ෂාපදය; **යථා**-යම් සේ; **අසාධාරණපඤ්ඤත්ති අනාණත්තිකං, තථා සෙසානිපි**-සෙසු ශික්ෂාපදයෝ ද; **තථා**-එසේ මැ තිකපාටිදෙසනීයයෝ යි. **එසෙව නයො**-එ මැ නය යි. එසේ මැ දුක්කට ය යි සේයි **උපනික්ඛිපිත්වා දදමානාය**-අතින් අතට නො දී බිමැ තබා දෙනකල්හි ද; **යා**-යම් භික්ෂුණියක් තොමෝ; **අන්තරාරාමෙ**-ඇතුළු අරමැ සිටැ දේ ද; **භික්ඛුනුපස්සයෙ**-මෙහෙණවර සිටැ දේ ද; **තිත්ථියසෙය්‍යාසු**-තිත්ථියාරාමයෙහි සිටැ දේ ද; **පටික්කමනෙසු ඨත්වා**-ආසනසාලායෙහි සිට දෙනකල්හි ද; **ගාමතො බහි නිහරිත්වා**-ගමින් පිටතට ගෙණැ ගොස්; **යා ච දෙති**-යම් භික්ෂුණියක් තොමෝ දේ ද; **යාමකාලිකාදීනි සති පච්චයෙ පරිභුඤ්ජාති යා ච දෙති**-යාමකාලිකාදීන් ප්‍රත්‍යයක් ඇති කල්හි අනුභව කර යි යම් භික්ෂුණියක් තොමෝ දේ ද; **තස්ස**-උක්තප්‍රකාරනයින් දුන්දෙය ගන්නා භික්ෂුනට ද;

**පඨමං.**

---

**වොසාසන්තාකාරදස්සනං**-කථනාකාරදර්‍ශිතය යි. **අපසාදෙතබ්බාකාරදස්සනං**-අපසාදයිතව්‍ය භික්ෂුණියගේ ආකාරදර්‍ශිතය යි. **එකෙනාපි භික්ඛුනා**-බොහෝ භික්ෂූන් අතුරෙහි ලා එක්තරා භික්ෂුවක්හු විසින් ද; **අනපසාදිතෙ**-පහ නො කළකල්හි;

**භික්ඛුනියා වොසාසන්තියා**-අනුශාසනා කරණ භික්ෂුණිය; **න නිවාරණවත්ථුස්මිං**-නො වළකන වස්තුයෙහි; **පඤ්ඤත්තං**-පණවනලදී. **තිකපාටිදෙසනීයං**-උභතොපසම්පන්නාව කෙරෙහි උභතොපසම්පන්නසඤ්ඤී ය, අනුපසම්පන්නසඤ්ඤී ය, වෙමතික යැ යි තිකපාටිදෙසනීයයෙක් වේ. **අනුපසම්පන්නාය**-අනුපසම්පන්නාව කෙරෙහි; **උපසම්පන්නසඤ්ඤිනො**-උපසම්පන්න ය යන සංඥා ඇත්තාහට ද; **වෙමතිකස්ස ච**-එ මැ අනුපසම්පන්නාව කෙරෙහි උපසම්පන්න දෝ හෝ අනුපසම්පන්න දෝ හෝ යන විමති ඇත්තාහට ද; **තථා දුක්කටං** යි යොදනු. **අනුපසම්පන්නසඤ්ඤිනො ච**-අනුපසම්පන්නාව

කෙරෙහි අනුපසම්පන්න ය යන සංඥ ඇත්තාහට ද; **අනාපත්තීති සම්බන්ධෝ. යො ච භුඤ්ජති තස්ස චාති සම්බන්ධෝ. අත්තනො සන්තං දාපෙන්තියා**-තමාගේ ආහාරය අනුන් ලවා දෙවනකල්හි ද; **අඤ්ඤස්සං වා සන්තං දෙන්තියා**-උපාසකාදි වූ අනෙක් කිසිවක්හුගේ ආහාරය දෙනකල්හි ද; **යං වා න දින්නං**-සුපාදි වූ යම් කිසිවෙක් නො දෙනලද ද; **තං දාපෙන්තියාති සම්බන්ධෝ. යස්ස න දින්නං**-යම් භික්ෂුවක්හට නො දෙනලද ද; **තස්ස දාපෙන්තියා**-ඔහට දෙවනකල්හි ද; **යස්ස තස්ස** යනු චතුර්ථීඅර්ථයෙහි **සප්තමී** යි. **සබ්බේසං සමකං දාපෙන්තියා**-හැමදෙනහට සම කොට දෙවනකල්හි ද; **සික්ඛමානාය වා**-සික්ඛමානාව විසින් හෝ; **සාමණේරියා වා**-සාමණේරියක හෝ; **වොසාසන්තියා**-විධාන කරණකල්හි ද; **පටිග්ගණ්හිත්වා**-පිළිගෙණ; **යො ච භුඤ්ජති**-යමෙක් වළඳා ද; **තස්ස ච**-ඔහට ද; **අනුඤ්ඤාතප්පකාරතො**-අනුදත්තාවූ ප්‍රකාරයෙන්; අනුදත්ප්‍රකාර නම් තමාගේ ආහාරය අනුන් ලවා දෙවීම අනුන්ගේ ආහාරය තමා දීම ය යනාදි වූ උක්ත ප්‍රකාරය යි. **ඉදං පන ක්‍රියාක්‍රියං**- ක්‍රියා නම් **පටිග්ගහණ** යෑ. අක්‍රියා නම් පහ නො කිරීම්.

**දුතියං.**

---

**සරූපවාරෙනාගමනතො**-සරූපවාරයට බැස්මෙන්; **පඨමතරං**-පළමු කොට මැ; **උපචාරං අනොක්කන්තෙනෙව**[1]-උපචාරයට නො බටකල්හි මැ; **අනිමන්තිතො**-නො පවරණලද්දේ; උපචාරයට බටකල්හි පැවරුවා ගතහොත් ආපත්ති මැ යි. **තං**- ඒ ආමිෂය;

**න මත්තං ජානිත්වා**-ඔවුන්ගේ ශක්ති නො බලා බොහෝ කොට පිළිගන්නා වස්තුයෙහි; **පඤ්ඤත්තං**-පණවනලදී. **තෙසං ඝරෙ**-ඔවුන්ගේ ගෙහි; **පඤ්ඤත්තං**-පණවනලද; **අඤ්ඤස්ස භික්ඛං ගණ්හාති**-අනෙකක්හුගේ භික්‍ෂා ගණී ද; **ඝරා නීහරිත්වා**-ගෙන් ගෙණැ ගොස්; **ආසනසාලාදීසු වා ඨපිතං යස්ස ච දෙන්තීති සම්බන්ධෝ.** ආසනසාලාදියෙහි තබා යමක් හට දෙද්ද; **තං භුඤ්ජන්තස්ස**-ඒ වළඳන්නවුහට ද;

**තතියං.**

---

1. අනොක්කමන්තෙනෙව-කඞ්ඛාවිතරණී

**යං ආරොචිතං** සි යොදනු. **පච්ඡා**-ඒ පැවරුවහට පසු වැ; **යථාරොචිතමෙව වා ආහරතු**[1]-කීපරිද්දෙන් ගෙණෙව සි; **තස්ස පරිවාරං කත්වා**-ඒ පැවරුමාට පිරිවර කොට; **පටිසංවිදිතං කත්වා**-පවරා ගෙණැ; **තෙහි සද්ධිං**-ඒ පවරා ගෙණැ දෙන්නාවූ උපාසකවරුන් හා සමග; **අඤ්ඤානි වා කුලානි**-සෙසු කුලයෝ ද; **පහූතම්පි**-බොහෝ ද වූ; **අඤ්ඤම්පි**-සෙසු ඛාදනීයභොජනීයයක්; **තෙන සද්ධිං**-ආදර කොටැ පවරා ගත්තාවූ උපාසකවරුන්ගේ ඒඛාදනීයභොජනීය හා සමග; **ආහරන්තු**-ගෙණෙත්වයි; **සබ්බං වට්ටති** සි අර්ථ බණනු. **එවං අනාරොචිතස්ස අනාගතස්ස යං තං අප්පටිසංවිදිතං නාම** සි යොදනු. **අගතමග්ගෙන**-අධමාගතයෙන්; **ආරාමමජ්ඣෙන**-ආරාමමධ්‍යයෙන් යන්නාවූ; **භික්ඛූහි**-මැශීන් විසින් ද; **දින්නං**-දෙනලද්දවූ; **එවරූපං**-මෙබඳු ඛාදනීයයක් හෝ භොජනීයයක් හෝ;

**තිකපාටිදෙසනීයං**-අප්පටිසංවිදිතයෙහි අප්පටිසංවිදිතසඤ්ඤී යැ, පටිසංවිදිතසඤ්ඤී යැ, වෙමතික යැ යි තිකපාටි දෙසනීයයෙක් වේ. **යථාවුත්තසෙනාසනානි**[2]-යථොක්ත සෙනාසන නම් දුනු පන්සියයක් හෝ ගව්වක් හෝ පමණ ඇති සෙනසුන් බව.

## චතුත්ථං.

**සමන්තතො**-සිසාරවා; **පරිමණ්ඩලං**-වට කොටැ; **එවං**-මෙසේ සිසාරවා වට කොටැ; **එත්ථ**-මේ සෙඛියයෙහි ලා; **වත්තක්ඛන්ධකෙ**-වත්තක්ඛන්ධකයෙහි; **වුත්තවත්තානි**-කියන ලද වෘත්තයෝ ද; **සික්ඛිතබ්බත්තා**-හික්මිය යුතුබැවින්; **යස්මා සෙඛියානෙව හොන්ති**-යම් හෙයකින් සෙඛිය නම් මැ වෙද්ද; **තස්මා**-එහෙයින්; **පාරාජිකාදීසු විය**-පාරාජිකාදියෙහි මෙන්; **පරිච්ඡෙදො න කතො**-පන්සැත්තෑ සෙඛිය යැ යි පරිච්ඡේද නො කරණලදී. **චාරිත්තනයදස්සනත්ථඤ්ච**-හැසිරෙණනය දක්වන පිණිස; **පාලි ආරොපිතා** යි යොදනු. **ඉදානි**-දැන්; **පරිමණ්ඩලන්ති එත්ථ**-පරිමණ්ඩලං යන මේ පාඨයෙහි අර්ථ කියම්හ යි සේසි. **අට්ඨඞ්ගුලමත්තං**-අටඟුලක් පමණ තැන්; **නිවාසනං ඔතාරෙත්වා**-හඳනය බහා; **න කෙවලඤ්ච තතොව**-හුදෙක් ඔහට මතු මැ නො වේ. **ඛන්ධකෙ**[3]-ඛන්ධකයෙහි ලා; **යෙ චඤ්ඤෙ නිවාසනදොසා වුත්තා** යි යොදනු. **නාභිතො**-

1. ආහරියතු-කඞ්ඛාවිතරණී 2. යථාවුත්ත ආරඤ්ඤකසෙනාසනානි-කඞ්ඛාවිතරණී. 3. ආපත්තික්ඛන්ධකෙහි-නැම.

නාභියෙන්; **හත්ථිසොණ්ඩසණ්ඨානං**-තරුඹත්පිළිය ඇත් සොඬක් සේ කොට; **නිවත්ථං**-හඳනාලද්දේ යි. **එකතො දසන්තං**-එක්පාශ්වයෙක්හි දසන් ද; **එකතො පාසන්තං**-එක් පාශ්වයෙක්හි කුරුගුලා කන් ද; **උපරි ද්වෙ**-මත්තෙහි දෙකොන; **හෙට්ඨතො ද්වෙති**-යටින් දෙකොන යි; **එවං**-මෙසේ; **චතුක්කණ්ණං දස්සෙත්වා නිවත්ථං**-සතරකන් දක්වා හඳනාලද්දේ යි. **අනෙකසතං**-නොයෙක්වර; **ඔභඤ්ජිත්වා**-බිඳ; **ඔවට්ටිකං කරොන්තෙන**-හිණ ගන්වා සිසාරන්නහු විසින්; **නිවත්ථං**-හඳනාලද්දේ හෝ; **සතවලිකං** නම් වේ. **වාමදක්ඛිණපස්සෙසු**-වම්උකුළෙහි දකුණුඋකුළෙහි ද; **නිරන්තරං**-සිදුරු නැති නො කොට; **වලියො දස්සෙත්වා**-වළු දක්වා; **නිවත්ථං වා**-හඳනාලද්දේ හෝ; **සතවලිකං** නම් වේ. **සතශබ්ද**යෙන් සියෙක් මැ යැ යි නො ගත යුතු. බොහෝ බව කීතියා යි. **ජාණුතො පට්ඨාය**-දන පටන්; දනසමීපයෙහි පටන යි යුතැති. **කච්ඡං බන්ධිත්වා**-අමුඩු ගලා; **එවං නිවාසෙතුං**-මේ උක්තප්‍රකාරයෙන් හඳනට; **ගිලානස්සාපි**-ගිලන්හට ද; **මග්ගපටිපන්නස්සාපි**-ගමන් යන්නාහට ද; නො වටී. **යම්පි නිවාසෙන්ති සබ්බං න වට්ටතීති සම්බන්ධො.** මග්ගං **පටිපන්නා**-මාර්ගයෙහි යන්නාහු; **එකං වා**-එක් කණක් හෝ; **ද්වෙ වා කණ්ණෙ**-දෙ කණක් හෝ; **උක්ඛිපිත්වා**-නගා; **අන්තරවාසකස්ස**-අන්තරවාසකයාගේ; **උපරි ලග්ගෙන්ති**[1]-මත්තෙහි ගන්වා ගණිද්ද; **අන්තො වා**-ඇතුළෙහි හෝ; **එකං කාසාවං**-එක් සිවුරක්; **තථා නිවාසෙත්වා**-එක් දෙ කණක් මත්තෙහි ගන්වා ගෙණ; **බහි අපරං නිවාසෙන්ති**-යට හන්සිවුර මත්තෙහි අනෙකක් හඳිත් ද; **සබ්බං න වට්ටති**-උක්තප්‍රකාර සියල්ල නො වටී. **ඔවට්ටිකං දස්සෙත්වා**-සගුණ කොට යුතන්. යට එකක් හැඳ මත්තෙහි හඳනාහට වටී. **ඔවට්ටිකං දස්සෙත්වා**-අන් සිවුරෙහි මැද බිඳ පය ගැහෙන නුවා මත්තෙහි ගන්වා ගෙණ; **අපරං**-අනෙකක්; **උපරි**-ඒ සිවුර මත්තෙහි; **එවං නිවාසෙන්තෙන අගිලානෙන** යි යොදනු. **සගුණං කත්වා**-කස්පිළිසන ද හඳනය ද එක් කොට; **ඉති**-මෙසේ උක්තප්‍රකාරයෙන්; **ඛන්ධකෙ පටික්ඛිත්තානඤ්ච**-මෙ නිවාසනදෝෂයන් ද; **ඔලම්බකඤ්ච**-ඉදිරියෙන් පස්සෙන් එල්වා හැඳීම ද යන; **සබ්බං විවජ්ජෙත්වා**-සියල්ල වර්ජිත කොට; **ඔලම්බකඤ්ච** යනු තිදන ගත පරිද්දෙන් කීතියා යැ. **ඛන්ධකාගත** යනු ඔලම්බකයට නැගේ.

---

1. ලග්ගෙන්ති-සබ්බංවිතරණී

**ආදිසෙසු පන**-මේ ආදි විනිශ්චයෙහි වනාහි එක් විනිශ්චයක් කියම්හ යි සේයි. **සුරුසුරුකාරකං කොසම්බියං**-"**න සුරුසුරුකාරකං භුඤ්ජිස්සාමි**" යන මේ ශික්ෂාපදය කොසඹෑ නුවර දී පණවනලද. **සම්බහුලෙ** භික්ඛූ **ආරබ්භ පඤ්ඤත්තං** යනු හා සම්බන්ධ යි. **සබ්බානෙව**-සියලු ශික්ෂාපදයෝ; **සාධාරණපඤ්ඤත්තිකානි**-සාධාරණප්‍රඥප්තීහ. **අනාණත්තිකානි**-අනාණත්තිකයෝ යි. **සබ්බෙසු**-හැම ශික්ෂාපදයෙහි; **විපත්ති විචාරණා වුත්තනයෙව** යි යැ මෙන් ආචාරවිපත්තිබව **කීතියා** යි. **තඤ්චිදං**-ඒ මේ අනාපත්තිමාත්‍රයක් හා අඞ්ග හා කියනු ලැබේ. **අනාපත්තිකාරණාභාවො**-අසඤ්චිච්චාදි අනාපත්ති කාරණයක් නැතිබව යැ; **යථා චෙත්ථ, එත්ථ**-මේශික්ෂාප දයෙහි; **යථා-අනාදරියං** අනාපත්තිකාරණාභාවොති යන මෙ දෙක යම් සේ ආපත්තියට අඞ්ග ද; **එවං සබ්බත්ථ පුරිමානි ද්වෙ**-හැම ශික්ෂාපදයෙහි මැ අනාදරියං අනාපත්ති කාරණාභාවො යන මෙ පුරිම දෙක ද; **එවං**-එසේ මැ ආපත්තියට අඞ්ග යි. **තත්ථ තත්ථ පටිපක්ඛකරණසඞ්ඛාතං**[1]-ඒ ඒ ශික්ෂාපදයට ප්‍රතිපක්ෂය කිරීම යැ යි හැම ශික්ෂාපදයෙහි තුන්තුන් අඟ මැ වේ.

**පඨමං.**

---

**එවමාදි**-මේ ආදි වූ; **පරිමණ්ඩලලක්ඛණෙන**-වට කොට හැඳීමෙන්; **අඤ්ඤතරා**-අන්‍ය වූ; **යං කිඤ්චි පාරුතං** යි යොදනු. **තස්මාති** යස්මා ගිහිපාරුතං නාම තස්මා; **සෙතපටා** යි සේයි, **අද්ධපාලකා**[2]-අඞ්පාලකයෝ යි; අද්ධං පාලෙන්තීති=අද්ධපාලකා; ශරීරයෙන් අඞ්යක් රක්ෂා කරණහෙයින් අඞ්පාලකයෝ නම්හු. **යථා පාරුපන්ති** යි යොදනු. **උරං විවරිත්වා**-ළය විවර කොට; **ද්වීසු අංසකූටෙසු**-දෙදසරැයෙහි හෙවත් දෙවුරයෙහි; **පාපුරණං**[3]-තමන් පොරෝණාවස්ත්‍රය; **යථා ඨපෙන්ති** යි යොදනු. **නිවත්ථසාටකස්ස**-හඳනා සාටකයාගේ; **එකෙන අන්තෙන**-එක් කෙළවරෙකින්; **පිට්ඨිං පාරුපිත්වා**-පිට පෙරෙවැ; **උභො කණ්ණෙ**-හන් වස්ත්‍රයාගේ දෙ කොන්; **උභොසු අංසකූටෙසු**-දෙදසරි යෙහි; **යථා ඨපෙන්ති** යි යොදනු. **ගීවං පරික්ඛිපන්තා**-ග්‍රීවය සිසා රන්නාහු; **උභො අන්තෙ**-දෙ කෙළවර; **උරෙ වා ඔලම්බන්ති**-ළෙහි හෝ එල්වද්ද; **පිට්ඨියං වා ඛිපන්ති**-පිටට හෝ දමා ලද්ද;

---

1. තත්ථ තත්ථ වුත්තපටිපක්ඛකාරණසඞ්ඛාතං-කඞ්ඛාවිතරණී,
2. අද්ධපාලකාහි ගණ්ඨා-කඞ්ඛාවිතරණී,
3. පාරුපනං-කඞ්ඛාවිතරණී,

**අන්තෙපුරිකායො**-අන්තඃපුරස්ත්‍රීහු; **අක්ඛිතාරකමත්තං දස්සෙත්වා**-දෙඇස මතු තබා; **ඔගුණ්ඨිකං**-හිස වසා; **යථා පාරුපන්ති. කස්සකා**-ගොවීහු; **පළිවෙඨෙත්වා**-හකුළුවා; **තංයෙව**-එ මැ සාටකයාගේ; **උභින්නං උපකච්ඡකානං**-උපකච්ඡකයන් දෙදෙනාගේ; **අන්තරෙන**-අතුරෙන්; **සාටකං පවෙසෙත්වා**-සාටකය යවා; **පාලිකාරකො භික්ඛු**-සඞ්ඝයා පෙලැ සිටුවන්නාවූ මහණ; **එකංසපාරුපනෙන**-එකස් කොටැ පෙරෙවීමෙන්; **පාරුතං**-පොරෝණාලද්දේ; **වාමබාහුං විවරිත්වා**-වම් දසරුව විවර කොටැ; **චීවරං**-සිවුර; **අංසකූටෙ**-වම් දසරුයෙහි; **යථා ආරොපෙති**-රැස් කොටැ යම් සේ පොරෙවා ද; **එවං අපාරුපිත්වා**-එ පාලිකාරකභික්ෂුහු පරිද්දෙන් නො පෙරෙවැ; **එතෙ සබ්බෙපි**-සියලු පාරුපණය ද; **එවරූපෙ**-මෙබඳු වූ; **අඤ්ඤෙ ච පාරුපණදෙසෙ විවජ්ජෙත්වා**-සෙසු ද පාරුපණදෙසයන් හැරැ;

**යාව මණිබන්ධං**-මණිබන්ධය දක්වා; **ජත්තුං වා**-දසරුව හෝ; **උරං වා**-ලය හෝ;

**තතියං.**

---

ගලවළු නම් උකුණුවල හා උගුරෙ තික්ම තිබෙන්නාවූ ඇට ද ගලවළු නම් වේ.

**සුපිහිතොති අත්ථො**-මනා කොටැ සන්හුන්නෙ යැ යන අර්‍ථ යි.

**හෙට්ඨා ඛිත්තචක්ඛු හුත්වා**-යට බලා නමන ඇස් ඇති වැ හෙවත් යට බලා දමනලද ඇස් ඇති වැ; **පුරතො**-අභිමුඛයෙන්; **යුගමත්තං**-වියයක් පමණ නොහොත් සතර රියනක් පමණ හෝ; **භූමිභාගං**-භූමිප්‍රදේශය; **පෙක්ඛමානො**-බලන්නේ; **පරිස්සයාභාවං**-උපද්‍රව නැතිබව;

**අන්තො ඉන්දඛීලතො පට්ඨාය**-පරික්ෂිප්තග්‍රාමයාගේ ඇතුළු එළිපතැ සිටැ මෙසේ නොයා යුතු යැ. අපරික්ෂිප්තග්‍රාමයාගේ පරික්ෂේපාර්හස්ථානයෙහි සිටැ නො යායුත්තේ යි. පරික්ෂේපාර්හස්ථාන නම් දෙ ලෙඩ්ඩුපාතයෙකි.

**වාසූපගතස්ස**-රෑ එහි මැ වෙසෙම් යි එළෙඹියහට ආපත්ති නැති.

**උභයත්ථ**-"න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ ගමිස්සාමි, නිසීදිස්සාමි" යන ශික්ෂාපදද්වයෙහි ලා; **හසනීයස්මිං වත්ථුස්මිං**-සිනැ

යුතු කාරණයක් ඇතිකල්හි; **මිහිතමත්තං**-සතුටු පමණක්; **කරොන්තස්ස**-කරන්නාහට; **හසනීයස්මිං වත්ථුස්මිං**ති හෙත්වත්ථෙ භුම්මං. හසිතබ්බවත්ථුකාරණෙති අත්ථො.

**උච්චාසද්දො**-උස් වූ ශබ්ද ඇති වැ; **මහාසද්දො**-පැතුරුණාවූ ශබ්ද ඇති වැ; **එත්ථ**-මේ ශික්ෂාපදයෙහි; **අයං පන**-මේ අප මතු කියන්නේ වනාහි; **අප්පසද්දස්ස පරිච්ඡෙදො**-අල්පශබ්දත්වයෙහි පරිච්ඡෙද යි. **කථං ච වවත්ථාපෙති**-කථාව ද නිශ්චය කෙරේ.

**ඉතො පරෙසු ඡසු**-මෙයින් මතු ශික්ෂාපද සයෙහි; **කායාදීනි**-කායාදීන්; ආදිශබ්දයෙන් බාහුසීසදෙක ගත්හු. **පග්ගහෙත්වා නිච්චලානි උජුනි** යි එ මැ ප්‍රකාශ කරණු පිණිසැ කීහු. **නිසීදනපටිසංයුත්තෙසු**-නිසීදිස්සාමි යන පදය ප්‍රතිසංයුක්ත වූ ශික්ෂාපද තුණෙහි ලා;

**කටියං**-උකුළෙහි; **කතබන්ධො**-කරණලද බන්ධ ඇත්තේ යැ යන අර්ථ යි.

**සසීසං පාරුතො**-හිස් සහිත කොටැ පෙරෙවියේ; හිස් වසා පෙරෙවියේ යි සේයි.

**භූමියං ඵුසන්තස්ස ගමනං උක්කුටිකාති වුච්චති** යි යොදනු. **කරණවචනං පනෙත්ථ**-උක්කුටිකාය යන මේ පාඨ යෙහි කරණවචනය; **වුත්තලක්ඛණමෙව**-ඉපර්මහුත ලක්ඛණ යැ යි සේයි.

**ඉධාපි**-න පල්ලත්ථිකාය අන්තරඝරෙ ගමිස්සාමි යන මේ ශික්ෂාපදයෙහි ද; **පුරිමෙසු**-යටැ කී; **මාවීසචතුවීසෙසු**-"න පල්ලත්ථිකාය අන්තරඝරෙ ගමිස්සාමි," "න ඔගුණ්ඨිතො අන්තර ඝරෙ ගමිස්සාමි" යන මේ ශික්ෂාපදවයෙහි;

**ඡබ්බීසති සාරුප්පානි නිට්ඨිතානි.**

——(੦)——

**සා සඤ්ඤා**-ඒ සංඥතොමෝ; **අස්ස අත්ථි**-ඒ මහණහට ඇත් නු යි; එ මහණතෙමේ පත්තසඤ්ඤී නම් වේ. **අත්තනො භාජනෙ**-තමාගේ භාජනයෙහි; **උපනිබද්ධසඤ්ඤී හුත්වාති අත්ථො**-බත් ඇවිසිනාසද අනාදර පිණිස ඔබ ඔබ නො බලා පාත්‍රයෙහි ආභොගසංඥ ඇති වැ යැ යන අර්ථ යි.

**හත්ථහාරියො**-අතින් ගෙණ යා හැක්කාවූ; **සො සූපො**-ඒ සූපය; **භත්තස්ස**-ආහාරයාගේ; **චතුත්ථභාගප්පමාණො**-සතර වැනි කොටසය පමණ වූයේ; **වට්ටති**-වටී. **තතො ති**-ඒ ආහාරය

සම්බන්ධ වූ සතර වැනි කොඨාසයෙන්; **අධිකං**-අධික කොටැ; **ගණ්හන්තස්ස**-ගන්නාහට; **තස්මිං රසරසෙ**-ඒ රසරසයෙහි ද; රසරසෙ ද වටී යෙති යනු **විනයසන්නෙ** සි. රසරස යනු සූපය තබා අවශෙෂයට නම්. **අනාපත්ති** යි. **ඤාතකපවාරිතානං**-නෑපැවරුවන්ගේ සූප අධික කොට ගන්නාහට ද; අනා පත්ති යි.

**සමපුණ්ණං**-පිරුණු; **සමතිත්තිකං**-මුවවිටින් යටැ රේඛාව හා සම කොටැ පුරණලද්දවූ; **අනතික්කමිත්වා**-නො ඉක්මවා; **රචිතං**-වක්කරණ ලද්දේ පිළිගන්නට වටී. **අනධිට්ඨානුපගෙ පත්තෙ**-අධිඨානුපග නො වන්නාවූ පාත්‍රයෙහි; **යාවකාලිකං**-යාවකාලිකය ධූපික කොට ගන්නාහට ද; **යාමකාලිකාදීනි**-යාමකාලිකාදීන්; **යස්මිං කස්මිංචි**-අධිඨානුපග වූ හෝ නො වූ හෝ යම් කිසි පාත්‍රයෙක්හි; **ධූපිතකානිපි**[1]-ධූපිකත වූවාහුදු වටිත්. **යං පන** භොජනං යුතන්; **ද්වීසු පත්තෙසු** **ගහෙත්වා**-පාත්‍රයන් දෙදෙනකුන් ගෙණැ ගොස්; **එකං පූරෙත්වා**-දෙපයැ බත් එක් පයෙකැ පුරා; **විහාරං ආහරති**-විහාරයට ගෙණැ යේ ද; ඕහට අනාපත්ති යි. **තක්කොල වතංසකා**-තකුල්වැලයන් මැ; ආදිශබ්දයෙන් පුප්ඵවතංසක කටුක ඵලාදි වතංසක ගතයුතු. **තක්කොල**-තකුල්; **වතංසකා**-පස්කැන්, මුදුන්මල්[2].

**තත්ථ තත්ථ**-ඒ ඒ තන්හි; **ඔධිං අදත්වා**-හිරි නො දක්වා; **අනුපටිපාටියා**-තමාදිසායෙන් පනිතින්; **ආකිරන්තො**-වත් කරන්නේ; **තතො තතො**-ඒ ඒ තැනින්; **ඔමසති**-අ වො (ද?;) **තස්ස**-ඔහට ද; **උත්තරිභඞ්ග** ච-උත්තරිං භඤ්ජනබ්බො=උත්තරිභඞ්ගො; මාළුයෙහි ද; **උප්පටිපාටියා**-උත්පරිපාටියෙන්; **ගණ්හන්තස්ස**-ගන්නාහට ද;

**වෙමජ්ඣතොති අත්ථො**-මුදුනෙනැ යන **අර්ථ** යි. **පරිත්තසෙසෙ**-වලදා ශෙෂ වැ ගිය දෙය; **එකතො සංකඩ්ඪිත්වා**-එක් කොටැ ඇදැ; **ඔමද්දිත්වා**-මැඩැ;

**යස්ස**-යම් භික්ෂුවක්හට; **මාඝාතසමයාදිසු**-රජදරුවන් විසින් **මච්ඡමංස** නො මරන්නෙ නොකන්නෙ යනාදි සමයෙහි සහවා වලඳන්නාහට ද **අනාපත්ති** යි. හවුරුද්දකට දෙමසකට තුන් මසකට යැ යි නියම කොටැ සතුන් නො මරන්නට බෙර පියෝ කිරීම **මාඝාතසමය** නම් වෙ. ආදිශබ්දයෙන් කාල නියමය නො කොටැ හැම කලැ මැ සතුන් නො මරන්නේ යැ යි සම්මතකාලය ගත යුතු.

---

1. ධූපිගතානිපි-කඞ්ඛාවිතරණී.
2. පුප්ඵවතංසක යනු හිස නොහයි, තක්කොල-තකුල්; වතංසක-පස්කැත් ගත යුතුයි මුදුන්මල්-හැම.

**උජ්ඣානෙ සඤ්ඤා**-කිපිසිතින් වෙෂවිතනයෙහි ලා සංඥා තොමෝ; **උජ්ඣානසඤ්ඤී**-උජ්ඣානයෙහි සංඥා නම් වේ. මෙහි සඤ්ඤාසද්දයෙන් චිත්තයා මැ ගත්හු. **සා සඤ්ඤා, අස්ස**-මේ භික්ෂුහට; **උජ්ඣානසඤ්ඤී**-මහණතෙමේ උජ්ඣානසඤ්ඤී නම් වේ.

මයූරණ්ඩය අතිමහත්ත යැ යි කී හෙයින් නො වටනේ යැ යි හැඟේ. **තෙසං**-ඔවුන් දෙදෙනාගේ; **වෙමජ්ඣප්පමාණං**-මධ්‍යමප්‍රමාණ කොටැ ආලෝපය ගෙණැ වලදත් වටී. **ඵල** නම් කරඹ ආදි ක්‍ෂුද්‍රඵල යි. **අඵල** නම් පනස ලබුජ ආදි වූ මහාඵල යි.

**යත්තකෙන**-යම් පමණ දෙයක් මුඛයෙහි තුබූකලැ; **වචනං අපරිපුණ්ණං හොති**-වචනය අපරිපූර්ණ වේ ද; **තත්තකෙ සති**-එ පමණ දෙයක් මුඛයෙහි ඇතිකල්හි; **කථෙන්තස්ස**-බණන්නාහට; **ආපත්ති**-දුක්කටාපත්ති වෙ.

**පිණ්ඩං**-ආලොපය; **උක්ඛිපිත්වා උක්ඛිපිත්වා**-දම දමාලා;

**කබලං**-ආලොපය; **අවච්ඡින්දිත්වා අවච්ඡින්දිත්වා**-සිඳැ සිඳැ ගෙණැ;

**මක්කටො විය**-වඳුරකු සෙයින්; **ගණ්ඩෙ කත්වා**-කපාලයෙහි කොටැ; **ඵලාඵලමත්තෙ අනාපත්ති** යි යැමෙත් උත්තරිභඞ්ගයෙහි ආපත්ති යි.

**හත්ථං නිද්ධුනිත්වා නිද්ධුනිත්වා**-අත සල සලා;

**සිත්ථානි අවකිරිත්වා අවකිරිත්වා**-හුළු වගුරුැව වගුරුැවා; **ජඞ්ඝිස්සතීති**[1]-දමනු ලැබේ නු යි යන; **ඉදං**-මේ; **අනාපත්තියං**-අනාපත්තිවාරයෙහි ලා; **අධිකං**-අධික යි.

**ජිව්හං නිච්ඡාරෙත්වා නිච්ඡාරෙත්වා**-දිව නෙර නෙරා;

**හත්ථං නිල්ලෙහිත්වා නිල්ලෙහිත්වා**-අත ලෙවැ ලෙවැ; **භුඤ්ජන්තෙන** ති-වලඳන්නවු විසින්; **අඞ්ගුලිමත්තම්පි**-අඞ්ගුලිමාත්‍රය කුදු; **නිල්ලෙහිතුං**-ලෙව්නට; **න වට්ටති**-නො වටී. යම් හෙයකින් පාත්‍ර ලෙව්නට නො වටී ද එහෙයින්; **අඞ්ගුලියාපි**-ඇඟිල්ලෙනුදු; **පත්තො**-පාත්‍රය; **න නිල්ලෙහිතබ්බො**-නො ලෙවියයුත්තේ යි. **එකොට්ඨොපි**-එකතොලෙකුදු; **ජිව්හාය**-දිවින්; **න නිල්ලෙහිතබ්බො**-නො ලෙවිය යුත්තේ යි. **ඔට්ඨමංසෙහි එව**-ඔෂ්ඨමාංසයෙන් මැ; **අන්තො**-ඇතුළුමුවට; **පවෙසෙතුං වට්ටති**-ප්‍රවෙශ කරන්නට වටී.

1, ජඞ්ඝතීති-කඞ්ඛාවිතරණී.

**න සාමිසෙනාති එතං**-න සාමිසෙන යන මේ ශික්ෂා පදය; **පටික්කූලවසෙන**-උපාසකවරුන් පිළිකුල් කරණ විසින් පණවනලද; **තස්මා**-එසේ පිළිකුල් කොටැ පණවනලද හෙයින්; මේ සිඛයෙහි සඞ්ඛාදිග්‍රහණයෙන් මලාආදි ගත යුතු. හෙ ද නො වටී..

**පටිග්ගහෙන**-මුව සෝධන්නාවූ මලායෙන්; **පටිච්ඡන්නානං**-පිළිගන්නවුන්ගේ; **පටිග්ගහෙ**-මලායෙහි; **ඡඩ්ඩෙති**-වත් හෙරේ ද; **බහි නීහරිත්වා**-උපාසකවරුන්ගේ පවිත්‍ර වැ තිබෙන ඇතුළුගෙ ආදීන් පිටතට ගෙණ හැර; **ඡඩ්ඩෙත්**-දමා ද; උන්ගෙ කසල ගොඩැ, මොලංකනැ, දියෙහි වත් කරත් දෙෂ නැති.

**භොජනපටිසංයුත්තානි තිංස.**

——(○)——

**යං කිඤ්චි ඡත්තං**-පණ්ණච්ඡත්ත යැ, සෙතච්ඡත්ත යැ, කිලඤ්ජ ච්ඡත්ත යැ යන ඡත්‍රයන් තුන්දෙනා අතුරෙහි ලා යම් කිසි ඡත්‍රයෙක්; **පාණිම්හි**-අත්ලෙහි; **අස්සාති**-මොහට තූ යි හෙ තෙම; **ඡත්තපාණී**-ඡත්තපාණී නම් වේ. සෙතච්ඡත්ත නම් ජිනකකුඩ යි· කිලඤ්ජච්ඡත්ත නම් කඩරෙදි කලාල්කඩ ආදීන් කරණ ලද්දේ යි. **සො**-හෙතෙම; **තං ඡත්තං**-ඒ ඡත්‍රය; **අඤ්ඤෙන**-අනෙකෙක්; **අස්ස**-ඔහට; **සචෙ ඡත්තං ධාරෙති**-ඉදින් ඡත්‍රයක් බරා ද; **පසෙ වා ඨපිතං**-තෙමේ මැ බිමැ සිටුවා ලා ඇල යෙහි රඳවා ගෙණැ සිටියේ නම් හෝ; **හත්ථතො අපගත මත්තෙ**-අතින් පහ වූ මාත්‍රයෙහි; **ඡත්තපාණී නාම න හොති**-ඡත්තපාණී නම් නො වේ.

**එත්ථ**-මේ ශික්ෂාපදයෙහි; **චතුහත්ථප්පමාණො**=සතරරිය තක් පමණ වූයේ; **අස්ස දණ්ඩපාණිභාවො පන**-මොහුගේ දණ්ඩපාණිභාවය; **ඡත්තපාණිම්හි වුත්තනයෙන වෙදිතබ්බො. යො කොචි දණ්ඩො පාණිම්හි අස්සාති**=දණ්ඩපාණී; **යං කිඤ්චි සත්ථං පාණිම්හි අස්සාති**=සත්ථපාණී. මේ තුන්වන ශික්ෂාපදයෙහි දු මෙසේ මැ යි.

**අසිං සන්නය්හිත්වා**-කඩුව බැඳැ ගෙණැ; **තිට්ඨතො**-සිටියේ ද; **සරවිකතියා සද්ධිං සබ්බාපි ධනුවිකති ආවුධන්ති වෙදිතබ්බං** යි යොදනු. **සරෙන සද්ධිං ධනුං වා** යි යොදනු. ශරය හා සමග දුන්න ගෙණැ සිටියාහට ද හුන්නාහට ද; **ධම්මං දෙසෙතුං න වට්ටති** යි යොදනු. **සුද්ධධනුං වා**-ශරය නැති වැ

දුන්න මතු අල්වා ගෙණැ සිටියාහට ද හුන්නාහට ද; **ඛුඛශරං වා** - දුන්න නැති වැ ශරය මතු අල්වා ගෙණැ හුන්නාහට ද සිටියාහට ද; **සජියධනුං වා**[1] - නැගූ දුන්න ද; **නිජ්ජියධනුං වා** - නො නැගූ දුන්න ද; **ගහෙත්වා ඨිතස්ස වා නිසින්නස්ස වා ධම්මං දෙසෙතුං න වට්ටති. ධනෙඩ පටිමුක්කං හොති** - කරු බහා ලන ලද්දේ වේ ද; **පටිමුක්කං** - එල්වන ලද්දේ යි. **යාව න ගණ්හාති** - එසේ කරු බහා ලූ දුන්න යම් තාක් අතින් නො ගණී ද; **තාව වට්ටති** ඒ තාක් ධර්මය දෙසන් වටී.

**ඡත්තදණ්ඩකෙ** - සැත්දඬෙහි ලා; **අඞ්ගුලන්තරිකං** - ඇඟිලි ගස්ස; **අප්පවෙසෙත්වා** - ප්‍රවේශ නො කොටැ; **කෙවලං** - හුදෙක්; **අක්කන්තස්ස වා** - ඇක්මූනාට වෙවයි; නිතම් මැඩැ ගෙණැ සිටියාහට යයි සේයි. **පවෙසෙත්වා** - ඡත්තදණ්ඩයට ඇඟිලි ගස්ස බහා; **ඨානවසෙන** - සිටීම් වසයෙන්; **පටිමුක්කස්ස වා** - පය ලූවාහට වේවයි; **විසඞ්ඛරිත්වා** - ගලවා; මෙ සිඛයෙන් යානායෙහි හුන්නාහට බණ දෙසීම් ප්‍රතික්ෂෙප යැ. අටවන සිඛයෙහි හොත්ත වූ මැ ගත යුතු. එහෙයින් **අන්තමසො සකටසාරකෙපි පන තිභූමියමපි නිපන්නස්ස** යි කීහු.

**යාය කායචි නිසින්නස්ස** - යම් කිසි පලඟපිනායෙකින් හුන්නාහට;

**සසීසං පාරුතස්ස** - හිස් වසා පෙරෙව්යහට; යටැ සිඛයෙන් හිස මතු වෙළා ගෙණැ සිටියා ගත්හ. මෙ සිඛයෙන් සෙසු ශරීරය හා එක් කොටැ හිස් වසා පෙරෙව්ය ගත්හු.

ඡමාශබ්දය භූමිපර්‍යාය හෙයින් **භූමියං නිසීදන්තෙන** යි කීහු.

**සමධුරෙන** - වියයක් සේ සම වැ යන්නාහට ද;

**සකටමග්ගගමනෙ** - ශකටය ගිය හිරෙහි; **හරිතසඞ්ඛාතමෙව** - හරිත නම් මැ[2] වේ; **අප්පහරිතට්ඨානෙති** අහරිතඨානෙ; **තිණණ්ඩුපකං වා** - තණසුඹුළුවක් හෝ; **පලාලණ්ඩුපකං වා** - පිදුරු සුඹුළුවක් හෝ; **සිඞ්ඝානිකා** - මූකුණු;

**සමුද්දාදි** යන ආදිශබ්දයෙන් පරිඛාදිජලය ගත්හු. මෙ හැම සෙඛිය අනාදරයෙන් අවදනා හෙයින් ලොකවජ්ජ[3] මැ වේ.

**සෙඛියා.**

---

1. සජ්ජියධනුං වා - හැම. 2, හරිතකො සමෙව — හැ. 3. ලොකවජ්ජං - හැම.

**අධිකරණානි** යනු ශුද්ධකර්ම යි. අනුක්ත හෙයින් ද්විතීයා මැ වී. **සමෙන්ති** යනු ප්‍රයොජක යි. **ආපත්තාධිකරණසඞ්ඛාතාසු**–ආපත්තිඅධිකරණසඞ්ඛ්‍යාත වූ ද; **අවසෙසාධිකරණත්තයපච්චයාසු** ච–අවශෙෂඅධිකරණත්‍රයය ප්‍රත්‍යය කොට ඇති; **ආපත්තිසු**–ආපත්තියෙහි ද; ආපත්තියෙව=ආපත්තාධිකරණං; **එස නයො සබ්බත්ථ.** අධික්‍රියතෙ ඉති=අධිකරණං; **සමථත්ථං චෙව වූපසමනත්ථඤ්ච** යනු එකාර්ථ යි. **තත්‍රාති** අධිකරණසමථෙසු; දිට්ඨිආජීවවිපත්ති යැ යි කිසි ආපත්තියක් නැත ද උපචාර හෙයින් තන්මූලක ආපත්ති මැ ගත යුතු. **අනුවාදෙති** උපවාදෙ; **උපවාදනා** චොදනා එව; **අනුවදනාති** ආකාරනිදස්සනමෙතං. උපවාදනාති අත්ථො. **සඞ්ඝස්සාති** සඞ්ඝෙන; සංඝස්ස කිච්චතතා කරණීයතතා අපලොකනාදීනි චත්තාරි කිච්චානි කිච්චාධිකරණං නාම. **අපලොකනකම්මාදිකිච්චානි** විඤ්ඤත්තිසමුට්ඨාපකචිත්තං අධිප්පෙතං යනු **වජ්‍රබුද්ධි** යි. යො පාපුස්සන්නතාය පාපියො පුග්ගලො තස්ස කාතබ්බතො **තස්සපාපියසිකාකම්මන්ති** වුච්චති. **සඞ්ඝෙවාති** ගතට්ඨානෙ. **සඞ්ඝසම්මුඛතාති** ආදිසු යාවතිකා භික්ඛූ කම්මප්පත්තා තෙ ආගතා හොන්ති ඡන්දාරහානං ඡන්දො ආහටො හොති සම්මුඛීභූතා න පටික්කොසන්තීති අයං තත්ථ **සඞ්ඝසම්මුඛතා.** කා ච තත්ථ ධම්මසම්මුඛතා විනයසම්මුඛතා? යෙන ධම්මෙන යෙන විනයෙන යෙන සත්ථුසාසනෙන තං අධිකරණං වූපසම්මති අයං තත්ථ ධම්මසම්මුඛතා විනයසම්මුඛතා. **යො ච විවදති යෙන ච විවදති තෙසං අත්තපච්චත්ථිකානං සම්මුඛීභාවො පුග්ගලසම්මුඛතා** යනු පෙළ යි. **යො ච විවදති**–යමෙක් විවාද කෙරේ ද; **යෙන ච විවදති**–යමක්හු හා විවාද කෙරේ ද; **පඤ්චඞ්ගසමන්නාගතං භික්ඛුං**–න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, ගහිතාගහිතං ජානාති යි කියනලද පඤ්චාඞ්ගයෙන් යුක්ත භික්ෂුවක්හු; **ගූළ්හකසලාකගාහ** නම් ධර්මවාදී ලහපත් ද අධර්මවාදී ලහපත් ද වෙන් කොටැ සිවුරු කණැ එවැ ගෙණැ පුගුලන් කරා වෙත වෙත එළඹැ ලහපත් වෙන් වෙන් කොටැ පැ ‘මින් රිසියෙන ලහපතක් ගන්ව’ යි රහසින් කියා ගැන්වීම්. **විවටක** නම් ධර්මවාදීන් බහුතර සේ දැකැ හැමදෙනා ගන්නා සේ දැකැ හැමදෙනා දන්නා සේ ගැන්වීම්. **සකණ්ණජප්පක** නම් මෙසේ මැ බුමුනා කියා ගැන්වීම් යනු **නිස්සන්දෙහ** යි. ගාහකතන්ති ආදිසු අලජ්ජුස්සන්නාය පරිසාය ගූළ්හකො සලාකගාහො කාතබ්බො, ලජ්ජුස්සන්නාය විවටකො, බාලුස්සන්නාය සකණ්ණජප්පකො යනු අටුවා යි. **ධම්මවාදීනං යෙභුය්‍යතායාති** එත්ථ එකෙනාපි අධිකතා යෙභුය්‍යතාව. කො පන

වාදෙ ඵීහි තීහි? **අස්සාමණකෙ අජ්ඣාචාරෙ**-මහණහට සරුප් නො වන ව්‍යතික්‍රම කල කල්හි; පරිවාසාදි වූ යාවතාසඞ්ඛ්‍යාත ප්‍රතිඥාවට; **භික්ඛුනි චොදියමානො** වා යන්නෙහි වාශබ්ද එව කාරාර්ථ යි. **පාරාජිකාසාමන්තෙන වාති** එහි-

“දුක්කටං පඨමසෙසව සාමන්තමිති වණ්ණිතං,
සෙසානං පන තිණ්ණන්නං-ථුල්ලච්චයමුදීරිතං” යි

කියනලද සාමන්තාපත්තියෙන් හෝ; **පාරාජිකසාමන්තෙන වා**-පාරාජිකවර්ජ්‍යායෙන් හෝ; **සියාපීති** කදචි; **අථවා, එකංසෙන**-අවශ්‍යයෙන්; **කක්ඛලතාය වාලතායාති** කක්ඛලභාවාය චෙව වාළභාවාය ච; **වාලන්ති** චණ්ඩං; **කක්ඛලන්ති** අභෙජ්ජං; **ථුල්ලවජ්ජන්ති** පාරාජිකඤ්ච සඞ්ඝාදිසෙසඤ්ච. **ගිහිපටිසංයුත්තන්ති** ගිහීනං ධංසනවම්භනධම්මිකපටිස්සවෙසු ආපන්නං ආපත්තිං යනු අටුවා යි.

**අධිකරණසමථා,**

---

**පධංසිතාය**-බලාත්කාරයෙන් නසනලද මෙහෙණට; **උබ්භ** ශබ්දය ඌර්ධ්වපර්‍ය්‍යාය යි. **අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස**-කායසංසර්ග රාගයෙන් තෙත් වැ ගියාවූ පුරුෂයාගේ; **උබ්භජාණුමණ්ඩලිකා නාම පාරාජිකා**-උබ්භජානුමණ්ඩලිකා යැ යන නම් ඇත්තී යැ යි සේයි. **චොදෙන්තා සාරෙන්තා** යනු **උක්ඛිත්තං** යන්නට සම්බන්ධ යි. **කාරණං** යන්නට නො වේ. **චොදෙන්තා සාරෙන්තා කාරණමෙව** යන්නෙහි කාරණං යන්නෙන් ඥත්තිඅනුශ්‍රාවන සම්පත් කීවා වෙත්. **ඡන්දොකාසං අනතික්කමිත්වාපි** යන්නෙහි **අපි** ශබ්දය සම්භාවනා යි.

**එකතො අවස්සුතෙ** යන්නෙහි භික්ෂුණියගේ මැ එකතො අවස්සවය ගතයුතු යි. කො පන වාදො ඵීහි තීහි? **සක්ඛ පෙපක්ඛපණ්ඩක** යන්නෙහි පණ්ඩකග්‍රහණයෙන් පණ්ඩකයන් පස්දෙනා ද උභතොව්‍යඤ්ජනකයා ද ගත්හු.

**ලොකස්සාදමිත්තසන්ථවවසෙන** - කාමාස්වාදමිත්‍රසංස්තව විසින්; තං දස්සෙතුං **කායසංසග්ගරාගෙනාති** වුත්තං.

**පාරාජිකකණ්ඩං.**

---

**අට්ඨකරණත්ථාය**-යුක්ති බණනු පිණිස; **භික්ඛුනිසඞ්ඝතො නිස්සාරෙතීති** එත්ථ න හි සො ධම්මො සඞ්ඝම්හා කෙනචි නිස්සාරියති. තෙන පන ධම්මෙන භික්ඛුනී නිස්සාරීයති තස්මා සො

**නිස්සාරෙතීති**=නිස්සාරණීයො; තං නිස්සාරණීයං. නෙරතී යන; ආපත්ති නිස්සාරණීයහෙතුත්තා නිස්සාරණීයාති වුත්තා. **යථා තථා**-පූර්වෝක්ත යම් කිසි ප්‍රකාරයෙකින්;

පඨමං.

---

**යාය**-යමක විසින්; **භටපිපුත්තකගණ** නම් කුමාරභත්ති ගණය යි. කුමාරවරුන් රක්‍ෂා කරණ කුඩා සේවාවෝ ය. සෙස්ස **සත්‍යයෙහි** කී පරිද්දෙන් දත යුතු.

**චොරිවුට්ඨාපනයෙහි** උපාධ්‍යායකම් කරන්නියට ආපත්ති යි. අනෙකක් කරවත් හොත් අනාණත්තිකහෙයින් දොෂ නැති වැ හැගේ. අව්‍යතික්‍රමිතව්‍යය ව්‍යතික්‍රම දැනැ පණත් නො දැනැ කරණ පක්‍ෂයෙහි යි.

දුතියං.

---

**ඔකාකණෙනාති** යන්නෙහි අර්ථ අතිකෙකනෙන යි දතයුතු. අජ්ඣාකාසයෙහි දස්සනූපචාරය හරණට **දූරෙපි දස්සනූපචාරෙ හොති** යි යනාදි කීහු. දස්සනූපචාරය ගම මැ යැ. **සවණූපචාරය** අජ්ඣාකාසයෙහි මැ යි.

**බුද්ධවරෙන**-බුද්ධවරයා විසින්; ශික්‍ෂාපදයෝ වර්ණිතයහ. ඔහු කවරහ?යත්:-**චතුරො සඞ්ඝාදිසෙසා භවෙය්‍යුං**-සඞ්ඝාදිසෙසා පත්තීහු සතරදෙනෙක් වන්නාහ. **නො සඞ්ඝෙ එකපයොගෙන ආපජ්ජෙය්‍ය**. **එකතො භාවො** යනු අසඞ්ඛ්‍ය හෙයින් හුදකලා වැ යැ යි අර්ථ ගත යුතු.

තතියං.

---

ආපත්ති හෙයින් නො දක්නා බව යි **ආපත්තියා අදස්සන** නම්. **චුල්ලවග්ගෙති** විහෙව **එතං** චුල්ලවග්ගං. **ඡන්දං ජනිත්වා**-පවත්නා ලෙසින් අභිප්‍රාය දැනැ;

චතුත්ථං.

---

**හත්ථ පත**-ඒ යකබාදීන් අතින් පිළිගැන්මෙහි; **සබ්බත්ථ** ව-ගහණාදීසු; පටිග්ගහණ පරිභොග හැම තන්හි.

පඤ්චමං.

---

**තෙසන්ති** උදකදන්තපොනානං; පුන **තෙසන්ති** අවසෙසාහාරානං.

ඡට්ඨං.

---

චතුසු අඞ්ගෙසූති සඞ්ඝභෙදසික්ඛාපදෙ වුත්තඅඞ්ගෙසු; තෙසු පඨමං අඞ්ගං අපනෙත්වා එවං වචනසඞ්ඛාතං පඨමං අඞ්ගං; ඨානන්ති බහිද්ධා භික්ඛුනීනං.

දසමං. එකාදසමං.

---

භොමටන-ගිහීනට පැරීම. ඔවුනට මැ පවනාදි කිරීමෙන් ගිහීන් හා මිස්සීභූතා. මිච්ඡාජීවය (පාපයි) ලොක නම්.

ද්වාදසමං.

---

සමනුභාසනා-සමනුභාසනාකර්ම කරණලද්දී; බලවගස්සා වෙන-බලවත් තෙපුල් ඇතිබැවින්; බලපත්තාසනසමුත්‍රාසනෙන-තමන්ගේ ශක්ති හඟවන්නාවූ උරණීනෑ යන අර්ථ යි. හෙවත් සමුත්‍රාසනෙන-භයපත් කැරවීමෙන්; සබ්බපච්ච සමුච්චයත්ථොති සබ්බපදෙසු උස්සූයා ච පරිහවෙන ච අක්ඛන්තියා ච දුබ්බල්‍යං චාති එවං සමුච්චයත්ථො.

තෙරසමං.

---

භික්ඛුණී සඞ්ඝං න භින්දතීති සඞ්ඝභෙදෙ හි භික්ඛුසඞ්ඝස්ස භෙදවසෙන සියාති ච, භික්ඛුස්ස සඞ්ඝං භින්දිත්වා පවෙච්චකං උපොසථාදිකම්මකරණවසෙන හොන්තීති ච, භික්ඛුණියා සහ උපොසථාදි කරණාභාවතො ච වුත්තං. තත්‍රාති පක්කමාතනං. තත්‍රායන්ති යොජනාය. එවමස්ස වචනීයොති සඞ්ඝෙන එවං වචනීයො භවෙය්‍ය; ඛමති සඞ්ඝස්ස-සඞ්ඝයාට අභිමත යෑ. තස්මා තුණ්හී-එහෙයින් තුෂ්ණීම්භූතයක. එතං-මේ තුෂ්ණීම්භාවය; එවං ධාරයාමි-එසෙයින් ධරමි. පිරිසුදු වූ හෙයිනෑ යි සලකමි. වෙදියාමහං අය්‍යෙ වෙදියාමීති ජානාමි, චිත්තෙන සම්පටිච්ඡිත්වා සුඛං අනුභවාමි, න තප්පච්චයා අහං දුක්ඛිතාති අධිප්පායොති ලිඛිතං. වෙදියාමීති පදෙපි එසෙව නයො. වෙදියාමි-දන්වමි. මෙනම් මෙනම් සිතින් පිළිගෙණෑ පුරා සුව අනුභව කෙරෙමි. එ මානත් හැසුරුණු ප්‍රත්‍යයෙන් දුක්ඛි වන්නෙම් නො වෙමි. ඒ මානත් හැසුරුමට දුක්ඛයෙක් නැතෑ යි දන්වමි යි සේයි. නොහොත් මානත් පූරණබව දන්වමි. ඒ මානත් පූරණබව හඟව යි මා සඞ්ඝ දනීව යි යන අර්ථ යි. චතුන්නං භික්ඛූනසඞ්ඝ භික්ඛුනීනසඞ්ඝ යි අනතිම පක්ෂය ගෙණෑ කීහු. එත්ථ-මෙ මානත් හැසිරීමෙහි.

සඞ්ඝාදිසෙසවණ්ණනා.

---

**අධිඨහිත්වා**-සිතා ගෙණැ;

**පඨමං.**

**යථා දින්නානෙව**—පෙර උපාසකවරු චීවරාදි යමක් උදෙසා දුන්හු ද එසේ දුන්පරිද්දෙන් මැ; **අධිඨාය**—කාලචීවර යැ යි සිතා ගෙණැ; **ලෙසෙන**—අපගේ කඨිනාස්තරණය කළහෙයින් කාලචීවර යැ යි මේ ලෙශයෙන්.

**දුතියං. තතියං.**

**යඤ්ච විඤ්ඤත්තං**[1]—යමෙක් ආදි කොට විනවත ලද ද; **තතො අඤ්ඤං**-එයින් අන්‍යය; **සමග්ඝතරං හොති චෙ**-ඉදින් සම අගනා බවක් වී නම්[2]; **ඉමං ආනිසංසං**—මෙ සම අගනා බව යැ යි කියනලද ආනිසංසය හගවා හුදක් අන්‍යය ද;

**චතුත්ථං. පඤ්චමං.**

**අඤ්ඤදත්ථාය**—චීවරාදි යමක් පිණිසැ; **අඤ්ඤං උද්දිසිත්වා**-චීවරාදි යමක් උදෙසා; **සඞ්ඝෙන**-ඒ නියමිත චීවරාදි පරිෂ්කාරයෙන්; **සෙසකං**—දායකයන් නියම කළදෙය ගෙණැ ඉතිරිය; **උපනෙතබ්බා**-යම් අනෙකෙකැ එලවන්නියට ද.

**ඡට්ඨං.**

**සයං යාචිතකෙනාපි**—තමා විසින් යාච්ඤා කරණලද්දවූ; **සඞ්ඝිකෙන** යි සම්බන්ධ යි. ප්‍රත්‍යකයෙන් නො ගත යුතු. තමන් විසින් මැ සඞ්ඝයාහට ආදි කොට පැවැත්වූ හෙයින් **සඞ්ඝිකෙන සඤ්ඤාචිතකෙන** යි කීයේයි. නැවත ද යොජනාවෙක් ඇති. මෙ **සයං යාචිතකෙනාපි** යන **අපි** ශබ්දයෙන් එහි මැ කියනලද අඤ්ඤුද්දිසික සඞ්ඝිකය සමුච්චය කෙරේ. එහෙයින් අඤ්ඤුද්දිසික සඞ්ඝිකය ද සඤ්ඤාචිතය ද එකක් කොට අනෙකක් පරිවත්තනය කරන්නියට දොෂ වෙ යි දත යුතු. පෙල ද යොජනාව මෙසේ මැ කට යුතු. "අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන ච පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන අඤ්ඤං චෙතාපෙය්‍ය නිස්සග්ගියං" යි යෙදිය යුතු. මෙ යොජනාව වජිරබුද්ධියෙහි කීයේ. දෙක වෙන් වෙන් කොට චෙතාපනය කළහොත් මෙ සිඛයෙන් දොෂ නො වෙ යි. සාඞ්ඝිකය යටැ සිඛයෙන් දොෂ කෙරෙයි.

---

1. විඤ්ඤාපිතං-කඞ්ඛාවිතරණී. 2, ඉදින් මහා ද හෙවත් මහා වී නම්-නැම.

සංඝාටිකාය අනෙකෙකින් ධෞෂ කෙරේ. මතු කියන සඳසඳ විනයෙහි ද මෙසේ මැ අර්ථ ගත යුතු.

සත්තමං. අට්ඨමං. නවමං. දසමං.

---

පඨමො වග්ගො.

——(ං)——

කංසො නාම-කංසයෙක් නම්; චතුක්කහාපණිකො-සතර කහවණුවක් අගනේ යි. මහග්ඝං චෙතාපෙන්තං-මා ඇගි දෙයක නමා පිණිස පරිවත්තනය කරන්නාහු; අප්පග්ඝං චෙතාපෙන්තියා-අල්පාර්ඝයක් විතවන්නියට;

පඨමං.

---

[illegible]වණ්ණනා.

——:——

භණ්ඩිකලසුනං නාම මෙ බොහෝ බික්[1] ඇති ලූනු මැ. න එකමිඤ්ජකං-එක්බික් දෙබික් තුන්බික් ඇති සැලූනු හෙලලූනු වේ. පලණ්ඩුකාදීන් අතුරෙහි චතුමිඤ්ජයෙහි පටන් උඩත භණ්ඩිකලසුන නම් වේ. භණ්ඩික නම් ලූනුජාතිය එකමිඤ්ජක නො වෙ යි දත යුතු. බික් බෙහෙවැ යි යේයි. සං ගිති භණ්ඩිකං ලසුනං; පලණ්ඩුකො-හෙළ ලූනුනෙහි; භඤ්ජනකො-සැලූනෙහි; හරිතකො-තිල ලූනු නම් ලූනුජාතියෙහි; චාපලසුණො-බිජු නැති ගෙඩි මතු වූ සිවිලූනු නම් ලූනුජාතියෙහි ද; සාලොඩෙ-ගිවුළුසාලවයෙහි; යෙදූ ගිවුළුයෙහි යැ යි කෙයි.

පඨමං. දුතියං.

---

මුත්තකරණස්ස-මූත්‍ර කරණ ස්ථානයාගේ; තලඝාතකෙ-මුදුන පැහැරුමෙහි ද; ආබාධපච්චයා අනාපත්ති යි වෙන ගත යුතු.

තතියචතුත්ථපඤ්චමානි.

——:——

සුවෙන වා උදකෙනාති තකකාදි අම්සසකෙන වා උදකෙන;

ඡට්ඨං.

---

එත්ථ ච-මෙ ශික්ෂාපදයෙහි ද;

සත්තමං.

---

1. බිබ්-හැම.

**අසිකම්බලකෙසු**-මස්ඇට කටුඇට ආදි ඇටෙහි ද බුලත් සප් උක්සප් ආදි වූ සප්හි ද;

අට්ඨමං. නවමං.

**ධම්මභාණකගීතම්පි**-ධර්මසුවකගීත ද; **උපට්ඨානං**-බෙරපුද; **සලාකහත්ථාදිකෙ සති**-ලහබත් ආදියක් ඇතිකල්හි ද; **කරණීයෙන**[1] **ගන්ත්වා**-යම් කිසි කටයුත්තෙකින් ද ගොස්; **සමජ්ජට්ඨානං**-නෘත්‍යගීතාදි පවත්නා ස්ථානයට; මෙහි සමජ්ජට්ඨානං යන්නෙහි සමජ්ජ නම් සමග යෙදීම යැ. ඒ ස්ථානය ද උපචාර යෙතැ යි සේයි. උපචාර ගැන්මෙන් සමජ්ජට්ඨාන නම් වෙ.

දසමං.

**ලසුනවග්ගො.**

**පජ්ජොතෙ**-ප්‍රදීප[2]; **අනොභාසිතෙ**-ආලොකයක් නැති කල්හි; **සන්තිකෙ ඨාතුං**[3] **සල්ලපිතුං වාති** හිකවුතියා ඨාතුං සල්ලපිතුං ච. **ගෙහසිතකථන්ති** ගිහිගෙහනිස්සිතං කථං පටිසන්ථාරවසෙනාති.

පඨමං දුතියං. තතියං.

**අවිනිබ්බිධරච්ඡාය**[4]-ඉදුරු නො යැ හැකි මුල්ලට ගොසිනුදු නැවතිය හැකි වූ කොවෙකන්හි ද; **චච්චරෙ**-සතරමංසන්ධියෙහි; වීථි සිවු සන්ධියෙහි යැ යි සේයි. මෙ හැම මහාවීථියෙහි ද කොවෙයෙහි ද සිවු වීථිසන්ධියෙහි ද යනු යි.

චතුත්ථං.

**පල්ලඞ්කස්සොකාසභූතෙ**-පල්ලඞ්කයට සෑහෙනු ව අවකාශ වූ ස්ථානයෙහි; **සාමිකෙති** පධානවසෙන වුත්තත්තා ආහ: **තස්මිං කුලෙ යං කිඤ්චි විඤ්ඤූමනුස්සන්ති**. **ජානස්ස**-පෙ-**අනොවස්සකං අතික්කාමෙන්තියා** යි කියා ද **අජ්ඣොකාසෙ නිසීදිත්වා උපචාරං අතික්කාමෙන්තියා** යි කියා ද සම්බන්ධ කරණු.

**අසංහාරිමෙ**-නො ගෙණැ යැහැකි හස්තෙහි ද;

පඤ්චමං. ඡට්ඨං. සත්තමං.

1. කරණීයෙ-කඞ්ඛාවිතරණී. 2. ප්‍රාණිප්‍රදීප-භැම.
3. සන්තිට්ඨිතුං-කඞ්ඛාවිතරණී. 4. අනිබ්බිද්ධරච්ඡාය-ඇනැම්.

**පර** නම් උපස්ථාන ලද්දී යි. එහෙයින් **කිවු උපසම්පන්නං** යි. **අඤ්ඤස්ස සන්තිකං ගන්ත්වා අහං කිරණෂ්‍යකාදිනා වදති උජ්ඣාපෙන්ති නාම** ලාමකතො චින්තාපෙන්තියා.

**අට්ඨමං.**

**මනුස්සදොභග්ගෙන වා**- මනුෂ්‍යලොකයෙහි දුර්භාග්‍යබැවින් හෝ නොහොත් කාණ වෙම්ව යි පිළි වෙම්ව යි යනාදි විරූප බැවින් හෝ යැ යි සේයි.

**නවමං.**

**කෙවලං රොදන්තියා එව න වෙදෙන්තියා**- ඥාතිව්‍යසනාදීන් තමා නො පැහැර හුදෙක් හඬන්නියට ද;

**දසමං.**

**අන්ධකාරවග්ගො.**

**පඨමං. දුතියං.**

රාජචොරමනුස්සාග්ගිතොයවාලසිරිංසපාමනුස්සජීවිතබ්‍රහ්මචරියන්තරායකාති වුත්තෙසු **දසසු අන්තරායෙසු; කිඤ්චි න ලභන්ති**[1]-හු ගිදිකවු ආදි වූ කිසිවක් නො ලැබේ ද;

**තතියං.**

**සඞ්ඝම්පි භින්දන්ත**-දෙපළ එක් කොටැ සවිතාප්පයෙන්; **සඞ්කච්චිකා**-තනවැස්ම.

**චතුත්ථං.**

**සඞ්කමෙතබ්බචීවරං**-දිය යුතු ඇත්තවුන් කරා පැමිණ විය යුතු චීවරය.

**පඤ්චමං.**

**සමග්ගකාලෙ දස්සථ**-දූන් පිළී නො හැකෙයි. මිල මනා වැ ගියසමයෙහි ගෙණැ දෙව යි යනාදීන් මෙසේ **අනුදන්වා** වලකන්නියට ද;

**ඡට්ඨං.**

---

1, න ලභති-කඞ්ඛාවිතරණී,

චීවරවිභඞ්ගං-සිවුරු බෙදීම.

සත්තමං.

---

කප්පකතං-කප්බින්දු ඔබනලද;

අට්ඨමං.

---

සචෙ සමග්ගාම දස්සාම-ඉදින් සමගී වූවෝ නම් දෙම්හ යි; කිඤ්චාපි න සමග්ගාමාති වදන්ති-කිසි සේත් අසමගී වූවෝ වම්හ යි කියති. ඉද්දනි-දූත් මත්තෙහි;

නවමං.

---

අත්ථාරමූලකොති-කඨිනත්ථාරමූලකො; සමඅධිකය දීම කඨිනත්ථාරයට මැ යි. අකාලචීවරය වෙන මැ දෙත්.

දසමං.

---

නග්ගවග්ගො.

---

පඨමං.

---

පාවාර-පිඬාම්; අත්ථරක-අසත්ථරක රථත්ථරකාදි ඇතිරි; කටසාරක-කලාල්;

දුතියං, තතියං.

---

සද්ධිං විහරතීති=සද්ධිවිහාරිණී. අන්තෙ සමීපෙ වසතීති= අන්තෙවාසිනී. පරියෙසිත්වා-භෙසජ්ජාදිපර්යෙෂණය කොටැ;

චතුත්ථං.

---

කවාටබද්ධං-දොර ලූ.

පඤ්චමං, ඡට්ඨං.

---

සංසට්ඨා-ජඞ්ඝසත්ථ යැ සකටසත්ථ යැ යන සාර්ථයක් හා සමඟ.

සත්තමං.

---

**එසා**-මේ සිඛයෙහි; තිදන් හොරතුරු හෙයින් **රාජගඟං** යුහු.

**අඨමං.**

**නෙනාමි**-කිසිවක්හු විසින්; **උබ්බාලහායෙ වා**-නාහා පියන ලද්දියට හෙවත් උපද්‍රැතවූවා[1] හට ද;

**නවමං.**

**පච්චාගච්ජන්ති**-පච්ජා පච්ජා ආගච්ඡන්ති. අද්ධානාති මග්ගෙ;

**දසමං.**

**තුවට්ටවග්ගො.**

**උපවනං**-උයන; **උය්‍යානං**-බැහැර කෙළෙ උයන් නම්.

**පඨමං.**

**අභාජිමෙන වාලෙන**-ඇර හිදුවා සාල ව්‍යාඝ්‍රරූපයෙන්.

**දුතියං.**

**අසඞපිතං හොති**-යම් පමණ කැට කැට අතින් එව ගන්නා ලද ද; **කඃම්ං**-ඒ අසඞපිතය හෙවත් අත එව ගත්හු; **ගගාමගි වෙඩිතෙ**-හිද්දෙහි වෙළ කැර ඔත්කල්හි; **ඉදං හි සඞ්බාය**-මෙ හුකැටි හිද්දෙහි ඔනාබව සඳහා; **උජ්ජවුජ්ජවෙති චුන්නං**-කැට නග නගා හිද්දෙහි ඔත්සදැ යැ සි කියනලදි

**කප්පාසවිච්ඡනනං**-කපු සෙවීම;

**තතියං.**

**මාතාපිතරො**-මවුපියන් ලවා කිසි කම්මාන්තයක් තමහට නො කරවා; **තෙසං**-මාතාපිතුන්නං; **පූගගණිනාය**-එකි එකි පූව පූප නම්. එහෙයින් පූ ගණතින්;

**යාගුපානකාති** යාගුදනෙ; **සඞ්ඝ** යාහට හගු දීමෙහි ද; **තෙසං**-ඒ මනුෂ්‍යයන්ට; **අත්තනො කාව වෙය්‍යාවච්චකරස්ස**-ඒ තමාගේ වෙය්‍යාවච්චකරයහට ද;

**චතුත්ථං, පඤ්චමං, ජට්ඨං.**

**උතුනියො භික්ඛුනියො**-ඔසප් භික්ඛුනීහු; **අනිසාජිතබ්බා**-නො දී;

---

1, විචීයනට, විචියනට-කැම.

**පුත්ත පරියායෙන** වා-නැවත ඔසප් වූ වාරයෙහි;

**සත්තමං. අට්ඨමං.**

**ථරුසිප්පං**-ඛඩ්ගශිල්ප; **ආථබ්බණං** නම් එකාහති(?) අශ්වාදීන් මරා යාග කරණ සැටි කියන වේදයෙකි. **ඛීලමන්ත්‍ර** නම් උල[1] තබන මන්ත්‍රය යි. **වසීකරණ** නම් අනුන් වසඟ කරණ මන්ත්‍ර යි. **සොසාපනමන්ත්‍ර** නම් මන්ත්‍ර ජප කොට අනුන් වියළන මන්ත්‍ර යි. **අගදප්පයොගාදිභෙදං**-මෙසේ මන්ත්‍ර හා බෙහෙත් යෙදීම් ආදි වූ භෙද ඇති; **පරූපඝාතකරං**-මෙරමාගේ උපඝාතය(=විනාශය)කරන්නාවූ විද්‍යාව යුතැති.

**නවමං.**

**උග්ගණ්හෙය්‍යපි**-මේ ශික්ෂාපදවයෙ ම; **යථාක්කමං ඡබ්බග්ගියා** වෙව **සබ්බහුලා** ච යුහු. **ලෙඛ**-අභිසුවක විද්‍යායෙහි, අකුරෙහි ද හෙවත් අකුරු උගන්නා පිණිස; **ධාරණාය** ච-ධාරණ මන්ත්‍රශාස්ත්‍ර ඉගැන්මෙහි ද හෙවත් එකදවසක් එක් වේලෙක හෝ කී බිණූ දෑ විචාළකලැ සමෘතිශෛථිල්‍ය නැති වැ ධරන්නට සමර්ථ වීම් කියන ශිල්පයෙහි ද; **ගුත්තිපරිත්තා**-රක්ෂාමන්ත්‍ර; **පරිත්තා** යනු පරිපූර්ව වූ තා පාලනෙ යන ධාතු යි. **පරිත්තාශබ්දයෙන්** මන්ත්‍ර ද කියත්. **නාගමණ්ඩල**-සර්පමන්ත්‍ර යි. සර්පයන් නො වදනට පිරි යෙන් මන්ත්‍ර ලියා මඩුලු බඳිත් ලු.

**දසමං.**

**චිත්තාගාරවග්ගො.**

**සන්තං භික්ඛුං අනාපුච්ඡා** යි **මාතෘකායෙහි** නො කීව ද **පදභාජනියෙහි** මෙ මැ සිඛයෙහි අනුප්‍රඥප්තියක් බැවින් කීහු මෙ අනුප්‍රඥප්තිදෙක්හි අනාපුච්ඡා යි ද ජානං යි ද තොරතුරු[2](?) මුත් සන්තං භික්ඛුං සභික්ඛුං යී එක් මැ යි. **සීසානුලොකිකාති** පඨමං පවිසන්තීනං සීසං අනුලොකෙන්ති;

**පඨමං.**

අස්ස-මේ භික්ඛුහට; **භයං උපදංසෙස්ස**-මරු පියම්හ යනාදීන් භය දක්වා නම්.

**දුතියං.**

**යස්ස කස්සචි**-යම් කිසිවෙකින්;

**තතියං.**

1. තොල, කොල යී හැම. 2. තො තොරතුරු-ඇත්ම.

**ඡිමන්තිතා අප්පවාරිතා**-හත්තස්ස නිමන්තිතා සංඝස්ස අප්පවාරිතා යාගුමපිවන්ති, ආපුච්ඡා භුඤ්ජන්ති වට්ටති.

**චතුත්ථං.**

---

කුලෙ මච්ඡරෙ=**කුලමච්ඡරෙ**. සො **එතිස්සා අත්ථීති** වා **කුලං වා මච්ඡරායතීති** යනු ශීලාර්ථ හෙයින් කිහු. **කුලං වා මච්ඡරායතීති**-කුලය හෝ මසුරු කෙරේ නු යි; **කථං නාම න ගච්ඡෙය්‍යුන්ති**-ඒ භික්ෂුණීහු ඒ කුලයට කෙසේ නම් නො යෙද්දේ හෝ යි;

**පඤ්චමං.**

---

**සෙනාසනපඤ්ඤාපන**-හෝනා හිඳිනා ඇතිරි ආදි සෙන සුන් පැණවීම්;

**ඡට්ඨං.**

---

**සබ්බසඞ්ඝාතිකඤ්ඤන්ති**-එකාවාසිකවෙවාසික තෙවාසිකසමාන මස්සිකයට එක්කොට හකුළුවා තබන ඤත්ති යි. **තමඤ්ඤවාති** භික්ඛුනීසඞ්ඝස්ස එව;

**සත්තමං.**

---

**අත්ථායගමන**න්ති අත්ථාය අගමනං.

**අට්ඨමං.**

---

චාතුද්දසො උපොසථො හොති තෙරසෙ ගච්ඡන්ති. **ආපුච්ඡන ආයාචනාය**-ආපුච්ඡනායාචනායෙන් ධුරනික්ෂෙප යි.

**නවමං.**

---

**තතො ති**-ඒ ප්‍රදෙශයෙන්; **මෙ ඌරු පයිජ්ජිත්වා ගතා** යි සම්බන්ධ යි.

**දසමං.**

---

**ආරාමවග්ගො.**

---

**පඨමං.**

---

**යන්ති** යං වුත්තං;

**දුතියං.**

---

**මානනතො**-ආදර කරණ හෙයින්;

**තතියං.**

---

**උපසම්පදසම්මුතීති** ඤත්තිකම්මෙන සම්මුති; **යථා න දින්නා හොති** යි යොදනු. මතු ගිහිගතය කියන හෙයින් **ඉමාපි මහාසික්ඛමානා නාම** යි කීහු.

**චතුත්ථං.**

---

**ගිහිගතාති** අබ්‍රහ්මචරියාය එතං අධිවචනං.

**පඤ්චමං.**

---

**ඡට්ඨං. සත්තමං. අට්ඨමං. නවමං.**

---

**න වූපකාසාපෙය්‍ය**-ගෙන නො යවා ද; **න ආණාපෙය්‍ය** යනු යෙහි පදනී නො වේ.

**දුතියිකං අලභන්තියා** ගිලානාය-ඇය කැටි වැ යවන් නට සුදුසු දෙවන එකක නො ලබන්නියට ද;

**දසමං.**

---

**ගබ්භිනිවග්ගො.**

---

**පඨමදුතියතතියානි** ප්‍රථමද්විතීයතෘතීය ශික්ෂාපදයෝ; **තීණි ගිහිගතසික්ඛාපදෙහි සදිසානෙව**-ගිහිගත ශික්ෂාපදයන් තුන්දෙන හා යථාක්‍රමයෙන් සමානයෝ යි **ගිහිගතා** යන් නෙහි දෙළොස් හැවිරිද්දෙහි පටන් අටළොස් හැවිරිද්ද දක්වා ගිහිගත යැ යි කිය යුත්තේ යි. අටළොස් හැවිරිද්දෙහි පටන් ගිහිගත කුමාරිභූත යැ යි දෙක මැ කියත් ලැබේ. **සම්මුති කම්මාදීසු**-වත් පුරන්නට සම්මුති ය, උපසම්පදඤත්ති ය, කම්මවාක්‍යය යන මෙහි; **අයං පනාති** ගිහිගතා. **සා පනායං සාමණෙරා සා කුමාරිභූතාති** වුත්තා. මේ කුමාරිභූතා යන් නෙහි කුමාරිකා වනාහි අටළොස්හැවිරිද්දෙහි සික්ඛාසම්මුතිය ලදින් විසිහැවිරිදිකලැ උපසම්පදා ලැබේ. මීට ඌන වුවහොත් උපසම්පදා නො අර යි දත යුතු. මෙහි ගිහිගතයා සම යැ යි කී හෙයින් අටළොස් හැවිරිද්දෙන් යටැ කුමාරිභූතභාවය නො ලැබේ.

**තතියං.**

---

**දුක්කටානං** - දුක්කටයන් දෙන්නාට අතුරු වෑ;

**චතුත්ථං. පඤ්චමං.**

**ඤාතිසම්මුතියා** යාචිතාය - උපසම්පදා සම්මුතිය ඉල්වූ කල්හි; **නූන** - එකාන්තයෙන්; **ඛීයන්ති** අවණ්ණම් ප්‍රකාශ කෙරෙත්.

**ඡට්ඨං. සත්තමං.**

**උභයත්ථ**[1] - යන ශික්ෂාපදද්වයයෙහි; **එවාහං තං වුට්ඨාපෙස්සාමි** යන ප්‍රතිඥාව යෑ; **ආකඞ්ඛිතානි පවත්ති** - ප්‍රාර්ථිතචීවර යාගේ නිෂ්පත්තිය යෑ.

**අට්ඨමං.**

**ඝරං** - තමන්ගේ ගෘහයට වදනා; **ඝරසාමිකා විය** - ඝර ස්වාමීන් මෙන්; **අයම්පි** - මෙ ද; **සොකං ආවිසති ඉති** - තමා සතන්හි උපන් ශොකයට තොමෝ ම වදී නු යි; **සා ආවිසති** - යම් ශොකයකට වදී ද; **සො** - එ ශොකය; **අයං** - මට;

**නවමං. දසමං.**

**පාරිවාසිකෙන** - විසූවාවූ; **උස්සාරණා වා කයිරති** - පහ වච යනාදීන් තබා පීම හෝ කරණුලැබේ ද; එ පමණ එතැනින් ඉගිල ගිය බව යි **පරිසපාරිවාසිය** නම්. **එකං අජ්ඣෙසනාති** - එක් භික්ෂුවක්හට ආරාධනා කෙරේද්ද; ඇණවතුදු යි කීතියා යි. **ගන්ථිං** - ඒ ධර්මකථිකයා; රාත්‍රිය ඉකුත්බව යි **රත්තිපාරිවාසිය** නම්. **උපචම්මගා** - ඉක්මෙන්නේ යි.

**එකාදසමං.**

**එකන්තරිය**න්ති **එකෙන** සංවච්ඡරෙන **අනන්තරබාහිකං** කත්වා.

**ද්වාදසමං.**

**එකන්තරියං** වුට්ඨාපනං **කරෙය්‍යාති** යි ක්‍රියාවිශෙෂණ කටයුතු. **එකන**න්ති **සික්ඛමානං**.

**තෙරසමං.**

**කුමාරිභූතවග්ගො.**

—(◦)—

1. උභයම්පි - සබ්බාචීතරණී.

**අපනෙත්වා**[1]-හිසින් පහ කොට;

**පඨමං.**

---

**වයහාදිනා**-සිව්ගෙ ආදීන්;

**දුතියං.**

---

**සඞ්ඝාණිං**-හිණැ පලඳනා ආභරණ යි. එහෙයින් කීහු "**යං කිඤ්චි කටූපගං**" යි. **කටූපගං**-කටිසන්ධියට උපග වූ, යොග්‍ය වූ; **කටිසුත්තකං**-හිණැ පලඳනා පිරිත්හුආදීහු යි.

**තතියං.**

---

**වත්ථුගණනාය**-ව්‍යතික්‍රමගණතින්;

**චතුත්ථං. පඤ්චමං.**

---

**ගන්ධවාසිතකෙන**-සුවඳ ගැන් වූ; **තිලපිට්ඨෙන**-තලමුරුවටින්;

**ඡට්ඨං.**

---

**උබ්බට්ටාපෙය්‍ය**-උලවා ද; **සම්බාහාපෙය්‍ය**-මඩවා ද;

**සත්තමං. අට්ඨමං. නවමං, දසමං.**

---

**අභිමුඛමෙවාති අපෙතා න** ඉති සම්බන්ධො. **උපචාරන්ති** වාදස හත්ථං. **ඡමායපි**-සිස් බිම්හි දූ;

**එකාදසමං.**

---

**තත්ථ ගත්ථාති** සුත්තාභිධම්මාදිසු; **අනොදිස්සාති** සුත්තං වා විනයං වා අභිධම්මං වා අනොදිස්ස;

**ද්වාදසමං. තෙරසමං.**

---

**ඡත්තවග්ගො.**

---

**පාචිත්තියවණ්ණනා** යි.

—(ං)—

1. අපනාමෙත්වා-කඞ්ඛාවිතරණී.

**සඤ්ඤාති** භික්ඛුනීපාතිමොක්ඛ; **සමුට්ඨානවිනිච්ඡයො**-ශික්ෂාපදෝත්පත්තිනිශ්චයය; **ගිරග්ගසමජ්ජ**-පර්වතයාගේ අග්‍රභාගයෙහි කැටුම්සිබය ද; ගිරග්ගසමජ්ජං යනු නිදානවශයෙන් කීතියා යැ. පෙල හෙයින් "නච්චං වා ගීතං වා දස්සනාය ගච්ඡෙය්‍ය පාචිත්තියං" යන සිඛය යි. **එත්ථ**-අචිත්තක යැ අකුසලචිත්ත යැ යන මෙහි; **පුබ්බෙ වුත්තවිනිච්ඡය**නානි යෙසං මංසං කප්පති තෙසං සප්පීති වුත්තවිනිච්ඡයං;

**පාලියං අනාගතෙසු පන අණ්ඩුපි** යනු විචාරන්නට තුබූ ය. **අගම්භීර** වූ **සෙස්ස** පාඨානුසාරයෙන් දත යුතු.

### පාචිත්තියසනීසා.

---

තත්ථ **මෙථුනනානි** ඉදං තාව පඨමපාරාජිකං නාම සමුට්ඨානසීසං. **සෙසානි** තෙන සදිසානි. තත්ථ-ඒ **සමුට්ඨානශීර්ෂ** යෙහි; **සුක්කසංසග්ගානි** සුක්කවිස්සට්ඨිය ද, කායසංසර්ගය ද, **අනියතා පඨමිකා**-පළමු වන **අනියත**ශික්ෂාපදය ද, **පුබ්බූප පරිපාචිතානි** "ජනං පුබ්බූපගතං භික්ඛුං" යන ශික්ෂාපදය ද, භික්ඛුනීපරිපාචිතපිණ්ඩපාතශික්ෂාපදය ද; **රහො භික්ඛුනියා සහානි** "භික්ඛුනියා සද්ධිං රහො නිසජ්ජං" යන ශික්ෂාපදය ද;

**සභොජනෙ රහො ද්වෙචාති** "සභොජනෙ කුලෙ අනුපඛජ්ජ නිසජ්ජ ශික්ෂාපද රහොනිසජ්ජශික්ෂාපදයෝ දෙදෙන ද; **අඞ්ගුලි උදකෙ හසනානි** අඞ්ගුලිපතොදකය ද, උදකෙ හස්සධම්ම ශික්ෂාපදය ද; **පහාරෙ උග්ගිරෙ ද්වෙචාති** පහාරදානශික්ෂා පදය ද, තලසත්තිකඋග්ගිරණශික්ෂාපදය ද; **තෙපඤ්ඤාසා ච සෙඛියානි** පරිමණ්ඩලනිවාසනාදි වූ බුද්ධකවණ්ණනාවශයෙන් කියනලද තෙපණස් සෙඛිය ශික්ෂා පදයෝ ද;

**අධක්ඛකං ගාමවස්සුතානි** භික්ෂුණීන්ගේ අධක්ඛකශික්ෂාපදය ද, ගාමන්තගමනශික්ෂාපදය ද, අවස්සුතස්ස හත්ථතො ඛාදනීයගහණශික්ෂාපදය ද; **තලමට්ඨඤ්ච සුද්ධිකානි** තලඝාතක යැ, ජතුමට්ඨක යැ, උදකසුද්ධික යැ යන **ශික්ෂාපද** තුණ ද; **වස්සං වුත්ථාච**-"ඡප්පඤ්චයොජනානි" යන **ශික්ෂාපදය** ද, ඔවාදය අගමනශික්ෂාපදය ද;

**ඉමෙ සික්ඛාති** ඉමා සික්ඛායො යි ලිඞ්ගවිපරියය කරණ ලදී. **කායමානසිකා කතාති** කායචිත්තසමුට්ඨානයෙන් කරණ ලද්හු.

**අදින්නන්ති** ඉදං තාව අදින්නාදානන්ති වා දුතියපාරාජිකන්ති වා එකං සමුට්ඨානසීසං. සෙසාති තෙන සදිසාති. **තත්ථ**–ඒ අදින්නාදානසමුට්ඨාන යැ යි ද දුතියපාරාජිකසමුට්ඨාන යැ යි ද කියනලද අදින්නාදානසමුට්ඨානසීසයෙහි; මෙ ප්‍රධාන කොට මෙ හා සමුට්ඨාන කියම්හ යි සේයි. **විග්ගහුත්තරීනන්ති** මනුස්සවිග්ගහ යැ උත්තරිමනුස්සධම්ම යැ යන ශික්ෂාපද දෙක ද; **දුට්ඨුල්ලඅත්තකාමන්ති** දුට්ඨුල්ලවාචා යැ අත්තකාමපාරිචරියා යැ යන ශික්ෂාපද දෙක ද; **අමූලා අඤ්ඤභාගියාති** අමූලඅඤ්ඤභාගිය ශික්ෂාපදයෝ දෙදෙන ද; **අනියතා දුතියකාති** ද්විතීයානියත ශික්ෂාපදය ද;

**අච්ඡින්දෙ පරිණාමනෙති** "සාමං චීවරං දත්වා අච්ඡින්දෙය්‍ය," "ජානං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමෙය්‍ය" යන මෙ දෙ ශික්ෂාපදය ද; **මුසාඔමසපෙසුඤ්ඤාති** මුසාවාදශික්ෂාපදය ද, ඔමසවාදශික්ෂාපදය ද, භික්ඛුපෙසුඤ්ඤශික්ෂාපදය ද; **දුට්ඨුල්ලා පඨවිං ඛණෙති** දුට්ඨුල්ලාපත්තිආරොචනශික්ෂාපදය ද, පඨවිඛණනශික්ෂාපදය ද; **භූතං අඤ්ඤඤ්ච උජ්ඣාපෙති** භූතගාමසිඛය ද, අඤ්ඤවාදසිඛය ද, උජ්ඣාපනසිඛය ද;

**නික්කඩ්ඪනං සිඤ්චනඤ්චාති** විහාරනික්කඩ්ඪනසිඛය ද, සප්පාණොදකයෙන් තිණාදිසිඤ්චනසිඛය ද; **ආමිසහෙතු භුත්තාවීනන්ති** "ආමිසහෙතු භික්ඛූ භික්ඛුනියො ඔවදන්ති" යන සිඛය ද, "භුත්තාවිං පවාරිතං අනතිරිත්තෙන ඛාදනීයෙන" යනාදීන් පවාරණසිඛය ද; **එහි අනාදරියභිංසාති** "එහාවුසො ගාමං වා" යනාදි සිඛය ද, අනාදරිය සිඛය ද, භිංසාපනසිඛය ද; **අපනිධෙ ච ජීවිතන්ති** පත්තාදීනං අපනිධාන සිඛය ද, සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපණ සිඛය ද;

**ජානං සප්පාණකං කම්මන්ති** "ජානං සප්පාණකං උදකං පරිභුඤ්ජෙය්‍ය" යන සිඛය හා පුනකම්මාය උක්කොටනසිඛය ද; **ඌනසංවාස නාසනාති** "ඌනවීසතිවස්සං" යන සිඛය හා "ජානං තථාවාදිනා" යන උක්ඛිත්තකයා හා සංවාස සිඛය ද, නාසිතසාමණෙරසම්භොගසිඛය ද; **සහධම්මිකං විලෙඛා චාති** "භික්ඛූහි සහධම්මිකං වුච්චමානො" යන සිඛය හා "විලෙඛාය සංවත්තන්තීති" යන සිඛය ද; **මොහනා අමූලකෙන චාති** "මොහනකෙ පාචිත්තියං" යන සිඛය ද, "අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙය්‍ය" යන සිඛය ද;

**කුක්කුච්චං බීජනං දදාති** කුක්කුච්චුප්පාදනසික්ඛාපදය හා "ධම්මිකානං කම්මානං ඡන්දං දත්වා ඛීයන" සික්ඛාපදය ද; **පරිණාමෙය්‍ය පුග්ගලෙති** "සඞ්ඝිකං ලාභං පරිණතං පුග්ගලස්ස පරිණාමෙය්‍ය" යන සික්ඛාපදය ද; **කිංතෙන අකාලං අච්ඡින්දෙති** "කිංතෙන අය්‍යෙ එසො පුරිසපුග්ගලො කරිස්සති" යන සික්ඛාපදය හා "අකාලචීවරං කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙය්‍ය" යන සික්ඛාපදය හා "භික්ඛුනියා සද්ධිං චීවරං පරිවත්තෙත්වා අච්ඡින්දෙය්‍ය" යන සික්ඛාපදය ද; **දුග්ගහිං නිරයෙන චාති** "දුග්ගහිතෙන දූපධාරිතෙන පරං උජ්ඣාපෙය්‍ය" යන සික්ඛාපදය හා "නිරයෙන වා බ්‍රහ්මචරියෙන වා අභිසපෙය්‍ය" යන සික්ඛාපදය ද;

**ගණං විභඞ්ගං දුබ්බලාසා**ති "ගණස්ස චීවරලාභං අන්තරායං කරෙය්‍ය" යන සික්ඛාපදය හා "ධම්මිකං චීවරවිභඞ්ගං පටිබාහෙය්‍ය" යන සික්ඛාපදය හා "දුබ්බලචීවරපච්චාසාය චීවරකාලසමයං අතික්කාමෙය්‍ය" යන සික්ඛාපදය ද; **කඨිනාඵාසුපස්සයාති** "ධම්මිකං කඨිනුද්ධාරං පටිබාහෙය්‍ය" යන සික්ඛාපදය හා "භික්ඛුනියා සඤ්චිච්ච අඵාසුං කරෙය්‍ය" යන සික්ඛාපදය හා "භික්ඛුනියා කුපිතා අනත්තමනා නික්කඩ්ඪෙය්‍ය වා" යන භික්ඛුනූපස්සයෙන් නික්කඩ්ඪනසික්ඛාපදය ද; **අක්කොසචණ්ඩිමච්ඡරීති** "භික්ඛුං අක්කොසෙය්‍ය වා පරිභාසෙය්‍ය වා" යන සික්ඛාපදය හා "චණ්ඩිකතා ගණං පරිභාසෙය්‍ය" යන සික්ඛාපදය හා "කුලමච්ඡරිනී අස්ස" යන සික්ඛාපදය ද; **ගබ්භිනී ච පායන්තියාති** "ගබ්භිනිං වුට්ඨාපෙය්‍ය" යන සික්ඛාපදය හා "පායන්තිං වුට්ඨාපෙය්‍ය" යන සික්ඛාපදය ද;

**ද්වෙ වස්සා සික්ඛාසඞ්ඝෙනාති** "ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං සික්ඛමානං වුට්ඨාපෙය්‍ය" යන සික්ඛාපදය හා "සික්ඛිතසික්ඛං සික්ඛමානං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙය්‍ය" යන (දෙ) සික්ඛාපදය ද; **තයො චෙව ගිහිගතාති** "ඌනද්වාදසවස්සං ගිහිගතං" යන සික්ඛාපදය හා "පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං" යන සික්ඛාපදය ද, "ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඞ්ඝෙන අසම්මතං" යන (තුන්) සික්ඛාපදය ද; **කුමාරීභූතා තිස්සො චාති** "ඌනවීසතිවස්සං කුමාරිභූතං" යනාදීන් කියනලද තුන් සික්ඛාපදය ද; **ඌනද්වාදසසම්මතාති** "ඌනද්වාදසවස්සා වුට්ඨාපෙය්‍ය" යන සික්ඛාපදය හා "පරිපුණ්ණද්වාදසවස්සා සඞ්ඝෙන අසම්මතා වුට්ඨාපෙය්‍ය" යන (දෙ) සික්ඛාපදය ද;

**අලං තාව සොකාවස්ස**න්ති "අලං තාව තෙ අය්‍යෙ වුට්ඨාපිතෙන" යන සික්ඛාපදය ද, "සොකාවස්සං සික්ඛමානං වුට්ඨාපෙය්‍ය" යන (දෙ) සික්ඛාපදය ද; **ඡන්දාඅනුවස්සා ච ද්වෙති** "පාරිවාසිකඡන්ද

දූතෙන සික්ඛමානං වුට්ඨාපෙය්‍ය" යන සිඛය හා "අනුවස්සං වුට්ඨාපෙය්‍ය" යන සිඛය හා "එකං වස්සං වෙ වුට්ඨාපෙය්‍ය" යන (තුන්) සිඛය ද; **සමුට්ඨානා තිකා කතාති** අදින්නාදාන සමුට්ඨාන නම් වූ මෙ යථොක්ත ශික්ෂාපදයෝ තිසමුට්ඨානයක යි එක් කරණලදහු.

**සඤ්චරි කුටිවිහාරෙති** සඤ්චරිත්තසිඛය හා "සඤ්ඤාචිකාය කුටිං කාරෙය්‍ය" යන සිඛය හා "මහල්ලකං විහාරං කාරෙය්‍ය" යන තුන්) සිඛය ද; **ධොවනඤ්ච පටිග්ගහොති** "අඤ්ඤාතිකාය භික්ඛුනියා පුරාණචීවරං ධොවාපෙය්‍ය" යන සිඛය ද, එසේ මැ පටිග්ගහණසිඛය ද; **විඤ්ඤත්තඤ්ඤාතකං අභිහට්ඨුන්ති** "අඤ්ඤාතකං ගහපතිං චීවරං විඤ්ඤාපෙය්‍ය" යන සිඛය හා "බහූහි චීවරෙහි අභිහට්ඨුං පවාරෙය්‍ය" යන සිඛය ද; **උභින්නං දූතකෙන චාති** "චීවරචෙතාපන්නං උපක්ඛටං හොති" යන ශික්ෂාපද දෙක ද, "දූතෙන චීවරචෙතාපන්නං පහිණෙය්‍ය" යන සිඛය ද;

**කොසිය සුද්ධ ද්වෙභාගා ඡබ්බස්සානි නිසීදනන්ති** "කොසිය මිස්සකං සන්ථතං" යනාදි ශික්ෂාපද පස ද; **රිඤ්චන්ති රූපිකා චෙව චාති** භික්ඛුවිභඞ්ගයෙහි "රිඤ්චන්ති උද්දෙසං" යි ආ එළකලොමධොවාපන සිඛය හා රූපියපටිග්ගහණ සිඛය ද; **උභො නානප්පකාරකාති** රූපියසංවොහාරය හා කයවික්කයසිඛය ද;

**ඌනබන්ධනවස්සිකාති** "ඌනපඤ්චබන්ධනෙන පත්තෙන" යන සිඛය හා වස්සිකසාටිකසිඛය ද; **සුත්තං විඤ්ඤාපෙත්වා චාති** "සුත්තං විඤ්ඤාපෙත්වා චීවරං වායාපෙය්‍ය" යන සිඛය හා "තන්තවායෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය" යන සිඛය ද; **ද්වාරදානා සිබ්බනී චාති** "යාවද්වාරකොසා අග්ගළට්ඨපනාය" යන සිඛය හා "අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං දදෙය්‍ය" යන සිඛය හා "චීවරං සිබ්බෙය්‍ය" යන(තුන්)සිඛය ද; **පූවපච්චය ජොති චාති** "පූවෙහි වා මන්ථෙහි වා" යන සිඛය හා චාතුමාස පච්චයපවාරණසිඛය හා "ජොතිං සමාදහෙය්‍ය" වා යන (තුන්) සිඛය ද;

**රතනං සූචි මඤ්චො ච තූලං නිසීදනකණ්ඩු ච-වස්සිකා ච සුගතෙනාති** රතනසිඛය හා සූචිඝරශික්ෂාපදාදි වූ සත් සිඛය ද; **විඤ්ඤත්ති අඤ්ඤචෙතනා.**

**සඞ්ඝිකා මහාජනි චෙව පුග්ගලො ගරුකො ලහුන්ති** "යා පන භික්ඛුනී අඤ්ඤං විඤ්ඤාපෙත්වා අඤ්ඤං විඤ්ඤාපෙය්‍ය" යනාදි

වූ ශික්ෂාපදයෝ නවදෙන ද; මෙ **විඝාසා සාවිකා** චාති "උච්චාරං වා පස්සාවං වා සඞ්කාරං වා විඝාසං වා තිරොකුඩ්ඩෙ වා" යනාදි සිඛය හා "හරිතෙ ඡඩ්ඩෙය්‍ය වා ඡඩ්ඩාපෙය්‍ය වා" යන සිඛය ද, උදකසාටිකසිඛය ද; **සමණචීවරෙන** චාති "සමණචීවරං දදෙය්‍ය" යන සිඛය ද;

**භෙදනුවත්තනදුබ්බචදූසදුට්ඨුල්ලදිට්ඨි** චාති සඞ්ඝභෙදසිඛය හා භෙදානුවත්තකසිඛය හා දුබ්බචසිඛය හා කුලදූසකසිඛය හා දුට්ඨුල්ලපටිච්ඡාදනසිඛය හා දිට්ඨිඅප්පටිනිස්සජ්ජනසිඛය ද; **ඡන්දං උජ්ජග්ඝිකා** මෙ චාති "ඡන්දං අදත්වා උට්ඨායාසනා" යන සිඛය හා උජ්ජග්ඝිකාය අන්තරඝරෙ ගමනනිසීදන දෙ සිඛය ද; මෙ ම **සද්දුති** "අප්පසද්දො අන්තරඝරෙ ගමිස්සාමි, නිසීදිස්සාමි" යන දෙ සිඛය ද; **න ව්‍යාහරෙති** "න සකබළෙන මුඛෙන ව්‍යාහරිස්සාමි" යන සිඛය ද; **ඡමා නීචාසනෙ ඨානං පච්ඡතො උප්පථෙන** චාති "ඡමාය නිසීදිත්වා, නීචෙ ආසනෙ නිසීදිත්වා, ඨිතො නිසින්නස්ස, පච්ඡතො ගච්ඡන්තො පුරතො ගච්ඡන්තස්ස, උප්පථෙන ගච්ඡන්තො පථෙන ගච්ඡන්තස්ස යන මෙතෙක් සිඛය ද; **වජ්ජානුවත්තිගහණා**ති වජ්ජපටිච්ඡාදනය හා උක්ඛිත්තානුවත්තනසිඛය හා හත්ථග්ගහණාදිසඞ්ඛ්‍යාත වූ තුන් පාරාජිකා සිඛයෝ ද; **ඔසාරෙ පච්චාචික්ඛණා**ති "අනපලොකෙත්වා කාරකසඞ්ඝං අනඤ්ඤාය ගණස්ස ඡන්දං ඔසාරෙය්‍ය" යන සිඛය හා 'බුද්ධං පච්චාචික්ඛාමි" යනාදි සිඛය ද,

**කිස්මිං සංසට්ඨා** මෙ වධීති "කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතා" යන සිඛය හා "භික්ඛුනියො පනෙව සංසට්ඨා විහරන්ති" යන සිඛය හා "යා පන භික්ඛුනී එවං වදෙය්‍ය සංසට්ඨාව අය්‍යෙ තුම්හෙ විහරථ" යන සිඛය හා "අත්තානං වධිත්වා වධිත්වා" යන මෙතෙක් සිඛයෝ ද; **විසිබ්බෙ දුක්ඛිතාය** චාති "භික්ඛුනියා චීවරං විසිබ්බෙත්වා වා විසිබ්බාපෙත්වා වා" යන සිඛය හා "දුක්ඛිතං සහජීවිනිං" යන (දෙ) සිඛයද; **පුන සංසට්ඨා න වූපසමෙති** "සංසට්ඨා විහරෙය්‍ය ගහපතිනා වා ගහපතිපුත්තෙන වා" ති එවං පුන වුත්තසංසට්ඨසිඛය හා "එහය්‍යෙ ඉමං අධිකරණං වූපසමෙහීති වුච්චමානා" යන (දෙ) සිඛය ද; **ආරාමඤ්ච පවාරණා**ති "ජානං සභික්ඛුකං ආරාමං" යන සිඛය හා "උභතො සඞ්ඝෙ තීහි ඨානෙහි නප්පවාරෙය්‍ය" යන (දෙ) සිඛය ද;

**අන්වද්ධං සහජීවි** මෙති "අන්වද්ධමාසං භික්ඛුනියා භික්ඛුසඞ්ඝතො" යන සිඛය හා "සහජීවිනිං වුට්ඨාපෙත්වා වෙ වස්සානි නෙව අනුග්ගණ්හෙය්‍ය" යන සිඛය හා "සහජීවිනිං වුට්ඨාපෙත්වා නෙව

වූපකාසෙය්‍ය" යන (දෙ) සිඛය ද; **චීවරං අනුබන්ධනාති** "සචෙ මෙ ත්වං අය්‍යෙ චීවරං දස්සසි" යනාදි සිඛය හා "සචෙ මෙ ත්වං අය්‍යෙ වෙ වස්සානි අනුබන්ධිස්සසි" යන (දෙ) සිඛය ද;

**උභතො කසිනං භිණ්ණි**ති "නිහිතචීවරකම්මං පන භික්ඛුනා උභතො කම්මං කසිනෙ" යනාදීන් කියනලද තුන් ශික්ෂාපදය ද; **පරමං සත්තාහභෙසජ්ජ**න්ති "දසාහපරමං අතිරෙකපත්තො" යන සිඛය හා "පටිසායනීයානි භෙසජ්ජානි" යන (දෙ) සිඛය ද; **අචෙමකං චාපි සාසඞ්ක**න්ති අචෙමකචීවරසිඛය හා එයට එක්තීති වැති සාසඞ්කසිඛය ද; **පක්කමන්තෙන වා දුවෙති** "තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය" යි එක තැනැ තී දෙ සිඛය ද;

**උපස්සයං පරම්පරන්ති** "භික්ඛුනුපස්සයං උපසඞ්කමිත්වා භික්ඛුනියො ඔවදෙය්‍ය" යන සිඛය හා "පරම්පරභොජනෙ පාචිත්තියං" යන සිඛය ද; **අනතිරිත්තං නිමන්තනාති** "අනතිරිත්තං ඛාදනීයං වා" යන සිඛය හා "නිමන්තිතො සභත්තො සමානො" යන දෙ සිඛය ද; **විකප්පං රඤ්ඤො විකාලෙති** "සාමං චීවරං විකප්පෙත්වා" යන සිඛය හා "රඤ්ඤො ඛත්තියස්ස" යන සිඛය හා "විකාලෙ ගාමං පවිසෙය්‍ය" යන (තුන්)සිඛය ද; **වොසාසාරඤ්ඤකෙන චාති** "වොසාසමානරූපා ඨිතා" යන සිඛය හා "තථාරූපෙසු ආරඤ්ඤකෙසු සෙනාසනෙසු" යන පුබ්බෙ අප්පටිසංවිදිතසිඛය ද;

**උස්සයා සන්නිචයඤ්චාති** "උස්සයවාදිකා විහරෙය්‍ය" යන සිඛය හා "පත්තසන්නිචයං කරෙය්‍ය" යන දෙ)සිඛය ද; **පුරෙ පච්ඡා විකාලෙ චාති** "යා පන භික්ඛුනී පුරෙභත්තං කුලානි උපසඞ්කමිත්වා" යන සිඛය හා "පච්ඡාභත්තං කුලානි උපසඞ්කමිත්වා" යන සිඛය හා "විකාලෙ කුලානි උපසඞ්කමිත්වා" යන (තුන්) සිඛය ද; **පඤ්චාහිකා සඞ්කමන්ති** "පඤ්චාහිකං සඞ්ඝාටිචාරං අතික්කාමෙය්‍ය" යන සිඛය හා "චීවරං සඞ්කමනීයං ධාරෙය්‍ය" යන (දෙ)සිඛය ද; **ද්වෙ ආවසථෙන චාති** "ආවසථචීවරං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජෙය්‍ය" යන සිඛය හා "ආවසථං අනිස්සජ්ජිත්වා චාරිකං පක්කාමෙය්‍ය" යි මෙසේ ආවසථය හා සමග කියනලද දෙ සිඛය ද;

**පසාඛෙ ආසනෙ චෙවාති** "පසාඛෙ ජාතං ගණ්ඩං වා" යන සිඛය හා "භික්ඛුස්ස පුරතො අනාපුච්ඡා ආසනෙ නිසීදෙය්‍ය" යන (දෙ)සිඛය ද;

**එළකලොමා චෙ ව සෙය්‍යාති** එළකලොමසිඛය හා අනුපසම්පන්න මාතුගාම දෙදෙනා හා සහසෙය්‍ය දෙ සිඛය ද; **ආහච්ච පිණ්ඩභොජන**න්ති ආහච්චපාදසිඛය හා ආවසථපිණ්ඩ

භොජනසික්ඛය ද; **ගණං විකාලෙ සන්නිධින්**ති ගණභොජනසික්ඛය හා විකාලභොජනසික්ඛය හා සන්නිධිකාරසික්ඛය හා තුන් සික්ඛය ද; **දන්තපොණං නග්ගචෙලකා**ති දන්තපොනසික්ඛය හා අචෙලකසික්ඛය ද;

**උය්‍යුත්තං වසෙ උය්‍යොධි**ති "උය්‍යුත්තං සෙනං දස්සනාය" යන සික්ඛය හා "සෙනාය වසෙය්‍ය" යන සික්ඛය හා "උය්‍යොධිකං වා-පෙ-අනීකදස්සනං වා ගච්ඡෙය්‍ය" යන මේ තුන් සික්ඛය ද;

**සුරා ඔරෙ නහායනා**ති සුරාපානසික්ඛය හා 'ඔරෙනද්ධමාසං නහායෙය්‍ය" යන (දෙ) සික්ඛය ද; **දුබ්බණ්ණා මෙ දෙසනිකා**ති "තිණ්ණං දුබ්බණ්ණකරණානං" යන සික්ඛය හා 'අනාරඤ්ඤං පච්ඡාය හත්ථතො" යන සික්ඛය හා "සෙඛසම්මතානි කුලානි" යන උක්තාවශෙෂපාටිදෙසනීයවර්ගය ද; **ලසුණ නච්චදස්සනම්මනා**ති ලසුණසික්ඛාපදය හා "භික්ඛුස්ස භුඤ්ජන්තස්ස පානීයෙන වා විධූපනෙන වා" යන සික්ඛය හා "නච්චං වා ගීතං වා වාදිතං වා දස්සනාය" යන සික්ඛය ද;

ඉතො පරං පාළිං විරජ්ඣිත්වා ලිඛන්ති. යථා පන අත්ථං වණ්ණයාම, එවමෙත්ථ අත්ථො වෙදිතබ්බො.

**නහානං අත්ථරණං සෙය්‍යා**නාති "නග්ගා නහායෙය්‍ය" යන සික්ඛය හා "එකත්ථරණපාවුරණා තුවට්ටෙය්‍යුං" යන සික්ඛය හා "එකමඤ්චෙ තුවට්ටෙය්‍යුං" යන (තුන්) සික්ඛය ද; **අන්තොරට්ඨෙ තථා බහි**ති "අන්තොරට්ඨෙ සාසඞ්කසම්මතෙ" යන සික්ඛය හා එසේ ම "බහිරට්ඨෙ[1]" යන සික්ඛය ද; **අන්තොවස්සං චිත්තාගාර**නාති "අන්තොවස්සෙ චාරිකං පක්කමෙය්‍ය" යන සික්ඛය හා "රාජාගාරං වා චිත්තාගාරං"වා යන සික්ඛය ද; **ආසන්දිං සුත්තකන්තන**නාති "ආසන්දිං වා පල්ලඞ්කං වා" යන සික්ඛය හා "සුත්තං කන්තෙය්‍ය" යන මේ (දෙ) සික්ඛය ද;

**වෙය්‍යාවච්චං සහත්ථා වා**ති "ගිහිවෙය්‍යාවච්චං කරෙය්‍ය" යන සික්ඛය හා "අගාරිකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සහත්ථා ඛාදනීයං වා භොජනීයං වා දදෙය්‍ය" යන මේ (දෙ) සික්ඛය ද; **අභික්ඛුකාවාසකෙන චා**ති "අභික්ඛුකෙ ආවාසෙ වස්සං වසෙය්‍යා"ති ඉදමෙතං සන්ධාය වුත්තං. **ඡත්තං යානඤ්ච සඞ්ඝාණි**ති "ඡත්තුපාහනං ධාරෙය්‍ය" යන සික්ඛය හා "යානෙන යායෙය්‍ය" යන සික්ඛය හා "සඞ්ඝාණිං ධාරෙය්‍ය" යන මේ (තුන්) සික්ඛය ද; **අලඞ්කාරං ගන්ධවාසිත**නාති "ඉත්ථාලඞ්කාරං ධාරෙය්‍ය" යන සික්ඛය හා "ගන්ධවණ්ණකෙන නහායෙය්‍ය" යන සික්ඛය හා "වාසිතකෙන පිඤ්ඤාකෙන නහායෙය්‍ය" යන මේ (තුන්) සික්ඛය ද;

1. තිරෙ රට්ඨෙ - පාතිමොක්ඛ.

**භික්ඛුනියෝති** ආදීනා "භික්ඛුනියො උම්මද්දාපෙය්‍ය වා" යනාදීන් කියනලද ශික්ෂාපදයෝ සතරදෙන ද; **අසඞ්කච්චිකා ආපත්තීති** "අසඞ්කච්චිකා ගාමං පවිසෙය්‍ය පාචිත්තියං" යි මෙසේ කියනලද්දවූ ආපත්ති ද; **චත්තාරීසා චතුත්තරීනි** මෙ සියලු සූසාලිස් ශික්ෂාපදයෝ;

**කායෙන න වාචාචිත්තෙන කායචිත්තෙන න වාචතොති** කායෙන චෙව කායචිත්තෙන ච සමුට්ඨහන්ති, න වාචාචිත්තෙන න වාචතොති අත්‍ථො. තයින් කායචිත්තයෙනුදු උපදනාහ, වාචාචිත්තයෙන් ද වචසින් ද නො උපදනාහ යි සේයි. **ඡ සමුට්ඨානිකා සබ්බෙ සමා එළකලොමකාති** යන මෙ අගම්භීර වූ අර්ථ ඇත්තේ මැ යි.

**පදං අඤ්ඤත්‍රසම්මතාති** පදසොධම්මසිඛය හා "මාතුගාමස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙය්‍ය අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහෙන" යන සිඛය හා "අසම්මතො භික්ඛුනියො ඔවදෙය්‍ය" යන මේ තාක් ශික්ෂාපදයෝ ද; **තථා අත්ථඞ්ගතෙන චාති** "අත්ථඞ්ගතෙ සූරියෙ ඔවදෙය්‍යා"ති ඉදමෙතං සන්ධාය වුත්තං, **තිරච්ඡානවිජ්ජා චෙති** "තිරච්ඡානවිජ්ජං පරියාපුණෙය්‍ය," "වාචෙය්‍ය" යන දෙ සිඛය ද; **අනොකාසෙ ච පුච්ඡනාති** "අනොකාසකතං භික්ඛුං පඤ්හං පුච්ඡෙය්‍යා"ති ඉදමෙතං සන්ධාය වුත්තං.

**අද්ධානං නාවා පණීතනාති** "භික්ඛුනියා සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං" යන සිඛය හා "එකං නාවං අභිරූහෙය්‍ය" යන සිඛය හා "පණීතභොජනානි අත්තනො අත්ථාය" යන සිඛය හා තුන් සිඛය ද; **මාතුගාමෙන සංහරෙති** "මාතුගාමෙන සද්ධිං සංවිධාය" යන සිඛය ද, "සම්බාධෙ ලොමං සංහරාපෙය්‍ය" යන මෙ (දෙ) සිඛය ද; **ධඤ්ඤං නිමන්තිතා චෙවාති** "ආමකධඤ්ඤං විඤ්ඤාපෙත්වා" යන සිඛය හා "නිමන්තිතා වා පවාරිතා වා ඛාදනීයං වා භොජනීයං වා" යන (දෙ) සිඛය ද; **අට්ඨ චාති** භික්ඛුනීන්ට කියනලද අඨ පාටිදෙසනීයයෝ ද;

**ථෙය්‍යසත්ථං උපස්සුතීනාති** "ථෙය්‍යසත්ථෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං" යන සිඛය හා "උපස්සුතිං තිට්ඨෙය්‍ය" යන සිඛය ද; **සූපං විඤ්ඤාපනෙන චාති** යන මෙ සෙඛියයෙහි සූපොදනවිඤ්ඤත්තිය සඳහා කියනලදී. **රත්තිච්ඡන්නා ච ඔකා**

**සනාති** "රතනභණ්ඩාගාරෙ අප්පදීපෙ" යන සිඛය හා "පටිච්ඡන්නෙ ඔකාසෙ" යන සිඛය හා "අජ්ඣොකාසෙ පුරිසෙන සද්ධිං" යන සිඛය හා යන තුන් සිඛය ද; **වත්ථුගෙන සන්නක්ඛාති** "රපිකාය වා වත්ථුකෙ වා" යනාදීන් කියනලද මෙ ශික්ෂාපදය සත් වනු කොට ඇති; **එතෙ**-මෙ ශික්ෂාපදයෝ;

**කායචිත්තතො ජායන්ති**-කායචිත්තයෙන් වෙති. **තෙ**-ඔහු; **වාචතො න ජායන්ති**-කයින් වෙති. **තීහි වාරෙහි ජායන්ති**-කාය වාචා චිත්ත ය යන තුන් දොරින් වෙති. **ඉමෙ ථෙය්‍යසත්ථසමුට්ඨානා**-මෙ ථෙය්‍යසත්ථසමුට්ඨානයෝ; **නම සමුට්ඨානිකා**-ෂිසමුට්ඨානිකයන සි; **ආදිචමබන්ධුනා දෙසිතා.**

**එකාදස අනූනකා**-අනූන වූ මෙ එකොළොස් ධර්ම දෙසන සිඛය ද; **වාචාචිත්තතො ජායන්ති**-වාචාචිත්තයෙන් වෙති. **තෙ**-ඔහු; **කායතො න ජායන්ති**-කයින් නො වෙති. **සබ්බෙ**-මොහු හැමදෙන; **එකසමුට්ඨානා**-එකසමුට්ඨානයන. **සමකා ධම්මදෙසනා**-ධර්මදෙශනාසමුට්ඨානය හා සමයෝ යි.

**භූතං**-භූතාරොචනය; **කායතො ජායති**-කයින් වෙයි. **න වාචා න ච චිත්තතො**-වාචාචිත්තයෙන් නො වෙයි. **වාචතො ච සමුට්ඨාති**-වාචායෙන් වෙයි. **න කායා න ච චිත්තතො**-කාය චිත්තයෙන් නො වෙයි.

**කායවාචාය ජායති**-කායවාචායෙන් වෙයි. **තං**-එ; **චිත්තතො න ජායති**-සිතින් නො වෙයි. **භූතාරොචනකා නාම**-භූතාරොචන නම් ආපත්ති ය; **තීහි ඨානෙහි ජායති**-කායෙ වාචා කායවාචා යන තුන් කාරණයෙන් වෙ.

**චොරී**-චොරී සමුට්ඨාපනය; **වාචාය චිත්තතො**-වාචාචිත්ත යෙන් වෙයි. **කායතො**-කයින්; **න තු ජායති**-නොවෙයි. **ජායති තීහි වාරෙහි**-කායවාචාචිත්තයෙන් වෙයි. **ඉදං චොරිවුට්ඨාපනං**-මෙ චොරිවුට්ඨාපනය; **අසම්මිස්සසමුට්ඨානං**-අභිනව වූ සමුට්ඨානදෙනක් ඇත්තේ; **ධම්මරාජෙන භාසිතං.**

**අනනුඤ්ඤාතං**- "මාතාපිතූහි වා සාමිකෙන වා අනනුඤ්ඤාතං" යන සිඛය; **වාචාය**-වාචායෙන් වෙයි. **න කායා න ච චිත්තතො**-කායචිත්තයෙන් නො වෙයි. **ජායති කායවාචාය**-කායවාචායෙන් වෙයි. **තං**-එ; **චිත්තතො**-සිතින්; **න ජායති**-නො වෙ.

**ජායති වාචාවිඤ්ඤත්තිතො**-වාචාවිඤ්ඤත්තියෙන් වෙයි. **න කා- ජායති කායතො**-එ කයින් නො වෙයි. **ජායති තීහි ද්වාරෙහි**-කායවාචාචිත්ත යන තුනින් වෙයි. **අකතං චතුට්ඨානිකං**-අගි නව වූ සතර සමුට්ඨානයක් ඇත්තේ යි.

**අසම්මොහකරං ඨානං**-සම්මොහ නො කිරීමට කාරණ වූ; **නෙත්තිධම්මානුලොමිකං**-විනයපාළිඅර්ථයාවට අනු ලොමව; **දස තීණි**-තෙලෙස් වැදෑරුම් වූ සමුට්ඨානභෙදයකුත්; **අදෙසයි**-භාග්‍යවත්තෙම මනා කොට දෙසී ය. **සමුට්ඨානමුඛෙ**-සමුට්ඨානයෙහි; **ඉමං සංඛෙපං**-මේ සංක්ෂෙපය; **ධාරයන්තා**-ධරන්නාවූ; **විසාරදා හි**-නුවණැත්තෝ ද; **සමුට්ඨානෙ**-සමුට්ඨානයෙහි හෙවත් ශික්ෂාපත්තිකාරණයෙහි; **න මුය්හන්ති**-මුළා නො වෙ.

මෙම **පරිවාර** බලා දත යුතු.

කඞ්ඛාවිතරණීපිටපොත

නිමි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු